අපේ බුදුහාමුදුරුවෝ

පුජ්‍ය තල්ගස්වැවේ සීලානන්ද
ස්වාමීන් වහන්සේ විසිනි

අපේ බුදුහාමුදුරුවෝ

© පූජ්‍ය තල්ගස්වැවේ සීලානන්ද ස්වාමීන් වහන්සේ
ආරණ්‍ය සේනාසනය
බටහිර වර්ජිනියා, ඇමෙරිකාව.

දෙවන මුද්‍රණය

ISBN 978-955-51791-2-6

ප්‍රකාශනය
ආරණ්‍ය සේනාසනය
බටහිර වර්ජිනියා
ඇමෙරිකාව.

සියලු විමසීම්
seela22bhavana@gmail.com
(Bhante Seelananda)

මුද්‍රණය
යූ එස් ලංකා ප්‍රින්ටර්ස්
අංක 10. 1 වන පටුමග, හේනපාර, ගල්කිස්ස.

දුරකතන - 0112725853
විද්‍යුත් තැපෑල -uslankaprint1@gmail.com

**ධර්ම දානය පිණිස
නොමිලේ බෙදාදීම සඳහා පමණි.**

බුදු උපත සැපතකි

සුඛෝ බුද්ධානං උප්පාදෝ
සුඛා සද්ධම්ම දේසනා
සුඛා සංඝස්ස සාමග්ගී
සමග්ගානං තපෝ සුඛෝ

(බුදුවරුන්ගේ උපත සැපතකි.
සද්ධර්ම දේශනාව සැපතකි.
සංඝයාගේ සමගි බව සැපතකි.
සමගි වුවන්ගේ ගුණදම් වැඩීම සැපතකි)

විශේෂ පුණ්‍යානුමෝදනය

සියලුම දාන අතරින් ධර්ම දානය ම උතුම් බව අපගේ තථාගත සම්බුද්ධ දේශනයයි. මෙම උතුම් ධර්ම ග්‍රන්ථය මුද්‍රණය කරවා අද ඔබ අතට පත් කරන්නේ ඇමෙරිකාවේ නිව්ජර්සි ජනපදයේ වාසය කරන **අරෝෂණී සුජීවා මීගම සහ අමන්ද මීගම දෙපල** විසින් ප්‍රධාන වශයෙන්ම මීට වසර 52 කට පෙර පරලෝ සැපත් අමන්දගේ ආදරණීය පියාණන් වූ **රාජා ලක්ෂ්මන් මීගම මහත්මාණන්ට** පිං අනුමෝදන් කරවීම සඳහා සහ සුජීවත්ව වාසය කරන අරෝෂණීගේ ආදරණීය පියාණන් වන ස්ටීවන් **අල්විස් සමරකෝන් උපාසක මහත්මාණන්ටත්** ආදරණීය මෑණියන්වන **කරුණා අතපත්තු සමරකෝන් උපාසිකාවටත්,** අමන්දගේ ආදරණීය මෑණියන් වන **සුධර්මා මීගම උපාසිකාවටත්** නිදුක් නිරෝගී චිරජීවනය ලැබේවා! වහ වහාම උතුම් වූ චතුරාර්‍ය සත්‍යය ධර්මය අවබෝධ වේවා! යන උතුම් ප්‍රාර්ථනයෙනි.

පවුලේ සහෝදර සහෝදරියන් හැමදෙනාටමත් සියලු ඥාතීන්ටත් වහ වහාම චතුරාර්‍ය සත්‍යය ධර්මයන් අවබෝධ වේවා! අප සැමටම මේ උතුම් ධර්ම දානමය පිංකමත් වහ වහාම **චතුරාර්‍ය සත්‍යය ධර්මයන් අවබෝධය පිණිස ම, නිවන් සුව අවබෝධය පිණිස ම පවතීවා!**

සාධු! සාධු! සාධු!

පිදුම

අපේ අසිරිමත් වූ මුනි සත්තම තථාගත
ලොවුතුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ
අනන්ත වූ
බුද්ධ ගුණයන්ට
මෙම ධර්ම ග්‍රන්ථයත් පූජා කරමි.
පූජා වේවා !

සාධු! සාධු! සාධු!

පටුන

පිටු

පෙරවදන **11-13**

1 පරිච්ඡේදය **15- 68**

අපේ සිදුහත් මහ බෝසත් උතුමාණෝ **15**

ගිහි ජීවිතය

1. අසහාය බෝසත් උපත (සිහිනුවණින් ම මව් කුසින්) 18
2. ළමා කාලය (ජම්බු ගසක් යට පුංචි පුතෙක් ඇත) 27
3. ගිහි ගෙදර වාසය 30
(සැපයෙන් අනූන වු සිවුමැලි ජීවිතයක්)
4. සතර පෙර නිමිති දැකීම (අඳුරෙන් එළියට) 33
5. ගිහිගෙය හැර දමා පැවිදිවීම (ගිහිගෙය සම්බාධ සහිතයි පැවිද්ද නම් අභ්‍යවකාශය වගෙයි) 35

සත්‍යය සොයා

1. ධ්‍යාන ලාභී ගුරුවරු අතර 41
(තොල්දෙක සෙලවුන පමණින් ම දැන ගතිමි)
2. මහ වන මැද දුෂ්කර ක්‍රියා සමය 45
(අසහාය වීරවන්තයාණෝ)
3. මැදුම් පිළිවෙතින් දහම් සුව සොයා (නිවැරදි තීරණය) 52
4. සම්මා සම්බුද්ධත්වය (ලොව උතුම් ම පදවියට පත්වීම) 58

2 පරිච්ඡේදය

ලොවට පහළ වූ අපේ බුදුහාමුදුරුවෝ 69-121

1. විමුක්ති සුවයෙන් සුසංවේදී ව 73
2. වෙළෙන්දෝ දෙදෙනෙක් (තපස්සු භල්ලික) 76
3. අජපල් රුක් සෙවනේ ගුරුවරයෙක් සොයයි 80
4. සොයාගත් ධර්මයේ ගැඹුර දැක 81
5. උපක ආජීවකගේ හමුවීම 84
6. ප්‍රථම ධර්ම දේශනය 86
7. අපේ බුදුහාමුදුරුවෝ දසබලධාරී වන සේක 87
8. අපේ බුදුහාමුදුරුවෝ විසාරද ඥාණ හතරකින් යුක්තයි 95
9. ලොව පහළ වූ ආශ්චෙයර්‍යවත් ම මනුෂ්‍යයා 99
10. බුදුගුණ අනන්තයි, අප්‍රමාණයි (සුවිශේෂ නම් සියයකින් බුදුගුණ) 102
11. සේල බ්‍රාහ්මණයා දුටු අපේ බුදුහාමුදුරුවෝ 105
12. සභිය පිරිවැජියා දුටු අපේ බුදුහාමුදුරුවෝ 106
13. උත්තර හා බ්‍රහ්මායු දෙදෙනා දුටු අපේ බුදුහාමුදුරුවෝ 107
14. සකුළුදායි දුටු අපේ බුදුහාමුදුරුවෝ 116

3 පරිච්ඡේදය

බුදුන් වදාළ නියම ධර්මය 122-181

1. සත් තිස් බෝධිපාක්ෂික ධර්ම හා ඒවායේ සරළ අදහස 130

අ. සතර සතිපට්ඨාන 130
ආ. සතර සම්මපධාන 131
ඇ.සතර ඉද්ධිපාද 133
ඈ.පඤ්ච ඉන්ද්‍රිය 135
ඉ. පඤ්ච බල 136
ඊ. සත්ත බොජ්ඣංග 136

උ. අයර්‍ය අෂ්ඨාංගික මාර්ගය 137

2. සත්තිස් බෝධිපාක්ෂික ධර්ම වඩන්නේ කෙසේද? 140

3 සම්බුද්ධ සුදේශිත නිමල ශ්‍රී සද්ධර්මය 144

4. සතර සතිපට්ඨාන භාවනාව ප්‍රගුණ කරනවිට සත්තිස් බෝධිපාක්ෂික ධර්ම සම්පූර්ණ වෙන ආකාරය 145

4 පරිච්ඡේදය

බුදුරජාණන් වහන්සේගේ සුවිශේෂ භාවනා ක්‍රමය හෙවත් සමථවිපස්සනා යුගනද්ධය 181

(1). කායානුපස්සනාව හෙවත් කයෙහි කයට අනුව බලමින් වාසය කිරීම 181
අ. ආනාපානය ගැන සිහියෙන් යුක්තවීම 182
ආ. සතර ඉරියව් ගැන ම සිහියෙන් යුක්තවීම 186
ඇ. කරන සෑම ක්‍රියාවක් ම සිහිනුවණින් කිරීම හෙවත් සම්පජානයෙන් යුක්තව කිරීම 187
ඈ. ශරීරයේ විවිධ කොටස් හෙවත් දෙතිස් කුණප සිහියෙන් යුතුව බැලීම 188
ඉ. පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන ධාතු කොටස් මනා සිහියෙන් තේරුම් ගැනීම 189
ඊ. මනා සිහියෙන් යුතුව මළ සිරුරක ඒ ඒ අවස්ථා දැක ගැනීම 190

(2). වේදනානුපස්සනාව හෙවත් වේදනාවන්හි වේදනාවන්ට අනුව බලමින් වාසය කිරීම 191
(3). චිත්තානුපස්සනාව හෙවත් සිතෙහි සිත්වලට අනුව බලමින් වාසය කිරීම 192
(4). ධම්මානුපස්සනාව හෙවත් ධර්මයන්හි ධර්මවලට අනුව බලමින් වාසය කිරීම 193

(අ). නීවරණ සහමුලින් ම නැති වීම 194
(ආ). පඤ්චස්ඛන්ධය අවබෝධකරගැනීම 194
(ඇ). දොළොස් ආකාර ආයතන අවබෝධකරගැනීම 195
(ඈ). සත්ත බොජ්ඣංග ධර්ම අවබෝධ කරගැනීම 200
(ඉ). චතුරාර්‍ය්‍ය සත්‍යය ධර්මයන් අවබෝධකරගැනිම 207
(ඊ). ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය 224

5. පරිච්ඡේදය

නිවණ සහ සම්බුද්ධ පරිනිර්වාණය 233

(1). නිවණ 233
(2). අනිදස්සන විඤ්ඤාණය 244
(3). අපේ බුදුහාමුදුරුවෝ තම අවසන් කාලය ගතකළ ආකාරය සහ සම්බුද්ධ පරිනිර්වාණය 256

ආශ්‍රිත ග්‍රන්ථ 295

පාදක සටහන් 296

පෙරවදන

ඔබ අතට පත් මේ ධර්ම ග්‍රන්ථය බුදුරජාණන් වහන්සේ විසින් ම තම ජීවිතයේ උපතේ සිට අවසන් මොහොත දක්වා දේශනා කළ ආකාරයෙන් සිය ජීවන චරිතයත්, උන්වහන්සේ විසින් දේශනා කොට වදාළ ශ්‍රී සද්ධර්මයත්, සංක්ෂිප්ත වශයෙන් ඔබට කියා දෙන විශේෂ ධර්ම ග්‍රන්ථයකි.

අටුවා ටීකා ටිප්පණී වලින් හෝ පසුකාලීනව විවිධ උගතුන් විසින් ලියන ලද ග්‍රන්ථ වලින් උපුටා ගත් කිසිවක් මෙහි නැත. නිමල බුදුවදන ම මෙහි ඇතුළත් කිරීම අපගේ වෑයම විය. එබැවින් ම මෙය පිරිසිදු බුදු දහම පෙන්වා දෙන ධර්ම ග්‍රන්ථයක් ලෙස හැඳින්වීම අනුචිත නොවේ. සෑම කරුණක් ම ඔබටත් පැහැදිලි කරගැනීමේ පහසුව පිණිස බුදුරජාණන් වහන්සේ විසින් ඒ ඒ කරුණ දේශනා කොට ඇති අදාළ සූත්‍රය සඳහන් වන ස්ථානය මෙම ග්‍රන්ථාවසානයේ එන පාදක සටහන් වලින් පෙන්වා දී ඇත.

බුදු දහම නමින් විවිධ දේ කරන, විවිධ දේ කියන, බුදුබණ විකෘති කරන, පිරිහෙන සමාජයට, රටට, මෙවන් ධර්ම ග්‍රන්ථ සිය ගණනින් නොව දහස් ගණනින් අවශ්‍ය බව අපගේ අදහසයි. එබැවින් ම තවත් ධර්ම ග්‍රන්ථ දෙකක් සිංහල භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් ලියමින් සිටියදී ඒවා පසෙක ලා හදිසියේ ම වුවද මෙම ග්‍රන්ථය ලිවීමට අදහස් කළෙමු.

දෙවෙනි මුද්‍රණය (2017 වෙසක් පෝදා)

මේ මෙම ධර්ම ග්‍රන්ථයේ දෙවෙනි මුද්‍රණයයි. ප්‍රථම මුද්‍රණය සඳහා මුද්‍රණ දායකත්වය ලබාදුන් ඇමෙරිකාවේ නිව්යෝර්ක් හි පදිංචි ලීලා ගෝමස් මහත්මිය ඇතුළු පවුලේ සැමටම මේ අවස්ථාවේදීත් පුණ්‍යානුමෝදනා කරන අතර විශේෂයෙන් මෙම දෙවෙනි මුද්‍රණය සඳහා මුද්‍රණ දායකත්වය සපයන ඇමෙරිකාවේ නිව් ජර්සි ජනපදයේ පදිංචි අමන්ද මීගම මහතාටත් අරෝෂණී මීගම මහත්මියටත් ඒ පවුලේ සැමටත් අපි මෙසේ පුණ්‍යානුමෝදනා පෙරටුව ස්තුතිය පළකරමු.

ඒ සමගම මෙවන් ධර්ම ග්‍රන්ථ සකස් කිරීමටත් දහම් පොත පත හැදෑරීමටත් මෙන්ම අපගේ ආධ්‍යාත්මික දියුණුව සඳහා කරන භාවනා කටයුතුවල නිරත වීමටත් අපට අවශ්‍ය කාලය, අවකාශය හා සියලු පහසුකම් ලබා දෙමින් අපට මහත් කරුණාවෙන් හා අනුකම්පාවෙන් උපදෙස් ලබාදෙන, අප වැඩ සිටින මෙම අරණ්‍ය සේනාසනයේ අධිපති ගරු අපේ හේනේපොල ගුණරතන නායක මාහිමිපාණන් වහන්සේට විශේෂයෙන් ම පින් පෙරටුව ස්තුතිවන්ත වෙන අතර නීරෝගීබව සහ දීර්ඝායුෂ ලැබේවා! යි පතමු.

තවද, මෙම ග්‍රන්ථයේ සෝදුපත් බැලීම සඳහා අපට උපකාර කළ මා සොයුරු පෙමින් සලකන අපේ ජයසේන ගුණවර්ධන මහතාටත් කැනඩාවේ වාසය කරන දුෂ්මන්තා කුමාරි රණවැල්ල සොයුරියටත් විශේෂයෙන් පින් පෙරටුව ස්තුතිය පළ කරමි.

මෙවර ද මෙම ධර්ම ග්‍රන්ථය කලට වේලාවට ඉතාමත්ම හොඳින් මුද්‍රණය කිරීම සඳහා අපට සහයෝගීව කටයුතු කළේ ගල්කිස්සේ හේන පාරේ යු.එස්. ලංකා මුද්‍රණාලයේ අයිතිකරුවන උපුල් ශාන්ත කුලසිංහ මහතා ප්‍රමුඛ කාර්‍ය මණ්ඩලයයි. අපි ඒ සැම දෙනාටම නිදුක් නිරෝගී චිරජීවනය සැලසේවා!යි ප්‍රාර්ථනා කරමු.

මෙසේ පෙරවදන අවසන් කරමින් අපි අපේ බුදුහාමුදුරුවෝ මේ ලෝකය ගැන අපට වදාළ සුවිශේෂ දේශනයකට දැන් සිත යොමු කරමු.

''අන්ධ භූතො අයං ලෝකෝ - තනුකෙත්ථ විපස්සති
සකුන්තෝ ජාල මුත්තෝව - අප්පො සග්ගාය ගච්ජති''

(මේ ලෝකයා අන්ධභාවයට පත්වී සිටිති. හොඳින් පෙනෙන්නේ ඉතාම සුළු පිරිසකට පමණයි. වටු වැද්දගේ දැලෙන් එක් කුරුල්ලෙක් හෝ දෙන්නෙක් මිදීයන්නාසේ ස්වර්ගාදි සැපයට පැමිණෙන්නේ ඉතාම සුළු පිරිසක් පමණි.)

පූජ්‍ය තල්ගස්වැවේ සීලානන්ද ස්වාමීන් වහන්සේ
ආරණ්‍ය සේනාසනය
බටහිර වර්ජිනියාව
ඇමෙරිකාව.
2016 නොවැම්බර් 24 වෙනි දින දීය.

1 පරිච්ඡේදය

අපේ සිදුහත් මහ බෝසත් උතුමාණෝ

අපි මෙහිදී අපගේ තිලෝගුරු වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට ''අපේ බුදුහාමුදුරුවෝ'' කියා ප්‍රකාශ කරන්නේ සුවිශේෂ අර්ථයකිනි. එසේ නැතිව බුදුහාමුදුරුවෝ සිංහලයන්ගේය, බෞද්ධයන්ගේය, හෝ ලාංකිකයන්ගේ ය යන පටු අදහසකින් නොවේ. මුලින් ම අපි තේරුම් ගත යුත්තේ බුදුහාමුදුරුවෝ වෙනත් කිසි ම ශාස්තෘවරයෙකුට හෝ කිසිවෙකුට සමකළ නොහැකි බවය. එබැවින් ම උන්වහන්සේ අසහාය වනසේක. වෙනත් බුදුවරයෙකුට පමණක් සමවන බැවින් අසමසම වන සේක. උන්වහන්සේ විසින් දේශනා කොට වදාළ ඒ ශ්‍රී සද්ධර්මය වෙනත් කිසි ම ධර්මයකට සම කළ නොහැක. එසේ ම උන්වහන්සේ විසින් ඇති කොට වදාළ සුපිළිපන් අෂ්ටායර්‍ය පුද්ගල වූ ඒ ආර්ය මහා සංඝ රත්නය ද වෙනත් කිසි ම සංඝ පිරිසකට සම කළ නොහැක.

අපේ බුදුහාමුදුරුවෝ මෙය තම සූත්‍ර දේශනාවල ඉතාමත් ම පැහැදිලිව දේශනා කොට වදාළහ.[1] එසේ සමාන කිරීමට අවශ්‍ය වන්නේ ද නැත. සමාන දේ සමාන ලෙස සැලකීම මෙන් ම අසමාන දේ අසමාන ලෙස සැලකීමත් ගුණවතුන්ගේ ප්‍රඥාවතුන්ගේ බුද්ධිමතුන්ගේ හෙවත් බෞද්ධයන්ගේ සුවිශේෂ ලක්ෂණයකි. බෞද්ධකම යනු බුද්ධිමත් කමයි. බෞද්ධයා හැමවිට ම බුද්ධිමත්ව කටයුතු කළ යුතුයි. බුද්ධිමත් ව

කටයුතු නොකරන්නා බෞද්ධයෙක් වෙතොත් ඒ ලේබලයකට පමණි. බුද්ධිය මෙහෙයවා කටයුතු කරන්නා තමාගේ මෙන්ම අන් අයගේත් යහපත සළසන පස්පව් වලින් දුරුව දස අකුසල් වලින් දුරුව පව පින හඳුනාගෙන ජීවත්වෙන කෙනෙකි. හෙතෙම ජීවත්වෙන්නේ පන්සලේ වුවද පල්ලියේ වුවද කෝවිලේ වුවද හෙතෙම බෞද්ධයෙකි. අපේ බුදුහාමුදුරුවෝ දහම් දේශනා කළේ බෞද්ධ යැයි තෝරාගත්ත එක් පිරිසකට පමණක් නොවේ. උන්වහන්සේගේ ශ්‍රී සද්ධර්මය ගුණ දම් හඳුනන සියලු මමනුෂ්‍යයන්ටයි, දෙවියන්ටයි.

තවත් ටිකක් මේ කරුණ පැහැදිලි කරගත යුතුයි. අපි මෙසේ මෙම ග්‍රන්ථයෙහි ''අපේ බුදුහාමුදුරුවෝ'' යැයි පවසන්නේ බුදුහාමුදුරුවෝ මේ මහා භද්‍ර කල්පයේ, එනම් මේ යුගයේ, අපේ යුගයේ, මෙලොව ජීවත්වෙන සමස්ත ලෝක වාසී වූ සියලුම මනුෂ්‍යයන්ගේත්, සියලුම දෙවියන්ගේත්, සියලුම බ්‍රහ්මයන්ගේත්, සියලුම සත්වයන්ගේත් අසහාය ශාස්තෲන් වහන්සේ වන බැවිනි. සියලුම සත්වයන් වෙත පතළ මහා කරුණා වෙන් දිනපතා ම උදෑසන තමන් වහන්සේට පමණක් සුවිශේෂ වූ මහා කරුණා සමාපත්තියෙන් ලොව බලා අපමණ සත්වයන් සසරින් එතෙර කළ මහා මුනිදාණෝ ඒ අපේ බුදුහාමුදුරුවෝ මය. අපි මේ උන්වහන්සේට ''අපේ බුදුහාමුදුරුවෝ'' යැයි කියන්නේ අපේ යුගයේ පහළ වූ අපේ ම බුදුහාමුදුරුවෝ වන නිසයි.

එකම යුගයක එකම ලෝක ධාතුවක බුදුරජාණන් වහන්සේලා දෙනමක් පහළ නොවන බව හෙවත් වැඩ වාසය නොකරන බව අපේ බුදුහාමුදුරුවෝ ම මජ්ඣිම නිකායේ බහුධාතුක සූත්‍රයේ අපට ඉතාම පැහැදිලිව

දේශනා කළහ.[2] එසේම ධම්මපදයේ බුද්ධ වර්ගයේ සඳහන් වෙන පරිදි ඒ අජානීය වු ශ්‍රේෂ්ඨවත් වු මහා පුරුෂයන්ගේ පහළ වීම දුර්ලභය එවන් උතුමෝ හැම තැනකම නූඋපදිති. එවන් උතුමෝ යම් තැනෙක උපත ලබත් ද ඒ වංශයම, කුලයම තෘප්තිමත් වෙයි, සමෘද්ධියට පත් වෙයි.[3] තවද අංගුත්තර නිකායේ ඒකක නිපාතයෙහි බුදුකෙනෙකුගේ උපත පිළිබඳව අපේ බුදුහාමුදුරුවෝ මේ ආකාරයෙන් දේශනා කොට වදාළහ. ''පින්වත් මහණෙනි, එක් පුද්ගලයෙක් ලෝකයේ බොහෝ ජනයාගේ හිත සුව පිණිස ලෝකානුකම්පාව පිණිස උපත ලබයි. ඒ පුද්ගලයා කවරෙක්ද? තථාගත වු අරහත් වු සම්මා සම්බුදුරජාණන් වහන්සේය.''

එම අංගුත්තර නිකායේ ඒක පුග්ගල වග්ගයේ පළමුවෙනි සුත්‍රයේ සිට විසිපස් වෙනි සුත්‍රය දක්වා සුත්‍රදේශනා විසිපහක ම සඳහන් වෙන පරිදි එක් පුද්ගලයෙකුගේ ලොවට පහළවීම ඉතාමත්ම දුර්ලභයි. ඒ පුද්ගලයා නම් තථාගත වු අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේය. උන්වහන්සේ ආශ්චර්යවත් මනුස්සයෙකි. උන්වහන්සේගේ කලුරිය කිරීම හෙවත් පිරිනිවන්පෑම බොහෝ ජනතාවට මහත් පසුතැවිල්ලට හේතුවකි. උන්වහන්සේ අද්විතීය තැනැත්තෙකි, අසහාය තැනැත්තෙකි, උන්වහන්සේට සමාන වෙනත් කෙනෙක් නැත. හෙතෙම දෙපා ඇත්තවුන්ගෙන් අග්‍රයි, ශ්‍රේෂ්ඨයි. උන්වහන්සේගේ උපතත් සමග මහත් ප්‍රඥාවක් ඇතිවෙයි, මහත් ආලෝකයක් ඇතිවෙයි, අනුත්තරීය ධර්ම හයක පහළවීම සිදුවෙයි, සිවුපිළිසිඹියාවන් ප්‍රත්‍යක්ෂ කරගැනීමේ අවස්ථාව උදාවෙයි, අනේකවිධ වු නානාවිධ වු ලෝකධාතු ගැන අවබෝධකරගැනිමේ හැකියාව ඇතිවෙයි, විද්‍යා හා

විමුක්ති ඵල ප්‍රත්‍යක්ෂ කරගැනීමේ හැකියාව උදාවෙයි, සෝතාපත්ති ඵල, සකදාගාමී ඵල, අනාගාමී ඵල හා අරහත් ඵල ප්‍රත්‍යක්ෂ කිරීමේ හැකියාව උදාවෙයි.[4]

ගිහි ජීවිතය

1. අසහාය බෝසත් උපත
(සිහි නුවණින් ම මව්කුසින් මෙලොවට)

අපගේ සිදුහත් බෝසතාණෝ තුසිත දෙව්ලොව සිට මෙහි පැමිණ සිය මව වූ මහාමායා බිසවගේ කුසයෙහි පිළිසිඳගත් බව සූත්‍රදේශනා වල පැහැදිලිවම සඳහන් කර ඇත. සිය පියාණන් වූයේ සුද්ධෝදන මහරජ තුමාණන්ය. බුදු උපත ලොවට ම සැපතකි (සුඛෝ බුද්ධානං උප්පාදෝ).[5] බුදුරජාණන් වහන්සේ නමක් ලොවට පහළ වෙන්නේ කලාතුරකිනි. එවන් බුදුඋතුමන්ගේ ලොව පහළ වීම ඉතාමත් දුර්ලභය (කිච්චෝ බුද්ධානං උප්පාදෝ).[6] අපේ බුදුහාමුදුරුවෝ ලොවට පහළ වූයේ හෙවත් මව්කුසයෙන් බිහිවූයේ වෙසක් පුර පසළොස්වක පෝහෝ දිනකය. ඒ මෙයට වර්ෂ 2636 කට පෙර දීය. වෙසක් පොහෝ දිනය අද ලෝක වාසී සියලුම බෞද්ධයන්ගේ සුවිශේෂ දිනය බවට පත්වී ඇත්තේ සිදුහත් මහ බෝසතාණන් වහන්සේගේ උපත, සම්මා සම්බුද්ධත්වය හා පරිනිර්වාණය යන තෙමඟුල ම එදිනට සිදු වූ බැවිනි.

මේ අපේ බෝසත් පුංචි කුමාරයාගේ උපත සිදුවූ ආකාරය නම් ඉතාමත් ම ආශ්චෙයර්‍යවත්ය, පුදුම සහගතය. මේ පුංචි පුතා ඉපදුණේ ලෝකයේ වෙනත් කිසිම කෙනෙක් ඉපදෙන ආකාරයට නොවෙයි. දිනක්

අපේ බුදුහාමුදුරුවෝම ආනන්ද හාමුදුරුවන්ට දේශනා කළා තමන් වහන්සේ ඉපදුණේ කොහොමද කියලා. ඒ ගැන ආනන්ද හාමුදුරුවෝ අපට කියන්නේ මෙන්න මේ විදිහටයි. ''මම බුදුරජාණන් වහන්සේගේම දෙතොළින් අහපු හැටියටයි මේ කියන්නේ'', කියලයි ආනන්ද හාමුදුරුවෝ මේ කතාව ආරම්භ කරන්නේ. ඉතින් ඒ ආනන්ද හාමුදුරුවෝ අපට මේ කරුණු කියාදෙන සූත්‍රදේශනයේ නම 'අච්චරිය අබ්භූත ධම්ම සූත්‍රය' යන්නයි. එහි තේරුම ආශ්චර්යය අත්භූත දේ යන්නයි. මේ සූත්‍ර දේශනයේ තමයි බුදු උපත ගැන පියවරෙන් පියවරට පැහැදිලි කරලා තියෙන්නේ. මෙය ඇතුළත් වෙන්නේ මජ්ඣිම නිකායේ තුන්වෙනි කොටසෙහිය. සූත්‍ර අංකය, එකයි, දෙකයි, තුනයි. ඒ කියන්නේ එකසිය විසිතුන.[7]

එක් දිනක් අපේ බුදුහාමුදුරුවෝ සැවත් නුවර ජේතවනාරාමයේ වැඩ සිටිද්දී බොහෝ භික්ෂූන් වහන්සේලා උදේ කාලයේ පිණ්ඩපාත චාරිකාව කරලා දහවල දානයෙන් අනතුරුව සවස් කාලය වෙද්දී උපස්ථානශාලාවට එක්රැස් වුණා. එක්රැස්වී සාකච්ඡාවක නිරතව සිටිද්දී අපේ බුදුහාමුදුරුවන් වහන්සේ ද එම ශාලාවට වැඩම කළහ. එහිදී බුදුපියාණන් වහන්සේගේ අවසරය පරිදි ආනන්ද මහා ස්ථවිරපාදයාණන් වහන්සේ විසින් මෙම සූත්‍රය දේශනා කළහ. මේ අවස්ථාවේ මෙයට පෙර දිනෙක බුදුපියාණන් වහන්සේ විසින් ආනන්ද හාමුදුරුවන්ට දේශනා කළ ආකාරයෙන්ම උන්වහන්සේ අපේ බුදුහාමුදුරුවෝ ඇතුළු මහා සංඝරත්නය ඉදිරියේ මෙම බුදු උපත සම්බන්ධ කරුණු අනාවරණය කළේ මෙන්න මේ ආකාරයටයි. ''මම බුදුරජාණන් වහන්සේ හමුවෙහි,

බුදුරජාණන් වහන්සේගෙන්ම අසා ඇති පරිදි, බෝධිසත්වයන් වහන්සේ සිහි නුවණින් යුතුව තුසිත දෙව්ලොව උපත ලබති. සිහි නුවණින් යුතුවම තුසිත දිව්‍ය ලෝකයෙහි වැඩ වසති. යම්තාක් ආයුෂ වේද ඒතාක් එහි වැඩ සිටිති. අනතුරුව සිහිනුවණින් යුතුවම තුසිත දිව්‍යලෝකයෙන් නික්ම මව්කුසට බැස ගනිති. යම් අවස්ථාවක තුසිත දිව්‍යලෝකයෙන් නික්ම මව්කුසට බැස ගන්නේ ද ඒ අවස්ථාවේ දෙවියන් බඹුන් මරුන් සමණ බ්‍රාහ්මණයින් දෙව්මිනිසුන් සහිත මේ ලෝකයෙහි අප්‍රමාණ වූ උදාර වූ දෙවියන්ගේ දේවානුභාවය ද ඉක්මවන්නාවූ ආලෝකයක් ඇතිවෙයි. මේ සා මහා ඍධිමත් වූ මහානුභාව සම්පන්න වූ හිරු සඳු දෙදෙනාගේ ආලෝකය පවා නොලබන්නා වූ, නිබඳවම විවෘතව ඇතත් අන්ධකාරී වූ, ඝන අන්ධකාරී වූ, ලෝකාන්තරික නම් වූ නිරයක් ඇද්ද ඒ නිරයෙහි ද මේ අවස්ථාවේ දී අප්‍රමාණ වූ උළාර වූ ආලෝකයක් පැතිරෙයි. එහි යම් සත්ව සමූහයක් උපත ලබා ඇද්ද ඒ අවස්ථාවේදී ඒ ආලෝකයෙන් වෙනත් සත්වයොත් මෙහි උපත ලබා සිටින බව ඔවුනොවුන් හඳුනාගනිති. බුදු උපත සමගම මේ දසදහසක් ලෝකධාතු කම්පනය වෙයි, ප්‍රකම්පනය වෙයි, කම්පාවෙන බව දැනෙයි. දෙවියන්ගේ දේවානුභාවය ද ඉක්මවන්නාවූ උදාර වූ උළාර වූ ආලෝකයක් ලෝකයෙහි පහළවෙයි.

''මව් කුසට පැමිණෙන විට ඒ අනුවම බෝධිසත්වයන් වහන්සේට හෝ සිය මෑණියන් වහන්සේට හෝ කිසියම් මනුෂ්‍යයෙකුගෙන් හෝ අමනුෂ්‍යයෙකුගෙන් හෝ උපද්‍රවයක් නොවේවා යන අදහසින් සතර මහා දෙව්වරු සතර දිසාවෙන් ආරක්ෂාව පිණිස පැමිණෙති. යම් දිනක බෝධිසත්වයන් වහන්සේ

මව්කුසට බැසගන්නේ ද ස්වභාවයෙන්ම සිය මව එදින ප්‍රාණඝාතයෙන්, අදත්තාදානයෙන්, කාමමිච්ඡා චාරයෙන්, මුසාවාදයෙන්, සුරා හා මේරය පානයෙන්, වැළකී සිල්වත්ව සිටින්නීය.

''යම් කලෙක බෝසත් මව් කුස පිළිසිඳ ගන්නේද එකල බෝසතුන්ගේ මවට පුරුෂයන් කෙරෙහි කාමනිශ්‍රිත වූ සිතක් ඇතිනොවේ. කිසිම පුරුෂයෙක් කෙරෙහි ඇලුණු සිතක් ද නැත.

''යම් කලෙක බෝසත් මව් කුස පිළිසිඳ ගන්නේ ද එකල සිය මව පඤ්චකාම ගුණයන් ගෙන් පිරිවර කරගන්නා තැනැත්තියක් වේ, හෙවත් සියලු සැප පහසුකම් වලින් අනූන වේ. යම්කලෙක බෝධිසත්ව තෙමේ මව්කුසට බැසගත්තේ ද එතැන් පටන් බෝසත් මවට කිසිදු ආබාධයක් ඇති නොවේ. ඇය කිසිදු ක්ලාන්ත ගතියකින් තොරව සුවසේ සිටියි. බෝසත් තෙමේ සියලු අඟපසඟ වලින් හා ඉඳුරන්ගෙන් පරිපූර්ණව මව් කුස තුළ සිටින ආකාරය ඇයට දැකගැනීමට හැකිවේ. එය හරියට යම් කෙනෙක් මනාව කපනලද, ඉතාම පිරිසිදු වූ අටපට්ටම් වූ පාරදෘෂ්‍ය මැණිකක් හෙවත් වෛරෛඩුර්මාණික්‍යයක් තුළ ඇති නිල්, කහ, රතු, සුදු, හෝ ගුරු පාට නූලක් දකින්නාක් මෙනි.

''බෝධිසත්වයන් ඉපදී දින හතකින් තම මව කලුරිය කරයි. ඇය තුසිත දෙව්ලොව උපදියි. වෙනත් ස්ත්‍රීන් නව මාසයක් හෝ දස මාසයක් කුස දරාගෙන සිට දරුවා බිහිකරයි. එහෙත් බෝසත් මව දරුවා බිහිකරන්නේ හරියටම දස මසක්ම කුස තුළ දරාගෙන සිටීමෙන් අනතුරුවය. වෙනත් ස්ත්‍රීහු වාඩිවී හෝ බිම

වැතිර හෝ දරුවා බිහිකරති. එහෙත් බෝසත් මව දරුවා බිහිකරන්නේ හිටගෙන සිටිමින්ම ය. බෝසත් තෙමේ මව් කුසින් බිහිවෙනවිට පළමුව පිළිගන්නේ දෙවිවරුන් විසින්ය. අනතුරුව මනුෂ්‍යයෝ පිළිගනිති. මව්කුසින් නික්මී පොළොවට පැමිණීමට පෙර සතර වරම් දෙවිවරුන් විසින් පිළිගෙන ''දේවීන් වහන්ස සතුටු වෙන්න. මෙන්න ඔබ තුමියගේ මහේශාක්‍ය වූ පුතා ඉපදුණා'' යැයි කියමින් මව ඉදිරියේ දරුවා තබති.

''බෝසත් තෙමේ මව් කුසින් නික්මෙන විට දියර ගතියකින් හෝ සෙම ගතියකින් හෝ ලෙයින් හෝ කිසිදු අපිරිසිදු දෙයකින් තැවරීමක් නැතිවම පිරිසිදුවම බිහිවෙයි. යම් කලෙක බෝසත් තෙමේ මව් කුසින් බිහිවන්නේ ද ඒ අවස්ථාවේ අහසින් ජලධාරා දෙකක් පහළ වෙති. එකක් ශීතල ජලයයි. අනික උණුසුම් ජලයයි. මේවායින් බෝධිසත්වයන් සහ මව පිරිසිදු කරති. උපතත් සමගම බෝසත් තෙමේ පොළොවෙහි පා තබා උතුරු දිසාව දෙසට සත් පියවරක් ගමන් කරයි. සේසතක් දරන කල්හීම සියලු දිසා විලෝකනය කරමින් සිංහනාදයක් කරයි.''

ඒ මෙසේය.

''මම ලොවට අග්‍ර වෙමි
මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි
මම ලොවට ජ්‍යෙෂ්ඨ වෙමි
මේ මගේ අන්තිම උපතයි
මින් මතු මට නැවත උපතක් නැත.''

(අග්ගෝ හමස්මි ලෝකස්ස,
සෙට්ඨෝ හමස්මි ලෝකස්ස,
ජෙට්ඨෝ හමස්මි ලෝකස්ස,
අයමන්තිමා ජාති නත්ථි'දානි පුනබ්භවෝ) යනුවෙනි.

අපේ බුදුහාමුදුරුවෝ ලොවේ වෙනත් කිසිම කෙනෙකු විසින් කවම කවදාකවත් නොදුටු අතීතයක් ගැන පූර්ණ විස්තර හෙළිකරමින් මෙයට කල්ප අනූ එකකට පෙර සිට මේ දක්වා කාලාන්තරයක් තිස්සේ ලොව පහළ වූ සියලු බුදුරජාණන් වහන්සේලාගේ ජීවිත කතාවන් සවිස්තරව ගෙන හැර දක්වමින් දේශනා කොට වදාළ දීඝනිකායේ මහාපදාන[8] සූත්‍රයෙන් තමන් වහන්සේ මේ යුගයේ පහළ වූ සම්මා සම්බුදුවරයාණන් වහන්සේ බව ද මහාමායා දේවිය තමන් වහන්සේගේ මව බව ද සුද්ධෝදන මහරජ තුමා තමන් වහන්සේගේ පියාණන් බව ද පැහැදිලිව ම දේශනා කොට වදාළහ. තවද තමන් වහන්සේ කපිලවස්තු නම් රාජධානියේ දී උපත ලද බව ද දේශනා කොට වදාළහ.

සුත්ත නිපාතයේ තුන්වෙනි පරිච්ඡේදයේනාලක සූත්‍රයෙන් ද අපේ බුදුහාමුදුරුවන් වහන්සේගේ උත්පත්තියට සම්බන්ධ කරුණු සමූහයක් අපට දැනගත හැකිය. එම සූත්‍ර දේශනයට අනුව එදා අසිත නම් ඍෂිවරයාණෝ සිය දිවා විහරණයට ගිය අවස්ථාවේදී තාවතිංස නම් දෙව්ලොව දෙවිවරු පිරිසිදු වූ සේත වර්ණ දිව්‍ය සළුපිළියෙන් සැරසී ඉන්ද්‍ර නම් වූ දෙදෙව් ලොවට අධිපති සක් දෙවිඳුන්ට ගරු කරමින් ඉමහත් සොම්නසින් ප්‍රමුදිතව ඔද වැඩීගිය සිතින් අතිශයින්ම ප්‍රීතිමත්ව නටමින් ගයමින් සිටිනු දැක ඒ කුමක් නිසාදැයි දෙවිවරුන්ගෙන් විමසීය.

එවිට දෙවිවරු, සම්මා සම්බුද්ධත්වය අවබෝධ කරගැනීමට සුදුසු වු උත්තම රත්නය වු අතුල්‍ය වු අසමසම වු බෝධිසත්වයන් වහන්සේ දෙවිමිනිසුන්ට හිතසුව පිණිස මිනිස් ලෝකයේ ශාක්‍යයන්ගේ ජනපදයෙහි වු ලුම්බිණි නම් ගමෙහි උපන් නිසා මෙසේ අතිශයින්ම සතුටට පත්ව සිටින්නෙමු යැයි කීහ.

එබස් ඇසු අසිත මහ සෘෂිතුමාණෝ සුද්ධෝදන මහරජතුමාගේ භවනට එළඹියේය. එහි වාඩිවු සෘෂිවරයාණෝ ''කුමාරයා කෝ මමත් දකින්න කැමතියි'' යැයි කීහ. මේ අවස්ථාවේ දක්‍ෂ රන්කරුවෙක් විසින් කෝවේ දමා සකස් කරනලද සුදිලෙන රත්තරන් කැබැල්ලක් වැනි වු අතිශයින්ම ශෝභාසම්පන්න වු ඒ පින්වත් පුත් කුමරු දැක්වුහ.

ඉමහත් සතුටට පත් සිත් ඇතිව සෘෂිවරයාණෝ කුමරු පිළිගත්හ. ලක්‍ෂණ ශාස්ත්‍රයෙහි හා වේද මන්ත්‍රයන්හි ද කෙළ පැමිණි ඒ සෘෂිවරයාණෝ කුමරු පරික්‍ෂාකරමින් ''දෙපා ඇත්තවුන්ගෙන් මේ කුමරු අනුත්තරයි'' යැයි කීහ. අනතුරුව තමා ගැන බලමින් නොසතුටු සිතින් කඳුළු සැලුහ. මෙය දැක ශාක්‍යයෝ කුමාරයාට කිසියම් අනතුරක් දැයි විමසුහ. ''නැහැ කුමරුට කිසිම අනතුරක් නැහැ. මේ කුමාරයා අනුත්තර වු සම්මා බෝධියට පැමිණෙයි. බොහෝ දෙනාට හිතසුව පිණිස දම්සක් පවත්වයි. මොහුගේ ශාසනය පතළ වෙයි. එහෙත් මම මේ ලොව එතෙක් කාලයක් ජීවත් වන්නේ නැත. එබැවින් සෝක වූයෙමි'' යැයි කීය.

අනතුරුව සෘෂි තෙමේ සිය බෑණනුවන් වු නාලක වෙත ගොස් නාලකට ''සම්බුද්ධ ශාසනයෙහි පැවිදි

වෙන්න, බුදුන්ගේ සරණ යන්න'' යැයි කියා අවවාද කළ බව මේ සූත්‍රයේ සඳහන් වේ.[9] අපේ බුදුහාමුදුරුවෝ බුදුවීම සඳහා මෙලොව උපතලද ආකාරය ගැන විවිධ කතා ඔබත් අහලා තියෙනවා නේද? ඉගෙන ගෙන තියෙනවා නේද? ඒවගේම කියවලා තියෙනවා. විවිධ මාධ්‍ය වලින් දැනගෙන තියෙනවා. ඒ රසබර, හැඟුම් බර, විවිධ විචිත්‍ර කතන්දර කීම අපගේ අරමුණ නොවනබව මෙහිදී නැවතත් මතක් කර ගනිමු. අප මෙහිදී පවසන්නේ අපගේ සම්මා සම්බුදු අමාමෑණී වූ තිලෝගුරු සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින්ම, අපේ බුදුහාමුදුරුවන් වහන්සේ විසින්ම, තමන් වහන්සේගේ ජීවන තොරතුරු සිය මුල් සූත්‍ර දේශනාවල අනාවරණය කර දක්වා ඇති ආකාරයෙන් පමණි.

වරක් අපේ බුදුහාමුදුරුවෝ තමන් වහන්සේගේ ශ්‍රාවක භික්ෂූන්වහන්සේලා අමතමින් තථාගතයන් වහන්සේගේ හෙවත් බුදුරජාණන් වහන්සේගේ උපත ගැන මෙසේ වදාළහ.

''පින්වත් මහණෙනි, සිංහ රාජයා සන්ධ්‍යා කාලයේ තම ගුහාවෙන් නික්මෙයි. ගුහාවෙන් නික්මී සිරුර හා අත්පා විහිදුවයි, දිග හරියි. සිරුර අත්පා විහිදුවා හාත්පස සිවු දිසා විලෝකනය කරයි, පරීක්ෂාකර බලයි. හාත්පස සිවු දිසා පරීක්ෂාකර බලා තෙවරක් සිංහනාද කරයි. එසේ තෙවරක් සිංහනාද කොට ගොදුරු පිණිස නික්මෙයි. යම් පමණ තිරිසන් ගත සත්වයෝ මේ සිංහනාදය අසත් ද ඒ බොහෝ වූ සත්වයෝ භයට, සංත්‍රාසයට, සංවේගයට පැමිණෙති. බිල්වල ජීවත්වෙන සත්වයෝ බිල්වලට රිංගා ගනිති. ජලයේ ජීවත්වෙන සත්වයෝ ජලයට බැස ගනිති. කැළයේ ජීවත්වෙන

සත්වයෝ කැළයට රිංගා ගනිති. පක්ෂීහු අහසට ඉගිළෙති. වෙන දෙයක් තියා ගම්වල නගරවල වරපට වලින්, දම්වැල් වලින්, බැඳලා ඉන්න මහා හස්ති රාජයෝ පවා භයට පත්ව මළ මුත්‍රා පිටකරමින් ඒ සියලු බැමි කඩාගෙන හැරුණු හැරුණු අත දුවති. පින්වත් මහණෙනි, සිංහරජායා ඒ තරම් මහේසාක්‍යයි. මහානුභාව සම්පන්නයි.

''එසේම පින්වත් මහණෙනි, යම් කලෙක අරහත්වු, සම්මා සම්බුද්ධ වු, විජ්ජා චරණ සම්පන්න වු, සුගත වු, ලෝකවිදූ වු, පුරුෂයන් දමනය කරන අසහාය ශාස්තෘවරයාණන් වු, සියලු දෙවි මිනිසුන්ට ගුරුවරයාණන් වු, බුද්ධ වු, භගවා නම් වු, තථාගතයන් වහන්සේ ලෝකයේ උපදිති. උන්වහන්සේ මේ රූපයයි, මේ රූපයේ ඇතිවීමයි, මේ රූපයේ නැතිවීමයි. මේ වේදනාවයි, මේ වේදනාවේ ඇතිවීමයි, මේ වේදනාවේ නැතිවීමයි. මේ සඤ්ඤාවයි, මේ සඤ්ඤාවේ ඇතිවීමයි, මේ සඤ්ඤාවේ නැතිවීමයි. මේ සංස්කාරයි, මේ සංස්කාරයන්ගේ ඇතිවීමයි, මේ සංස්කාරයන්ගේ නැතිවීමයි. මේ විඤ්ඤාණයයි, මේ විඤ්ඤාණයේ ඇතිවීමයි, මේ විඤ්ඤාණයේ නැතිවීමයි. යනුවෙන් මෙසේ දහම් දෙසති.

''එවිට දීර්ඝා යුෂ්ක වු වර්ණ වන්ත වු සැප බහුල කොට උසස් ප්‍රාසාද වල බොහෝ කාලයක් ජීවත්වෙන දෙවිවරු ඇද්ද, ඒ දෙවිවරු තථාගතයාණන් වහන්සේගේ ධර්මය අසා මේ අනිත්‍ය වු දෙයම අපි නිත්‍යලෙස සිතාගෙන සිටියෙමු. අස්ථිර වු දෙයම අපි ස්ථිර ලෙස සිතාගෙන සිටියෙමු. සදාකාලික නොවන දෙයම අපි සදාකාලික යැයි සිතාගෙන සිටියෙමු.

ස්වකීය කය ඇතුළු අපිත් සියල්ලම අනිත්‍යයි, අස්ථිරයි, සදාකාලික නොවේ ය යැයි සිතා, බොහෝ සෙයින් භයට, සන්ත්‍රාසයට, සංවේගයට පත්වෙති. පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ දෙවියන් සහිත ලෝකයාට මෙසේ මහේසාක්‍ය වෙති, මහානුභාව සම්පන්න වෙති.'' [10] යැයි දේශනා කළහ.

2. ළමා කාලය (ජම්බු ගසක් යට පුංචි පුතෙක් ඇත)

අපේ බුදුහාමුදුරුවෝ තමන් වහන්සේගේ ගිහි කාලේ, පුංචිම කාලේ, ඉඳලා හොඳ සිහි නුවණින් සිටිය බව විවිධ සූත්‍රදේශනාවල සඳහන් වෙනවා. මෙලොවට උපත ලැබුවෙත් සිහිනුවණින් යුතුවමයි. මෙලොව ජීවත්වුණෙත් සිහි නුවණින් යුතුවමයි. එසේම වසර අසූවක් ගතවෙලා ජීවිතයේ අවසන් මොහොතේදීත් ඉතාමත්ම පැහැදිලිව තමන්වහන්සේ ම අධිෂ්ඨාන කළ ආකාරයට ඒ ඒ ධ්‍යාන වලට සමවදිමින් පරිනිර්වාණයට පත් වුයේත් ඉතාම හොඳ සිහිනුවණින් යුතුවමයි. මේ නිසා අපි ඉතාම හොඳින් තේරුම් ගත යුත්තේ අපේ බුදුහාමුදුරුවෝ සිහිනුවණින් යුතුව මෙලොවට ඉපදිලා, සිහිනුවණින් යුතුව ම මෙලොව ජීවත්වෙලා, සිහිනුවණින් යුතුවම පිරිනිවන් පෑ මේ ලෝකයේ, මේ මහපොළොව මත උපන් අතිශ්‍රේෂ්ඨතම උතුමාණෝ බවය.

සිහිනුවණ කියන්නේ ''සතිමත්බව'' සහ ''නුවණින් යුක්ත'' බව කියන එකයි. පාලි භාෂාවෙන් හෙවත් බුද්ධ භාෂාවෙන් මෙය හඳුන්වන්නේ ''සති සම්පජඤ්ඤය'' කියලයි. නිතරම මේ දෙකම ගමන් කරන්නේ එකටයි. සතිය ඇති විට සම්පජඤ්ඤයත්

සම්පජඤ්ඤය ඇතිවිට සතියත් තිබේ. සතිමත්බව සහ නුවණින් යුක්ත වෙනවිට සියල්ල ඇති සැටියෙන් හෙවත් යථාභූත ලෙසින් දැකිය හැකිවේ. මෙහිදී සතිමත් බව යන්නට යොදන පාලිවචනය ''සති'' යන්නයි. නුවණින් යුත් යන්නට යොදන පාලි වචනය ''සම්පජඤ්ඤ'' යන්නයි. මේ දෙක වඩන විට අපගේ ජීවිතය සෑම අතින්ම සැපවත් වෙයි. මෙලොව සැනසිල්ලටත් පරලොව සැනසිල්ලටත් අවසාන වශයෙන් නිර්වාණ ධර්මය අවබෝධ කරගැනීමටත් මේ දෙක අප සැමදෙනාටම ඉතාමත් ම අවශ්‍යයි. මේ දෙකම එකට ගමන් කළ යුතුය. ඒ අනුව එය අපේ බුදුහාමුදුරුවෝ සිය සූත්‍ර දේශනාවල දක්වා ඇත්තේ ''සතො ච සම්පජානො ච'' 'සතිය ද සම්පජඤ්ඤය ද' යනුවෙනි යම් කෙනෙක් භාවනාව කියලා වැඩිය. යුත්තේ මේ දෙකයි. අපේ බුදුහාමුදුරුවෝ උපන් මොහොතේ ඉදලා මේ ගුණ දෙකම තිබුණ බවයි සඳහන් වෙන්නේ. තමා ගැනත් ලෝකය ගැනත් අලුත් විදියකට දකින්නට හැකියාව ලැබුණේ සතියෙන් හෙවත් සිහියෙන් හිටිය නිසයි. පුංචි ම කාලේ ඉදලා මේ දෙකම ටික ටික වැඩුණා. ඒ පෙර අප්‍රමාණ ආත්මභාවවල මේ දෙකම පුරුදු කරලා, පුහුණු කරලා, නැවත නැවතත් වඩලා තිබුණ නිසයි.

මේ භවයේදී තමන්ට අවුරුදු පහක් හයක් පමණ කාලේ එක් දවසක් තමන් වහන්සේගේ පියාණන් වූ සුද්ධෝදන මහරජතුමා ඇතුළු පිරිස කුඹුරේ සීසාමින් සිටින අවස්ථාවේදී තමන් භාවනාවක යෙදුන බව අපේ බුදුහාමුදුරුවෝම මජ්ඣිමනිකායේ එන මහා සච්චක සූත්‍රයේත්, බෝධිරාජකුමාර සූත්‍රයේත්, සංගාරව සූත්‍රයේත් දේශනා කොට වදාළහ.[11]

එහෙත් එම සූත්‍ර දේශනාවල සඳහන් වෙන එම කරුණ පිළිබඳව දීර්ඝ විස්තරයක් නම් අපට හමුවන්නේ නැත. අපේ බුදුහාමුදුරුවෝ දුෂ්කර ක්‍රියා කරලා අනන්ත දුක් ගැහැට විඳලා අවසානයේදී හිතුවා ''මේ ලෝකේ අතීතයේ යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ යම් උපක්‍රමයක් කරලා කිසියම් දුක්ඛ වේදනාවක් වින්දා නම් ඒ වේදනාව මෙයට වඩා වේදනාවක් නොවේ. මේ තමයි උපරිම වේදනාව. අනාගතයේදී යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ යම් උපක්‍රමයක් කරලා කිසියම් දුක්ඛ වේදනාවක් විඳින්නේ නම් ඒ වේදනාව මෙයට වඩා වේදනාවක් නොවේ. මේ තමයි උපරිම වේදනාව. වර්තමානයේ යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ යම් උපක්‍රමයක් කරලා කිසියම් දුක්ඛ වේදනාවක් විඳියි නම් ඒ වේදනාව මෙයට වඩා වේදනාවක් නොවේ. මේ තමයි උපරිම වේදනාව. එහෙත් මට මේ දුෂ්කර ක්‍රියාවෙන් නම් මිනිස් බව ඉක්මවූ ආර්ය ඥාණ දර්ශන විශේෂයකට පත්විය නොහැකියි.'' කියලා. ඉන් අනතුරුව උන්වහන්සේ මෙසේ කල්පනා කළහ. ''මේ අවබෝධය සඳහා වෙනත් මාර්ගයක්වත් තියෙනවද?'' කියලා.

ඒ අවස්ථාවේ තමන්වහන්සේට මතක් වුයේ අර පුංචි දවස්වල ජම්බු ගසක් යට භාවනා කළ ආකාරයයි. එය සංගාරව සූත්‍රයේ සංගාරව භාරද්වාජ හට අපේ බුදුහාමුදුරුවෝ දේශනා කළහ. ඒ අනුව එදා තමන්වහන්සේ පියාණන් සිය කර්මාන්තයෙහි යෙදී සිටිද්දී ජම්බු ගසෙහි සිසිල් සෙවනෙහි වාඩිවී සිටි බවත් එහිදී කාමයෙන් වෙන්වූ අකුසල ධර්මයන්ගෙන් වෙන්වූ විතක්ක සහිත වූ විචාර සහිත වූ විවේකය නිසා හටගත් ප්‍රීතිය හා සැපයෙන් යුත් පළමුවෙනි ධ්‍යානයට සමවැද

වාසය කළ බව පැහැදිලිවම දැනගත් බව පැවසූහ. මෙහිදී උන්වහන්සේ නිර්වාණාවබෝධය සඳහා මෙය මාර්ගය යැයි සතානුසාරී විඤ්ඤාණයෙන් හෙවත් සිහිය අනුව යන විඤ්ඤාණයෙන් අවබෝධකර ගත්හ. ඒ අනුව ''මම කාමයෙන් වෙන්වෙන අකුසලයෙන් වෙන්වෙන යම් සැපයක් වේනම් ඒ සැපයට බිය වෙන්නේ ඇයි?'' යනුවෙන් සිතා ඒ සැපයට බිය නොවී වැහැරී ගිය කෘශ බවට පත්වී ගිය ශරීරයෙන් මෙය කළ නොහැකි බව දැනගෙන, තේරුම් ගෙන, බත් පිට්ටු ආදී ආහාර ගත යුතු යැයි සිතූහ. අනතුරුව එසේ ආහාර ගනිමින් මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කළ බව එහි සඳහන් වේ.

3. ගිහි ගෙදර වාසය
(සැපයෙන් අනූන වූ සිවුමැලි ජීවිතයක්)

අපේ බුදුහාමුදුරුවෝ සාර්ථක ගිහි ජීවිතයක් ගත කළ කෙනෙකි. සියලුම සැප සම්පත් වලින් කිසිම අඩුපාඩුවක් නැතිව කුමාර සැප විඳිමින් ගිහි ජීවිතය ගත කළහ. තමන් වහන්සේ ගිහි ජීවිතය ගත කළ ආකාරය පැහැදිලි කරමින් දිනක් භික්ෂූන් අමතා අපේ බුදුහාමුදුරුවෝ මෙසේ වදාළහ.

''පින්වත් මහණෙනි, මම කිසිදු දුකක් නැතිව සිවුමැලි ජීවිතයක් ගත කළෙමි. උතුම් වූ සිවුමැලි ජීවිතයක් ගත කළෙමි. අත්‍යන්තයෙන්ම සිවුමැලිවීමි. පින්වත් මහණෙනි, මගේ පියාගේ නිවසේ පොකුණු කරවා තිබුණි. එක් පොකුණක වනාහී නිල් මහනෙල් පිපෙයි. එක් පොකුණක රතු නෙළුම් පිපෙයි, එක් පොකුණක සුදු නෙළුම් පිපෙයි. ඒ සියල්ල හුදෙක් මා

සිත් අලවා ගැනීම සඳහාය. මම පාවිච්චි කළේ ඉතාම සියුම් සෙරෙප්පු වර්ගයි. මගේ හිස් වෙළුම ද ඉතාම සි'යුම් එකක් විය. උතුරු සළුව ද සියුම්ම විය. ශීතලෙන් හෝ රස්නෙන් හෝ දූවිල්ලෙන් හෝ පින්නෙන් හෝ මට අයහපතක් වේ යැයි සිතා රෑ දවල් දෙකේම මට සේසතක් දරුවේය.

''පින්වත් මහණෙනි, මට ප්‍රාසාද තුනක් තිබුණි. එකක් හේමන්ත කාලයටයි. එකක් ගිම්හාන කාලයටයි. අනෙක වර්ෂා කාලයටයි. මම වැසිකාලයට සුදුසු ප්‍රාසාදයෙහි කිසිම පිරිමියෙක් නැතිව ස්ත්‍රීන් විසින් පමණක් කරන පඤ්ච තූර්ය නාදයෙන් ඉදුරන් පිනවමින් සිටියෙමි. පහළ ප්‍රාසාදයට නොබැස්සෙමි. අන් අයගේ නිවෙස් වල දැසි දස් කම්කරුවන්ට දුන්නේ කාඩි හොදියි නිවුඩු හාලේ බතුයි. එහෙත් මගේ පියාගේ නිවසෙහි දැසි දස් කම්කරුවන්ට දුන්නේ මස් සහිත ඇල්හාලේ බත්ය.

''මෙබඳු මහානුභාවයකින්, සෘද්ධිමත්බවකින් සියුමැලිව ජීවත් වූ මට මෙසේ සිතුනි.'' කරුණු නොදත් සාමාන්‍ය කෙනෙක් (පෘථග්ජන කෙනෙක්) තමන්ම දිරන කෙනෙක්ව ඉදගෙන, දිරීම නොඉක්මවූ කෙනෙක්ව ඉදගෙන, තවත් එවැනිම දිරීමට පත්වෙන, දිරීම නොඉක්මවූ කෙනෙක් දැක, බියට පත්වෙයි, ලැජ්ජාවට පත්වෙයි, පිළිකුලට පත්වෙයි. මම ද දිරීම ස්වභාව කොට, දිරීම නොඉක්මවමින්ම සිට, දිරීමට පත් කෙනෙක්, දිරීම නොඉක්මවූ කෙනෙක් දැක, බිය වෙන්නේ නම්, ලැජ්ජාවට පත්වෙන්නේ නම්, පිළිකුල් සහගත වෙන්නේ නම්, එය මට සුදුසු නොවේ.'' යනුවෙනි. පින්වත් මහණෙනි, මෙසේ නුවණින් සලකා

බලන කල්හි මගේ තරුණකම නිසා තිබුණ තරුණ මදයක් වී නම් එය සම්පූර්ණයෙන්ම ප්‍රහාණය විය.

''කරුණු නොදත් සාමාන්‍ය කෙනෙක් තමන්ම ව්‍යාධියට පත්වෙන කෙනෙක්ව ඉදගෙන,ව්‍යාධිය නොඉක්මවු කෙනෙක්ව ඉදගෙන, තවත් එවැනිම ව්‍යාධියට පත්වෙන ව්‍යාධිය නොඉක්මවු කෙනෙක් දැක, බියට පත්වෙයි, ලැජ්ජාවට පත්වෙයි, පිළිකුලට පත්වෙයි. මම ද ව්‍යාධිය ස්වභාව කොට, ව්‍යාධිය නොඉක්මවමින්ම සිට ව්‍යාධියට පත් කෙනෙක් ව්‍යාධිය නොඉක්මවු කෙනෙක් දැක බිය වෙන්නේ නම්, ලැජ්ජාවට පත් වෙන්නේ නම්, පිළිකුල් සහගත වෙන්නේ නම්, එය මට සුදුසු නොවේ. යනුවෙනි. '' පින්වත් මහණෙනි, මෙසේ නුවණින් සලකා බලන කල්හී මගේ ආරෝග්‍යය නිසා තිබුණ කිසියම් ආරෝග්‍ය මදයක් වී නම් එය සම්පූර්ණයෙන්ම ප්‍රහාණය විය.

''කරුණු නොදත් සාමාන්‍ය කෙනෙක් තමන්ම මරණයට පත්වෙන කෙනෙක්ව ඉදගෙන, මරණය නොඉක්මවු කෙනෙක්ව ඉදගෙන, තවත් එවැනිම මරණයට පත්වෙන, මරණය නොඉක්මවු කෙනෙක් දැක, බියට පත්වෙයි, ලැජ්ජාවට පත්වෙයි, පිළිකුලට පත්වෙයි. මම ද මරණය ස්වභාව කොට මරණය නොඉක්මවමින්ම සිට මරණයට පත් කෙනෙක්, මරණය නොඉක්මවු කෙනෙක් දැක, බිය වෙන්නේ නම්, ලැජ්ජාවට පත්වෙන්නේ නම් පිළිකුල් සහගත වෙන්නේ නම් එය මට සුදුසු නොවේ. යනුවෙනි. ''පින්වත් මහණෙනි, මෙසේ නුවණින් සලකා බලන කල්හී මගේ ජීවිතය නිමිති කරගෙන යම් ජීවිත මදයක් වී නම් එය සම්පුර්ණයෙන්ම ප්‍රහාණය විය.

''පින්වත් මහණෙනි, මේ මද තුනකි. එනම් යෞවනමදය, ආරෝග්‍ය මදය, සහ ජීවිත මදයයි. අශ්‍රුතවත් වු පෘතග්ජනයා යෞවන මදයෙන් මත්ව කයින් දුෂ්චරිතයෙහි හැසිරෙයි. වචනයෙන් දුෂ්චරිතයෙහි හැසිරෙයි. මනසින් දුෂ්චරිතයෙහි හැසිරෙයි. මෙසේ කයින් වචනයෙන් හා සිතින් දුෂ්චරිතයෙහි හැසිරී මරණින් පසු අපායෙහි උපදියි. ආරෝග්‍ය මදයෙන් මත්වීම නිසාත් එසේමය. ජීවිත මදයෙන් මත්වීම නිසාත් එසේමය. භික්ෂුව ද යෞවන මදයෙන් මත්ව ශික්ෂාව හැරදමා ගිහි බවට පත්වෙයි. ආරෝග්‍ය මදයෙන් මත්ව ද ශික්ෂාව හැරදමා ගිහි බවට පත්වෙයි. ජීවිත මදයෙන් මත්ව ද ශික්ෂාව හැරදමා ගිහි බවට පත්වෙයි.'' යනුවෙන් අපේ බුදුහාමුදුරුවෝ අප හැමටම මෙසේ ඉතාමත්ම අගනා, වටිනා, දේශනාවක් ගෙන හැර දක්වා වදාළහ.[12]

4. සතර පෙර නිමිති දැකීම
(අඳුරෙන් එළියට)

දිනක් අපේ බුදුහාමුදුරුවෝ ජේතවනාරාමයේදී දම්සභා මණ්ඩපයට රැස්ව පෙර භවයන් ගැන කතා කරමින් සිටි භික්ෂූන් වහන්සේලා වෙත වැඩමවා ''පින්වත් මහණෙනි, දැන් මා එන්න ප්‍රථමයෙන් මොකක් ගැන ද කතා කර කර හිටියේ'' කියා ඇසුහ. ඒ අවස්ථාවේදී භික්ෂූන් වහන්සේලා ''ස්වාමීනි, අපි පෙර භවයන් ගැන කතා කර කර සිටියෙමු'' යැයි කීහ. එවිට බුදුපියාණෝ පූර්ව භව පිළිබඳව කතාවක් දැනගන්නට කැමති දැයි විචාරා කැමති බව ප්‍රකාශ කළ කල්හී මෙයට කල්ප අනූ එකකට පෙර ලොව පහළ වු විපස්සී සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ පටන් අපේ

බුදුහාමුදුරුවෝ දක්වා වු සියලු බුදුවරයාණන් වහන්සේලා හය නමක් ගැනත් එනම්, විපස්සී, සිඛී, වෙස්සභූ, කකුසඳ, කෝණාගමන, කාශ්‍යප යන බුදුවරයාණන් වහන්සේලා ගැනත් තමන්වහන්සේ ගැනත් සම්පූර්ණ විස්තරයක් කරමින් මහාපදාන[13] නමින් විශේෂ සූත්‍ර දේශනයක් දේශනා කළහ.

එම සූත්‍ර දේශනයට අනුව මෙයට කල්ප අනූ එකකට පෙර විපස්සී බුදුරජාණෝ මෙලොව පහළ වූහ. මෙයට කල්ප තිස් එකකට පෙර සිඛී බුදුරජාණෝ ලොව පහළ වූහ. ඒ තිස් එක් වැනි කල්පයේම වෙස්සභූ බුදුරජාණෝ ලොව පහළ වූහ. මේ භද්‍ර කල්පයේ කකුසඳ, කෝණාගමන, කාශ්‍යප හා ගෞතම යන බුදුරජාණන් වහන්සේලා ලොව පහළ වූහ.

මෙම මහාපදාන සූත්‍ර දේශනයට අනුව මේ සියලු බුදුවරයාණන් වහන්සේලාගේ චරිත කතා බොහෝ සෙයින්ම සමානය. ඒ අනුව විපස්සී බෝධිසත්වයන් වහන්සේ සතර පෙර නිමිති දැක්කේ යම් ආකාරයකින් ද සෙසු බෝධිසත්වයන් වහන්සේලා ද ඒ ආකාරයෙන්ම සිය උද්‍යාන චාරිකාවේ දී සතර පෙර නිමිති දුටු බව පැහැදිලි කරයි. සතර පෙරනිමිති යනු මහල්ලෙක්, ලෙඩෙක්, මළ කඳක්, සහ ශ්‍රමණයෙක් යන හතරය. මේ සතර පෙර නිමිති යනු මොනවාද ඒවා දැක්කේ කොයි ආකාරයෙන් ද යන්න අපේ බෝහෝ පුංචි දරුවන් පවා දන්නා ඉතා ජනප්‍රිය මාතෘකාවක් නිසා අප මෙහිදී ඒවා පිළිබඳව විස්තර කිරීමට කාලය හා අවකාශය මිඩංගු කිරීමට අවශ්‍ය නැතැයි සිතමු. ඔබට අවශ්‍ය නම් දීඝ නිකායේ මහා පදාන සූත්‍රයෙන් ඉතා හොඳින් මෙම කරුණු කියවා දැනගත හැකිය.

5. ගිහිගෙය හැර දමා පැවිදිවීම
(ගිහිගෙය සම්බාධ සහිතයි. පැවිද්ද අවකාශය වගෙයි)

සම්මා සම්බුද්ධත්වය යනු ආයර්‍ය පර්යේෂණයක අග්‍ර ඵලයයි. අපේ බුදුහාමුදුරුවෝ භික්‍ෂූන් වහන්සේලා අමතා අරිය පරියේසන නමින් විශේෂ සූත්‍රදේශනයක් දේශනා කළා. එම සූත්‍රදේශනයට අනුව ආර්ය පරියේසනය හා අනාර්ය පරියේසනය නමින් පරියේසන දෙකක් ඇත.

ඒ අනුව යම් කෙනෙක් තමන් ඉපදෙන ස්වභාවයෙන් යුත් කෙනෙක්ව ඉඳිමින්, ඉපදීම ගැනම සොයනවා නම්, ජරාවට පත්වන ස්වභාවයෙන් යුත් කෙනෙක්ව ඉඳිමින්, ජරාවට පත්වීම ගැනම සොයනවා නම්, ව්‍යාධියට පත්වෙන ස්වභාවයෙන් යුත් කෙනෙක් ව ඉඳිමින්, ව්‍යාධිය ගැනම සොයනවා නම්, මරණයට පත්වෙන ස්වභාවයෙන් යුත් කෙනෙක්ව ඉඳමින්, මරණය ගැනම සොයනවා නම්, සෝක කරන ස්වභාවයෙන් යුත් කෙනෙක්ව ඉඳිමින්, සෝකය ඇතිවෙන දේම සොයනවා නම්, කෙලෙසෙන ස්වභාවයෙන් යුත් කෙනෙක්ව ඉඳිමින්, කෙලෙසෙන දේ ගැනම සොයනවා නම් එය අනාර්ය පරියේසනයකි. මෙහිදී මේ ඉපදෙන ස්වභාවය ජරාවට පත්වෙන ස්වභාවය කියන්නේ මොකක්දැයි හරියට පැහැදිලි නැත. එය අපේ බුදුහාමුදුරුවෝ අපට පැහැදිලි කරදෙන ආකාරයෙන්ම අසමු, දරාගනිමු. පැහැදිලි කරගනිමු.

අපේ බුදුහාමුදුරුවෝ මෙසේ දේශනා කරති. ''අඹු දරුවෝ ජාති ධර්මයි, ජරා ධර්මයි, ව්‍යාධි ධර්මයි, මරණ ධර්මයි, සෝක ධර්මයි, කෙලෙසෙන ධර්මයි. දැසි දස්

ආදීන් ජාති ධර්මයි, ජරා ධර්මයි, ව්‍යාධි ධර්මයි, මරණ ධර්මයි, සෝක ධර්මයි, කෙලෙසෙන ධර්මයි. එළු බැටළුවෝ ජාති ධර්මයි, ජරා ධර්මයි, ව්‍යාධි ධර්මයි, මරණ ධර්මයි, සෝක ධර්මයි, කෙලෙසෙන ධර්මයි. කුකුල්ලු, ඌරෝ, ජාති ධර්මයි, ජරා ධර්මයි, ව්‍යාධි ධර්මයි, මරණ ධර්මයි, සෝක ධර්මයි, කෙලෙසෙන ධර්මයි. ඇත්, ගව, අස්, වෙළඹුහු, ජාති ධර්මයි, ජරා ධර්මයි, ව්‍යාධි ධර්මයි, මරණ ධර්මයි, සෝක ධර්මයි, කෙලෙසෙන ධර්මයි. රන්, රිදී, ජාති ධර්මයි, ජරා ධර්මයි, ව්‍යාධි ධර්මයි, මරණ ධර්මයි, සෝක ධර්මයි, කෙලෙසෙන ධර්මයි.'' යනුවෙනි.

එසේ දේශනා කොට, මීළගට අපේ බුදුහාමුදුරුවෝ ආර්‍ය පර්යේෂණය හෙවත් අරිය පරිසේසනය යනු කුමක්දැයි දේශනා කළහ. තමන් ඉපදෙන කෙනෙක්ව, ඉපදෙන ස්වභාවයේ ආදීනව දැනගෙන, ඉපදීමක් නැති, අනුත්තර වූ කාමාදී බැම්වලින් නිදහස් වෙන්නාවූ, නිර්වාණය සොයන්නේ නම්, තමන් ජරාවට පත්වෙන කෙනෙක්ව, ජරාවට පත්වෙන ස්වභාවයේ ආදීනව දැනගෙන, ජරාවක් නැති අනුත්තර වූ කාමාදී බැම්වලින් නිදහස් වෙන්නාවූ නිර්වාණය සොයන්නේ නම්, තමන් ව්‍යාධියට පත්වෙන කෙනෙක්ව, ව්‍යාධියට පත්වෙන ස්වභාවයේ ආදීනව දැනගෙන ව්‍යාධියක් නැති අනුත්තර වූ කාමාදී බැම්වලින් නිදහස් වෙන්නාවූ නිර්වාණය සොයන්නේ නම්, තමන් මරණයට පත්වෙන කෙනෙක්ව, මරණ ස්වභාවයේ ආදීනව දැනගෙන මරණයක් නැති අනුත්තර වූ කාමාදී බැම්වලින් නිදහස් වෙන්නාවූ නිර්වාණය සොයන්නේ නම්, තමන් සෝක කරන කෙනෙක්ව, සෝක කරන ස්වභාවයේ ආදීනව

දැනගෙන, සෝකයක් නැති අනුත්තර වූ කාමාදී බැම්වලින් නිදහස් වෙන්නාවූ නිර්වාණය සොයන්නේ නම්, තමන් කෙලෙසෙන කෙනෙක්ව,කෙලෙසෙන ස්වභාවයේ ආදීනව දැනගෙන, කෙලෙසීමක් නැති අනුත්තර වූ කාමාදී බැම්වලින් නිදහස් වෙන්නාවූ නිර්වාණය සොයන්නේ නම්, එය අරිය පරියේසනයයි.'' යනුවෙන් දේශනා කළහ.

මෙසේ මෙම පරියේසන දෙක පැහැදිලි කළ බුදුපියාණෝ, සම්‍යක් සම්බෝධියට නොපැමිණි බෝධිසත්වයෙක් ව සිටි තමන් වහන්සේට මේ කරුණ වැටහීම නිසා ජාතියක් නැති, ජරාවක් නැති, මරණයක් නැති, සෝකයක් නැති, කෙලෙසීමක් නැති, අනුත්තර වූ කාමාදී බැම්වලින් නිදහස් වෙන්නාවූ නිර්වාණය සොයන්නේ නම් මැනවැයි සිතූහ. ඒ අනුව තමන් වහන්සේ අභිනිෂ්ක්‍රමණය කොට හෙවත් ගිහි ගෙය හැර දමා කිංකුසල ගවේශීව එනම් කුසලය යනු කුමක්දැයි සොයමින් ආළාර කාලාමයන් වෙත පැමිණුන බව සඳහන් කරයි. ඒ මෙසේය.

''පින්වත් මහණෙනි, ඒ මම පසුකාලීනව දහර වියේදීම ඉතා කළුවට තිබූ කෙස් ඇතිව, සොඳුරු භද්‍ර යෞවනයේදීම, දෙමව්පියන් අකැමැත්තෙන් කඳුළු පිරි මුහුණින් යුතුව හඬා වැළපෙද්දී, කෙස් රැවුළු කපා කහවත් ඇඳගෙන, ගිහිගෙයින් නික්ම අනගාරික වූ පැවිද්දට පත්වීමි. එසේ පැවිදි වූ මම කුසලය යනු කුමක්දැයි සොමින් අනුත්තර වූ ශාන්තපදය හෙවත් නිවන සොයමින් ආළාර කාලාම කරා පැමිණියෙමි. පැමිණ ආළාර කාලාමයන්හට මෙසේ කීමි. ''පින්වත් කාලාමයෙනි, මම මේ ධර්මවිනයෙහි බඹසර හැසිරීමට කැමතියි.''[14] යනුවෙනි.

මේ අපේ බුදුහාමුදුරුවෝ තමන්ගේ තුරුණු වියේදීම ගිහිගෙය අත්හැර ගිය ආකාරය උන්වහන්සේ විසින්ම අපට කියාදෙන ආකාරයයි. අපේ බුදුහාමුදුරුවෝ මේ ගිහිගෙය හැර ගිය ආකාරය විවාදාපන්නව තමන් වෙතට ආ සච්චක නම් තැනැත්තාට ද පැහැදිලි කර ඇත. එය මජ්ඣිම නිකායේ සච්චක සූත්‍රයේ මෙසේ සඳහන් වේ.

''අග්නිවෙස්න, පෙර සම්බෝධියට නොපත් බෝධිසත්වයෙක්ව සිටි මට මෙසේ සිතුණි. 'ගිහිගෙයි ජීවත්වීම කරදර සහිතයි. එය දූවිලි සහිත මාර්ගයකි. පැවිද්ද අභ්‍යවකාශය වගෙයි. මේ ගිහිගෙයි ජීවත්වෙමින් නම් ඉතාමත්ම පිරිසිදුව බ්‍රහ්මචරියාව සම්පූර්ණ කරනවා කියන එක නම් ලේසි වැඩක් නොවෙයි. ඒ නිසා මම කෙස් රැවුළු කපා කසාවත් හැදගෙන ගිහිගෙයින් නික්ම අනගාරික බවට පත්ව පැවිදිවෙන්නේ නම් යහපති' යනුවෙනි. ඒ අනුව අග්නිවෙස්න මම පසු කලෙක දහරව සිටිද්දීම කළුවන් කෙස් ඇත්තේ හද්‍ර යොවුන් වියේදී ජීවිතයේ මුල් වයසේ අකැමැත්තෙන් දෙමව්පියන් කඳුළු පිරි මුහුණින් යුතුව හඬද්දී කෙස් රැවුළු කපා කසාවත් හැඳගෙන ගිහිගෙයින් නික්ම අනගාරිකව පැවිදි වුයෙමි.''[15] යනුවෙනි.

මේ අනුව අපේ බුදුහාමුදුරුවෝ ගිහිගෙයින් නික්ම පැවිද්ද ලබාගත්තේ කුමන ආකාරයෙන් ද යන්න මුල් සූත්‍ර දේශනා ඇසුරින් මෙසේ අපට වටහා ගත හැකිය. මේ අපේ බුදුහාමුදුරුවෝම අපට කියා දෙන ආකාරයයි.

මෙසේ ගිහි ගෙයින් නික්ම පැවිද්ද ලබාගත්

උන්වහන්සේ මගධ දේශයේ පාණ්ඩව පර්වතය ඇසුරු කරමින් වැඩසිටි බව මුල් සූත්‍රදේශනා වලින්ම අපට පැහැදිලි කරගත හැකිය. එහිදී මුල් දවස්වල පිණ්ඩපාතයේ වැඩිය ආකාරය සහ උන්වහන්සේගේ ස්වභාවය දුටු බිම්බිසාර මහරජතුමාගේ ආයාචනය ඇතුළත්ව ඇති සුත්ත නිපාතයේ පබ්බජ්ජා සූත්‍රයෙන් අපි දැන් ඒ කරුණු අනාවරණය කරගනිමු.

එම සූත්‍රදේශනයට අනුව ගිහිගෙයි වාසය කුසල් වැඩීමට සම්බාධකයක් ලෙසත් පැවිද්ද වූ කලී අවකාශය මෙන් නිදහස් බවත් තේරුම් ගනිමින් සිදුහත් බෝසතාණෝ පැවිදි විය. ඒ අනුව පැවිද්ද ලබා ගත් මේ අපේ සිදුහත් බෝසත් උතුමාණෝ මුලින්ම කයින් කරන වැරදි තුනෙන් දුරුවූහ. වචනයෙන් කරන වැරදි හතරින් දුරුවූහ. ආජීව පාරිශුද්ධිය ඇතිකර ගත්හ. පැවිදි වීමෙන් අනතුරුව පිඬුසිඟා වැඩියේ මගධ දේශයේ රජගහ නුවරටය. උන්වහන්සේ එහි පිඬු පිණිස හැසිරෙන ශාන්ත විලාශය බිම්බිසාර මහරජ තුමා සිය ප්‍රාසාදයෙහි සිටිමින් බලා සිටියේය. මේ අසිරිමත් තවුසාණෝ දුටු රජතුමා සෙසු අයට, ''මේ පුද්ගලයා දෙස බලන්න, දැකුම් කලු අඟ පසඟ ඇති, අභිරූප සම්පන්න වූ, ආරෝහ පරිණාහ සම්පන්න වූ, පිවිතුරු සමෙන් යුත් කෙනෙකි. යටට හෙලූ ඇස් ඇතිව සිහිනුවණින් ගමන් කරන මේ තෙමේ නීච කුලයකින් පැවිදි වුවෙක් නම් නොවේ'' යැයි කියා කොහි යන්නේ දැයි විමසීම සඳහා රාජ දූතයන් යැවීය. රාජදූතයෝ හෙතෙම කොහි යන්නේ දැයි විමසමින් පිටු පසින් ගියහ. ඉන්ද්‍රිය සංවරයෙන් සුසංවරව ගෙපිළිවෙලින් සැරිසරමින් මනා නුවණින් යුතුව හා එළඹ සිටි සිහියෙන් යුතුව මෙසේ ගමන් කරන අප මහ බෝසත් තාපස උතුමාණන්ගේ පාත්‍රය පිරුණි.

පිඬු සිඟා අවසන, ඒ මුනිතුමා නුවරින් නික්ම තම වාසය වූ පාණ්ඩව පර්වතයට ගියේය. එය දැක රාජ දූතයෝ එහි ගියහ. එක් රාජ දූතයෙක් රජුවෙත පැමිණ ''රජතුමනි, එතුමා පාණ්ඩව පර්වතයෙහි පෙරදිග ගුහාවෙක ව්‍යාඝයෙකු, වෘෂභරාජයෙකු, හෝ සිංහ රාජයෙකු මෙන් වාසය කරති.'' යැයි කීය. ඒ ඇසූ රජතුමා පාණ්ඩව පර්වතයට ගියේය. ගොස් එහි වාඩි වී තාපසතුමා සමග සුහදව කථා කළහ.

බිම්බිසාර මහරජතුමා මෙසේ කීහ. ''ඔබ නව යොවුන් වියේ පසුවෙන තරුණයෙකි. ලදරු පෙනුම ඇත්තෙකි. වර්ණයෙන් හා ආරෝහ සම්පත්තියෙන් ක්ෂත්‍රිය ජාතිකයෙක් වගෙයි පේන්නේ. කැමති තාක් ඔබට අවශ්‍ය භෝග සම්පත් දෙමි. බලකායට නායකත්වය දෙමින් ඇත් සමුහයා පෙරටු කරගෙන භෝග සම්පත් වළඳන්න. ඔබේ ජාතිය මොකක්ද? කියන්න.''

එවිට අප මහා බෝසත් තාපසයාණෝ, ''මහරජ, හිමවත් ප්‍රදේශයේ ධනයෙන් හා වීර්‍ය්‍යයෙන් පරිපූර්ණ වූ කොසල නම් ජනපදයෙහි පෙර සිට පැවතෙන මහරජුන්ගේ ජනපදයක් වෙයි. ඔවුහු ගෝත්‍රයෙන් ආදිත්‍යය වන අතර ජාතියෙන් ශාක්‍ය නම් වෙති. මම ඒ කුලයෙන් පැවිදි වුයෙමි. කාමයන් පතන්නෙක් නොවෙමි. කාමයෙහි ආදීනව දැක ඒවායින් නික්මීම ක්ෂේම භූමිය බව දැක භාවනා කරමින් වීර්‍ය්‍යය වැඩීම සඳහා යන්නෙමි. මෙහි මේ භාවනාවට වීර්‍ය්‍යය කිරීමටම තමයි මගේ මනස ඇලෙන්නේ''[16] යැයි කීහ.

සත්‍යය සොයා

1. ධ්‍යානලාභී ගුරුවරු අතර
(තොල්දෙක සෙලවුන පමණින් ම දැනගතිමි)

ඉහත දී ද අප විසින් සඳහන් කර ඇති පරිදි අපේ බුදුහාමුදුරුවෝ සොඳුරු භද්‍ර යෞවනයේදී සිය දෙමව්පියන් අකැමැත්තෙන් හඬා වැළපෙද්දී කෙස් හා රැවුළු කපා කසාවත් හැඳගෙන පැවිදිවීමෙන් අනතුරුව කිංකුසල ගවේශීව හෙවත් කුසලය යනු කුමක්දැයි සොයමින් ගියහ. බෝසතාණෝ මුලින්ම කිසියම් ගුරුවරයෙක් වෙතට ගියේ ආළාර කාලාමයන් වෙතටය. ආළාර කාලාම යනු එකල දඹදිව සුප්‍රසිද්ධව සිටි රූපාවචර ධ්‍යාන හතර ලබා අනතුරුව පිළිවෙලින් ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, අකිඤ්චඤ්ඤායතනය යන අරූපාවචර සමාපත්ති තුන ද ලබා ගෙන මහත් සිසු පිරිසක් ද පිරිවර කරගෙන සිටි සුවිශේෂ ගුරුවරයෙක් විය.

මෙම ගුරුවරයා සමීපයේ දී අපේ සිදුහත් මහ බෝසතාණෝ ලබාගත් අත්දැකීම කුමක්දැයි දැන් අපි සොයා බලමු. ආළාර කාලාමයන් ළගට පැමිණ තමන් ආළාර කාලාමයන්ගේ ධර්ම විනයෙහි හෙවත් ශාසනයෙහි බඹසර හැසිරීමට කැමති බව ප්‍රකාශ කළේය. ඒ අනුව ආළාර කාලාම එයට කැමැත්ත පළ කරමින් සිය ඉගැන්වීම කියාදෙමින් මෙසේ කීවේය. ''ආ... ඔබ වගේ නුවණැති කෙනෙකුට නම් ඉතාමත්ම ඉක්මණින්, නොබෝ කලකින්ම, මේ ධර්මය ප්‍රත්‍යක්ෂ කරගත හැකියි.'' යනුවෙනි.

අපේ බුදුහාමුදුරුවෝ පසුකලෙක දහම් දේශනා කරද්දී භික්ෂූන්ට ආමන්ත්‍රණය කරමින් තමන් වහන්සේගේ එදා තිබුණ ඒ යමක් වටහා ගැනීමේ ශක්තිය මෙසේ දේශනා කළහ.'' පින්වත් මහණෙනි, මට ඔහු මේ කරුණු කීම සඳහා තොල් මතුළ පමණින්ම, වචනයක් කිවු පමණින්ම, මම එය දැනගතිමි, එහි ස්ථිරත්වයට ද පැමිණියෙමි. මම දැන ගතිමි, දැක ගතිමි, යැයි ප්‍රකාශ කළෙමි. මේ ආළාර කාලාම මට මෙහෙම කියන්නේ හුදු ශ්‍රද්ධා මාත්‍රයෙන් පමණක් නොවෙයි. ඇත්තෙන්ම මොහු මේ ධර්මය දැනගෙන දැකගෙන වාසය කරන කෙනෙක් කියා මට දැනුණි.'' අනතුරුව තමන් වහන්සේ ආළාර කාලාමයන්ගෙන් මේ ධර්මය කොපමණකින් පරිපුර්ණ වේද, සම්පුර්ණ වේදැයි විමසු විට හෙතෙම එය ආකිඤ්චඤ්ඤායතනය දක්වා යැයි කීවේය.

ඒ අවස්ථාවේ බෝසතාණෝ ''ආළාර කාලාමට පමණක් නොවෙයි ශ්‍රද්ධාව තියෙන්නේ මටත් ශ්‍රද්ධාව තියෙනවා. ආළාර කාලාමට පමණක් නොවෙයි වීරිය තියෙන්නේ මටත් වීරිය තියෙනවා. ආළාර කාලාමට පමණක් නොවෙයි සතිය තියෙන්නේ මටත් සතිය තියෙනවා. ආළාර කාලාමට පමණක් නොවෙයි සමාධිය තියෙන්නේ මටත් සමාධිය තියෙනවා. ආළාර කාලාමට පමණක් නොවෙයි ප්‍රඥාව තියෙන්නේ මටත් ප්‍රඥාව තියෙනවා'' යනුවෙන් සිතා යම්සේ ආළාර කාලාම මේ ධර්මයට පැමිණ වාසය කරමි යැයි කියන්නේ ද මම ඒ ධර්මයට පැමිණීමට උත්සාහ කළ යුතු යැයි සිතූහ. ඒ අනුව නොබෝ කලෙකින්ම, ඉතාම ඉක්මණින්ම, සිදුහත් බෝසතාණෝ ඒ ධර්මයෙහි පරිපුර්ණත්වයට පත්වූහ.

මෙසේ ආළාර කාලාමයන්ගේ ධර්මය වහ වහා අවබෝධ කරගත් සිදුහත් බෝසතාණෝ ආළාර කාලාම වෙත ගොස් ඒ බව කීහ. ඒ අවස්ථාවේ ආළාර කාලාම ඉතාමත්ම සතුටට පත්ව ''එසේනම් දැන් මා දන්නේ යමක් ද එය ඔබ ද දනියි. ඔබ දන්නේ යමක් ද මම ද එය දනිමි. ඒ නිසා දැන් අපි මේ පිරිසත් බලාගෙන ඉඳිමු.'' යැයි යෝජනා කරමින් විවිධ පූජාවන් ද කළේය. එහෙත් එය අපගේ සිදුහත් බෝසතාණන් වහන්සේගේ අභිප්‍රාය නොවුන බැවින් එතුමාණෝ මේ ධර්මය නිබ්බිදාව පිණිස, විරාගය පිණිස, නිරෝධය පිණිස, කෙළෙසුන් ගෙන් දුරුවී සැනසුම ලැබීම පිණිස, මැනවින් දැනගැනීම පිණිස, සම්බෝධිය පිණිස හා නිර්වාණය පිණිස ද, හේතු නොවන්නේය. මෙය ආකිඤ්චඤ්ඤායතනය දක්වා පමණක් වන්නේය යැයි දැන, දැක, ඒ ධර්මයෙහි තෘප්තිමත් නොවී, එහි කළ කිරී, එතැනික් නික්ම ගියේය.

මෙසේ ආළාර කාලාමයන් සමීපයේ වාසය කරමින් භාවනා කරමින් ආකිඤ්චඤ්ඤායතනය දක්වා සිත පුහුණු කළ අප මහා බෝසතාණෝ එතැනින් ඉවත්ව ඊළගට පැමිණියේ උද්දක රාම පුත්තයන් වෙතටය. මොහු ද එදා දඹදිව සුප්‍රසිද්ධව සිටි තවත් ආචාර්යවරයෙකි. හෙතෙම ආළාර කාලාමටත් වඩා තවත් පියවරක් ඉදිරියට ගොස් සිටි කෙනෙකි. එනම් අෂ්ට සමාපත්තිවලින් අටවැනි සමාපත්තිය වන නේවසඤ්ඤානාසඤ්ඤායතනය දක්වා හිත දියුණු කරමින් ඒ අත්දැකීම් ලබා සිටි කෙනෙකි. අප මහා බෝසතාණෝ එහි පැමිණ තමන් ඒ ධර්ම විනයෙහි හෙවත් ශාසනයෙහි බඹසර හැසිරීමට කැමති බව දැන්වූ විට ''ඔබ වැනි කෙනෙකුට නම් මෙය ඉතා ඉක්මණින්ම

අවබෝධ කළ හැකියි'' යනුවෙන් කියා සතුටින් පිළිගත්තේය.

මෙහිදී ද පෙර සේම කරුණු කියා දෙද්දී තොල් මතුළ පමණින්ම වචනයක් පිටකළ පමණින්ම කරුණු තේරුම් ගෙන අප මහා බෝසතාණන් වහන්සේ භාවනාවෙහි නිරතවිය. පෙරසේම ''උද්දක රාම පුත්තයන්ට පමණක් නොවේ ශ්‍රද්ධාව, විරිය, සතිය, සමාධිය, ප්‍රඥාව තියෙන්නේ මටත් තිබේ'' යැයි යන හැඟීමෙන් පඤ්ච ඉන්ද්‍රිය ධර්ම හා පඤ්ච බල ධර්ම වැඩෙන සේ සිය භාවනාව කරගෙන ගියේය. ඒ අනුව නොබෝ දිනකින්ම, ඉතාම ඉක්මණින්ම, නේවසඤ්ඤා නාසඤ්ඤායතනයට පැමිණ උද්දක රාම පුත්තයන්ට ඒ බව කීහ. ඒ අවස්ථාවේ දී උද්දක රාම පුත්තයෝ ආළාර කාලාම මෙන්ම අප මහා බෝසතාණෝ ආචාර්ය තනතුරේ තබමින් ''අපි දෙදෙනාම දැන් එකම මට්ටමේ සිටින අයයි එබැවින් මේ පිරිසත් බලාගෙන ඉඳිමු'' යැයි යෝජනා කළේය. එහෙත් තමන් වහන්සේගේ අභිප්‍රායය හෙවත් බලාපොරොත්තුව එය නොවන බැවින් ඒ ධර්මයෙහි ද අතෘප්තිමත්ව කළකිරීමෙන් යුතුව එතැනින් ද ඉවත්ව ගියේය.

මෙසේ පැවිද්දෙන් අනතුරුව සන්තිවර පදය වූ නිර්වාණ ධර්මය සොයමින් යන අතර දී මෙම ගුරුවරු දෙදෙනා ළගට පැමිණ නේවසඤ්ඤානාසඤ්ඤා යතනය දක්වා භාවනා කරමින් සිත දියුණු කළ බව බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරනලද මුල් සූත්‍රදේශනා කීපයකම අපට දක්නට ලැබේ. එනම් මජ්ඣිම නිකායේ අරියපරියේසන සූත්‍රය, මහා සච්චක සූත්‍රය, බෝධිරාජකුමාර සූත්‍රය හා සංගාරව සූත්‍රය වැනි සූත්‍ර දේශනාවලය.

2. මහ වන මැද දුෂ්කර ක්‍රියා සමය (අසහාය වීරවන්තයාණෝ)

මජ්ඣිම නිකායේ සංගාරව සූත්‍ර දේශනයට අනුව අපේ බුදුහාමුදුරුවෝ සම්මාසම්බුද්ධත්වයට පෙර බෝධිසත්වයන් වහන්සේව සිටියදී මෙසේ ආළාර කාලාම හා උද්දක රාමපුත්ත යන ගුරුවරුන්ගේ ධර්මයන්හි තමන් විසින් සොයමින් සිටින හරය හෙවත් උතුම් වූ ශාන්තිය, නිවණ, නැති බව තේරුම් ගෙන, ඒ අයගෙන් ඉවත්ව යද්දී පෙර කිසිම දිනක තමන් වහන්සේට ඇසීමට නොලැබුණ නැවත නැවතත් ආශ්චර්යයම උපදවන සුළු වූ උපමා තුනක් සිතට නැගුණ බව සඳහන් වේ. උන්වහන්සේ පසු කළෙක සංගාරව නම් වූ භාරද්වාජයන් අමතා මේ උපමා තුන විස්තර කළහ. ඒ උපමා තුන මෙසේය.

1. එළය සහිත ලී කැබැල්ලක් ජලයේ තෙත බරිතව ඇත. කිසියම් පුද්ගලයෙක් ජලයේ තියෙන එම එළය සහිත ලී කැබැල්ල ගෙන ගිනි නිපදවන ලීයක් එය මත තබා, ඒ ලී දෙක එකිනෙකට මදිමින්, එයින් ගිනි ඉදපවීමට උත්සාහ කරයි.

2. එළය සහිත වුත්, ජලයෙන් තෙත් වුත්, ලී කැබැල්ලක් ගොඩබිම ඇත. කිසියම් පුද්ගලයෙක් ගිනි නිපදවන ලීයක් ගෙන ඒ මත තබා එකිනෙකට මදිමින් ගිනි නිපදවීමට උත්සාහ කරයි.

3. හොඳින් වියළී ඇති ලී කැබැල්ලක් ජලයෙන් ඈත ගොඩබිම ඇත. කිසියම් පුද්ගලයෙක් මේ වියළි ලී කැබැල්ල ගෙන ගිනි නිපදවන ලී කැබැල්ලක් සමග එකිනෙකට මදිමින් ගිනි නිපදවීමට උත්සාහ කරයි.

මෙම උපමා තුනෙන් පළමුවෙනි උපමාවට අනුව උන්වහන්සේට වැටහී ගියේ යම් යම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් කාමයෙන් යුතුව කාමයේම බැසගෙන සිටිමින්, කාමච්ජන්දයෙන් කාමස්නේහයෙන් යුතුව සිටිමින් කාමයෙන් මුසපත්ව විවිධ දුක්, කටුක වේදනා ආදිය විඳිමින් ඤාණ දර්ශනය සඳහා, සම්බෝධිය සඳහා, උත්සුක වෙන බවයි. එහෙත් කොපමණ උත්සුක වුවද එය සාර්ථක වෙන්නේ නැත. එය හරියට තෙත බරිතව ඇති එළය සහිත ලීයකින් ගිනි නිපදවීමට උත්සහ දරන්නාක් මෙනි.

දෙවෙනි උපමාවට අනුව, යම් යම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් කාමයන්ගෙන් වෙන්වී ඇත. කාමච්ජන්දයෙන්, කාමස්නේහයෙන් වෙන්වී ඇත. එහෙත් ඒ අයගේ ඇතුළත හෙවත් හිතෙහි කාමාශාවන් මැනවින් ඉවත් වී නැත. එවැනි අයටත් ඤාණ දර්ශනය හෙවත් සම්බෝධිය ලබා ගත නොහැකිය. ගොඩ බිම තිබුණත් එළය සහිත මෙන්ම ජලයෙන් ද තෙත්වී ඇති ලී කැබැල්ලකින් ගිනි නිපදවිය නොහැකිවන්නාක් මෙනි.

තෙවැනි උපමාවට අනුව, යම් යම් ශ්‍රමණ බ්‍රාහ්මණවරු කයින් මෙන්ම සිතින් ද සම්පුර්ණයෙන්ම කාමයෙන් ඉවත්ව වාසය කරති. ඒ අයට කාමච්ජන්දය නැත. කාමස්නේහය නැත. කාම මුර්ජාවක් නැත. කාම පරිළාහයක් නැත. කාම පිපාසාවක් නැත. ඇතුළතත් ඉතාම හොඳින් කාමයන් ප්‍රහීණ වී ඇත. ප්‍රසාදජනක බවට පත්වී ඇත. ඒ අය විවිධ උපක්‍රම මගින් විවිධ දුක් ගැහැට වේදනා විඳිති. ඒ අයට ඤාණ දර්ශනය සම්බෝධිය ලබාගැනීමට හැකියාව ඇත. එය හරියට ගොඩබිම ඇති වියළි ලී කැබැල්ලක් ගෙන ගිනි නිපදවිය

හැකි තවත් ලී කැබැල්ලක් සමග මදිමින් ගිනි නිපදවීමට උත්සාහ දරන්නාක් මෙනි.

මෙසේ අප මහා බෝසතාණෝ මෙම උපමා තුන තේරුම් ගෙන වීරිය වැඩීමේ අගය සලකා අවබෝධයෙන් හා වීර්යයයෙන් යුතුව භාවනා කළ යුතුයැයි තීරණය කළහ. ඒ අනුව බුදුපියාණෝ ඒ කරුණු සංගාරව භාරද්වාජයන්හට පසුකළෙක මෙසේ දේශනා කළහ.

''භාරද්වාජය මට මෙහෙම හිතුණා, දත්වලට දත් තියලා, දිව තල්ලට තියලා තද කරමින් සිතින් සිත මැඩපවත්වන්න ඕනේ, සිත සන්තාපයට පත්කරන්න ඕනේ, සිත පෙළන්න ඕනේ, කියලා. මම එහෙම හිතලා එහෙම කළා. එහෙම කරන කොට මගේ කිහිල්ලෙන් දහදිය ගලන්න පටන් ගත්තා. හරියට බලවත් පුරුෂයෙක් දුබල කෙනෙක් හිසෙන් හෝ ශරීරයෙන් අල්ලාගෙන පෙළන්නාක් මෙනි. භාරද්වාජය, මට දැඩි වීර්‍ය්‍යයක් තිබුණා. කම්මැලි වුණේ නැහැ, හොඳ සිහියෙන් තමයි හිටියේ, සිහි මුළාව හිටියේ නැහැ. ඒ වීර්‍ය්‍යයෙන් යුක්ත වූ මගේ කය වෙහෙස වුවත්, සිත නම් වෙහෙස වුණේ නැත.

''භාරද්වාජය, මට මෙහෙම හිතුණා. 'මම අප්‍රාණක ධ්‍යාන වඩන්න ඕනේ කියලා හෙවත් හුස්ම සම්පූර්ණයෙන්ම නතර කරන්න ඕනේ' කියලා. ඒ අනුව මම මුඛයෙන්වත් නාසයෙන් වත් හුස්ම ගැනීමෙන් වැළකී සිටියා. එවිට මගේ කණ් සිදුරුවලින් මහත් ශබ්ද නගමින් වාතය පිටවෙන බව දැණුනා. ඒක හරියට මයින හමකින් නැගෙන ශබ්දය වගෙයි. එහෙත් මගේ ආරම්භ

කරන ලද වීර්‍ය්‍යය අඩු වුයේවත් එළඹ සිටි සිහියෙන් තොර වුයේවත් නැත. එසේ වුවද දැඩි වෙහෙසට පත්වීම නිසා හා දැඩි වේදනාව නිසා මගේ ශරීරය විඩාවට පත්විය. නොසන්සුන් බවට පත්විය. එහෙත් මා තුළ ඇතිවු ඒ වේදනාව නිසා මගේ මනස නම් වෙහෙසට පත්වුයේ නැත.

''තවදුරටත් එයම කළ යුතු යැයි සිතූ මට නැවත මෙහෙම හිතුණා. මුඛයෙන්වත් නාසයෙන් වත් කණ්වලින්වත් හුස්ම පිට නොකර ඉන්න ඕනේ කියලා. එසේ වැළකී සිටියෙමි. එවිට මගේ හිස මුදුනෙහි මහත්වු වේදනාවක් දැණුනි. එය හරියට බලවත් පුරුෂයෙක් වරපටයකින් හිස වෙළමින් තද කරන්නාක් මෙනි. එහෙත් මගේ අරඹනලද වීර්‍ය්‍යය නම් අඩු වුයේවත් එළඹ සිටි සිහියෙන් තොර වුයේවත් නැත. එසේ වුවද දැඩි වෙහෙසට පත්වීම නිසා හා දැඩි වේදනාව නිසා මගේ ශරීරය විඩාවට පත්විය. නොසන්සුන් බවට පත්විය. මා තුළ ඇතිවු ඒ වේදනාව නිසා මගේ මනස නම් වෙහෙසට පත්වුයේ නැත.

''භාරද්වාජය නැවත මම අප්‍රාණකවම ධ්‍යාන වඩමින් මුඛයෙන් ද නාසයෙන් ද කණ්වලින් ද හුස්ම ඉහළ පහළ යාම සම්පුර්ණයෙන්ම නතර කළෙමි. එවිට මගේ කුසයෙහි මහත් වාත වේදනාවක් ඇතිවිය. එය හරියට දක්ෂ ගවඝාතකයෙක් හෝ ගවඝාතක අතවැසියෙක් හෝ තියුණු මන්නා පිහියක් ගෙන ගවයාගේ කුස කපන්නාක් මෙනි. එහෙත් මගේ අරඹනලද වීර්‍ය්‍යය නම් අඩු වුයේවත් එළඹ සිටි සිහියෙන් තොර වුයේවත් නැත. එසේ වුවද දැඩි වෙහෙසට පත්වීම නිසා හා දැඩි වේදනාව නිසා මගේ ශරීරය විඩාවට

පත්විය. නොසන්සුන් බවට පත්විය. එහෙත් මා තුළ ඇතිවූ ඒ වේදනාව නිසා මගේ මනස නම් වෙහෙසට පත්වුයේ නැත.

''නැවතත් මුඛයෙන් ද නාසයෙන් ද කණ් වලින් ද හුස්ම ඉහළ පහළ යාම වැළැක් වුයෙමි. එවිට මුලු ශරීරයම දහඩියෙන් පිරුණි. හරියට බලවත් පුරුෂයෝ දෙදෙනෙක් ඉතා දුබල පුරුෂයෙකු අත්පා වලින් අල්ලාගෙන ගිනි අඟුරු වලකට අල්ලමින් රත්කරන්නාක් මෙනි, තවන්නාක් මෙනි. එහෙත් මගේ අරඹනලද වීර්‍ය්‍යය අඩු වුයේවත් එළඹ සිටි සිහියෙන් තොර වුයේවත් නැත. එසේ වුවද දැඩි වෙහෙසට පත්වීම නිසා හා දැඩි වේදනාව නිසා මගේ ශරීරය විඩාවට පත්විය. නොසන්සුන් බවට පත්විය. මා තුළ ඇතිවූ ඒ වේදනාව නිසා මගේ මනස නම් වෙහෙසට පත්වුයේ නැත.

''භාරද්වාජය මේ අවස්ථාවේ දේවතාවෝ මා දැක මෙසේ කීහ. 'අනේ ශ්‍රමණ ගෞතමයෝ කලුරිය කළා.' සමහර දේවතාවෝ මෙසේ කීහ. 'නෑ නෑ ශ්‍රමණ ගෞතමයෝ කලුරිය කළේ නෑ. හැබැයි කලුරිය කරමින් තමයි ඉන්නේ.' සමහරක් දේවතාවෝ මෙසේ කීහ. ශ්‍රමණ ගෞතමයෝ කලුරිය කළේ නැහැ. කලුරිය කරමින් සිටින්නේත් නැහැ. ශ්‍රමණ ගෞතමයෝ අරහත්ය. රහතන් වහන්සේලා මේ විදිහට තමයි ඉන්නේ.' යනුවෙනි.

''භාරද්වාජය මට මෙහෙම හිතුණා. දැන් මම සම්පුර්ණයෙන්ම ආහාර ගැනීම නතර කරන්න ඕනේ කියලා. එසේ ආහාර ගැනීම සම්පුර්ණයෙන්ම නතර කළාම දේවතාවෝ මා ළගට පැමිණ මෙසේ කීහ.

''නිදුකාණෙනි, සම්පුර්ණයෙන්ම ආහාර ගැනීමෙන් වැළකී ඉන්න නම් එපා. එසේ සම්පුර්ණයෙන්ම ආහාර ගැනීමෙන් වැළකී සිටියොත් අපි ඔබවහන්සේගේ රෝම කූප වලින් දිව්‍ය ඕජස් ඇතුළ් කරනවා.'' කියලා. භාරද්වාජය එවිට මට මෙසේ සිතුණා. මම ආහාර ගැනීමෙන් වැළකී සිටිමියි කියා කියමි. එහෙත් දෙවියෝ රෝමකූපවලින් දිව්‍ය ඕජස් ඇතුළ් කරති. එසේ කිරීම මුසාවකි. එබැවින් එසේ කිරීමෙන් වැළකී සුලු වශයෙන් ආහාර ස්වල්පයක් ගතිමි.''

මේ ආකාරයෙන් අපේ බුදුහාමුදුරුවෝ බුදුවීමට පෙර චතුරාර්‍ය්‍ය සත්‍යය නොදත් කම නිසාම විවිධ වූ දුෂ්කර ක්‍රියා කොට එය සත්‍යාවබෝධයට මඟ නොවන බව තේරුම් ගත්හ. ඒ අනුව ටිකෙන් ටික ආහාර ගන්නට පටන් ගත්හ. පසුකාලීනව උන්වහන්සේම මජ්ඣිම නිකායේ මහා සීහනාද, මහා සච්චක හා සංගාරව වැනි සූත්‍ර දේශනා වලින් අපට පැහැදිලි කරන පරිදි, මේ කාලයේදී උන්වහන්සේ ඉතාම සුලු ආහාරයක් පමණක් ගැනීම නිසාම උන්වහන්සේගේ ඇඟපත සම්පූර්ණ යෙන්ම කෙට්ටු වුණා. ආසීතික කියන වැල් පුරුක් වගේ වුණා. තට්ටම ඔටුවෙකුගේ පා සටහනක් වගේ වුණා. කොඳු ඇට පෙළ වට්ටනාවලි කියන වැළ වගේ උස්පහත් වුණා, හොඳටම දිරාපු ශාලාවක වහලේ පරාළ වගේ උස් පහත් වුණා. පපුවේ ඇට ටික පෙනුනේත් ඒ වගේමයි. ඇස් දෙක හරියට ගැඹුරු ළිඳක අඩියෙම පෙනෙන යාන්තම් තියෙන වතුර ටිකක් පෙනෙන්නාක් මෙන් තමයි තිබුණේ. ඒ කියන්නේ ඇස් දෙක ඇස් වල යටටම ගිළිලා යන්තමට තමයි දිලිසුනේ. හිසේ හම මැළවුණා, රැලිවැටුණා, ගැළවුණා. හරියට අමුවෙන් කඩලා අව්වේ දමලා තිබුණ ලබු ගෙඩියක් වගෙයි.

උන්වහන්සේම දේශනා කරන පරිදි බඩේ හම අතගානකොට අහුවුණේ කොඳුඇට පේළියයි. කොඳු ඇට පේළිය අතගානකොට අහුවුණේ බඩේ හමයි. වැසිකිළි කෙසිකිළි යන්න හදන කොට එතනම යටිකුරු අතට ඇද වැටුණා. අත පය පිරිමදින කොට මයිල්වල මුල් දිරලා. ඒ මයිල් ගැළවී ගැළවී වැටෙන්න පටන් ගත්තා. සමහර මිනිස්සු සිදුහත් බෝසතාණෝ දැකලා මෙහෙම කිව්වා ''අනේ මේ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ හොඳටම කළු වෙලා.'' එතකොට තවත් මිනිස්සු මෙහෙම කිව්වා ''නෑ නෑ දැන් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ රත්තරන් පාටයි'' තවත් අය මෙහෙම කිව්වා ''නෑ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ තළෙළුයි.''කියලා.

බුදුරජාණන් වහන්සේ සංගාරව භාරද්වාජ යන්හට මෙසේ වදාළා. ''භාරද්වාජයෙනි, අතීතයේ කිසියම් ශ්‍රමණයෙක් හෝ වේවා බ්‍රාහ්මණයෙක් හෝ වේවා හිතාමතාම යම් තියුණු වූ දුක් කම්කටොළු වේදනා වින්දා නම් ඒ සියලු වින්ද වේදනා මෙච්චර තමයි. මෙයට වඩා වේදනාවක් වින්දේ නෑ. අනාගතයේ කිසියම් ශ්‍රමණයෙක් හෝ වේවා බ්‍රාහ්මණයෙක් හෝ වේවා හිතාමතාම යම් තියුණු වූ දුක් කම්කටොළු වේදනා විඳී නම්, ඒ සියලු වේදනා විඳින්න තියෙන්නේ මෙච්චර තමයි. මෙයට වඩා වේදනාවක් විඳින්ට නෑ. ඒ වගේම වර්තමානයේ කිසියම් ශ්‍රමණයෙක් හෝ වේවා බ්‍රාහ්මණයෙක් හෝ වේවා හිතාමතාම යම් තියුණු වූ දුක් කම්කටොළු වේදනා විඳින්නේ නම් ඒ සියලු වේදනා විඳින්නේ මෙච්චර තමයි. විඳින්න මීට වඩා වැඩි වේදනාවක් තවත් නම් නෑ. එහෙත් මේ සා පීඩාකාරී වූ දුෂ්කර ක්‍රියාවක යෙදිලත්, මිනිස් ස්වභාවය ඉක්මවා ගිය

ශ්‍රේෂ්ඨ වූ ඥාණ දර්ශන කිසිවක් මට අවබෝධ කරගන්නට බැරිව ගියා. ඉතින් මේ සත්‍යාවබෝධයට වෙනත් මාර්යක්වත් තියෙනවා ද කියලා මට හිතුණා.'' යනුවෙනි.

3. මැදුම් පිළිවෙතින් දහම් සුව සොයා (නිවැරදි තීරණය)

මජ්ඣිම නිකායේ සංගාරව සූත්‍ර දේශනයට අනුවම අපේ බුදුහාමුදුරුවෝ මේ දුෂ්කර ක්‍රියාවලින් සත්‍යය සොය ගත නොහැකි බව තේරුම් ගෙන මැදුම් පිළිවෙතට අවතීර්ණ වූ ආකාරය ද උන්වහන්සේ විසින්ම ප්‍රකාශ කර ඇති ආකාරය උන්වහන්සේගේම මුවින් දැන් අපි අසමු. අපේ බුදුහාමුදුරුවෝ මෙසේ වදාරති. ''භාරද්වාජය ඒ අවස්ථාවේ මට සිහිපත් වුණා ශාක්‍ය වූ පිය මහරජතුමාගේ කුඹුරෙහි ජම්බු ගසෙහි සිසිල් සෙවනෙහි වාඩිවී සිටිය ආකාරය. එහිදී මා එදා කාමයන්ගෙන් වෙන්ව අකුසලයන් ගෙන් වෙන්ව විතර්ක සහිත, විචාර සහිත, විවේකයෙන් හටගත් ප්‍රීතියෙන් හා සැපයෙන් යුක්තවූ, පළමුවෙනි ධ්‍යානයට පැමිණ වාසය කළ අයුරු මට සිහිපත් වුණා. සත්‍යාවබෝධයට මාර්ගය මේකවත් ද? කියලා මට හිතුණා. භාරද්වාජය, ''අවබෝධයට ඇති මාර්ගය මේකමයි'' කියලා එහිදී මට සතානුසාරී විඤ්ඤාණය හෙවත් සිහියට සමගාමී වූ විඤ්ඤාණය ඇතිවුණා.

''එතකොට මට හිතුණා මම මේ කාමයන්ගෙන් වෙන්වූ, අකුසලයන්ගෙන් වෙන්වූ, සැපයට භයවෙන්නේ මොකටද? නෑ මම මේ සැපයට භයවෙන්නේ නෑ. මේ සැපය කාමයන්ගෙන් වෙන්වූ

සැපයක්, අකුසලයන්ගෙන් වෙන්වූ සැපයක්. භාරද්වාජය ඊ ළඟට මට මෙහෙම හිතුණා. ඒත් මෙහෙම දුර්වල වෙච්ච කයක් තියාගෙන නම් මට ඒ සැපය ලබන එක ලේසි දෙයක් නොවෙයි. මම ටිකෙන් ටික බත් පිට්ටු ආදීයෙන් යුත් ආහාර ගත යුතුයි කියලා. මේ අනුව මම බත් පිට්ටු වැනි ආහාර ගන්න පටන් ගත්තා. ඒ වෙනකොට ''ශ්‍රමණ ගෞතමයන් වහන්සේ යම් ධර්මයක් අවබෝධ කරයි ද ඒ ධර්මය අපටත් කියාදේවි'' යන අදහසින් භික්ෂුන් පස් නමක් මට උපස්ථාන කරමින් හිටියා. එසේ වුවද භාරද්වාජය, මම බත් පිට්ටු ආදිය වළඳන්න පටන් ගත්තාම ඒ භික්ෂුන් පස් නමම මං ගැන කළ කිරිලා ''ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සැප බහුල කරගත්තා'' කියලා මාව අත හැර දමලා යන්නට ගියා.'' (පසුව අපේ බුදුහාමුදුරුවෝ සම්මා සම්බුද්ධත්වයට පත්වෙලා මුලින්ම ධර්ම දේශනය කළේ මෙම භික්ෂුන් වහන්සේලා පස්දෙනාටය).

මෙසේ අපගේ සිදුහත් ගෞතම බෝසතාණෝ බත් පිට්ටු ආදී දේ ආහාරයට ගෙන ශරීර ශක්තිය ඇති වූ කල්හී පිළිවෙලින් කාමයන්ගෙන් වෙන්ව, අකුසලයන්ගෙන් වෙන්ව, විතර්ක සහිත විචාර සහිත චිත්ත විවේකය නිසා හටගත් ප්‍රීතිය හා සැපයෙන් යුක්ත වූ පළමුවෙනි ධ්‍යානයට සමවැදී වාසය කළා. නැවත පිළිවෙලින් දෙවෙනි ධ්‍යානයට ද තුන්වෙනි ධ්‍යානයට ද හතර වෙනි ධ්‍යානයට ද පත්ව වාසය කළා. මේ ආකාරයෙන් ධ්‍යානවලට සමවැදීමෙන් සමාධිමත් සිතක් ඇතිවිය. ඒ සිත සමාහිතය. පිවිතුරු වූ සමාධිමත්වූ කෙලෙස් වලින් විනිර්මුක්ත වූ, මෘදු වූ, කිසිදු කැළඹීමකින් තොරවූ, කර්මන්‍ය බවට පත් වූ, ඒ සිත තමන් වහන්සේ පෙර භවවල විසූ ආකාරය බැලීම සඳහා

යොමු කළ බවත් ඒ අනුව තමන් භවයේ විවිධ ආත්මභාව සිය ගණන් දහස් ගණන් ලක්ෂ ගණන් කෝටි ගණන් මෙන්ම කල්ප ගණන් ආත්මභාව වල ඉපදී ඒ ඒ ආත්ම භාවවල කළ කී දේ සිහිකිරීමට හැකියාව ලැබුණි.

අනතුරුව උන්වහන්සේ ඒ පිවිතුරු වූ සිතින්ම සත්වයන්ගේ චුතිය හා උත්පත්තිය සිදුවෙන ආකාරය හෙවත් සත්වයන් මෙළොවින් චුත වී තවත් ලෝකයක උපදින ආකාරය ද වෙනත් ලෝක වලින් චුතව මෙලොවට පැමිණ මෙලොව උපදින ආකාරය ද දැකීම සඳහා නුවණ මෙහෙය වූහ. එය ද ඒ ආකාරයෙන් ම කිසියම් පුද්ගලයෙක් සතර මං හන්දියක ඇති තට්ටු සහිත නිවාසයක උඩුමහල් තළයේ සිට සතර මං හන්දිය දෙස බලාගෙන සිටිද්දී විවිධ පුද්ගලයන් විවිධ දෙසින් පැමිණ මේ නිවාසයට ඇතුල්වෙන ආකාරය ද පිටවෙන ආකරය ද දකින්නාසේ සත්වයන් මෙලොවට එන ආකරය ද මෙලොවින් පිටවෙන ආකාරය ද දැක ගත්හ.

තදනන්තරව උන්වහන්සේ ඒ පිවිතුරු වූ සමාධිමත්වූ සිත සියලු ආශ්‍රව ධර්මයන් නැති කිරීම සඳහා යොමු කළ අතර එයින් උන්වහන්සේට දුක යනු කුමක්ද? දුකෙහි හටගැන්ම කුමක්ද? එහි නිරෝධය කුමක්ද? ඒ දුක්ඛ නිරෝධය සඳහා වූ මාර්ගය කුමක්ද? යන්න හෙවත් චතුරාර්‍ය සත්‍යය ධර්මය අවබෝධ විය. එසේම ආසව යනු මොනවාද? ආසව ඇතිවෙන්නේ කෙසේද? ආසව නැති කිරීම යනු කුමක්ද? ආසව නැති කිරීමේ මාර්ගය කුමක්ද? යන්න අවබෝධ වීමෙන් ඒ සියලු ආසව හෙවත් කෙලෙස් නැති කොට විමුක්තියට පත් වීමට හැකි වූ බව සංගාරව භාරද්වාජයන්හට දේශනා කළහ.

මේ උන්වහන්සේ විසින් අනුගමනය කළේ මැදුම් පිළිවෙතයි. මැදුම් පිළිවෙත යනු කාමසුඛල්ලිකානු යෝගය හෙවත් ශරීරයට විවිධාකාරයෙන් සැපම ලබාදෙන පිළිවෙත සහ අත්තකිලමථානුයෝගය හෙවත් ශරීරයට විවිධාකාරයෙන් දුක්ම ලබාදෙන පිළිවෙත යන පිළිවෙත් දෙකෙන්ම ඉවත්ව ශරීර යාපනයට හෙවත් ශරීරයේ යැපීමට අවශ්‍ය ප්‍රමාණයට පමණක් ආහාර ගනිමින් නිවැරදි ධර්මයෙහි පිහිටා කටයුතු කිරීමය.

අපේ බුදුහාමුදුරුවෝ අප කෙරෙහි මහත් අනුකම්පාවෙන් දෙසා වදාළ පළමු ධර්ම දේශනය වූ ධම්ම චක්කප්පවත්තන සූත්‍ර දේශනයෙන්ම මේ මැදුම් පිළිවෙත යනු කුමක්දැයි දේශනා කළහ. (ද්වේ මේ භික්ඛවේ අන්තා... මේ සූත්‍ර දේශනය සෑම බෞද්ධයෙකු විසින්ම කියවිය යුතුය. ඔබත් මේ ධම්ම චක්ක පවත්තන සූත්‍රයත් කියවන්න.) [17]

මෙම කරුණු වලට අනුව අපට ඉතාමත්ම පැහැදිලිව පෙනෙන්නේ අපේ බුදුහාමුදුරුවෝ කිංකුසල ගවේශීව, කිංසච්ච ගවේශීව, වසර හයක් තිස්සේ අනේක විධ වූ දුෂ්කර ක්‍රියාවන් සිදුකොට වෙනත් කිසිවෙකුගේ උපකාරයකින් තොරවම තමන්වහන්සේ විසින්ම මධ්‍යම ප්‍රතිපදාවෙහි ගමන් කරමින් හෙවත් මධ්‍යම ප්‍රතිපදාව නම්වූ ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කරමින්, මේ ශ්‍රී සද්ධර්මය හෙවත් චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මය, සත්‍ය ඥාණ වශයෙන් ද කෘත්‍ය ඥාණ වශයෙන්ද කෘත ඥාණ වශයෙන් ද ආකාර දොළසකින් හා තථ, අවිතථ, අනඤ්ඤථ වශයෙන් පරිවෘත තුනකින් යුතුවද අවබෝධ කරගෙන සම්මා සම්බුද්ධත්වයට පත්වූ බවය. ''සම්මා සම්බුද්ධ'' යනු වෙනත් කිසිවෙකුගේ උපකාරයකින්

තොරව තමන් වහන්සේ විසින්ම පරිපූර්ණ වශයෙන්ම චතුරාර්‍ය සත්‍ය ධර්මය අවබෝධ කරගත් යන අදහසයි. ලෝකයේ වෙනත් කිසිම කෙනෙකුගේ උපකාරයකින් තොරව මෙසේ බුද්ධත්වයට පත් එකම ශාස්තෘන් වහන්සේ අපගේ ශාන්ති නායක වූ ශාන්ති දායක වූ සම්මා සම්බුදුපියාණන් වහන්සේ පමණි. (අපේ බුදුරජාණන් වහන්සේගේ ඒ දුෂ්කර ක්‍රියා සමය හෙවත් වසර හයක පමණ කාලයක් වින්ද අපමණ දුක් ගොන්න දැනගැනීමට ඔබත් කැමති නම් මජ්ඣිම නිකායේ මහා සීහනාද සූත්‍රය, මහා සච්චක සූත්‍රය, බෝධිරාජකුමාර සූත්‍රය හෝ සංගාරව සූත්‍රය කියවන්න මෙන්න සූත්‍ර අංක පිළිවෙලි 12, 36, 85 සහ 100 .)

අංගුත්තර නිකායේ පඤ්චක නිපාතයේ සඳහන් වෙන මහාසුපින සූත්‍රයට අනුව සම්මා සම්බුද්ධත්වයට පැමිණීමට පෙර අනභිසම්බුද්ධ වූ අපේ සිදුහත් බෝධිසත්වයන් වහන්සේට මහා සිහින පහක් දක්නට ලැබුණහ. පසු කලෙක අපේ බුදුහාමුදුරුවෝ අපට කියා දෙන ආකාරයෙන් එම සිහින පහ මෙසේය.

1. පින්වත් මහණෙනි, අනභිසම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ මෙසේ සිහින දුටුවේය. මේ මහා පොළොව මගේ ඇඳ විය. මගේ කොට්ටය හිමල පර්වතය විය. මගේ වම් අත පෙරදිග මුහුදෙහි විය. දකුණු අත බටහිර මුහුදෙහි විය. මගේ පාදෙක දකුණු මුහුදෙහි වුහ. මෙසේ සයනය කරනු දුටුවෙමි. මේ පළවෙනි මහා සිහිනයයි.

2. නැවත ද පින්වත් මහණෙනි, තිරයා නම් වූ තෘණ වර්ගයක් ඇත (ඊතණ). මේ තෘණ පැළයක් මගේ

නාභියෙන් (පෙකණියෙන්) පැන නැගී අහස දක්වා ඉහළට ගොස් තිබෙණු දුටුවෙමි. මේ දෙවෙනි මහා සිහිනයයි.

3. නැවත ද පින්වත් මහණෙනි, කළුපාට හිස ඇති සුදු පාට පණුවෝ විශේෂයක් දෙපා වලින් නැගී දනහිස් තෙක් වසාගෙන සිටිනු දුටුවෙමි. මේ තුන්වැනි මහා සිහිනයයි.

4. නැවත ද පින්වත් මහණෙනි, විවිධ වර්ණයෙන් යුත් පක්ෂීහු සිව් දිසාවලින්ම පැමිණ මගේ පා මුල වැටී සියල්ලෝම සුදු වර්ණයෙන් යුක්තව සමෘද්ධව සිටිනු දුටුවෙමි. මේ හතර වෙනි මහා සිහිනයයි.

5. නැවත ද පින්වත් මහණෙනි, මහා අසුචි කන්දක් විය. එහෙත් ඒ අසුචියෙන් නොතැවරී අසුචි නොගෑවී ඒ මත සක්මන් කරමින් සිටිනු දුටුවෙමි. මේ පස්වෙනි මහා සිහිනයයි.

මෙම මහා සිහින මොනවා දැයි තෝරා දෙමින් බුදුපියාණන් වහන්සේම දේශනා කොට වදාළේ පළවෙනි සිහිනයෙන් තමන් වහන්සේ අරහත් සම්මා සම්බෝධියට පත්වෙන බව පෙන් වූ බවය හෙවත් තමන් වහන්සේ සමස්ත ලෝකයේම එකම සම්මා සම්බුදු පියාණන් වහන්සේ බවට පත්වෙන බවය.

දෙවෙනි සිහිනයෙන් දැක්වුයේ තමන් වහන්සේ විසින් අවබෝධ කරගන්නාලද ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය සියලු මිනිසුන්ට ද දෙවියන්ට ද එකසේ දුක් කෙළවර කිරීම පිණිස හේතුවන බවය.

තුන්වැනි සිහිනයෙන් දැක්වූ කලු හිස් ඇති පණුවෝ විශේෂය නම් ගිහියෝය. බොහෝ ගිහියෝ තම ජීවිතය අවසානය දක්වා තථාගතයන් වහන්සේ සරණ යන බව මෙයින් දැක්වූහ.

හතරවෙනි මහා සිහිනයෙහි සිව් දිසාවලින් පැමිණෙන විවිධ වර්ණයෙන් යුක්ත වූ පක්ෂීන් නම් ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍යය, ශූද්‍ර යන විවිධ කුලවලින් පිරිස් පැමිණ තථාගතයන් වහන්සේ වෙත පැවිද්ද ලබා තථාගත සුදේශිත ධර්ම විනය හදාරමින් සසුනෙහි සමෘද්ධව සිටිමින් විමුක්තිය සාක්ෂාත් කරගන්නා පිරිසය.

පස්වැනි මහා සිහිනයෙහි මහා අසුචි කන්ද නම් චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස ආදී වශයෙන් ලැබෙන විවිධ ප්‍රත්‍ය පහසු කම් හා ලාභ කීර්ති ප්‍රශංසාදියයි. තථාගතයන් වහන්සේ ඒ කිසිවකට නො ඇලී ඒ කිසිවක නොතැවරී සිටින බව එයින් දැක්වූහ.[18]

4. සම්මා සම්බුද්ධත්වය
(ලොව උතුම්ම පදවියට පත්වීම)

බුදුබව ලැබීම ලොව ඇති ශ්‍රේෂ්ඨතම පදවියට පත්වීමය. එය ශ්‍රේෂ්ඨතම පදවිය යැයි කියන්නේ අනිත් සියලුම පදවි ටික කලකින් වෙනස් වෙන අතර මේ උතුම් පදවිය වෙනස් නොවන එකක් බැවිනි. මෙය ආත්ම විජයග්‍රහණයකි. අනිත් පදවි සියල්ලම තවත් කෙනෙක් විසින් වෙනස් කළ හැකිය. එහෙත් මේ උතුම්ම පදවිය ලොව වෙසෙන කිසිම දෙවියකුට හෝ ගාන්ධර්වයෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට

හෝ වෙනත් කිසිම කෙනෙකුට වෙනස් කළ නොහැකිය. ඒ බව බුදුපියාණන් වහන්සේ විසින්ම මෙසේ වදාළ සේක.

''නේව දේවෝ න ගන්ධබ්බෝ
න මාරෝ සහ බ්‍රහ්මුණා
ජිතං අපජිතං කයිරා
තථා රූපස්ස ජන්තුනෝ''[19]

බුද්ධත්වය යනු මහා වීර්‍යයකින් මහා පරිත්‍යාගයකින්, මහා කැපවීමකින් හා තිර අදිටනකින් යුතුව අප්‍රමාණ කාලයක් තිස්සේ ඇතිකරගත් කුසල ශක්තීන්ගේ පරිපූර්ණත්වයටපත් වන අවස්ථාවයි. එය හුදෙක් ප්‍රාර්ථනා කොට ලැබිය හැක්කක් හෝ පාරමිතා පිරීමෙන් ලැබිය හැක්කක් නොව මහත් කැපවීමෙන් හා නිවැරදිව ධර්මානු ධර්ම ප්‍රතිපත්තියෙහි පිහිටා සිත ප්‍රගුණ කිරීමෙන් මැදුම් පිළිවෙතින් පමණක් චතුරාර්‍ය සත්‍යය ධර්මයන් අවබෝධ කරගැනීමේ ප්‍රතිඵලය වශයෙන් ලැබිය හැකි උතුම්ම වූ පරම සුන්දර වූ අසහාය වූ ලෝකෝත්තර තත්වයයි.

අපගේ බුදුපියාණෝ සම්මා සම්බුද්ධත්වය ලැබූ අයුරු උන්වහන්සේ විසින්ම අපට කියාදෙන ආකාරයෙන් දැන් අපි දැන ගනිමු. පිළිගනිමු.

අපේ බුදුහාමුදුරුවෝ තමන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත් නොවී කිසිම දිනෙක කිසිම ආකාරයකින් තමන් වහන්සේ ඒ තත්වයට පත්වී ඇතැයි ප්‍රකාශ කිරීමක් කළේ නැත. එවන් ප්‍රකාශයක් කළේ තමන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත්වීමෙන්

අනතුරුව පමණි. ඒ බව උන්වහන්සේ විසින්ම සංයුත්ත නිකායේ ඛන්ධ සංයුත්තයේ පළමුවැනි අස්සාද සුත්‍රයෙහි[20] පැහැදිලිවම මෙසේ දේශනා කොට වදාළහ.

''පින්වත් මහණෙනි, අනභිසම්බුද්ධ වූ බෝධිසත්වව සිටින කාලයේ මට මෙසේ සිතුණි. රූපයේ ආශ්වාදය මොකක්ද? ආදීනවය මොකක්ද? නිස්සරණය මොකක්ද? වේදනාවේ ... සඤ්ඤාවේ ... සංඛාරවල ... විඤ්ඤාණයේ ආශ්වාදය මොකක්ද? ආදීනවය මොකක්ද? නිස්සරණය මොකක්ද? එවිට මට මෙසේ අදහස ඇතිවිය. රූපය නිසා යම් සැපයක් සොම්නසක් උපදියි ද මේ රූපයේ ආශ්වාදයයි. යම් රූපයක් අනිත්‍ය ද දුක් සහිත ද විපරිණාමයට, වෙනස් වීමට පත් වේද මේ රූපයේ ආදීනවයයි. රූපයෙහි යම් ඡන්දරාගය නැති වීමක්, ප්‍රහාණය වීමක් ඇද්ද මේ රූපයේ නිස්සරණයයි. වේදනාව නිසා... සඤ්ඤාව නිසා ... සංඛාර නිසා... විඤ්ඤාණය නිසා යම් සැපයක් සොම්නසක් උපදියි ද මේ විඤ්ඤාණයේ ආශ්වාදයයි. යම් විඤ්ඤාණයක් අනිත්‍ය ද දුක්ඛ සහිත ද විපරිණාමයට වෙනස් වීමට පත්වේද මේ විඤ්ඤාණයේ ආදීනවයයි. විඤ්ඤාණයෙහි යම් ඡන්දරාගය නැතිවීමක්, ප්‍රහාණය වීමක් ඇද්ද මේ විඤ්ඤාණයේ නිස්සරණයයි. යනුවෙනි.

පින්වත් මහණෙනි, යම්තාක් මේ පඤ්ච උපාදන ස්ඛන්ධයන්ගේ මේ ආශ්වාදය, ආශ්වාදය වශයෙන් ද ආදීනවය ආදීනවය වශයෙන් ද නිස්සරණය නිස්සරණය වශයෙන් ද යථාභූත වශයෙන් (නියම ආකාරයෙන්) අවබෝධ නොකළෙම් ද ඒ තාක්, මම මේ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ශ්‍රමණ බ්‍රාහ්මණ පිරිස් සහිත දෙවි මිනිසුන් සහිත මේ ලෝකයේ අනුත්තර වූ සම්මා

සම්බෝධියට පත්වුයේ යැයි ප්‍රකාශ කළේ නැත. එහෙත් යම් දිනෙක මම මේ පඤ්ච උපාදානස්ඛන්ධයන්ගේ ආශ්වාදය ආශ්වාදය වශයෙන් ද ආදීනවය ආදීනවය වශයෙන්ද නිස්සරණය නිස්සරණය වශයෙන් ද යථාභූත වශයෙන්ම අවබෝධ කළෙම් ද එකල්හී මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත සමණ බ්‍රාහ්මණ පිරිස් සහිත දෙවිමිනිසුන් සහිත මේ ලෝකේ අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කළෙමි යැයි ප්‍රතිඥා දුනිමි, ප්‍රකාශ කළෙමි.'' යනුවෙනි.

සුත්ත නිපාතයේ පධාන සූත්‍රය, මජ්ඣිම නිකායේ අරිය පරියේසන සූත්‍රය, භය භේරව සූත්‍රය, මහා සච්චක සූත්‍රය, සංගාරව සූත්‍රය, විනය පිටකයේ මහාවග්ගය, උදාන පාළිය ආදී සූත්‍රදේශනා රාශියකම අපගේ බුදුපියාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වය අවබෝධකර ගැනීමේ පසුබිම හා සම්බුද්ධත්වය ලබාගත් ආකාරය ද පැහැදිලි කොට දක්වා වදාළහ.

අපගේ සම්මා සම්බුදුරජාණන් වහන්සේට ඒ සම්මා සම්බුද්ධත්වය ලබාගැනීම සඳහා ප්‍රධානතම බාධකය වුයේ මාරයාගේ බාධකයයි.

මාරයා යනු හුදු සංකල්පක් පමණක් බව සමහර අයගේ මතයයි. ඒ මතයමත් හුදු සංකල්පයකි. ඒ මත වලට වඩා අපට වටින්නේ කරුණු සොයා බලා දැනගැනීමයි. අපේ විවිධ සූත්‍රදේශනා වලට අනුව වසවත්තී මාරයා කියා දෙවි කෙනෙක් සිටිය බව පැහැදිලිය. ඒ වසවත්තී නැමති මාරයා මෙසේ බුදුපියාණන් වහන්සේට මහ මුගලන් මහ රහතන්

වහන්සේට මෙන්ම වෙනත් භික්ෂුන් වහන්සේලාටත් භික්ෂුණීන් වහන්සේලාටත් විවිධ අවස්ථාවල කරදර කළ ආකාරය සංයුත්ත නිකායේ මාර සංයුත්තය භික්ඛු සංයුත්තය හා භික්ඛුණී සංයුත්තයේ ඇති විවිධ සූත්‍රදේශනා වලින් ද මජ්ඣිම නිකායේ මාරතජ්ජනීය හා බ්‍රහ්ම නිමන්තන වැනි සූත්‍ර දේශනා වලින් ද අපට පැහැදිලි කරගත හැක. ප්‍රථමයෙන්ම දුෂ්කර ක්‍රියා සමය අවසන් කොට සම්මා සම්බුද්ධත්වයට පත්වීම සඳහා මහත් කැපවීමෙන් නොපසුබට වු සදුත්සාහයෙහි යෙදී සිටි අපගේ සිදුහත් මහ බෝසත් උතුමාණන් වහන්සේට මාරබාධක ඇති වු ආකාරය හා තමන් වහන්සේගේ මාර පරාජය කිරීම ගැන සුත්ත නිපාතයේ පධාන සූත්‍රයෙහි සඳහන් වෙන ආකාරය අපි දැන් ඉගෙන ගනිමු.

අපේ බුදුහාමුදුරුවෝ අපට මෙසේ වදාරති. ''ඒ නේරංජරා ගංගා තීරයේ මහත් උත්සාහයෙන් හා ධෛර්යයෙන් යුක්තව සියලු බන්ධන වලින් නිදහස් වු තත්වයකට පැමිණීම පිණිස භාවනාවෙහි යෙදී සිටින කල්හී මා වෙත මාරයා කාරුණික වදන් කියමින් පැමිණියේය. 'ඔබ කෙට්ටුයි. දුර්වර්ණයි, ඔබට දැන් මරණය ආසන්න වී ඇත. ඔබගේ ජීවිතයෙන් දහසක කොටසක් ම මරණයට කැප වී ඇති අතර ජීවත් වීමට ඇත්තේ එක් කොටසක් පමණි. පින්වත, ජීවත්වෙන්න. ජීවත් වීම උතුම්. ජීවත්වෙලා පින් දහම් කරගන්න. බ්‍රහ්මචරියාවෙහි හැසිරෙමින් ද ගිනි දෙවියන් පුදමින් ද ඔබට බොහෝ පින් රැස් කර ගත හැකියි. මේ වීර්‍යය කිරීමෙන් ඇති එලේ කුමක්ද? වීර්‍යය කිරීම පිණිස ඇති මාර්ගය අපහසු එකකි, දුෂ්කර එකකි.'' මෙසේ කියමින් මාරයා බුදුරජාණන් වහන්සේ සමීපයෙහි සිටියේය.

එසේ කියන්නා වූ මාරයාහට බුදුපියාණන් වහන්සේ මෙසේ වදාළහ. ''පමාවුවන්ගේ නෑදෑයා වන පව්කාරයාණෙනි, මෙහි ආවෙ කුමක් සඳහාද? අනුමාත්‍ර වූ හෝ පිනකින් මට ප්‍රයෝජනයක් නැත. යම් කෙනෙකුට පින්වලින් වැඩක් වේ නම් ඒ අයට ඒ ගැන කීම සුදුසුයි. මට ශ්‍රද්ධාව ද, වීය්‍යීය ද ප්‍රඥාව ද ඇත. මෙසේ උත්සාහයෙහි යෙදුණ මගෙන් ජීවත්වීම ගැන ප්‍රශ්න කරන්නේ කුමකටද? මේ වාතය ගංගාවල ජල පහර ද වියළ වන්නේය. එසේ නම් උත්සාහයෙහි යෙදුණ මගේ රුධිරය නොවියළී තියෙන්නේ කොහොමද? රුධිරය වියළී යන කල්හී පිත ද සෙම ද වියළී යයි. මස් ක්ෂය වී යන කල්හී සිත මහත්සේ ප්‍රසාදයට පත්වෙයි. මගේ සතිය ද ප්‍රඥාව ද සමාධිය ද බොහෝ සෙයින් පිහිටයි. මෙසේ උපරිම වූ වේදනාවට පත්ව සිටින මගේ සිත කාමයන් පිළිබඳව බලාපොරොත්තුවක් ඇති නොකරයි. බලව සත්වයෙකුගේ පිවිතුරු බව.

''ඔබේ පළමු සේනාව කාමයන්ය. දෙවැන්න අරතියයි. තුන් වැන්න කුසගින්න සහ පිපාසයයි. සතර වැන්න තෘෂ්ණාවයි. කම්මැලි හා නිදිබර ගතිය පස්වැන්නයි. හය වැන්න බියයි. සත් වැන්න විචිකිච්ජාවයි. ගුණමකු බව සහ මුරණ්ඩු බව අට වැන්නයි. ලාභය ද ප්‍රශංසාත්මක වාක්‍යය ද සත්කාරය ද වැරදි මාර්ගයෙන් ලබන ලද කීර්තිය ද තමා උසස් කොට සැලකීම සහ අනුන් අවඥාවට ලක් කිරීම ද යන මේවා මාරය ඔබගේ සේනාවයි. ශූර නොවූ කෙනෙක් ඔහුගෙන් ජය ගන්නේ නැත. ඔහු ජයගත් විට සැප ලබයි. පරාජය වී ජීවත් වෙනවාට වඩා සංග්‍රාමයේ දී මිය යෑම මට ශ්‍රේෂ්ඨයි. මේ මුඤ්ජ නම් වූ මෘදු තණ පරිහරණය කරන

මා පරාජය වුවහොත් මගේ ජීවිතයට නින්දා වේවා. සමහර ශ්‍රමණ බ්‍රාහ්මණයෝ කාමයන් තුළට බැස ගත්තාහුය. මනා ව්‍රත ඇති අය යම් මඟකින් ගමන් ගනිත් ද එය නොදකිති, නොදනිති. මරසෙන් සහිත වූ හාත්පසින් සිටින යුධසේනාව දැක යුද පිණිස ඉදිරියට යමි. මාගේ ස්ථානයෙන් මා ඉවත් කිරීමට ඉඩ නොදෙමි. දෙවියන් සහිත ලෝකයා ඔබගේ සේනාව මැඩීමට අසමත් වුවද, මම ඔබව අමු මැටි බඳුනක් ගලකින් විනාශ කරන්නාක් මෙන් ප්‍රඥාවෙන් විනාශ කිරීමට යමි. සම්මා සංකල්පය පාලනය කරමින්, මනාව සිහිය පිහිටුවා ගනිමින්, නොයෙක් ආකාරයෙන් ශ්‍රාවකයන් හික්මවමින් රටින් රට හැසිරෙන්නෙමි. අප්‍රමාදීව උත්සාහයෙන් ගුණ දම් පුරමින් මගේ අනුශාසනය පිළිපදින අය ඔබ අකැමති වුවද යම් තැනකට ගොස් සෝක නොකරන්නේද එතැනට යන්නාහ.''

එවිට මරහු මෙසේ කීය.

''වර්ෂ හතක් තිස්සේම පියවරෙන් පියවර භාග්‍යවතුන් වහන්සේ ලුහු බැන්දෙමි. එහෙත් සතිමත් වූ සම්බුදුරජාණන් වහන්සේ තුළට වැද ගැනීමට අවස්ථාවක් නොලැබුවෙමි. කිසියම් කපුටෙක් මේද වර්ණ වූ ගලක් (එළඟිතෙල් පාට ගලක්) දැක එහි රසය විඳිමියි සිතා ඒ මේ අතට පෙරළ පෙරළා බලන කළ එහි ලැබිය හැකි කිසිත් ආශ්වාදයක් නැති බව දැන එයින් පළායන්නේ යම්සේ ද එසේම ගෞතමයන් වහන්සේ සමග ගැටීමෙන් කළකිරීමට පත්ව මෙසේ පළායන්නෝ වෙමු.'' යනුවෙනි.

මෙම සූත්‍රයේ අවසානයට මෙසේ ද සඳහන් වේ. ශෝකයෙන් පීඩාවට පත් මරහුගේ වීණාව කිහිල්ලෙන්

මිදී වැටුණේය. එයින් ද දොම්නසට පත් යක්ෂයා එතැන්හිදීම අන්තර්ධාන විය.[21]

අරිය පරියේසන සූත්‍රයෙහි අපේ බුදුහාමුදුරුවෝ සම්මා සම්බුද්ධත්වය ලැබූ ආකාරය දැක්වෙන්නේ මේ ආකාරයෙනි.

අපේ බුදුහාමුදුරුවෝ මෙසේ වදාරති. ''පින්වත් මහණෙනි, මම කිංකුසල ගවේශීව අනුත්තර සන්තිවරපදය හෙවත් නිර්වාණ ධර්මය සොයමින් මගධයෙහි පිළිවෙලින් චාරිකාවෙහි හැසිරෙන කල්හී, උරුවේලාවෙහි සේනානිගම යම් තැනෙක ද එහි වාසය කෙළෙමි. එහි රමණීය භූමියක පිහිටි ප්‍රසාදජනක වූ වන ලැහැබ ද රමණීය වූ සුදුවන් වැලිතලාවෙන් හා මනා තොටුපලින් යුත් ගලා බස්නා ගඟ ද හාත්පස ගොදුරුගම ද දුටුවෙමි. එහිදී මට මෙසේ සිතුණි. මේ භූමිභාගය රමණීයය. වන ලැහැබ ප්‍රසාද ජනකය. සුදුවැලි තලා ඇති මනා තොටු ඇති සිත්කලු නදිය ද ගලා බස්නීය. හාත්පසින් පිඬුසිඟා ගැනීමට සුදුසු ගොදුරුගම ද වෙයි. ප්‍රධන් වීයර්‍ය වැඩීමට කැමති කෙනෙකුට ඒ සඳහා මෙය ඉතාම සුදුසු තැනකි. මෙසේ සිතා පින්වත් මහණෙනි, මම එහිම නතර වුයෙමි.''

මේ අපේ සිදුහත් මහ බෝසත් උතුමාණෝ එදා වෙසක් පුර පසළොස්වක පොහෝ දිනට පෙරදින සේනානි ගමේ දී සුජාතාව දුන් කිරිපිඬු වළඳා බෝමැඩ වෙතට පැමිණි ආකාරයයි. බෝ මැඩට පැමිණ එහි නතරවී එදින තුන් යම් රාත්‍රිය මුළුල්ලේම භාවනා කරමින් තුන්යම දී සුවිශේෂ ඥාණ තුනක් ලබාගනිමින් සම්මා සම්බුද්ධත්වයට පත්විය. ඒ අපේ බුදුහාමුදුරුවෝ

බුදුබව ලැබූ ආකාරයයි. එහිදී ලබාගත් දැනුම මෙසේ ප්‍රකට කළහ.

''පින්වත් මහණෙනි, මම ඉපදෙන සුළු කෙනෙක්ව සිටිමින් එහි ආදීනව දැනගෙන ඉපදීමක් නැති අනුත්තර වූ යෝගක්ඛෙමී වූ නිවණ සොයමින් නොඉපදෙන, අනුත්තර වූ යෝගක්ඛෙමී වූ නිර්වාණයට පත්වුයෙමි. ජරාවට පත්වන කෙනෙක්ව සිටිමින් ජරාවට පත්වීමේ ආදීනව දැනගෙන ජරාවට පත්වීමක් නැති, අනුත්තර වූ යෝගක්ඛෙමී වූ නිවණ සොයමින් ජරාවට පත්නොවෙන, අනුත්තර වූ යෝගක්ඛෙමී වූ නිවණට පත්වුයෙමි. ව්‍යාධියට පත්වෙන කෙනෙක්ව සිටිමින් ව්‍යාධියට පත්වීමේ ආදීනව දැනගෙන ව්‍යාධියට පත්විමක් නැති, අනුත්තර වූ යෝගක්ඛෙමී වූ නිවණට පත්වුයෙමි. මරණයට පත්වෙන කෙනෙක්ව සිටිමින් මරණයට පත්වීමේ ආදීනව දැනගෙන මරණයක් නැති අනුත්තර වූ යෝගක්ඛෙමී වූ නිවණට පත්වුයෙමි. සෝකයට පත්වෙන කෙනෙක්ව සිටිමින් සෝකයට පත්වීමේ ආදීනව දැනගෙන සෝකයක් නැති අනුත්තර වූ යෝගක්ඛෙමී වූ නිවණ සොයමින් අනුත්තර වූ අසෝකී වූ යෝගක්ඛෙමී වූ නිවණට පත්වුයෙමි. කෙලෙස්වලින් කෙළෙසෙන කෙනෙක්ව සිටිමින් කෙලෙස් ධර්මවල ආදීනව දැනගෙන නිකෙලෙස් වූ අනුත්තර වූ යෝගක්ඛෙමී වූ නිර්වාණයට පත්වුයෙමි. මට ඥාණය හා දර්ශනය පහළ විය . මගේ චිත්ත විමුත්තිය නොසෙල්වෙන තත්වයට පත්විය. මේ මගේ අන්තිම ජාතියයි. දැන් නැවත ඉපදීමක් නැත.'' යනුවෙනි.

මජ්ඣිම නිකායේ භය භේරව සූත්‍රයට අනුව උන්වහන්සේ එදා බෝ මැඩ දී රාත්‍රී පෙරයම දී පුබ්බේ නිවාසානුස්සති ඥාණය හෙවත් පෙර විසූ ආකාරය දැක ගැනීමේ ඥාණය ද මධ්‍යම යාමයේ දී චුතූපපාත ඥාණය හෙවත් සත්වයන්ගේ චුතිය හා උප්පත්තිය දැක ගැනීමේ ඥාණය ද අළුයම දී සියලු කෙලෙසුන් නැති කිරීමේ හැකියාව වන ආසවක්ඛයඥාණය ද ලබා ගත් බව සඳහන් වේ.[22]

සම්මා සම්බුද්ධත්වය යනු ලොව සල නිසල සියල්ලෙහි යථා ස්වභාවය ඒ ආකාරයෙන්ම දැන දැක ප්‍රත්‍යක්ෂ කර ගැනීමය. මේ අවබෝධය ත්‍රිලක්ෂණය පිළිබඳව අවබෝධයයි. මේ සමගම චතුරාර්‍යසත්‍ය ධර්මයන් පිළිබඳව ද පටිච්චසමුප්පාද ධර්මය පිළිබඳවද අවිපරීත වූ පිවිතුරු අවබෝධයක් ඇතිවිය.

අපේ බුදුහාමුදුරුවෝ තමන් වහන්සේ විසින් මේ ආකාරයෙන් ලොව වෙනත් කිසිම කෙනෙකුට නොදෙවෙනි වූ ආකාරයෙන් සියලු ඥාණ ලබාගනිමින්, ලොව කිසිම කෙනෙකුට නැති දස බලයක් ලබා ගනිමින්, බුදුකෙනෙකුට පමණක් ආවේණික වූ ඥාණ හයක් ද විශාරදත්වයන් හතරක් ද ලබා ගනිමින් ලොව සල නිසල සියල්ලෙහි යථා ස්වභාවය සක් සුදක්සේ වටහා ගනිමින් අපේ යුගයේ සම්මා සම්බුදු පියාණෝ බවට පත්වූහ, අපේ බුදුහාමුදුරුවෝ බවට පත්වූහ.

අපේ බුදුහාමුදුරුවෝ බුදුවීමත් සමගම දේශනා කළ විශේෂ දේශනය ප්‍රීති වාක්‍යය හෙවත් උදාන වාක්‍යය මෙසේය.

''සසර නොයෙක් ජාතිවල මේ ගෙය හදන වඩුවා සොයමින් ඇවිද්දෙමි. නැවත නැවත ඉපදීම දුකකි. වඩුව ඔබ දුටුවෙමි. නැවත ගෙය හැදිය නොහැක. ඔබේ නිවස හදන පරාල සියල්ලම භග්න කොට දමන ලදී. සුණු විසුණු කරදමන ලදී. ගෘහ කූටය ද කෑලි කෑලි වලට කඩන ලදී. මගේ සිත විසංඛාර බවට පත්විය. තණ්හාව ක්‍ෂය කරන ලදී.''යනුවෙනි.

(අනේකජාති සංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවේසන්තෝ දුක්ඛා ජාති පුනප්පුනං
ගහකාරක දිට්ඨෝසි පුන ගෙහං න කාහසි
සබ්බා තෙ ඵාසුකා භග්ගා ගහකූටං විසංඛිතං
විසංඛාර ගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා)

(ධම්මපදය 153 -154 ගාථා)

2 පරිච්ඡේදය

ලොවට පහළ වූ අපේ බුදුහාමුදුරුවෝ

එකම කාලයේ දී ලෝකයේ සම්මා බුදුරජාණන් වහන්සේලා අවම වශයෙන් දෙනමක් වත් පහළ වෙන්නේ නැහැ කියලා ඔබත් අහලා තිබුණද? ඔව් අපේ බුදුහාමුදුරුවෝ තමයි අපට ඒවා කියලා දෙන්නේ. ඒ අනුව අපේ යුගයේ හෙවත් මේ යුගයේ ලොව පහළ වූ එකම අසහාය වූ සම්මා සම්බුදුපියාණෝ අපගේ ගෞතම සම්මා සම්බුදුපියාණන් වහන්සේ ය.

ස්වාමීනී බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ ශ්‍රද්ධාවෙන් මෙන්ම ප්‍රඥාවෙන් ද අපි සරණ ගිය අපගේ එකම ශාස්තෲන් වහන්සේ වන සේක. ඔබ වහන්සේ ලොව පහළ වූ තීක්ෂණ බුද්ධියේ උපරි තළයටමපත් වූ අසහාය ප්‍රඥාවන්තයාණෝය. සව්සත සිත් දැන දැක මෙත් කරුණා මුදිතා දී අපමණ ගුණ පෙරටුව සුවහසක් දනන් සිත් සතන් සනසා ලූ චින්තන නිදහසේ හරය අපට කියා දුන් ශ්‍රේෂ්ඨතම ආචාර්යවරයාණෝ ඔබවහන්සේ ය. අවිද්‍යාවෙන් අන්ධ වී තණ්හාවෙන් බැඳී බැඳී සසර සැරසරන අපමණ සතහට දහම් ඇස පාදා දෙමින් නොමඟින් සුමඟට යොමු කරවා නිවන් මඟකියාදෙන (මග්ගක්ඛායී) මාර්ගයෙහි දක්ෂ වූ (මග්ග කෝවිදෝ) නියම මාර්ගය දන්නාවූ (මග්ගඤ්ඤූ) අද්විතීය වූ ආශ්චෙයඝීවත් වූ එකම මාර්ගෝපදේශකයාණෝ ඔබ වහන්සේ ය. ඔබ වහන්සේ මහා කරුණාවේ ප්‍රතිමූර්තියයි. මහා ප්‍රඥාවේ ප්‍රතිමූර්තියයි. අනන්ත වූ

මෙත් සාගරයයි. සත්‍යය සොයා ගත් මහා වීරවරයාණෙනි, අසහාය වු ධර්ම කථිකයාණෙනි, කරුණා ගුණ සාගරයක් වු මිහිපිට උපන් මහා කාරුණිකයාණෙනි, සැබෑම අවිහිංසාව යනු කුමක්දැයි අපට කියාදුන් ශ්‍රේෂ්ඨතම අවිහිංසාවාදියාණෙනි, චිරන්තන දෘෂ්ටිජාලවල පැටලී හිරවී සිටි ජනතාවට චින්තන විප්ලවයකට මග හෙළ කොට වදාළ චින්තනීය නිදහස ලොවට හෙළි කළි මහා ශාස්තෲවරයාණෙනි, මිහිපිට උපන් ප්‍රගතිශීලී මහා මහෝත්තමයාණෙනි, මිනිසෙක් වශයෙන් මිනිසුන් අතර උපන් ලොව සැබෑම ඉතිහාසයක් ඇති එකම ශාස්තෲවරයාණෙනි, අපගේ මහා කාරුණික ජගදානන්දන ලෝක සිවංකර සම්මා සම්බුදු පියාණෙනි, සම්මා සම්බුදු මැණියනි, ඔබවහන්සේගේ සුපිරිසිදු සිරිපා අබියස වැඳ වැටී හද උතුරායන බැති සිතින් මම නමස්කාර කරමි මාගේ නමස්කාරය වේවා! දෙවෙනුව ද මම නමස්කාර කරමි මාගේ නමස්කාරය වේවා! තෙවෙනුව ද මම නමස්කාර කරමි මාගේ නමස්කාරය වේවා!

සියලු කෙලෙසුන් නසා ලොව කිසිම කෙනෙකුට දෙවෙනි නොවෙන්නා වු අසහාය වු ඒ සම්මා සම්බුදුබවට පත් වු අපේ බුදුහාමුදුරුවෝ එදා උරුවේලාවේ නේරංජරා නදී තීරයේ පිහිටි ඒ බෝ රුක් සෙවනේ වැඩ වසමින් පුරා සතියක් තමන් වහන්සේ විසින් ලබා ගත් ඒ විමුක්ති සුවයෙන් සුසංවේදී වු බව විනය පිටකයේ මහාවග්ගයේ ද මජ්ඣිම නිකායේ අරියපරියේසන සූත්‍රයේ ද උදාන පාළියේ[1] ද සඳහන් වේ. එහිදී උන්වහන්සේ රාත්‍රී ප්‍රථම යාමයේ දී පටිච්ච සමුප්පාදය අනුලෝම වශයෙන් ද ප්‍රතිලෝම වශයෙන් ද මනසිකාරයට නඟා ගත්හ. අනතුරුව උන්වහන්සේ

විසින් විශේෂ උදානයක් ද දේශනා කළහ. ඒ මෙසේය.

''යදා හවේ පාතුභවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
අථස්ස කඞඛා වපයන්ති සබ්බා
යතෝ පජානාති සහේතු ධම්මං''

එහි අදහස මෙසේය.

''බැහැර කළ පව් ඇති කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුතුව ධ්‍යාන වඩන රහතුන් වහන්සේට යම් කලෙක හේතුප්‍රත්‍යය ධර්මයෝ ප්‍රකට වෙත් ද එකල්හී උන්වහන්සේ සහේතුක වූ ධර්ම දනිති. එබැවින් උන්වහන්සේගේ සියලු සැක දුරුවේ'' යන්නය.

අනතුරුව බුදුපියාණන් වහන්සේ රාත්‍රී මධ්‍යම යාමය මුළුල්ලේ ද පටිච්චසමුප්පාදයම අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි කළ සේක. ඒ අවස්ථාවේ දී භාග්‍යවතුන් වහන්සේ මෙසේ ප්‍රීති වාක්‍ය පහළ කළහ.

''යදා හවේ පාතුභවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
අථස්ස කඞඛා වපයන්ති සබ්බා
යතෝ ඛයං පච්චයානං අවේදී''

එහි අදහස, ''බැහැර කළ පව් ඇති කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුතුව ධ්‍යාන වඩන රහතුන් වහන්සේට යම් කලෙක හේතුප්‍රත්‍යය ධර්මයෝ ප්‍රකටව වැටහෙත් ද එකල්හී ප්‍රත්‍යයන්ගේ ක්‍ෂය වීම දැනගත් හෙයින් උන්වහන්සේගේ සියලු සැක දුරුවේ'' යන්නය.

නැවත බුදුපියාණෝ අළුයම් කාලයේදී ද පටිච්ච සමුප්පාදයම අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි කළ සේක. ඒ අවස්ථාවේදී භාග්‍යවතුන් වහන්සේ මෙසේ ප්‍රීති වාක්‍යය පහළ කළ සේක.

''යදා හවේ පාතුභවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
විධූපයං තිට්ඨති මාරසෙනං
සුරියෝව ඕභාසයං අන්තලික්ඛන්ති.''

එහි අදහස මෙසේය. ''බැහැර කළ පව් ඇති කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුතුව ධ්‍යාන වඩන රහතුන් වහන්සේට යම් කලෙක හේතුප්‍රත්‍යය ධර්මයෝ ප්‍රකටව වැටහෙත් ද එකල්හී උන්වහන්සේ මරසෙනග පිඹ හරිමින්, අහස බබුළුවන්නා වූ හිරු මෙන් සිටින සේක.'' යන්නය.

වරක් අපේ බුදුහාමුදුරුවෝ ධර්මභාණ්ඩාගාරික වූ මෙන්ම තමන්වහන්සේගේ අග්‍ර උපස්ථායකයාණන් වහන්සේ වූ ආනන්ද හිමියන් අමතා දේශනා කළේ මේ ආකාරයෙන් බුදුරජාණන් වහන්සේගේ පහළ වීම අන්‍ය ආගමිකයන්ට ලැබෙන සත්කාර සම්මාන, මානන, පූජන, ගරු සැළකිලි නොලැබීමට හේතුවක් වෙන බවය. එයට හේතුව ඔවුන් එතෙක් කරමින් සිටි බොරුව ලොවට හෙළි වීමයි. එහිදී බුදුපියාණෝ දක්වා වදාළේ හිරියට හිරුදුටු කදෝපැණියන් සේ ඔවුන් ගේ බැබලීම නැතිව යන බවයි. යම් තාක් කල් හිරු නොනඟී ද ඒතාක් කල් පමණක් කදෝපැණියෝ හෙවත් කළාමැදිරියෝ බබළයි. යම්දිනෙක බුදුහු පහළ වේද එවිට තාර්කික වූ මිද්‍යා දෘෂ්ටිකයෝත් ඔවුන්ගේ ශ්‍රාවකයෝත් නිහඬවෙති.

මිසදිටුගත් ඔවුන් දුකෙන් නොමිදෙති යැයි ද තවදුරටත් අපගේ ශාස්තෲ වූ සම්මා සම්බුදු පියාණෝ අපට දේශනා කොට වදාළහ.[2]

1. විමුක්ති සුවයෙන් සුසංවේදීව

උදාන පාළියේ ලෝකවෝලෝකන සූත්‍රයට අනුව මෙසේ සම්මා සම්බුද්ධත්වයෙන් අනතුරුව සත්දිනක් මුළුල්ලේ විමුක්ති සුවයෙන් සුසංවේදීව සිටි භාග්‍යවතුන් වහන්සේ ඒ සමාධියෙන් නැගී සිට බුදු ඇසින් ලොව බලා වදාළ සේක. එවිට රාගයෙන් ද ද්වේශයෙන් ද මෝහයෙන් ද උපන් නොයෙකුත් සන්තාපයන්ගෙන් සංතාපිත වූ හෙවත් තැවෙන්නා වූ සත්වයන් දුටුසේක. එකල්හී භාග්‍යවත් වූ බුදුපියාණෝ මෙසේ වදාළ සේක.

''මේ ලෝකය (සඤ්ඤා සහිත මනස සහිත බඹයක් පමණ වූ කළේබරය හෙවත් පඤ්චස්ඛන්ධය) සන්තාපයෙන් උපන්නකි. ස්පර්ශයෙන් පීඩිත වූයේ වෙයි. රෝගයට (කයට)[3] 'තමා' යැයි කියයි. යම් යම් ආකාරයකින් මමත්වයෙන් ගනියි ද ඒ ඒ ආකාරයෙන් වෙනත් දෙයක්ම සිදුවෙයි. භවගාමී වූ ලෝක සත්වයා වෙනත් ආකාරයකටම පත්වෙයි. භවයෙන්ම පිඩිත වූයේ භවයම නැවත නැවතත් කැමති වෙයි. යමකට නැවත නැවත කැමතිවෙයි ද එයම භයකි. යමකට භයවෙයිද එයම දුකකි. භවය නැති කිරීම පිණිස ම මේ බඹසර පුරනු ලැබේ. භවයෙන්ම භවයේ මිදීමක් ඇතැයි කියන යම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ වෙත් ද ඒ සියල්ලෝම භවයෙන් නොමිදුණෝ යැයි කියමි. විභවයෙන් භවයේ නිස්සරණයක් හෙවත් නැතිවීමක් ඇතැයි කියන කිසියම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ

වෙත්ද ඒ සියල්ලෝම භවයෙන් ඉවත් නොවුවෝ යැයි කියමි. උපාදාන හේතුවෙන් මේ දුක ඇතිවෙයි. සියලු උපාදාන නැති කිරීමෙන් දුකෙහි ඇතිවීමක් නොවේ. මේ විවිධාකාර වු ලෝකය දෙස බලන්න. අවිද්‍යාවෙන් පීඩිත වු සත්වයෝ ඇතිවු දේවල් වලටම ඇලී භවයෙන් නොමිදුණෝ වෙති. යම්තාක් භවයෝ ඇත්ද ඒ හැමතැන පැතිර ඇත්තේ අනිත්‍යයයි, දුක්ඛයි වෙනස් වෙන සුළු බවයි. මෙසේ මෙය ඇති සැටියෙන් මනා ප්‍රඥාවෙන් දකින්නාගේ භවතණ්හා ප්‍රහීණ වෙයි. හෙතෙම විභවය වර්ණනා කරන්නේ ද නොවෙයි. සියලු තණ්හා ක්‍ෂය කරමින් කෙලෙස් ඉතිරි නැතිව සම්පූර්ණයෙන්ම ප්‍රහාණය කරයි ද එය නොඇලීම හා නිරෝධ නම් වු නිවන් සුවයයි. එසේ නිවුණ භික්ෂුවට උපාදාන රහිත වු බැවින් නැවත උපතක් නොවෙයි. හෙතෙම මරු මඬනා ලද්දේය. යුද්ධය දිනන ලද්දේය. සියලු භව වලින් ඉක්ම ගියේය.''[4]

ඉක්බිති බුදුපියාණන් වහන්සේ දින හතක් ඇවෑමෙන් බෝධි වෘක්‍ෂ මුලයෙන් අජපාල නුගරුක වෙත වැඩම කළහ. එතැන ද වැඩ සිටිමින් දින හතක් තිස්සේ විමුක්ති සුවයෙන් සුසංවේදී වුහ. එතැනට හුහුංකජාතික වු බ්‍රාහ්මණයෙක් පැමිණ බුදුපියාණන් වහන්සේ සමග පිළිසඳර කථා කොට ''භවත් ගෞතමයන් වහන්ස, යම් කෙනෙක් බ්‍රාහ්මණයෙක් වෙන්නේ කෙසේ ද? බ්‍රාහ්මණයෙක් වීමට හේතුවන කරුණු මොනවාද?'' යැයි විචාළේය. එවිට බුදුපියාණෝ මෙසේ වදාළහ.

''පව් බැහැර කළ, හුහුංකාරයන්ගේ පහකිරීමෙන් හුහුංකාර මානය නැති, රාගාදි කෙලෙස් කහට නැති,

සංසුන් සිත් ඇති, වේදයෙහි කෙළවරට පැමිණි, වැස නිමවූ බ්‍රහ්මචරියාව ඇති, යම් බ්‍රාහ්මණයෙක් වේද ධර්මානුකූල වූ බ්‍රහ්මවාදය ප්‍රකාශ කරයි ද හෙතෙම බ්‍රාහ්මණ යෙක් වේ'' යනුවෙනි.

(යො බ්‍රාහ්මණො බාහිතපාප ධම්මො
නිහුහුඬකකො නික්කසාවො යතත්තො
වෙදන්තගූ වුසිත බ්‍රහ්මචරියො
ධම්මේන සො බ්‍රහ්මවාදං වදෙය්‍ය
යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලෝකේ)

ඉක්බිතිව අපගේ ශාන්ති දායක වූ බුදුපියාණෝ සත් දවසක් ඇවෑමෙන් අජපාල නුගරුක් සෙවනින් මුචලින්ද රුක්මුලට වැඩම කළහ. එහි වැඩ සිටිමින් සත්දිනක් මුළුල්ලේ විමුක්ති සුවයෙන් සුසංවේදී වූහ. එකල්හී සීත සුළඟින් යුත්ත වූ අකාල මහා වැස්සක් ඇද හැළුණි. එවිට මුචලින්ද නම් නා රජු සිය භවනයෙන් නික්මී භාග්‍යවතුන් වහන්සේගේ කය සත්වරක් සිය කයින් වෙළාගෙන භාග්‍යවතුන් වහන්සේගේ හිසට මුදුනින් සිය මහත් පෙණය තබාගෙන ''භාග්‍යවතුන් වහන්සේට සීතළ හෝ උණුසුම හෝ මැසි මදුරු ආදී වූ කිසිවෙකුගෙන් හෝ අයහපතක් නොවේවා'' යන අදහසින් සිටියේය. සත් දිනක් ඇවෑමෙන් ඒ මුචලින්ද නා රජු වැසි වළාවන් පහව ගිය බව දැන සිය සිරුර වෙළුම් හැර සිය වේශය අතුරුදහන් කොට තරුණ මිනිස් වෙසක් ගෙන බුදුරජාණන් වහන්සේගේ ඉදිරියෙහි දොහොත් මුදුන් දී වැඳගෙන සිටියේය. බුදුහු එහිදී ද මෙසේ ප්‍රීති වාක්‍ය පහළ කළසේක.

''ඇසූ දහම් දකින්නාවූ සතුටින් යුත් තැනැත්තාට විවේකය සැපයකි. සතුන් කෙරෙහි සංයමයෙන් යුතුව ව්‍යාපාදයෙන් තොරව සිටින්නාට ඒ අව්‍යාපාදයම සැපයකි. ලෝකයෙහි කාමයන්ගෙන් ඉක්මී විරාගීබව ඇති කර ගැනීම සැපයකි. යමෙක් අස්මිමානය නැති කළේ ද එයම ඒකාන්තයෙන්ම උතුම්ම සැපය වේ''

(සුඛො විවේකො තුට්ඨස්ස සුතධම්මස්ස පස්සතෝ
අබ්‍යාපජ්ජං සුඛං ලෝකේ පාණභූතෙසු සංයමෝ
සුඛා විරාගතා ලෝකේ කාමානං සමතික්කමෝ
අස්මිමානසස යෝ විනයෝ එතං වෙ පරමං සුඛං)[6]

නැවත ද අපගේ බුදුපියාණන් වහන්සේ සත්දවසක් ඇවෑමෙන් මුචලින්ද රුක් මුලින් රාජායතන නම් වූ කිරිපලු රුක වෙතට වැඩම කළහ. එහිදී ද සත් දිනක් මුළුල්ලේ පර්යංකයෙන් වැඩ සිටිමින් විමුක්ති සුවයෙන් සුසංවේදී වූහ.

2. වෙළෙන්දෝ දෙදෙනෙක්
(තපස්සු භල්ලික)

මේ අතර උක්කලා නුවර සිට මාර්ගයෙහි පැමිණෙමින් සිටි තපස්සු භල්ලික යන වෙළෙන්දන් දෙදෙනාට තමන්ගේ සහලේ ඥාති වරයෙක් වූ දේවතාවෙක් මෙසේ කීය. ''පිංවතුනි, බුදුරජාණන් වහන්සේ සම්බුද්ධත්වයෙන් අභිසම්බෝධියට පත් අලුත ම මේ අසල කිරිපලු රුක මුල වැඩ වසති. යන්න ඒ භාග්‍යවතුන් වහන්සේ වෙතට අත්සුණු සහ මීපිඬුයෙන් පුදන්න. ඒ පිදීම ඔබලාට බොහෝ කාලයක් හිත සුව

පිණිසම වන්නේය.'' යනුවෙනි. අනතුරුව ඔවුහු අත්සුණු හා මීපිඩු ද ගෙන භාග්‍යවතුන් වහන්සේ වෙතට ගියෝය. එහි ගොස් වැඳ එකත් පසෙක සිටියහ. එකත් පසෙක සිටි තපස්සු හා භල්ලික වෙළෙන්දෝ දෙදෙන භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ. ''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, අපට බොහෝ කාලයක් හිතසුව පිණිස මේ අත්සුණු හා මීපිඩු පිළිගන්නා සේක්වා''. එවිට බුදුරජාණන් වහන්සේට මෙසේ සිතුණි. ''තථාගතයන් වහන්සේලා වැළඳීම සඳහා අත්වලට ආහාර පිළි නොගනිති. මම වනාහී කුමකින් අත්සුණු හා මීපිඩු පිළිගන්නේ ද ?'' එකල්හී සතර වරම් දෙවිවරු භාග්‍යවතුන් වහන්සේගේ මේ සිතුවිල්ල දැන බුදුරජාණන් වහන්සේට ශෛලමය වූ පාත්‍ර හතරක්ම රැගෙන අවුත් පිළිගැන්වූහ. බුදුපියාණෝ පාත්‍රයට අත්සුණු හා මීපිඩු පිළිගෙන වැළඳූ බවත් තදනන්තරව ඒ වෙළඳුන් දෙදෙනා භාග්‍යවතුන් වහන්සේ ද ධර්මරත්නය ද සරණ ගිය බවත් ඒ දෙදෙනා ලෝකයෙහි පළමු ද්වේවාචික උපාසකයෝ වූ බවත් (සංඝ රත්නය මේ වනවිට ලොව පහළව නොතිබුණ බැවිනි) විනය පිටකයේ මහාවග්ගයෙහි රාජායතන කථාවෙහි දැක්වේ.[7]

මෙසේ බුදුපියාණන් වහන්සේ දින හතක් මෙම රාජායතන මුලයෙහි වැඩ සිට නැවත අජපාල නුගරුක වෙතට වැඩම කළහ. සංයුත්ත නිකායේ ඉන්ද්‍රිය සංයුත්තයේ බ්‍රහ්ම සූත්‍රයට අනුව අපේ බුදුහාමුදුරුවෝ මෙම අජපාල නුගරුක් සෙවනෙහි හුදකලාව භාවනාවෙහි යෙදී සිටින විට මෙසේ අදහසක් පහළ විය. ''පඤ්ච ඉන්ද්‍රියයෝ වැඩූ කල්හී බහුල වශයෙන් වැඩූ කල්හී අමෘතය නම් වූ නිවණට ඇතුළත් වුවාහූ නිවණ

පිහිට කොට ඇත්තාහු නිවණ කෙළවර කොට ඇත්තාහු වෙති. කවර පඤ්ච ඉන්ද්‍රියයෝද? සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධි ඉන්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන මේවායි.'' මේ අවස්ථාවේ සහම්පතී නම් බ්‍රහ්මතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ මේ සිතුවිල්ල දැන භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ වැඳ නමස්කාර කොට ''එය එසේමයි ස්වාමීනි එය එසේමයි'' යනුවෙන් උදන් අනා පෙර තමන් ද කස්සප බුදුන් දවස මෙසේ මෙම පඤ්චේන්ද්‍රියයන් වැඩූ බවත් එයින් චුතව බ්‍රහ්මලෝකයෙහි උපන් බවත් ප්‍රකාශ කළේය.[8]

සංයුත්ත නිකායේම සතිපට්ඨාන සංයුත්තයේ සඳහන් වෙන බ්‍රහ්ම සූත්‍රය අනුව බුදුපියාණෝ මෙම අජපාල නුගරුක් සෙවනෙහි හුදකලාව වැඩ සිටිද්දී, මෙසේ සිතුවිල්ලක් පහළ විය. '' සත්වයන්ගේ පිරිසිදු වීම පිණිස, සෝක හැඬුම් වැළපීම් නැති කිරීම පිණිස, දුක් දොම්නස් නැති කිරීම පිණිස, අරි අටඟිමගට පිවිසීම පිණිස, නිර්වාණ ධර්මය අවබෝධකරගැනීම පිණිස මේ එකම මාර්ගයයි. එනම් සතර සතිපට්ඨානයයි. කවර සතරක් ද? කයෙහි කය අනුව බලමින් වාසය කිරීම, වින්දනයන් හි වින්දන අනුව බලමින් වාසය කිරීම, සිතෙහි සිත් අනුව බලමින් වාසය කිරීම හා ධර්මයන්හි ධර්ම අනුව බලමින් වාසය කිරීමය. මෙහිදී ද සහම්පතී බ්‍රහ්ම තෙමේ පැමිණ වැඳ නමස්කාර කොට උදන් අනා ඇති බව සඳහන් වේ.[9]

සංයුත්ත නිකායේ මාර සංයුත්තයේ තපොකම්ම සූත්‍රය අනුව එදා බුදුපියාණෝ මෙම අජපාල නුගරුක් සෙවනෙහි වැඩ සිටිද්දී, මෙසේ සිතක් ඇතිවිය. ''මම ඒකාන්තයෙන්ම ඒ දුෂ්කර කාර්‍යයෙන් මිදුණෙමි. ඒ

අනර්ථය පිණිස පවතින දුෂ්කර කායයීයෙන් මිදීම ඒකාන්තයෙන්ම ඉතාමත්ම හොඳයි. එළඹසිටි සිහියෙන් යුත්තව සිට මැනවින් බුද්ධත්වය අවබෝධ කළෙමි. එය ඉතාමත් හොඳයි'' යනුවෙනි. ඒ අවස්ථාවේ පවිටු වූ මාර තෙමේ බුදුපියාණන් වහන්සේගේ මේ සිතුවිල්ල දැන භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹුණේය. එළඹ භාග්‍යවත් වූ අපගේ බුදුරජාණන් වහන්සේට ගාථාවකින් මෙසේ කීය.

''යම් තපසකින් මනුෂ්‍යයෝ පිරිසිදු වෙත්ද ඒ තපස් කර්මයෙන් ඉවත්ව සිටින ඔබ ශුද්ධ වූයේ නොවේ. ශුද්ධමාර්ය වරදවාගෙන අශුද්ධ වූයේම ශුද්ධ යැයි හඟියි.'' යනුවෙනි.

(තපො කම්මා අපක්කම්ම යෙන සුජ්ඣන්ති මානවා අසුද්ධො මඤ්ඤසි සුද්ධෝ සුද්ධිමග්ගමපරද්ධෝති)

එවිට අපගේ තථාගත බුදුරජාණන් වහන්සේ ඒ පවිටු මාරයාම බව දැනගෙන මෙසේ වදාළහ.

''යම්කිසි අමරණීය තත්වයක් නම් වූ තපස් කර්ම වේද ඒ සියල්ල අනර්ථ සහිත බව දැන අත්හළෙමි. නැවෙහි හබල හෝ සුක්කානම මරුකතරෙහි අර්ථ රහිත වන්නාක් මෙනි. නමුත් සීලය ද සමාධියද ප්‍රඥාව ද මාර්ගය ද වඩමින් පරම විසුද්ධියට, සම්බුද්ධත්වයට, පත්වූයෙමි. මාරය දැන් තොප මඬනලද්දේ වෙයි.'' එවිට මාරයා භාග්‍යවතුන් වහන්සේ මා හඳුනා ගත්තේය. සුගතයන් වහන්සේ මා හඳුනාගත්තේ ය යැයි දුකට පත්ව දොම්නසට පත්ව එතැනින් අතුරුදහන් විය.[11]

මෙසේ අපගේ තථාගත ලොවුතුරා සම්මා සම්බුදුපියාණන් වහන්සේ දුක යනු කුමක්ද, දුකට හේතුව කුමක්ද, දුක නැති කරන්නේ කෙසේද, ඒ සඳහා වූ මාර්ගය කුමක්ද, යන මේ චතුරාර්‍ය්‍ය සත්‍යය ධර්මයන් ද ලොව සල නිසල සියල්ලෙහි ඇති හේතු ඵල සබඳතාවය මත ඇතිවෙන පැවැත්ම හා දුකෙහි ඇතිවීමත්, නැතිවීමත්, මැනවින් කියාදෙන පටිච්ච සමුප්පාදය නම් වූ ගම්භීර ඥානයත් සල නිසල සියල්ලටම සාධාරණ වූ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, යන ත්‍රිලක්ෂණ සිද්ධාන්තයත් ප්‍රමුඛව සකල විධ ඥෙයයමණ්ඩලයම අතැඹුලක් සේ ප්‍රත්‍යක්ෂ කරගනිමින් අවබෝධ කරගත්හ. ඒ අනුව කිසිම කෙනෙකුගේ උපකාරයකින් තොරව සම්බුද්ධත්වය අවබෝධ කරගත් බැවින්ම අපගේ ශාන්ති නායක බුදුපියාණෝ සම්මා සම්බුද්ධ වන සේක.

3. අජපල් රුක් සෙවනේ ගුරුවරයෙක් සොයයි

සම්මා සම්බුද්ධත්වයට පත්වීමෙන් අනතුරුව මෙසේ මෙම අජපාල නුග රුක් සෙවනෙහි ම වැඩ සිටිද්දී අපගේ බුදුපියාණන් උන්වහන්සේට ''කිසියම් කෙනෙක් ගුරු තනතුරෙහි නොතබා, උතුම් තනතුරෙහි නොතබා, සිටීම දුකසේ විසීමකි. මම ගුරුවරයා වශයෙන් සලකන්නේ කාටද?'' යනුවෙන් අදහසක් ඇතිවූ බව සංයුත්ත නිකායේ බ්‍රහ්ම සංයුත්තයේ දෙවෙනි ගාරව සූත්‍රයෙහි සඳහන් වේ.

එහිදී සීලයෙන් ද සමාධියෙන් ද ප්‍රඥාවෙන් ද විමුක්තියෙන් ද විමුක්ති ඥාණ දර්ශනයෙන් ද තමාට වඩා උසස්ම තත්වයට පත් වෙනත් කෙනෙකු මේ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ශ්‍රමණ

බ්‍රාහ්මණයන් සහිත ප්‍රජාවෙහි දෙව්මිනිසුන් සහිත මුළු තුන් ලෝකයෙහිම දැක ගැනීමට භාග්‍යවතුන් වහන්සේට නොහැකි විය. ඒ අනුව බුදුපියාණන් වහන්සේ ''යම් ධර්මයක් මා විසින් අවබෝධ කරගන්නා ලද ද ඒ ධර්මයටම මම සත්කාර කරමින් ගරු කරමින් ධර්මයම ඇසුරු කරමින් වාසය කරන්නෙමි'' (යන්නු නාහං ය්වායං ධම්මෝ මයා අභිසම්බුද්ධෝ තමේව ධම්මං සක්කත්වා ගරු කත්වා උපනිස්සාය විහරෙය්‍යන්ති.)[11] යැයි සිතූහ. මෙසේ තමන් වහන්සේ විසින් අවබෝධ කරගත් ධර්මයම තමන්ගේ ගුරුවරයා වශයෙන් සැළකීම පෙර බුදුවරුන්ගේ ද සිරිත විය. ඒ බව අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ උරුවේල වග්ගයේ ප්‍රථම උරුවේල සූත්‍රයේ ද සඳහන් වේ.[12]

4. සොයා ගත් ධර්මයේ ගැඹුර දැක

විනය පිටකයේ මහාවග්ගයේ බ්‍රහ්මායාචන කථාවෙහි ද මජ්ඣිම නිකායේ අරිය පරියේසන සූත්‍රයෙහි ද සංයුත්ත නිකායේ බ්‍රහ්ම සංයුත්තයේ පළවෙනි බ්‍රහ්මායාචන සූත්‍රයෙහි ද සඳහන් වෙන පරිදි මෙම අජපාල නුගරුක මුලදීම බුදුපියාණන් වහන්සේට තමන් වහන්සේ විසින් අවබෝධ කරගත් ඒ ධර්මය ලොවට හෙළි කිරීමට කිසියම් මන්දෝත්සාහි බවක් ඇති වූ බව සඳහන් වේ. උන්වහන්සේට එහිදී මෙබඳු සිතුවිල්ලක් ඇතිවූ බව කියති. '' මා විසින් මේ අවබෝධ කරගත්තේ ගාම්භිර වූ දැකිමට අපහසුවූ, අවබෝධ කිරිමට අපහසු වූ, ශාන්ත වූ, ප්‍රණීත වූ, තර්කයට ගොචර නොවන්නාවූ, පණ්ඩිතයන් විසින් අවබෝධ කළ යුතු වූ, ධර්මයක්. මේ සමස්ත ප්‍රජාව කාමයෙහි ඇලුණෝ වෙති.

කාමයෙහි බැසගත්තෝ වෙති. කාමයෙහි ඇලුණු, කාමයෙහිම බැසගත් ඔවුන්ට මේ ඉදප්පච්චයතාව නම් වූ පටිච්චසමුප්පාදය දැකීම අපහසුය. එසේම සියලු සංඛාරයන්ගේ සමථය වන, සියලු උපදීන්ගේ සම්පූර්ණයෙන්ම නැතිවීම වන, තණ්හක්ඛය නම් වූ විරාගය නම් වූ නිරෝධය නම් වූ නිවණ නම් වූ මෙයද දැකීම ඉතාමත්ම අපහසුය. ඉදින් මම ධර්ම දේශනා කරන්නේ නම් එය මට ද වෙහෙසකි. අන් අයට ද නො වැටහෙන්නකි. එය මට ක්ලාන්ත වීමකි, වෙහෙස ගෙන දෙන්නකි.'' යනුවෙනි.

ඒ අවස්ථාවේ දී භාග්‍යවතුන් වහන්සේට පෙර නොඇසූ විරූ වූ නැවත නැවතත් විශ්මය පළකරන්නාවූ මේ ගාථාවෝ වැටහුණහ.

''ඉතාමත් මහන්සියෙන් මා මේ ධර්මය අවබෝධ කළේ. මේ ධර්මය අන් අයට කීමෙන් ඵලක් නැහැ. රාග ද්වේශ වලින් පෙළෙන මේ ජනතාවට මේ ධර්මය අවබෝධ කරනවා කියන එක ලේසි දෙයක් නොවෙයි. මේ ධර්මය උඩුගම් බලා යන එකක්. ඉතාමත්ම සියුම් වූ මෙන්ම ගැඹුරු වුත් කීමට දුෂ්කර වුත් එකකි. අවිද්‍යා අන්ධකාරයෙන් වැසුණු රාගයෙන් ඇලුණු මේ සත්වයෝ මේ ධර්මය අවබෝධ කරන්නේ නෑ.'' යනුවෙනි.

(කිච්ජේන මේ අධිගතං හලන්දානි පකාසිතුං
රාගදොසපරෙතෙහි නායං ධම්මෝ සුසම්බුධො.
පටිසොතගාමිං නිපුණං ගම්භීරං දුද්දසං අණුං
රාගරත්තා න දක්ඛින්ති තමොක්ඛන්ධෙන ආවටා)

මේ අවස්ථාවේ දී සහම්පතී බ්‍රහ්ම තෙමේ මෙය

දැක බ්‍රහ්ම ලෝකයෙන් නික්ම බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ සිය උත්තරාසඞ්ගය හෙවත් උතුරු සළුව ඒකාංස කරගෙන මහත් ගෞරවයෙන් දකුණු දණ මඬල පොළොවට තබා ඇඳිලි බැඳගෙන ''පින්වත් භාග්‍යවතුන් වහන්ස අල්ප වූ රජස් හෙවත් කෙලෙස් ඇතිසත්වයෝ ලොව සිටින බැවින් ඒ අයට දහම් දෙසන සේක්වා ඔවුහු දහම් නො ඇසීමෙන් පිරිහෙති.'' යැයි කියා දහම් දෙසන ලෙස ආරාධනා කළ බවත් ඒ අනුව බුදුපියාණෝ සත්වයන් කෙරෙහි කරුණාවෙන් ලොව දෙස බැලූ බවත් එහිදී උන්වහන්සේට මේ ලෝකය මහනෙල් නෙළුම් හෝ සුදු නෙළුම් විලක් මෙන් පෙනුන බවත් සඳහන් වේ. එම නෙළුම් විලෙහි සමහර නෙළුම් දිය මතු පිටට පැමිණ නැත. ඇතැම් නෙළුම් දිය හා සමව සිටිත්, ඇතැම් නෙළුම් දියෙන් මතු පිටට පැමිණ දියෙහි නොතැවරී සිටිත්. ඒ ආකාරයෙන්ම සත්වයන්ගේ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන්ගේ වැඩීමේ අඩු වැඩි කම් ද දුටුසේක. ඒ අනුව දහම් දෙසීමට තීරණය කළ බව විනය මහාවග්ගයේ බ්‍රහ්මායාචන කථාවේ සහ මජ්ඣිම නිකායේ අරිය පරියේසන සූත්‍රයේ ද සඳහන් වේ.

විනය පිටකයේ මහාවග්ගයට අනුව අපගේ තථාගත බුදුපියාණන් වහන්සේ අනතුරුව ප්‍රථමයෙන්ම ධර්මය දේශනා කරන්නේ කවරෙකුට දැයි සිතා ඉතාමත්ම ඉක්මණින් මේ ධර්මය තේරුම් ගැනීමේ හැකියාව ආළාර කාලාමයන්ට ඇතැයි සිතා ඔහුට ධර්ම දේශනා කළ යුතුයැයි කල්පනා කොට ඔහු ගැන සොයා බැලුහ. හෙතෙම එයට දින හතකට පෙර කළුරිය කොට තිබුණි. අනතුරුව එසේනම් උද්දක රාමපුත්‍රයන් මේ ධර්මය ඉතා ඉක්මණින් වටහා ගනියි යැයි සිතා උද්දක රාම පුත්‍රහට ප්‍රථමයෙන්ම ධර්ම දේශනා කළ යුතු යැයි

සිතූහ. හෙතෙම ගැන සොයා බැලීමේදී එක්තරා දේවතාවෙක් 'ස්වාමීනි උද්දක රාම පුත් තෙමේ ඊ මැදියම කළුරිය කළේය' යැයි කීවේය. අනතුරුව පස්වග තවුසන්ට දහම් දෙසීමට අදහස් කොට බුදුරජාණන් වහන්සේ ඔවුහු දැන් වාසය කරන්නේ මොන ස්ථානයේ දැයි සොයා බලා බරණැස මිගදාය නම් වු ඉසිපතනයේ බව දැනගෙන උරුවෙල් දනව්වෙන් පිටත්ව බරණැස ඉසිපතනයේ මිගදාය නම් වූ ස්ථානයට වැඩම කළ සේක.

5. උපක ආජීවකගේ හමුවීම

අපගේ තථාගත සම්මා සම්බුදුපියාණන් වහන්සේට මේ බරණැස ඉසිපතනය කරා වඩින ගමනේ දී ගයාවටත් බෝධියටත් අතර දී උපක නම් ආජීවකයෙක් හමුවූ බව ද හෙතෙම බුදුපියාණන්ගේ ඉන්ද්‍රියයන්ගේ මනා ප්‍රසන්න බව හා පවිත්‍ර වූ පිරිසිදු වූ ඡවි වර්ණය ද දැක ''ඇවැත්නි, ඔබ කවුරුන් උදෙසා පැවිදි වූ කෙනෙක් ද ඔබේ ගුරුවරයා කවරෙක් ද ඔබ කැමත්ත දක්වන්නේ කවුරුන්ගේ ධර්මයට ද'' යැයි විමසුවේය. එවිට බුදුහු මෙසේ දේශනා කළහ.

1. ''මම සියලු අකුසල් මැඬලූ කෙනෙක්මී. සියල්ල අවබෝධ කළ කෙනෙක්මී. කිසිම දෙයකට නොඇලුණ කෙනෙක්මී. සියල්ල අත්හළ කෙනෙක්මී. තණ්හාව ක්‍ෂය කොට විමුක්තියට පත් වූ කෙනෙක්මී. මා තුළ ඇති වූ අවබෝධඥාණයෙන් සියල්ල දැනගත් මම කවර ගුරුවරයෙක් නම් සොයන්නද?

2. ''මට ගුරුවරයෙක් නැත. මා හා සමාන කෙනෙකුත්

නැත. දෙවියන් සහිත වූ මේ ලෝකයේ මට සමාන කෙනෙක් සොයාගන්නත් නොහැක.

3. ''මම ලෝකයේ අරහත්භාවයට පත් කෙනා වෙමි. මම අනුත්තර වූ ශාස්තෲන් වහන්සේ වෙමි. ලෝකයේ එකම සම්මා සම්බුදුවරයාණෝ මමය. මම සිසිල් භාවයට පත්වුයෙමි. නිවුණෙමි.

4. ''ධම්මචක්කය පැවැත්වීම සඳහා කසීපුරයට යමි. අවිද්‍යාවෙන් අන්ධ වූ ලෝකය තුළ අමා බෙරය වයන්නට යන්නෙමි.''

මෙසේ වදාළ කළ උපක ආජීවක තෙමේ ''ආයුෂ්මතුනි, ඔබ ඔය කියන්නේ අනන්ත ජින කෙනෙක් ගැන ද?'' යැයි ඇසුවේය. එවිට බුදුහු

5. ''ඔව් යම් කෙනෙක් සියලු ආශ්‍රවයන් ක්‍ෂය කරලා උතුම් නිවණට පත්වුයේ ද එවැනි මා වැනි කෙනෙකුට තමයි ජින කියලා කියන්නේ. මං සියලු පාපයන් ජයගත්තා. ඒ නිසා උපක මම තමයි ජින කියන්නේ.'' යැයි දේශනා කළහ.

අපේ බුදුහාමුදුරුවෝ මේ ආකාරයෙන් උපකට පැවසු කල්හී උපක තෙමේ ''ආ එහෙම වෙන්නත් පුළුවනි'' කියා ඔළුවත් සොලවමින් වෙනත් මඟකින් යන්නට ගියේය.(සසරේ භයානක බව නේද? බුදුකෙනෙක් හමුවුවත් ධර්මයෙන් සැනසෙන්න, නිවණ සාක්‍ෂාත් කරගන්න අවස්ථාව නොලැබුණ හැටි!).

මජ්ඣිම නිකායේ අරිය පරියේසන සූත්‍රයට

අනුවත් විනය පිටකයේ මහා වග්ගයට අනුවත් අපේ බුදුහාමුදුරුවෝ ඉන් අනතුරුව පිළිවෙලින් බරණැස ඉසිපතනයේ මිගදායට වැඩම කොට තමන් වහන්සේගේ සම්මා සම්බුද්ධත්වයෙන් දෙමසක් ගත වෙද්දී ඇසළ පුන් පොහෝ දා බරණැස ඉසිපතනයේ මිගදායේදී කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම සහ අස්සජී යන පස්වග තවුසන්ට ප්‍රථම ධර්ම දේශනය වූ ධම්ම චක්ක පවත්තන සූත්‍රය දේශනා කොට තමන් වහන්සේ විසින් අවබෝධ කළ ඒ ශ්‍රී සද්ධර්මය ප්‍රථමයෙන්ම ලොවට හෙළි කොට වදාළහ.

6. ප්‍රථම ධර්ම දේශනය

අපේ බුදුහාමුදුරුවෝ එදා ඇසළ පුන් පොහෝදා බරණැස ඉසිපතනයේ මිගදායේදී පස්වග මහණුන් වහන්සේලාට ප්‍රථමයෙන්ම ධර්මදේශනා කරමින් මේ ලෝකේ අන්ත දෙකක් ඇති බවත් ඒ අන්ත දෙකම ඉවත් කළ යුතු බවත් ඒ දෙක ඉවත් කොට මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කළ යුතු බවත් දේශනා කළේ ''ද්වේ මේ භික්ඛවේ අන්තා පබ්බජිතෙන න සේවිතබ්බා'' යනාදි වශයෙන් දේශනා කරමිනි. මේ බ්‍රහ්මස්වරය මිහි තලය පමණක් නොව දස දහසක් සක්වල ප්‍රකම්පිත කරන්නක් වූ බවත්, ලොවෙහි අප්‍රමාණ වූ උදාර වූ උළාර වූ ආලෝකයක් පහළ වූ බවත්, මෙම සූත්‍රදේශනයේම අවසානයට සඳහන් වෙයි.

සම්මා සම්බුද්ධත්වයට පත්වීමත් සමගම අපගේ සම්බුදුපියාණන් වහන්සේට දස බල ඤාණ පහළ විය. ඒ දස බල යනු මොනවාදැයි දැනගැනීම ද අත්‍යවශ්‍යයි. බුදුපියාණෝ මජ්ඣිම නිකායේ මහා සීහනාද සූත්‍රයේ[13]

සැරියුත් මහ රහතන් වහන්සේ අමතා එම දස බල මොනවාදැයි දේශනා කොට වදාළහ. දස බලධාරී බුදු කෙනෙක් ලොව පහළ වන්නේ ඉතාමත්ම කලාතුරකිනි.

7. අපේ බුදුහාමුදුරුවෝ දසබල ධාරී වන සේක

දසබල

1. බුදුපියාණෝ සිදුවිය හැකි දේ සිදුවිය හැකි දේ හැටියටත් සිදු නොවිය හැකි දේ සිදුනොවිය හැකි දේ හැටියටත් ඒ ආකාරයෙන්ම දන්නා සේක. එය තථාගත බලයකි. මේ සිදුවිය හැකි දේ හා සිදුනොවිය හැකි දේ යනු කුමක්ද යන්න ද බුදුපියාණන් වහන්සේ විසින්ම මජ්ඣිම නිකායේ බහුධාතුක සූත්‍රයෙහි ආනන්ද හිමියන්හට මෙසේ දක්වා වදාළහ.[14]

''ආනන්ද දිට්ඨිසම්පන්න පුද්ගලයා හෙවත් සෝවාන් තත්වයට පත්වූ පුද්ගලයා කිසියම් සංස්කාරයක් හෙවත් ඇතිවෙන නැතිවෙන දෙයක්, තවත් දෙයක් නිසා පවතින දෙයක්, නිත්‍ය වශයෙන් සදාකාලික වශයෙන් ගන්නේ යැයි කියයි ද එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් පෘතග්ජන පුද්ගලයා සංස්කාර නිත්‍ය වශයෙන් ගන්නේ යැයි කියයි ද එය සිදුවිය හැකි දෙයකි.

''යම් සෝතාපන්න පුද්ගලයෙක් සංස්කාර සැප ලෙස සලකන්නේ යැයි කියයි ද එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් පෘතග්ජන පුද්ගලයා සංස්කාර සැපලෙස සලකන්නේ යැයි ද එය සිදුවිය හැකි දෙයකි.

''සෝතාපන්න පුද්ගලයා කිසියම් දෙයක් ආත්ම වශයෙන් ගන්නේ යැයි කියයි ද එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් පෘතග්ජන පුද්ගලයා යම් දෙයක් ආත්ම වශයෙන් ගනියි යැයි කියයි ද එය සිදුවිය හැකි දෙයකි.

''සෝතාපන්න පුද්ගලයෙක් මවගේ ජීවිතය නැති කරන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැක. එහෙත් පෘතග්ජන පුද්ගලයා මවගේ ජීවිතය නැති කරන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''සෝතාපන්න පුද්ගලයෙක් පියාගේ ජීවිතය නැති කරන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් පෘතග්ජන පුද්ගලයෙක් පියාගේ ජීවිතය නැති කරන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''සෝතාපන්න පුද්ගලයෙක් රහතන් වහන්සේ කෙනෙකුගේ ජීවිතය නැති කරන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් පෘතග්ජන පුද්ගලයෙක් රහතන් වහන්සේ කෙනෙකුගේ ජීවිතය නැති කරන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''සෝතාපන්න පුද්ගලයෙක් බුදු කෙනෙකුගේ ලේ සොලවන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් පෘතග්ජන පුද්ගලයෙක් බුදුකෙනෙකුගේ ලේ සොලවන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''සෝතාපන්න පුද්ගලයෙක් සංඝයා භේද

කරන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් පෘතග්ජන පුද්ගලයෙක් සංඝයා භේද කරන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''සෝතාපන්න පුද්ගලයෙක් වෙනත් ශාස්තෘන් වහන්සේ කෙනෙක් තම ශාස්තෘවරයා ලෙස සලකන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් පෘතග්ජන පුද්ගලයෙක් වෙනත් ශාස්තෘන් වහන්සේ කෙනෙක් තම ශාස්තෘන් වහන්සේ ලෙස සලකන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''එකම ලෝක ධාතුවක එකම කාලයක සම්මා සම්බුදුරජාණන් වහන්සේලා දෙනමක් උපත ලබති යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් එක් ලෝක ධාතුවක එක් කාලයක එක් සම්මා සම්බුදු රජාණන් වහන්සේ කෙනෙක් පමණක් උපත ලබති යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''එකම ලෝක ධාතුවක එකම කාලයක සක්විති රජවරු දෙදෙනෙක් උපත ලබති යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැක. එහෙත් එක් ලෝක ධාතුවක එක් කාලයක එක් සක්විති රජකෙනෙක් පමණක් උපත ලබති යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''යම් හෙයකින් ස්ත්‍රියක් අරහත් සම්මා සම්බුද්ධ වන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් යම් පුරුෂයෙක් අරහත් සම්මා සම්බුද්ධ වන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''යම් හෙයකින් ස්ත්‍රියක් සක්විති රජ වන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් යම් පුරුෂයෙක් සක්විති රජ වන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''යම් හෙයකින් ස්ත්‍රියක් සක්‍රයා (දෙවියන්ගේ ප්‍රධානියා) වන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් යම් පුරුෂයෙක් සක්‍රයා වන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''යම් හෙයකින් ස්ත්‍රියක් මාරයා බවට පත් වන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් යම් පුරුෂයෙක් මාරයා බවට වන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''යම් හෙයකින් ස්ත්‍රියක් බ්‍රහ්මයා බවට පත් වන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් යම් පුරුෂයෙක් බ්‍රහ්මයා බවට පත් වන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''යම් හෙයකින් කාය දුෂ්චරිතයාට සැප විපාක ලැබෙන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් කාය දුෂ්චරිතයාට දුක් සහිත විපාක ලැබෙන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''යම් හෙයකින් වචී දුෂ්චරිතයාට සැප විපාක ලැබෙන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් වචී දුෂ්චරිතයාට දුක් සහිත විපාක ලැබෙන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''යම් හෙයකින් මනෝ දුෂ්චරිතයාට සැප විපාක ලැබෙන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් මනෝ දුෂ්චරිතයාට දුක් සහිත විපාක ලැබෙන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''යම් හෙයකින් කාය සුචරිතයාට දුක් විපාක ලැබෙන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් කාය සුචරිතයාට සැප විපාක ලැබෙන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''යම් හෙයකින් වචී සුචරිතයාට දුක් විපාක ලැබෙන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් වචී සුචරිතයාට සැප විපාක ලැබෙන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''යම් හෙයකින් මනෝ සුචරිතයාට දුක් සහිත විපාක ලැබෙන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් මනෝ සුචරිතයාට සැප සහිත විපාක ලැබෙන්නේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''යම් හෙයකින් කාය දුෂ්චරිත පුද්ගලයා ඒ හේතුවෙන් සුගති ගාමී වේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් කාය දුෂ්චරිතයා ඒ හේතුවෙන් අපායගාමී වේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''යම් හෙයකින් වචී දුෂ්චරිත පුද්ගලයා ඒ හේතුවෙන් සුගති ගාමී වේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් වචී දුෂ්චරිතයා ඒ හේතුවෙන් අපායගාමී වේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''යම් හෙයකින් මනෝ දුෂ්චරිත පුද්ගලයා ඒ හේතුවෙන් සුගති ගාමී වේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් මනෝ දුෂ්චරිතයා ඒ හේතුවෙන් අපායගාමී වේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''යම් හෙයකින් කාය සුචරිත පුද්ගලයා ඒ හේතුවෙන් අපායගාමී වේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් කාය සුචරිතයා ඒ හේතුවෙන් සුගතිගාමී වේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''යම් හෙයකින් වචී සුචරිත පුද්ගලයා ඒ හේතුවෙන් අපායගාමී වේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් වචී සුචරිතයා ඒ හේතුවෙන් සුගතිගාමී වේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි.

''යම් හෙයකින් මනෝ සුචරිත පුද්ගලයා ඒ හේතුවෙන් අපායගාමී වේ යැයි කියන්නේ නම් එය සිදුවිය නොහැකි දෙයකි. එහෙත් මනෝ සුචරිතයා ඒ හේතුවෙන් සුගතිගාමී වේ යැයි කියන්නේ නම් එය සිදුවිය හැකි දෙයකි'' යනුවෙනි. (මෙම කරුණු අංගුත්තර නිකායේ ඒකක නිපාතයේ අට්ඨාන පාළියේ පිළිවෙලින් සූත්‍ර දේශනා විසි අටක සඳහන් වේ).

2. අතීත අනාගත වර්තමාන කාලයන්ට අයත්ව කරන ඒ ඒ කර්මයන්ට ලැබෙන විපාක, හේතු වශයෙන් ද ස්ථාන වශයෙන් ද ඒ ඒ ආකාරයෙන්ම යථාර්ථ වශයෙන්ම අවබෝධයක් තථාගතයන් වහන්සේට ඇති සේක. එය තථාගත බලයකි.

3. ඕනෑම ආකාරයේ උපතක් කරා යෑමට හේතුවෙන සෑම වැඩ පිළිවෙලක් ගැනම තථාගතයන් වහන්සේට පරිපූර්ණ අවබෝධයක් ඇති සේක.එය තථාගත බලයකි.

4. නා නා ආකාරයෙන් නානා ස්වභාවයෙන් යුත් මේ ලෝකය ගැන තථාගතයන් වහන්සේට පරිපූර්ණ වූ අවබෝධයක් ඇති සේක. එය තථාගත බලයකි. (අපේ බුදුහාමුදුරුවෝ ලෝක විදූ හෙවත් ලෝකය ගැන පරිපූර්ණ වශයෙන්ම දැනගෙන මේ තුන් ලෝකයෙන්ම මිදුන උතුමාණන් වහන්සේය. බුදුරජාණන් වහන්සේ තුන් ලෝවටම ගුරුවරයාය, ''තිලෝගුරු''. තිලොව යනු කාම ලෝක, රූප ලෝක සහ අරූප ලෝක යන ලෝක තුනයි. උන්වහන්සේ කථා කළේ දහස් ගණන් චක්‍රවාට ගැනය. අංගුත්තර නිකායේ ආනන්ද වර්ගයේ සඳහන් පරිදි සහස්සී ලෝක ධාතු, ද්විසහස්සී ලෝක ධාතු හා තිසහස්සී ලෝක ධාතු ගැන උන්වහන්සේ කළ විවරණය ලොව වෙනත් කිසිම කෙනෙකුට මේ තාක් සිතා ගන්නටවත් බැරි වූ දෙයකි).

5. විවිධ වූ ජීවිතවල මේ සත්වයන් විවිධාකාරයෙන් සකස් වෙවී යන ආකාරය ගැන තථාගතයන් වහන්සේට පරිපූර්ණ වූ අවබෝධයක් ඇති සේක. එය තථාගත බලයකි.

6. ඕනෑම සත්වයෙකුගේ ඕනෑම පුද්ගලයෙකුගේ ජීවිතයෙහි අභ්‍යන්තරයේ සැඟවී ඇති හැබෑ හැකියාවන් දියුණු වෙන හැටි සහ පිරිහෙන හැටි පිළිබඳව හෙවත් ඒ ඒ පුද්ගලයන්ගේ ඒ ඒ ඉන්ද්‍රියයන් වැඩී ඇති ආකාරය හෝ නොවැඩී ඇති ආකාරය ඒ අයුරින්ම පරිපූර්ණ වශයෙන්ම දැකීමේ හැකියාව තථාගතයන් වහන්සේට ඇති සේක. එය තථාගත බලයකි.

7. ධ්‍යාන ගැන, හිත කෙලෙස්වලින් නිදහස් කරගන්න ක්‍රම ගැන, සමාධි ගැන, සමාපත්ති ගැන, ඒවායේ ඇති විවිධතාවයන් ගැන ඒවායින් පිරිහෙන හැටි ගැන, ඒවා පිරිසිදු කරගන්නේ කෙසේ ද යන්න ගැන, ඒ ඒ සමාපත්ති වලින් නැගී සිටීම ගැන ද තථාගතයන් වහන්සේට පරිපූර්ණ වූ අවබෝධයක් ඇති සේක. එය තථාගත බලයකි.

8. තමන් වහන්සේ කලින් ගතකළ අනේක වූ ජීවිත සිය ගණන් දහස් ගණන්, ලක්ෂ ගණන්, කෝටි ගණන් හෝ කල්ප ගණන්, වුවද තමන් වහන්සේට කැමති තාක් ප්‍රමාණයක් සිහි කිරීමට තථාගතයන් වහන්සේට හැකියාව ඇති සේක. එය තථාගත බලයකි.

9. මෙලොව ජීවත් වෙන විවිධ සත්වයන් මියගොස් තවත් ලෝකයක ඉපදෙන ආකාරය ද වෙනත් ලෝක වලින් සත්වයන් මිය ගොස් මෙලොවට පැමිණෙන ආකාරය ද දැකීමේ හැකියාව වූ සාමාන්‍ය මිනිස් හැකියාවන් ඉක්මවා ගිය ඉතාම පිරිසිදු වූ දිව්‍ය නේත්‍ර ඥාණයක් තථාගතයන් වහන්සේට ඇති සේක. එය තථාගත බලයකි.

10. සියලුම ආශ්‍රව ධර්මයන් නැති කරමින් ආශ්‍රව රහිතව මේ ජීවිතයේ දීම ඒ චිත්ත විමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් තමන්ගේම ඉතා බලවත් ව දියුණු කළ ඥාණයෙන් අවබෝධ කරගෙන එය සාත් ක්ෂාත් කරගෙන සිටින බැවින්ම එය ද තථාගතයන් වහන්සේගේ බලයකි.

මේ අපේ බුදුහාමුදුරුවන් වහන්සේගේ දසබලයන්ය.

8 අපේ බුදුහාමුදුරුවෝ විසාරද ඤාණ හතරකින් යුක්ත වන සේක

අපේ බුදුහාමුදුරුවෝ වෙනත් කිසිම කෙනෙකුට නැති මහා විශාරද ඤාණ හතරකින් ද යුක්ත වනසේක. මෙම විසාරද ඤාණ හතරකින් සමන්විත වන නිසාම උන්වහන්සේ ඕනෑම තැනකට අභීතව වැඩම කොට ලෝකයේ ඕනෑම පිරිසකට නිර්භීතව, නොපැකිලව, කතා කිරීමට මහා පුදුම වූ නොසැලෙන ආත්මශක්තියකින් යුක්තව වැඩ සිටිසේක. මජ්ඣිම නිකායේ මහා සීහනාද සූත්‍රයෙහිම සඳහන් වන ආකාරයට ඒ විසාරද ඤාණ හතර මෙසේය.

1. අපි බුදුපියාණන් වහන්සේගේ මුවින්ම අසමු. ''සාරිපුත්ත යම් කෙනෙක් කියනවා නම් 'ඔබ වහන්සේ මේ... සම්මා සම්බුද්ධයි කියලා කියනවා, නමුත් ඔබවහන්සේ මේ මේ ආශ්‍රවයන් තාම ප්‍රහාණය කරලා නැහැ නේද?' කියලා. මේ ලෝකේ කිසිම ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ කිසිම කෙනෙකුට සම්මා සම්බුද්ධත්වය උදෙසා ධර්මානුකූලව කරුණු සහිතව

එවැනි කිසිම අභියෝගයක් කරන්න බැහැ. එසේ චෝදනාවක් කිරීමට තරම් අල්ප මාත්‍ර වූ නිමිත්තක් වත් මම දකින්නේ නැහැ. මේ නිසාම සාරිපුත්ත මම නිදහස් සිතින් යුක්තව, කිසිම බියකින් තොරව විශාරදත්වයට පත්ව වාසය කරමි.'' ඒ පළමුවෙනි විශාරද භාවයයි, විශාරද ඤාණයයි.

2. ''යම් කෙනෙක් කියනවා නම්, 'ඔබ වහන්සේ ක්ෂීණාශ්‍රවයන් වහන්සේ කෙනෙක් හෙවත් සියලු ආශ්‍රවයන් නැති කළ රහතන් වහන්සේ කෙනෙක් කියලා කියනවා, ඒත් ඔබ වහන්සේ තුළ මේ මේ ආශ්‍රවයන් තාමත් ප්‍රහාණය වෙලා නෑනේ' කියලා. මේ ලෝකේ කිසිම ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ කිසිම කෙනෙකුට අරහත්වය උදෙසා ධර්මානුකූලව කරුණු සහිතව එවැනි කිසිම අභියෝගයක් කරන්න බැහැ. එසේ චෝදනාවක් කිරීමට තරම් අල්ප මාත්‍ර වූ නිමිත්තක් වත් මම දකින්නේ නැහැ. මේ නිසාම සාරිපුත්ත මම නිදහස් සිතින් යුක්තව, කිසිම බියකින් තොරව විශාරදත්වයට පත්ව වාසය කරමි.'' ඒ දෙවෙනි විශාරද භාවයයි, විශාරද ඤාණයයි.

3. ''යම් කෙනෙක් කියනවා නම් 'ඔබවහන්සේ ප්‍රකාශ කරනවා ධර්මාවබෝධය කරන කෙනෙකුට මේ මේ දේවල් අනතුරුදායකයි කියල. ඒත් ඒ දේවල් කළාට කිසිම අනතුරුදායක බවක් නැහැ නේ' කියලා. මේ ලෝකේ කිසිම ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ කිසිම කෙනෙකුට ධර්මානුකූලව කරුණු සහිතව එවැනි

කිසිම අභියෝගයක් කරන්න බැහැ. එසේ චෝදනාවක් කිරීමට තරම් අල්ප මාත්‍ර වූ නිමිත්තක් වත් මම දකින්නේ නැහැ. මේ නිසාම සාරිපුත්ත මම නිදහස් සිතින් යුක්තව, කිසිම බියකින් තොරව විශාරදත්වයට පත්ව වාසය කරමි.'' ඒ තුන්වෙනි විශාරද භාවයයි, විශාරද ඤාණයයි.

4. ''යම් ඉලක්කයක් සඳහා නම් ධර්මය දේශනා කරලා තියෙන්නේ 'එසේ දේසනා කරනලද ධර්මයට අනුව පිළිපදින තැනැත්තාගේ දුක් කෙළවර කිරීමට එය මැනවින් උපකාර වෙන්නේ නැහැ. ඒ ඉලක්කය කරා යන්නේ නැහැ.' කියලා මේ ලෝකේ කිසිම ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ කිසිම කෙනෙකුට ධර්මානුකූලව කරුණු සහිතව එවැනි කිසිම අභියෝගයක් කරන්න බැහැ. එසේ චෝදනාවක් කිරීමට තරම් අල්ප මාත්‍ර වූ නිමිත්තක් වත් මම දකින්නේ නැහැ. මේ නිසාම සාරිපුත්ත මම නිදහස් සිතින් යුක්තව, කිසිම බියකින් තොරව විශාරදත්වයට පත්ව වාසය කරමි.'' ඒ හතරවෙනි විශාරද භාවයයි, විශාරද ඤාණයයි.

මේ පිළිබඳව අපේ බුදුහාමුදුරුවෝ මේ මහා සීහනාද සූත්‍රයේම දේශනා කරනවා මෙන්න මෙහෙම. ''සාරිපුත්ත මේ ලෝකයේ පිරිස් අටක් ඉන්නවා. කවුද ඒ පිරිස් අට?

1. රජ කුලයේ පිරිස
2. බමුණු කුලයේ පිරිස
3. ගෘහපති පිරිස
4. ශ්‍රමණ පිරිස

5. චාතුම්මහාරාජික දෙව් පිරිස
6. තාවතිංස දෙව් පිරිස
7. මාර පිරිස
8. බ්‍රහ්ම පිරිස.

''පින්වත් සාරිපුත්ත, මේ තමයි ඒ පිරිස් අට. මේ විශාරද ඥාණ හතරෙන් යුක්ත වූ තථාගතයන් වහන්සේ ඔය අට පිරිස වෙතටම එළඹෙනවා, ඔවුන් අතරට පිවිසෙනවා. 'මට මතකයි නොයෙක් සිය ගණන් බමුණු කුලයේ පිරිස් ළගට මම ගිහින් තියෙනවා, ගෘහපති පිරිස් ළගට ගිහින් තියෙනවා, ශ්‍රමණ පිරිස් ළගට ගිහින් තියෙනවා, චාතුම්මහාරාජික දෙව් පිරිස් ළගට ගිහින් තියෙනවා, තව්තිසා වැසි දෙව් පිරිස් ළගට ගිහින් තියෙනවා, මාර පිරිස් ළඟට ගිහින් තියෙනවා, බ්‍රහ්ම පිරිස් ළඟට ගිහින් තියෙනවා, එහිදී ඒ ඒ පිරිස් අතර මං වාඩිවෙලත් ඉන්නවා, කතා බහත් කරනවා, සාකච්ජාත් කරලා තියෙනවා, නමුත් එහිදී මට කිසිම විදියේ භයක්වත්, තැති ගැනීමක් වත්, ඇතිවෙලා නැහැ. ඒ සඳහා අල්පමාත්‍රයක නිමිත්තක් වත් ඇතිවෙලා තිබුණ බව මම දකින්නේ නැහැ.' එවැනි නිමිත්තක් වත් නොදකින නිසාම සාරිපුත්ත මම නිදහස් සිතින් යුක්තව, කිසිම බියකින් තොරව විශාරදත්වයට පත් වෙලයි වාසය කරන්නේ.''[15]

9. ලොව පහළ වූ ආශ්චර්යවත් ම මනුෂ්‍යයා අපේ බුදුහාමුදුරුවෝ

අපේ බුදුහාමුදුරුවෝ මිනිසෙක් වශයෙන් ඉපදී මිනිසෙක් වශයෙන් වින්ද යුතු සැප හා දුක් විද මිනිස් සිත උපරිතලයටම දියුණු කරමින් සියලු දුක් වලින් නිදහස්ව උතුම් මිනිසෙක් වශයෙන් හෙවත් ආශ්චර්යවත් මනුෂ්‍යයෙක් වශයෙන් ලොව කිසිම දෙයකට නො ඇලී කිසිම දෙයකින් නොගැටී පල් ගඳ ගහන, මඬගඳ ගහන, ජලයෙහි නොතැවරී පියුම් විලෙක, ජලයෙන් මතුපිටට පත් සුපිපි පියුමක් සේ, නෙළුම් මලක් සේ, මේ මිනිස් සමාජය නැමති මඬ වතුරෙහි ඉපිද ජීවත් වී පන්සාළිස් වසක් දෙව් මිනිසුන්ට දහම් දෙසා, අසූ වැනි වියේදී නැවත කිසිමදාක කිසිම තැනක නොඉපදෙන සේ මහා පරිනිර්වාණයෙන් පිරිනිවන් පා වදාළ සේක.

ඒ ආශ්චර්යවත්ම වූ මනුෂ්‍ය රත්නයේ, මෙලොව පහළ වූ උතුම්ම මිනිසාගේ, මිනිස් ගුණ සමුදාය අනන්තයි අප්‍රමාණයි. එහෙත් මිනිසෙක් වුවද තමන් වහන්සේ සාමාන්‍ය මනුෂ්‍යයෙක් ද නොව ආශ්චර්යත්වයට පත් මනුෂ්‍යයෙක් බව දිනක් ද්‍රෝණ නම් එක්තරා බ්‍රාහ්මණයෙකුට අපගේ බුදුරජාණන් වහන්සේ විසින්ම දේශනා කොට වදාළහ.

එදා බුදුපියාණෝ උක්කට්ඨා සහ සේතව්‍යා යන නගර දෙක අතර පා ගමනින් වැඩම කරමින් සිටියහ. ඒ අවස්ථාවේ පියසටහන් කියවීමේ දක්ෂ වූ ද්‍රෝණ නමැති බ්‍රාහ්මණ තෙමේ ද ඒ මාර්ගයේම ඒ දිසාවටම තමන් වහන්සේ පිටුපසින් ගමන් කරමින් සිටිද්දී බුදුරජාණන්

වහන්සේගේ පිය සටහන් දැක මවිතයට පත්විය. ''ආ...මොනවා, මේ පියසටහන් වෙනස්. මෙවැනි පියසටහන් නම් කවදාවත්ම දැකලා නෑ. මේවා මනුෂ්‍යයෙකුගේ පියසටහන් වගේ තිබුණත්... හරිම වෙනස්. හැඩහුරුව නම් මනුෂ්‍යයෙකු ගේ වගේම තමයි. ඒත්... මේවා නම් ඒකාන්තයෙන්ම සාමාන්‍ය මනුෂ්‍යයෙකුගේ පිය සටහන් නොවෙයි.'' යනුවෙන් සිතා හෙතෙම ඒ පිය සටහන් ඔස්සේ ඉදිරියටම ගියේ මේ අසහාය මනුෂ්‍යයා දැකගැනීමටය. මේ වනවිට අපේ බුදුහාමුදුරුවෝ, තථාගත ලොවුතුරා බුදුපියාණෝ, ඒ මඟින් ඉවත්ව ගසක් මුල තම සඟල සිවුර මත බද්ධ පර්යඞ්කයෙන් යුතුව විවේක සුවයෙන් වැඩ සිටියහ. අතිශයින්ම ශාන්තව, ලෝකයේ සුදාන්තම, සුසංවරම සුශික්ෂිතම ඉදුරන් ඇති අපේ බුදුහාමුදුරුවෝ එසේ වැඩ සිටිද්දී එහි පැමිණි බමුණු තෙමේ උන්වහන්සේ දැක උන්වහන්සේ සමීපයට පැමිණ කරුණු විචාළේය. එහිදී මෙසේ සංවාදයක් ඇතිවිය.

බමුණා : පින්වත ඔබ දෙවියෙක්ද?
බුදුහු : බමුණ මම දෙවියෙක් නොවෙමි.
බමුණා : එසේනම් ඔබ ගාන්ධර්වයෙක් ද?
බුදුහු : බමුණ මම ගාන්ධර්වයෙක් ද නොවෙමි.
බමුණා : එසේ නම් ඔබ යක්ෂයෙක් ද ?
බුදුහූ : බමුණ මම යක්ෂයෙක් ද නොවෙමි.
බමුණා : ආ...එසේනම් ඔබ මනුෂ්‍යයෙක් ද?
බුදුහු : බමුණ මම මනුෂ්‍යයෙක් ද නොවෙමි.

මෙසේ මෙම ප්‍රකාශයෙන් බමුණු තෙමේ මවිතයට පත්විය. මවිතයට පත් බමුණු තෙමේ මෙසේ කීය. මම ඔබෙන් ඔබ දෙවියෙක් දැයි ඇසු විට නැත යැයි

කියයි. ගාන්ධර්වයෙක් දැයි ඇසූ විට නැත යයි කියයි. යක්ෂයෙක් දැයි ඇසූ විට නැත යැයි කියයි. මනුෂ්‍යයෙක් දැයි ඇසූ විට ද නැත යැයි කියයි. එසේ නම් ඔබ කවරෙක් ද? එවිට අපේ බුදුහාමුදුරුවෝ බමුණාට මෙසේ දේශනා කළහ.

''පින්වත් බමුණ මම දෙවියෙක් නම් දෙවියෙක් තුළ තිබිය යුතු කාමාදී ආශ්‍රවයන් මා තුළත් තිබිය යුතුය. එහෙත් මම ඒ කාමාදී ආශ්‍රවයන් සියල්ල සහමුලින්ම ප්‍රහීණ කළෙමි. ඒ නිසා මම දෙවියෙක් නොවේ. මම ගාන්ධර්වයෙක් නම් ගාන්ධර්වයෙක් තුළ තිබිය යුතු කාමාදී ආශ්‍රවයන් මා තුළත් තිබිය යුතුය. එහෙත් මම ඒ කාමාදී ආශ්‍රවයන් සියල්ල සහමුලින්ම ප්‍රහීණ කළෙමි. ඒ නිසා මම ගාන්ධර්වයෙක් නොවේ. මම යක්ෂයෙක් නම් යක්ෂයෙක් තුළ තිබිය යුතු කාමාදී ආශ්‍රවයන් මා තුළත් තිබිය යුතුය. එහෙත් මම ඒ කාමාදී ආශ්‍රවයන් සියල්ල සහමුලින්ම ප්‍රහීණ කළෙමි. ඒ නිසා මම යක්ෂයෙක් ද නොවේ. මම සමාන්‍ය මනුෂ්‍යයෙක් නම් සාමාන්‍ය මනුෂ්‍යයෙක් තුළ තිබිය යුතු කාමාදී ආශ්‍රවයන් මා තුළත් තිබිය යුතුය. එහෙත් මම ඒ කාමාදී ආශ්‍රවයන් සියල්ල සහමුලින්ම ප්‍රහීණ කළෙමි. ඒ නිසා මම සාමාන්‍ය මනුෂ්‍යයෙක් ද නොවේ. බ්‍රාහ්මණය, උපුලක් හෝ පියුමක් හෝ හෙළ පියුමක් හෝ දියෙහි ඉපිද, දියෙහි වැඩී, දියෙන් ඉස්මතු වී, එහෙත් දියෙහි නොගෑවී, නොතැවරී, තිබෙන්නේ යම්සේද, මම ද මේ ලෝකයෙහි මිනිසුන් අතර උපන්නෙමි, ලෝකයෙහි මිනිසුන් අතර වැඩී, ලෝකයාගෙන් හෙවත් මිනිසුන්ගෙන් ඉස්මතුවී ලෝකයා සමග නොගැටී, නොගෑවී, නොබැඳී සිටිමි. ඒ නිසා මම මිනිස් දුර්වල කම් සියල්ල නැති කෙනෙකි. මම 'බුද්ධ' යැයි දැනගන්න'' යැයි දේශනා කළහ.[16] ඒ

අපගේ සම්මා සම්බුදුපියාණෝ සීල සමාධි පඤ්ඤා විමුත්ති විමුත්තිඤාණ දර්ශනයන්ගෙන් සෝභාමත්ව අතිශයින්ම පිවිතුරු වූ ශ්‍රේෂ්ඨතම මනුෂ්‍යරත්නයයි. එබැවින්ම උන්වහන්සේ මෙම මහා භද්‍ර කල්පයෙහි මෙලොව උපන් සියලුම මිනිසුන් අතර පහළ වූ ආශ්චර්යවත්ම මනුෂ්‍යරත්නයයි. මිනිස් සිත අවදිකළ ඒ මහා පුරුෂයාණෝ මිනිසාගේ සිත එසේ අවදිමත් කළ හැකි බව, දියුණු කළ හැකි බව ලොවට ප්‍රකට කළ ආශ්චර්යවත්ම මනුෂ්‍ය රත්නයයි.

10. බුදුගුණ අනන්තයි, අප්‍රමාණයි
(සුවිශේෂ නම් සියයකින් බුදුගුණ)

අපේ බුදුහාමුදුරුවෝ ගැන, අපේ බුදුහාමුදුරුවන් වහන්සේගේ ගුණ ගැන, විවිධ අය විවිධාකාරයෙන් පසුගිය වර්ෂ දෙදහස් හයසිය තිස්හයක් තිස්සේම කතා කරලා තියෙනවා. ඒත් ඒ ගුණ අවසන් ද? අපේ බුදුරජාණන් වහන්සේගේ ගුණ කඳ දුටු අන්‍යාගමිකයෙක් වූ උපාලි නම් තරුණයෙක් එක් දිනක් හිටිවනම හෙවත් එක මොහොතේම අසුනින් නැගී සිට තමන්ගේ උතුරු සළුව එකාංශ කරගෙන බුදුරජාණන් වහන්සේ දෙසට වැඳගෙන ඒ විවිධ බුදුගුණ කියවෙන ආකාරයෙන් බුදුරජාණන් වහන්සේට සුවිශේෂ නම් සියයක් යොදමින්, පටබඳිමින්, කවි දහයක් පද බැඳ, තමන්ගේ ආචාර්ය වරයා වූ, ශාස්තෘවරයා වූ, නිගණ්ඨනාත පුත්තයන් ඊර්ෂ්‍යාවෙන් වෙව්ලද්දී ඔහු ඉදිරියේම බුදුරජාණන් වහන්සේ කෙරෙහි ඉමහත් ශ්‍රද්ධාවෙන් ඉපිළෙමින් ගායනා කළේය. ඒ නම් සියය මෙසේය.

1. ධීර (මහා නුවණැති) 2. විගත මෝහ (පහවූ මෝහ

ඇති) 3. පභින්නඛිල (විශේෂයෙන් බිඳින ලද කෙලෙස් උල්ඇති) 4. විජිත විජය (මාර පරාජයෙන් විජය ග්‍රහණය කළ) 5. අනීඝ (දුක්නැති) 6. සුසම චිත්ත (සමවූ සිත් ඇති) 7. වුද්ධසීල (වැඩුණු සිල් ඇති) 8. සාධුපඤ්ඤ (මනා ප්‍රඥා ඇති) 9. වෙස්සන්තර (රාගාදී විෂම තරණය කළ) 10. විමල (රාගාදී මල රහිත)11. අකථඞකථී (සැක නැති කළ) 12. තුසිත (සතුටුසිත් ඇති) 13. වන්තලෝකාමිස (වමාරණ ලද කාම ගුණ ඇති) 14. මුදිත (මෘදුවූ) 15. කතසමණ (කරනලද මහණ දම් ඇති) 16. මනුජ (අසහාය මනුෂ්‍යයෙක් වූ) 17.අන්තිමසාරීර (අන්තිම ශරීරය දරන්නාවූ) 18. නර (උත්තම නර වූ) 19. අනෝපම (උපමා රහිතවූ) 20. විරජ (පහවූ රාගාදී රජස් ඇති) 21. අසංසය (සැක රහිතවූ) 22. කුල (නිපුණ වූ) 23. වේනයික (සත්වයන් හික්මවන්නා වූ) 24.සාරථීවර (උත්තම රියදුරාණන් වූ) 25.අනුත්තර (නිරුත්තර වූ) 26. රුචිරධම්ම (පවිත්‍ර ධර්ම ඇති) 27. නික්කඞඛ (සැක රහිත වූ) 28. පභාසකර (ආලෝක කරන්නාවූ) 29. මානච්ඡිද (සිඳින ලද මානය ඇති) 30. වීර (වීර්‍ය්‍ය සම්පන්න වූ) 31. නිසභ (සියල්ලන්ටම ශ්‍රේෂ්ඨ වූ) 32. අප්පමෙය්‍ය (ප්‍රමාණ රහිත වූ) 33. ගම්භීර (ගුණයෙන් ගැඹුරු වූ) 34. මෝන පත්ත (නුවණට පැමිණියාවූ) 35. ඛෙමඞකර (නිර්භය කරන්නාවූ) 36.දේව (ඥාණය ඇති) 37. ධම්මට්ඨ (ධර්මයෙහි පිහිටියාවූ) 38.සංවුත (සංවර කරනලද දිවියක් ඇති) 39.සඞගාතිග (රාගාදී කෙලෙස් පහකළ) 40.මුත්ත (දුකෙන් නිදහස් වූ) 41. නාග (ශ්‍රේෂ්ඨ වූ) 42. පන්තසේන (වන සෙනසුන් ඇති) 43. ඛීණ සංයෝජන (සියලු බැඳීම් විනාශ කළ) 44. මුත්ත කෙළෙසුන් ගෙන් නිදහස් වූ) 45. පටිමන්ත (කෙලෙසුන් ගෙන් මිඳුණු) 46. ධෝන (නුවණැති) 47. පන්නද්ධජ (පහත දමන ලද මාන ධජ ඇති) 48. වීතරාග (වීත රාගී

වු) 49.දන්ත (දමනය වු) 50.නිප්පපඤ්ච (ප්‍රපඤ්ච නැති) 51. ඉසි සත්තම (සත්වැනි ඍෂිවරයාණන් වු) 52. අකුහ (කුහක නොවු) 53. තේවිජ්ජ (ත්‍රිවිද්‍යා ඇති) 54.බ්‍රහ්මපත්ත (බ්‍රහ්මත්වයට පත්වු) 55.නාහතක (කෙලෙස් සෝදා හළ) (56. පදක (ගාථා පද කිරීමෙහි දක්‍ෂවු) 57.පස්සද්ධ (සැහැල්ලු වු) 58. විදිත වේද (මැනවින් දන්නාලද නුවණ ඇති) 59.පුරින්දද (පළමුවෙන්ම ධර්ම දානය කළා වු) 60.සක්ක (සමර්ථ වු) 61. අරිය (ආර්‍යය වු) 62. භාවිතත්ත (වඩනාලද ඉදුරන් ඇති) 63.පත්තිපත්ත (පැමිණිය යුතු ගුණයන්ට පත්වු) 64.වෙය්‍යාකරණ (විස්තරාත්මකව අර්ථ පැහැදිලි කරන) 65. සතිමත (සිහි ඇති) 66. විපස්සි (විශේෂයෙන් දකින නුවණ ඇති) 67. අනභිනත (කෙලෙස් වලට යටත් නොවු හෙවත් අරහත්වු) 68. අපනත (කෙලෙස් වලට නොනැමුණු)69.අනේජ (තෘෂ්ණා නැති) 70. වසිප්පත්ත (වසඟභාවයට පත්) 71.සම්මග්ගත (යහපත් මාර්ගයෙන් වැඩමකළ) 72.ඣායි (ධ්‍යාන ඇත්තාවු) 73. අනනුගතන්තර (කෙලෙසුන් විසින් අනුමගනය නොකරන සිත් ඇති) 74. සුද්ධ (පිවිතුරු වු) 75. අසිත (කෙලෙසුන් ඇසුරු නොකරන්නාවු) 76. අප්පහීන (ප්‍රහීණ නොවු) 77. පවිවිත්ත (උතුම් විවේකය ඇති) 78.අග්ගපත්ත (අග්‍ර බවට පත්වු) 79. තිණ්ණ (එතෙර වු) 80. තාරයන්ත (එතෙර කරන්නාවු) 81.සන්ත (ශාන්ත වු) 82. භූරිපඤ්ඤ (පුළුල් ප්‍රඥා ඇති) 83. මහාපඤ්ඤ (මහා ප්‍රඥා ඇති) 84.වීතලෝභ (ලෝභ පහකළ) 85. තථාගත (තථ තත්වයට වැඩමකළ) 86. සුගත (මැනවින් වැඩමකළ) 87.අප්පටිපුග්ගල (සමාන අන් පුද්ගලයෙක් නැති) 88.අසම (කිසිවෙකුට සමාන නැති) 89.විසාරද (විසාරදත්වයට පත්වු) 90 . නිපුණ (නිපුණ බවට පත්වු) 91. තණ්හච්ඡිද (තණ්හාව නැති කළාවු) 92. බුද්ධ (විසුද්ධ

බුද්ධියෙන් ප්‍රබුද්ධ වු) 93.වීතධුම (පහකළ කෙලෙස් දුම් ඇති) 94. අනුපලිත්ත (නො ඇලුණු) 95. ආහුණෙය්‍ය (පුජාර්හ හෙවත් පුජාවට සුදුසුවු) 96. යක්ඛ (ආනුභාව සම්පන්න) 97. උත්තමපුග්ගල (උතුම් පුද්ගල වු) 98. අතුළ (අසම වු) 99. මහතෝ (මහත් වු) 100. යසග්ගපත්ත (යසසින් අග පැමිණි). යන මෙම විශේෂ නම් සියයයි.

11.සේල බ්‍රාහ්මණයා දුටු අපේ බුදුහාමුදුරුවෝ

සුත්ත නිපාතයේ සේල සූත්‍රයට අනුව සේල බ්‍රාහ්මණයා කේණිය නම් ජටිලයාගෙන් බුදුරජාණන් වහන්සේ ගැන ඇසූ පමණින්ම ''මොනවා, 'බුද්ධ' 'බුද්ධ', ඔව්, මේ 'බුද්ධ' කියන වචනය පවා, ශබ්දය පවා, ලෝකේ දුර්ලභ දෙයක්. කොහොද දැන් ඒ බුදුරජාණන් වහන්සේ වැඩ ඉන්නේ'' කියලයි ඇහුවේ. (එදා අනේපිඬු සිටුතුමා හෙවත් සුදත්ත සිටුතුමා රජගහ නුවරට පැමිණි අවස්ථාවේ රජගහ නුවර සිටුවරයාගෙන් අපේ බුදුහාමුදුරුවෝ ගැන ඇසූ පමණින්ම ඉමහත් සන්තෝෂයට පත්ව බුදුරජාණන් වහන්සේ බැහැදැකීමට ආශාව ඇති කරගත්තේත් මෙසේමයි නේද?) බුදුවරු ලෝකයේ අතිශයින්ම දුර්ලභයි (කිච්චෝ බුද්ධානං උප්පාදෝ). බුදුකෙනෙක් දැකීමම කොයිතරම් වාසනාවක්ද?

ඒත් නියම බුදුන් දැකීම බුදුසිරුර දැකීම නොවේ. අපේ බුදුහාමුදුරුවෝ අපට දේශනා කළේ යම් කෙනෙක් ධර්මය දකින්නේද හෙතෙම බුදුන් දකින බවයි. වක්කලී නම් භික්ෂුව බුදුරජාණන් වහන්සේ දෙසම, බුදුසිරුර දෙසම, මහත් ආශාවෙන් බලාගෙන සිටියේය. ඒ අවස්ථාවේ බුදුපියාණෝ දේශනා කළේ, '' වක්කලී මේ

කුණු ශරීරය දෙස බලාගෙන ඉඳීමෙන් ඇති එලේ මොකක්ද?'' කියලයි නේද?

ඉතින් මේ සේල බ්‍රාහ්මණයා අපේ බුදුරජාණන් වහන්සේ දැක ගත්තා. හෙතෙම බුදුරජාණන් වහන්සේ ගැන විස්තර කළේ ''උන්වහන්සේ සෑම අතින්ම සම්පූර්ණ වූ කයක් ඇති, ඉතාම පියකරුවූ, හොඳ උපතක් ඇති, සුන්දර වූ රන්වන් පෙනුමක් ඇති, වීර්‍ය්‍යවත් වූ, ඉතා සුදු දත්වලින් යුත්, සියලු මහාපුරුෂ ලක්‍ෂණ ඇති, ප්‍රසන්න ඇස් ඇති, යහපත් මුව ඇති, වැඩුණු ශරීරයක් ඇති, සෘජු වූ, ප්‍රතාපවත් වූ, ශ්‍රමණ සමූහයා මැද සූර්‍ය්‍යයා මෙන් බැබළෙන, කෙනෙක් ලෙසටය. එහිදී අපේ බුදුහාමුදුරුවෝ මෙම බමුණාට තමන් වහන්සේ කවුද යන්න පැහැදිලි කළේ මෙසේය.

''සේලය මම රජ කෙනෙක් වෙමි. අනුත්තර වූ ධර්මරාජයෙක් වෙමි. ධර්මයෙන් චක්‍රය පෙරළමි. එම චක්‍රය අනිත් අතට පෙරළිය නොහැකිය.'' යනුවෙනි.

(රාජාහමසමි සෙල - ධම්මරාජා අනුත්තරෝ
ධම්මේන චක්කං වත්තෙමි - චක්කං අප්පතිවත්තියං[17])

12. සභිය පිරිවැජියා දුටු අපේ බුදුහාමුදුරුවෝ

සුත්ත නිපාතයේම සභිය සූත්‍රයට අනුව සභිය පරිබ්‍රාජකයා බුදුරජාණන් වහන්සේ ගැන පැහැදී ප්‍රකාශ කළේ , '' නිවණ කරා පැමිණි, දුකෙහි පරතෙරට ගියාවූ, අරහත් වූ, සම්මා සම්බුද්ධ වූ, ඔබවහන්සේ සියලු ආශ්‍රව ධර්ම ක්‍ෂය කළ කෙනෙකි, ජුතිමත්ය, මුතිමත්ය, මහා

ප්‍රඥාවෙන් යුක්තය, දුක් කෙළවර කළ නිදුකාණෙනි, මම ද එතෙර කරන්න. ඔබ වහන්සේට නීවරණයෝ නැත, නිෂ්පාපී උතුමාණෙනි, නාග වූ, මහා වීර වූ, පුරුෂ ශ්‍රේෂ්ඨයාණෙනි, ඔබ වහන්සේට නමස්කාර වේවා, පුරිසෝත්තමයාණෙනි, ඔබ වහන්සේට නමස්කාර වේවා, දෙවියන් සහිත ලෝකයෙහි ඔබ වහන්සේට සමාන පුද්ගලයෙක් නැත. යම්සේ මනරම් නෙළුමක් මඩ දියෙහි නොතැවරෙන්නේ ද එසේම ඔබවන්සේ පින් හා පව් යන දෙකෙහිම නොතැවෙරෙන සේක. වීරයන් වහන්ස, සභිය ශාස්තෲන් වහන්සේගේ පායුග වඳියි, පා යුගල දිගු කරන සේක්වා''[18]යනාදී වශයෙනි.

13. උත්තර සහ බ්‍රහ්මායු දෙදෙනා දුටු අපේ බුදුහාමුදුරුවෝ

අපේ බුදුහාමුදුරුවෝ ගැන අසා එදා ඉන්දියාවේ මහත් ප්‍රසිද්ධියක් ඉසුලූ ත්‍රිවේදයේ පරතෙරට ගිය බ්‍රහ්මායු නම් බ්‍රාහ්මණයෙක් විසින් දිනක් බුදුරජාණන් වහන්සේ 'ඇත්තෙන්ම බුද්ධ ද'? කියා සොයා බලන්න යැයි තමන්ගේ ශිෂ්‍යයෙක් වූ උත්තර නම් වූ තරුණ ශිෂ්‍යයෙක් බුදුපියාණන් වහන්සේ වෙත එවන ලදී. උත්තර බුදුරජාණන් වහන්සේගේ සියලු මහා පුරුෂ ලක්ෂණ දැකීමත් සමග උත්තරට කට උත්තරත් නැතිව ගියේය. එහෙත් එතැනින් නොනැවතුණු උත්තර තව දුරටත[P] අපේ බුදුහාමුදුරුවන් වහන්සේගේ වැරදි අඩුපාඩු සොයන්නට යැයි සිතා මාස හතක් තිස්සේම අපේ බුදුහාමුදුරුවෝ පසුපස සෙවනැල්ලක් මෙන් සිටියේය. අවසානයට ඔහු අපේ බුදුහාමුදුරුවෝ කවුදැයි තේරුම් ගෙන සිය ගුරුවරයා වූ බ්‍රහ්මායු වෙත ආපසු ගොස් සිය

වාර්තාව ඉදිරිපත් කළේ මෙසේය.

''භවත් ගෞතමයන් ගැන පැතිර ඇති ඒ තොරතුරු සත්‍යයි. ඔව් හෙතෙම දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් ගෙන් සමන්විතයි. හෙතෙම ඇවිදින විට මුලින්ම දකුණු පාදය බිම තබා තමයි ඇවිදින්නේ. පියවර හුගක් ඈතින් තියන්නෙත් නෑ. ළඟින්ම තියන්නෙත් නෑ, හිමින්ම ඇවිදින්නෙත් නෑ. වේගෙන් ඇවිදින්නෙත් නෑ. ඇවිදින විට දනිස් දෙක එකි'නෙකට ගැටෙන්නේ නෑ. ගොප් ඇට එකි'නෙකට ගැටෙන්නේ නෑ. කලවා උඩට උස්සන්නේත් නෑ, පහත් කරන්නේත් නෑ. ඒවා එකට ගටන්නේත් නෑ, ඈත් කරන්නේත් නෑ. ඇවිදින කොට ඇගේ පහළ කොටස විතරයි හෙල්ලෙන්නේ. ශරීරයට හුගක් බලයක් දීලා ඇවිදින්නේ නෑ. යමක් බැලීමට හැරෙන කොට මුළු ශරීරයම තමයි හරවන්නේ. කෙලින්ම උඩ බලන්නේ නෑ. කෙලින්ම බිම බලන්නේත් නෑ. එහෙ මෙහෙ බල බලා ඇවිදින්නේත් නෑ. තමන් ඉදිරියේ වියගහක පමණ දුරක් බලමින් තමයි ඇවිදින්නේ. එසේ වුවද එයින් ඔබ්බටත් දැනීම හා දැකීම තියෙනවා. ගමකට ඇතුළ් වෙන කොට ශරීරය පහත් කරන්නේ හෝ උස්සන්නේ හෝ ඉදිරියට හෝ පිටුපසට නමන්නේත් නෑ. වාඩිවෙන්ඩ යන කොට ආසනයට දුරින් හෝ ඉතාම ලගින් හෝ හැරෙන්නේ නෑ. අත්වලින් එල්ලීගෙන ආසනයේ ඉන්නේ නෑ, ආසනයට පෙරළෙන්නේ නෑ. වාඩිවී සිටින විට අත්පා සොලව සොලව එහා මෙහා නළියන්නේ නැ. දඟලන්නේ නෑ. කකුලක් මත කකුලක් දමාගෙන ඉන්නේ නෑ. ගොප් ඇටය මත ගොප් ඇටය තබාගෙන ඉන්නේ නෑ, නිකටට අත තියාගෙන ඉන්නේ නෑ. ඇතුළ් ගමෙහි වාඩිවී සිටින විට හෙතෙම කිසිම බයක් නැතිවයි ඉන්නේ. තැති

ගැනීමක්, වෙව්ලීමක්, රෝම කෙලින් සිටීමක් නෑ. බොහොම සැහැල්ලුව, ශාන්තව, විවේකයෙන්ම තමයි වාඩිවෙලා ඉන්නේ.

''පාත්‍රයට පැන් පිළිගන්වන විට පාත්‍රය උඩට හරවන්නේත් නෑ. යටට හරවන්නේත් නෑ. පාත්‍රය තද කරලා අල්ලා ගන්නේත් නෑ. එහාට මෙහාට සොලවන්නේත් නෑ. පැන් පිළිගන්නවිට හුගක් ගන්නේත් නෑ. ඉතාම ටිකක් ගන්නේත් නෑ. පාත්‍රය හෝදන කොට බුලු බුලු ගාලා ශබ්ද ඇහෙන විදියට ශබ්ද නගා හෝදන්නේ නෑ. පාත්‍රය පෙරළ පෙරළ හෝදන්නේ නෑ. පාත්‍රය බිම තියාගෙන අත් හෝදන්නේ නෑ. අත හෝදමින් පාත්‍රය හෝදනවා, පාත්‍රය හෝදමින් අත හෝදා ගන්නවා. පාත්‍රය සේදූ ජලය විසුරුවන්නේත් නැතිව විසිකරන්නේ ඉතාම ළගටත් නොවෙයි, ඉතාම ඈතටත් නොවෙයි.

''ආහාර පිළිගන්නාවිට, පාත්‍රය උඩට නමන්නේත් නෑ, පහළට නමන්නේත් නෑ. තද කරලා අල්ලන්නෙත් නෑ. එහාමෙහා සොළවන්නේත් නෑ. බත් පිළිගන්නේ ඉතාම ටිකකුත් නොවෙයි, ඉතාම හුගකුත් නොවෙයි. ව්‍යඤ්ජන පිළිගන්න කොට ඉතාම ටිකක් පිළිගන්නේත් නෑ. ඉතා හුගක් පිළිගන්නේත් නෑ. බතට ප්‍රමාණවත් තරමටයි ව්‍යඤ්ජන පිළිගන්නේ. බතට වැඩියෙන් ව්‍යඤ්ජන පිළිගන්නේ නෑ. දෙතුන් සැරයක් එහා මෙහා පෙරළලා තමයි බත්පිඬ මුව තුළට ගන්නේ. කිසිම බත් තුළක්, ඇටයක්, නොකඩා (නොසපා) කයට පිවිසෙන්නේ නෑ. කිසිම බත් තුළක් මුඛයෙහි ඉතිරිවෙන්නේ නෑ. බත් පිඩක් සම්පූර්ණයෙන්ම හපලා ඊට පස්සේ තමයි නැවත බත් පිඬක් මුවට ගෙනෙන්නේ. ඒ භවත් ගෞතමයෝ

ආහාර වළඳන්නේ රස විඳිමින්, එහෙත් රසරාග විඳිමින් නෙමෙයි.

ආහාර ගන්නේ කරුණු අටක් හේතු කරගෙනයි. එනම් ''සෙල්ලම් කිරීමට හෙවත් ක්‍රීඩාව පිණිස නොවේ, මදය පිණිස නොවේ, ශරීරය පුෂ්ටිමත් කරගැනීම පිණිස නොවේ, අලංකාර කරගැනීමට නොවේ මේ කයෙහි පැවැත්ම පිණිසය, යැපීම පිණිසය, වෙහෙස සංසිඳවීම පිණිසය, මේ බඹසරට අනුග්‍රහ පිණිසය. මේ අනුව මම පැරණි වේදනා නැති කරළමි, අලුත් වේදනාවන් ඇති කර නොගන්නෙමි, නිවැරදිව ජීවිත යාත්‍රාව ගෙනයන්නෙමි, පහසුවෙන් ජීවත් වෙන්නෙමි'' යන අදහසිනි.

''දානය වළඳා අවසන් වුණාමත් හෙතෙම පාත්‍රයට පැන් ගන්නා විට පාත්‍රය උඩට නමන්නේත් නැහැ. පහතට නමන්නේත් නැහැ. තද කරලා පාත්‍රය අල්ලා ගන්නේත් නැහැ. එහාට මෙහාට සොළවන්නේත් නැහැ. පැන් ගොඩක් පිළිගන්නේත් නැහැ. ටිකක්ම පිළිගන්නේත් නැහැ. බුලු බුලු ගාමින් ශබ්ද නගා පාත්‍රය සෝදන්නෙත් නැහැ. පාත්‍රය පෙරළ පෙරළ සෝදන්නේත් නැහැ. පාත්‍රය බිම තියාගෙන අත් සෝදන්නේත් නැහැ. පාත්‍රය සොදමින් අත සෝදා ගනිති. පාත්‍රය සෝදන ලද දිය විසුරුවන්නේ නැතිව ඉතාම ළගටම දමන්නේත් නැහැ. ඉතාම ඈතට විසිකරන්නේත් නැහැ. දානය වළඳලා අවසන් වූ විට පාත්‍රය ඉතාම දුරින් හෝ ඉතාම ළගින් බිම තබා ගන්නේ නැහැ. පාත්‍රය ගැන නොසලකා හරින්නේත් නැහැ. එසේම ඒ ගැන අනවශ්‍ය උනන්දුවක් දක්වන්නේත් නැහැ.

‘‘දානය වළඳා අවසන් වී ටික වේලාවක් නිහඬව සිටිනවා. භුක්තානුමෝදනාවට හුඟක් කල් ඉක්ම වන්නේත් නැහැ. වළඳා අවසන් වෙලා භුක්තානුමෝදනා වශයෙන් ධර්මය දේශනා කරනවා. වැළඳූ දානය පිළිබඳව විවිධ විවේචන කරන්නේත් නෑ. එයින් පසු එතැනින් වෙනත් දානයක් බලාපොරොත්තු වන්නේත් නැහැ. ඒකාන්තයෙන් දැහැමි කථාවෙන්ම ඒ පිරිසට කරුණු දක්වනවා. එහි සමාදන් කරවනවා. උනන්දු කරවනවා. සතුටු කරවනවා. එසේ දැහැමි කථාවෙන් කරුණු දක්වා සමාදන් කරවා උනන්දු කරවා වැඩ සිටි ආසනයෙන් නැඟී සිට නික්ම යනවා.

‘‘යනවිට ඉතා ඉක්මණින් යන්නේත් නැහැ. ඉතාම හෙමින් යන්නේත් නැහැ. හරියට පිරිසකගෙන් වහාම මිදිලායන්නා වගේ යන්නේත් නැහැ. ඒ භවත් ගෞතමයන්ගේ කයෙහි සිවුර ඉතාම උසට සිටින සේ පොරවන්නේත් නැහැ. ඉතාම පහතට සිටින සේ පොරවන්නේත් නැහැ. කයට ඉතාම තදින් සිටින සේ පොරවන්නේත් නැහැ. ඉතාම ලිහිල්ව සිටින සේ පොරවන්නේත් නැහැ. සුළඟට සිවුර විසිරිලා යන්නේත් නැහැ. භවත් ගෞතමයන්ගේ සිරුරට දූවිලි ආදිය ඇලෙන්නේ නැහැ.

‘‘හෙතෙම ආරාමයට ගොස් පනවා ඇති ආසනයෙහි වාඩිවෙයි. වාඩිවී පා සෝදාගනියි. එහෙත් පාද මඳින්නට යන්නේ නැහැ. මෙසේ පා සෝදාගෙන පර්යන්කය බැඳගෙන කය ඍජුව තබාගෙන මුහුණු ඉදිරියෙහි සිහිය පිහිටුවා ගනිමින් වාඩිවෙයි. හෙතෙම තමන්ට අයහපත පිණිස නොසිතයි. අනුන්ට අයහපත

පිණිස නොසිතයි. දෙපිරිසටම අයහපත පිණිස නොසිතයි. තමන්ගේ යහපත පිණිස අනුන්ගේ යහපත පිණිස යන දෙපිරිසගේම යහපත පිණිස සිතමින් සියලු ලෝකයේම හිතසුව පිණිස සිතමින් වැඩසිටින්නේ වෙයි.

"හෙතෙම ආරාමයට ගිය කල්හී පිරිසට දහම් දෙසති. එහෙත් ඒ පිරිස උසස් කොට සලකන්නේවත් පහත් කොට සලකන්නේ වත් නැහැ. දැහැමි කථාවෙන්ම ඒ පිරිසට කරුණු දක්වති, සමාදන් කරවති, උනන්දු කරවති, සතුටු කරවති. භවත් ගෞතමයන්ගේ මුඛයෙන් අංග අටකින් යුත් මිහිරි වූ ශබ්ද පිටවෙයි. ඒ විස්සට්ඨ (ඉතාම පැහැදිලිව අවබෝධ වෙන), විඤ්ඤෙය්‍යය (බුද්ධි ගොචර වූ), මඤ්ජු (ඉතාමත්ම මිහිරි වූ), සවනීය (ඇසීමට ප්‍රසන්න වූ),බින්දු (සීනු හඬක් මෙන් රැව්දෙන), අවිසාරී (මනා ස්වර සංකලනයෙන් යුක්තවූ හෙවත් සුස්වරීය), ගම්භීර (ගැඹුරු වූ), නින්නාද (සුමිහිරි ඝෝෂාවෙන් නදදෙන හෙවත් කන්කලු) යන ශබ්ද අටය. එහෙත් සිය ශබ්දය පිරිස ඉක්මවා ඈතට නික්ම යන්නේ නැත. එම ශ්‍රාවකයන්ට පමණක් සීමිත වෙයි. එසේ පිරිස දැහැමි කථාවෙන් කරුණු දක්වා, සමාදන් කරවා, උනන්දු කරවා, සතුටට පත් කරවූ කල්හී ඔවුහු ආසන වලින් නැගී සිට ඉවත්ව යාමට අකැමැත්තෙන් වගේ උන්වහන්සේ දෙසම බලාගෙන තම ආසනයෙන් නැගිටයති.

"ඒ භාග්‍යවත් වූ ගෞතමයන් ගමන් කරන විට ද අපි දුටුවෙමු. එක් තැනක සිටින විට ද අපි දුටුවෙමු. ඇතුළ් ගමට පිවිසෙන විට ද අපි දුටුවෙමු. ඇතුළ් ගමෙහි තුෂ්ණීම්භූතව වාඩිවී සිටින විට ද අපි දුටුවෙමු. භුක්තානුමෝදනා කරනවිට ද අපි දුටුවෙමු. ආරාමයට

යනවිට ද අපි දුටුවෙමු. ආරාමයට ගොස් තුෂ්ණීම්භූතව සිටින විටද අපි දුටුවෙමු. ආරාමයට ගොස් පිරිසට දහම් දෙසනවිට ද අපි දුටුවෙමු. භවත් ගෞතමයන් වහන්සේ මෙබඳු මෙබඳු කෙනෙකි. මේ විතරක් නොවෙයි මෙයිටත් වඩා ගුණ ඇති කෙනෙකි.'' යැයි කීවේය. (පිංවත මේ අපේ බුදුහාමුදුරුවෝ සරණ ගිය කෙනෙක් නොවෙයි. මේ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෙක් නොවෙයි. අපේ භාග්‍යවන්ත වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට විවිධාකාරයෙන් විරුද්ධකම් කළ අප්‍රමාණ බමුණන් අතරින් තවත් එක්තරා බමුණු පැටියෙක්, බමුණු දරුවෙක් පමණයි. බලන්න ඇත්ත දැකපු හැටි.)

ඉතින් මෙසේ කී කල්හී උත්තරගේ ගුරුවරයා වූ ඒ බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ තමන් වාඩිවී සිටි ආසනයෙන් නැගී සිට උතුරු සළුව ඒකාංස කොට භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ යම් දිසාවක ඒ වනවිට වැඩ සිටිසේක් ද ඒ දිසාවට හැරී තුන් වතාවක් ''නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස'' යැයි කියා නමස්කාර කරමින් උදන් ඇණුවේය. ''අපි යම් දවසක ඒ භවත් ගෞතමයන් වහන්සේ සමග හමුවී කතා කිරීමට යායුතුයි. කිසියම් විදියකින් කතා සල්ලාපයක් ඇති කරගැනීමට හැකි වුණොත් බොහොම අගෙයි'' යැයි ද කීවේය.

වරක් අපේ බුදුහාමුදුරුවෝ පිළිවෙලින් චාරිකාවෙහි හැසිරෙද්දී විදේහ කියන ප්‍රදේශවල හැසිරෙමින් පිළිවෙලින් මිථිලාවට හෙවත් මේ බ්‍රහ්මායු බමුණා වාසය කළ ප්‍රදේශයට ද වැඩම කොට මඛාදේව නම් වූ අඹවනයෙහි වැඩ සිටිසේක. එවිට මේ බ්‍රහ්මායු නම් බමුණු තෙමේ බුදුපියාණන් වහන්සේ වෙත පැමිණ

උන්වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලකුණ පරීක්ෂා කොට බලා අපේ බුදුහාමුදුරුවෝ දෙතිස් මහා පුරුෂ ලකුණු වලින් සමන්විත බව දැන දැක ප්‍රත්‍යක්‍ෂව මහත් සේ සතුටුට පත්ව බුදුරජාණන් වහන්සේගෙන් ප්‍රශ්න ආසා ලද පිළිතුරුවලින් ද තවදුරටත් මහත් සේ ප්‍රමුදිත භාවයට පත්විය.

මෙහිදී අපේ බුදුහාමුදුරුවෝ තමන් කවුදැයි හඳුන්වා දෙමින් බ්‍රහ්මායු බමුණාට මෙසේ දේශනා කොට වදාළහ.

''බ්‍රාහ්මණය, මම මැනවින් දැනගත යුතු දෙය දැනගතිමි. ප්‍රගුණ කළ යුතු දෙය හෙවත් භාවිතා කළ යුතු දෙය භාවිතා කළෙමි. ප්‍රහාණය කළ යුතු දෙය ප්‍රහාණය කළෙමි. ඒ නිසා මම බුද්ධ වෙමි''

(අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං - භාවෙතබ්බං ච භාවිතං පහාතබ්බං පහීනං මේ-තස්මා බුද්ධෝස්මි බ්‍රාහ්මණ).

මෙය ද ඇසුවිට බ්‍රහ්මායු බමුණාගේ සතුට නිම්හිම් නැතිව ගියේය. හෙතෙම තමන් වාඩිවී සිටි ආසනයෙන් නැගී සිට අපේ බුදුහාමුදුරුවන් වහන්සේගේ සිරිපතුල්මත සිරස තබා නමස්කාර කරමින් ඒ භාග්‍යවතුන් වහන්සේගේ, පිවිතුරු වූ සිරිපතුල් සිඹිමින් හා අත්වලින් සිරිපතුල් දෙක පිරිමදිමින් ''භවත් ගෞතමයෙනි, මම බ්‍රහ්මායු, භවත් ගෞතමයෙනි, මම බ්‍රහ්මායු'' යැයි තම නම ද කියන්නට විය. එහි සිටි පිරිස ඇත්තෙන්ම මෙය නම් ආශ්චර්යයක්, අත්භූත වූ දෙයක්, යැයි පවසමින් බුදුරජාණන් වහන්සේ මෙවන් කීර්තිමත් බමුණෙක් පවා පරම නිහතමානී කෙනෙක්

බවට පත් කළේයැයි මහත් සේ සතුටුව අපේ බුදුරජාණන් වහන්සේගේ මහානුභාවය ගැන අතිශයින්ම ප්‍රශංසා කළේය. බුදුහු බ්‍රහ්මායු බමුණාට නැගී සිටිමින් තමන්ගේ ආසනයෙන් වාඩිවෙන්න යැයි කීහ. එවිට බමුණු තෙමේ ආසනයෙහි වාඩිවිය. බුදුපියාණෝ ඔහුට දානකථා, සීල කථා, සග්ග කථා, ආදී වූ අනුපිළිවෙලින් යුතුව ධර්මය දේශනා කොට අනතුරුව සාමුක්කංසික දේසනය නම් වූ චතුරාර්‍ය්‍ය සත්‍යය ධර්මය දේශනා කළහ. එම දහම් දෙසුම අවසන් වෙද්දී බ්‍රහ්මායු බ්‍රාහ්මණයාහට ඒ ආසනයේදීම කෙලෙස් දූවිලි විරහිත වූ දහම් ඇස පහළවිය හෙවත් හෙතෙම සෝවාන් තත්වයට පත්විය. හෙතෙම බුදුරජාණන් වහන්සේ ද ධර්ම රත්නය ද සංඝරත්නය ද සරණ ගිය උපාසකයෙක් බවට පත්විය.

අනතුරුව හෙතෙම බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලාට පසුදින සිය නිවසට දානය සඳහා වැඩම වන ලෙස ආරාධනා කළේය. බුදුපියාණෝ එම ආරාධනය පිළිගෙන පසුදින භික්ෂූන් සමග එහි වැඩම කොට දන් වැළඳූහ. මෙසේ හෙතෙම බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට එක් දවසක් නොව දවස් හතක් ම දන් පිළිගැන්වූහ. ඉන් අනතුරුව අපේ බුදුහාමුදුරුවෝ එම විදේහ නම් ප්‍රදේශයෙන් වෙනත් ප්‍රදේශයකට වැඩම කළහ. ඒ අතරතුර බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ කළුරිය කළේය. ඒ බව බුදුපියාණන් වහන්සේට භික්ෂූන් වහන්සේලා විසින් දැනුම් දුන් කල්හී බුදුපියාණෝ මෙසේ දේශනා කළහ. ''පින්වත් මහණෙනි, බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ ඔරම්භාගිය සංයෝජන ධර්ම පහ ක්ෂය කොට අනාගාමී තත්වයට පත්ව සුද්ධාවාස බ්‍රහ්මලෝකයෙහි උපන්නේය.''[19]

14. සකුළුදායි දුටු අපේ බුදුහාමුදුරුවෝ

සකුළුදායි අපේ බුදුහාමුදුරුවෝ රජගහ නුවර වැඩ සිටින කාලයේ රජගහ නුවර මහත් පිරිසක් පිරිවර කරගෙන සමාජයේ බැබලෙමින් සිටි සුප්‍රසිද්ධ ප්‍රබල පරිබ්‍රාජකයෙකි. දිනක් අපේ බුදුහාමුදුරුවෝ උදෑසනම රජගහ නුවරට පිණ්ඩපාතයේ වඩිද්දී අතර මගදී පිණ්ඩපාතයට තවම වේලාසන වැඩි නිසා සකුළුදායිගේ ආරාමයට වැඩම කළා. එහි වඩිද්දී සකුළුදායිගේ ගෝල පිරිස මහත් කෝලාහලයක් කරගන්නාක් මෙන් කෑකෝ ගසමින් ගුණ දහම් සුරකින අයට නුසුදුසු වූ දෙතිස් කතා වලින් යුතුව තමයි හිටියේ. බුදුරජාණන් වහන්සේ වඩිනවා දැකලා සකුළුදායි ඒ අයගේ ඒ කාල ගෝට්ටිය නතර කරන්න, කියලා 'නිශ්ශබ්ද වෙන්න' 'නිශ්ශබ්ද වෙන්න' කියලා කෑගහලා කීවා. තවදුරටත් කීවා නිශ්ශබ්දව හිටියොත් සමහර විට සමණ ගෞතමයොත් අපිව අනුගමනය කරාවි, අපි ළගට ඒවි කියාලා.

ඉතින් අපේ බුදුහාමුදුරුවෝ දැකලා වඩින්න වඩින්න කියලා ආසනයක් පනවා දුන්නා. ඒ ආසනයේ වැඩ සිටි අපේ බුදුහාමුදුරුවෝ සකුළුදායි ගෙන් ඇසුවා මොකක් ගැන ද ඔය පිරිස දැන් කථා කර කර උන්නේ සමහරවිට ඒ කථාවටත් බාධාවක් වෙන්න ඇති නේද කියලා. ඉතින් ඒ කතාව ඒ තරම් වැදගත් එකක් නෙවෙයි, ඒව ඉතින් පස්සෙත් අහන්න පුළුවනි කියලා, සකුළුදායි කියනවා මෙහෙම. ''මේ ළගදී දවසක් සංවාද ශාලාවට එකතු වෙච්ච විවිධ ආගමික ශ්‍රමණ හා බ්‍රාහ්මණ කණ්ඩායම් අතර විශේෂ කතාවක් ඇතිවුණා මේ අංග මගධ ජනපද වල ඉන්න අයට විශාල ලාභයක් තියෙනවා කියලා. ඒ මොකක්ද, මේ අංග මගධ ජනපදවල විශාල

සඟ පිරිස් පිරිවර කරගත්ත ශ්‍රේෂ්ඨ ශාස්තෘවරු කීපදෙනෙක්ම දැන් වැඩඉන්නවා කියලා. ඒ කියන්නේ පුරණ කස්සප, මක්ඛලී ගෝසාල, පකුධ කච්චායන, අජිත කේසකම්බල, සංජය බෙලට්ඨිපුත්ත, නිගණ්ඨනාථ පුත්ත සහ ශ්‍රමණ භවත් ගෞතම යන මේ අයයි. ඊ ළගට ඒ අය කතා කළා ඒ ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ ගෝල පිරිස් ඒ අයට සළකන හැටි, ගරුකරන හැටි. ඉතින් ඒ අය අතුරින් ඒ හැම දෙනාගේම ප්‍රශංසාව හිමිවුණේ ශ්‍රමණ ගෞතමයන්ගේ ගෝලයන් ශ්‍රමණ ගෞතමයන්ට සළකන, ගරුකරන ආකාරය ගැනයි.''

මේ අවස්ථාවේ අපේ බුදුහාමුදුරුවෝ සකුළුදායිගෙන් ඇහුවා ''සකුළුදායි ඔබ හිතන හැටියට ඒ ආකාරයෙන් සැළකීමට හේතුව මොකක්ද?'' කියලා. සකුළුදායි කියනවා. ''ඒ කරුණු පහක් නිසයි.'' කියලා. ඒ සකුළුදායි කියන හැටියට අපේ බුදුරජාණන් වහන්සේට උන්වහන්සේගේ ශ්‍රාවක පිරිස සළකන්නේ ගරු කරන්නේ මේ කරුණු පහ නිසාය.

1. බුදුරජාණන් වහන්සේ ඉතාම ටිකක් වළදන නිසා.
2. බුදුරජාණන් වහන්සේ සරළ සිවුරු පරිහරණය කරන නිසා සහ එය අගය කරන නිසා.
3. බුදුරජාණන් වහන්සේ සරළ ආහාරයකින් හෝ සතුටුවෙන නිසා සහ එය අගය කරන නිසා.
4. බුදුරජාණන් වහන්සේ වන සෙනසුන් වල වාසය කරන නිසා සහ එය අගය කරන නිසා.
5. බුදුරජාණන් වහන්සේ හුදකලාව සුවසේ වාසය කරමින් එය අගය කරන නිසා.

ඉතින් අපේ බුදුහාමුදුරුවෝ කරුණු සහිතව බ්‍රාහ්මණයාට පෙන්වා දුන්නා මේ එකම කාරණයක්

නිසාවත් නොවෙයි උන්වහන්සේගේ ශ්‍රාවක පිරිස බුදුරජාණන් වහන්සේට සලකන්නේ කියලා. එහිදී අපේ බුදුහාමුදුරුවෝත් කරුණු පහක් දේශනා කළා, මොන හේතූන් නිසාද උන්වහන්සේගේ ශ්‍රාවක පිරිස උන්වහන්සේට සළකන්නේ කියලා. අපේ බුදුහාමුදුරුවෝ ඔහුට දේශනා කළ පරිදි උන්වහන්සේගේ ශ්‍රාවක පිරිස උන්වහන්සේට සළකන්නේ ගරු කරන්නේ මෙන්න මේ කරුණු පහ නිසයි.

1. බුදුරජාණන් වහන්සේගේ අධි ශීලය නිසා.
2. බුදුරජාණන් වහන්සේගේ ඤාණ දර්ශනය නිසා.
3. බුදුරජාණන් වහන්සේගේ අධි ප්‍රඥාව නිසා.
4. බුදුරජාණන් වහන්සේ චතුරාර්‍ය්‍ය සත්‍යය ධර්මය දේශනාකර මැනවින් පහදා දෙන නිසා.
5. බුදුරජාණන් වහන්සේ කුශල ධර්මයන් වඩන ආකාරය කියාදෙන නිසා.

මේ කුශල ධර්ම ද ප්‍රගුණ කරන ආකාරය ද අපට අපේ බුදුහාමුදරුවෝ කියා දුන්හ. එසේ අපට කියා දුන්නේ:

1. සතර සතිපට්ඨාන ධර්මයෝ ප්‍රගුණ කරන ආකාරය
2. සතර සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෝ ප්‍රගුණ කරන ආකාරය
3. සතර ඉද්ධිපාදයෝ ප්‍රගුණ කරන ආකාරය
4. පඤ්ච ඉන්ද්‍රිය ධර්මයෝ ප්‍රගුණ කරන ආකාරය
5. පඤ්ච බල ධර්මයෝ ප්‍රගුණ කරන ආකාරය
6. සත්ත බොජ්ඣංග ධර්මයෝ ප්‍රගුණ කරන ආකාරය
7. ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය ප්‍රගුණ කරන ආකාරය
8. අෂ්ට විමෝක්ෂ ධර්මයෝ ප්‍රගුණ කරන ආකාරය

9. අෂ්ට අභිභායතන ප්‍රගුණ කරන ආකාරය
10. දස කසින ප්‍රගුණ කරන ආකාරය
11. සතර ධ්‍යාන වලට පත්වෙන ආකාරය
12.විදර්ශනා ඥාණය උපදවා ගන්නා ආකාරය
13. මනෝමය කයක් උපදවා ගන්නා ආකාරය
14. ඉද්ධිප්‍රාතිහාර්ය පාන ආකාරය
15. දිබ්බ සෝතය හෙවත් දිව කණ ඇති කර ගන්නා ආකාරය
16. අන් අයගේ සිත් දැන ගන්නා ආකාරය
17. පෙර භවයන් පිළබඳව දැනගන්නා නුවණ ඇති කරගන්නා ආකාරය
18. දිවැස් හෙවත් සත්වයන් මෙලොවින් චුතවෙන ආකාරය හා වෙනත් ලෝක වල ඉපදෙන ආකාරය දැකීමේ ඥාණය උපදවා ගන්නා ආකාරය
19. සියලු ආශ්‍රව ධර්මයන් නැති කර දමා නිවන් සුව පසක් කරගන්නා ආශ්‍රවක්‍ෂය ඥාණය උපදවා ගන්නා ආකාරය යන මේවාය.

මෙසේ බුදුපියාණෝ සකුළුදායි හට මෙම කරුණු දේශනා කර අවසන් වෙද්දී සකුළුදායි ඉමහත් සතුටට සන්තෝෂයට පත්විය.[20]

මේ සියල්ලම අපට දේශනා කළ මේ කල්පයේ මෙලොව පහළ වු එකම ශාස්තෘවරයාණෝ අපගේ තථාගත ලොවුතුරා බුදුහාමුදුරුවෝ පමණි. මෙවන් ධර්මයක් අපට කියා දුන් ඒ අපේ බුදුහාමුදුරුවෝ අපි සදා නමදිමු. සදා සරණ යමු. ආදරයෙන් ගෞරවයෙන් වන්දනා කරමු. නිබඳවම නිරතුරුවම ඒ අනන්ත වු බුදු ගුණ හදෙහි දරාගෙන අපිත් සැනසිල්ලේ ජීවත් වෙමු.

අපේ බුදුහාමුදුරුවෝ ගැන කතා කරලා ලියලා හෝ විවිධාකාරයෙන් විවිධ වූ දේශනා පවත්වලා මෙලොව කිසිම කෙනෙකුට උන්වහන්සේගේ ගුණ කඳ නිම කළ නොහැකිය. බුදුගුණ මහා සාගරයකි. එහි පරක් තෙරක් නොදැකිය හැකිය. එසේම ගම්භීරයි, අනන්තයි, අප්‍රමාණයි.

හිතන්න,... කිසියම් බුදු කෙනෙක් බුදු බවට පත් වූ දවසේ පටන් තවත් බුදුකෙනෙකුගේ ගුණ වර්ණනා කරන්නට ආරම්භ කරනවා කියලා. ඉතින් ඒ බුදුහාමුදුරුවෝ කල්පයක් ගත වෙන තුරුම බුදුගුණ කතා කරනවා, දේශනා කරනවා කියා හිතන්න. ඒ කියන්නේ ඒ බුදුරජාණන් වහන්සේගේ ජීවිත කාලය පුරාම දේශනා කරන්නේ බුදුගුණ පමණයි. ඉතින් එහෙම දේශනා කරගෙන යන කොට, යන කොට, ඔන්න කල්පය ඉවර වෙනවා. ඒත් බුදුගුණ නම් ඉවර වෙන්නේ නැහැ. අපේ බුදුහාමුදුරුවන් වහන්සේගේ බුදුගුණ සියල්ල මෙච්චරයි මෙපමණයි කියා කියන්න කිසිවෙකුත් ලෝකයේ නැහැ. ඒත් බුදුගුණ කෙටි කරලා අපේ බුදුහාමුදුරුවෝම අපට දේශනා කරලා තියෙන ගාථාවක් තමයි අපි උදේ සවස ''ඉතිපි සෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජා චරණ සම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවා'' යනුවෙන් කියන්නේ. ඒ ගාථාවේ ගුණ නමයකට කෙටි කරලා තියෙන්නේ අප්‍රමාණ වූ බුදුගුණ තමයි. ඒ බුදුගුණ අපිත් නිතර නිතර සිහිකරමු. ඒ බුදුගුණ එකක් එකක් පාසා ඉතාම හොඳින් දැනගනිමු. නිවන් මගට පිවිසෙන්නට හෙවත් සෝවාන් තත්වයට පත්වෙන්නට අවශ්‍යම, සෝතාපත්ති අංගයන් වන බුදුරජාණන් වහන්සේ කෙරෙහි, ධර්ම රත්නය

කෙරෙහි, සංඝ රත්නය කෙරෙහි, අචල ශ්‍රද්ධාව ඇති කරගැනීමට අපිත් උත්සුක වෙමු. දිනපතා ශ්‍රද්ධාවත් ප්‍රඥාවත් පෙරටුව බුද්ධ වන්දනා කරමු. අනන්ත බුදුගුණ දම්ගුණ සඟ ගුණ අපටත් වැටහේවා. ත්‍රිවිධ රත්නයේ අනන්ත ගුණ බලයෙන් සියලුම සත්වයෝ සුවසේ ජීවත් වෙත්වා!

බුදුගුණ නිරතුරු මට සිහි වේවා
දම් ගුණ නිරතුරු මට සිහි වේවා
සඟ ගුණ නිරතුරු මට සිහි වේවා
මගෙ සිත කෙලෙසුන්ගෙන් දුරුවේවා!

3 පරිච්ඡේදය

බුදුන් වදාළ නියම ධර්මය

බුදුන් වදාළ ධර්මය ගැන අපි හුඟාක් දේවල් අහලා තියෙනවා. ඒ ගැන විවිධ උගතුන් විසින් විවිධ පොත පත ලියලා තියෙනවා, අටුවා, ටීකා, ටිප්පණි වලින් බුදු දහම ගැන විවිධාකාරයෙන් කථාකරලා තියෙනවා. ඒ විස්තර විවරණ වැඩිවෙන්ඩ වැඩිවෙන්ඩ තව තව සංකල්ප, ආකල්ප, ප්‍රවාද, මතවාද, අදහස්, එකතු වෙලා නිමල බුදුදහම විවරණය වෙනවට වඩා සිද්ධ වෙලා තියෙන්නේ ආවරණය වීමයි, වැසීයාමයි. මේ විවිධ මති මතාන්තර වලින් නිර්මල බුදුදහම වැසීයාම නිසාම මිනිසාට සසරින් එතර වීමට තිබෙන අවස්ථාව ද, දුක තුනී කරගන්නත් දුක සම්පූර්ණයෙන්ම නැති කරගන්නත් තියෙන අවස්ථාව ද, නැතිවී යයි. අපේ බුදුපියාණන් වහන්සේ විසින් විසුද්ධිය පිණිස ඉතාමත්ම පැහැදිලි, නිවැරදි, නිරවුල් මගක් අපට දේශනා කොට ඇතත් පසුකාලීනව මේ විවිධාකාරයෙන් සිදුකොට ඇති විස්තර විවරණ වලින්, විසුද්ධියට මග යැයි ඉදිරිපත් කළ මග සලකුණු වලින් සිදුවී ඇත්තේ ඒ මාර්ග සංඥාම මාර්ග බාධක බවට පත් වීමකි.

අපේ බුදුහාමුදුරුවෝ නිමල බුදුදහම දේශනා කළේ සසර අප්‍රමාණ දුක් ගැහැට විඳින සත්වයා සසරින් එතර කිරීමටයි. සසර සැරි සැරීම එක් මොහොතක්වත් ප්‍රශංසා නොකළ බුදුපියාණෝ වහ වහාම සසරින් එතෙර වෙන්න කියා දහම් දේශනා කළහ. මෙසේ පැටලුණ නූල් බෝලයක් වගේ, මෘදු වු තණ කොළ ගුලියක් වගේ, අග මුල සොයා ගැනීමට නොහැකිව සත්වයා ඉපදි ඉපදී

මැරි මැරී මළ කුණු වලින් කනතු පුරව පුරවා, සසර සැරි සරන්නේ චතුරාර්‍ය සත්‍යය හා පටිච්චසමුප්පාද ධර්මය නොදැනීම නිසා බව අපේ බුදුහාමුදුරුවෝ අපට පැහැදිලිවම දේශනා කළහ.[1]

බුදුදහමේ හරය තේරුම් ගෙන ඒ අනුව ධර්මය ප්‍රගුණ කරනවාට වඩා අද අපේ සමහර බෞද්ධයෝ යැයි කියා ගන්නා අය වෙන මොන මොනවා හරි කර කර, සමහරවිට බුදුරජාණන් වහන්සේ විසින් කොහෙත්ම දේශනා නොකළ, නිර්මල බුද්ධ වචනයට, බුදුදහමට, කොහෙත්ම නොගැළපෙන, දෙවියන්ට යාඥා කිරීම් වැනි දේවල් අනුගමනය කරමින් බුදුපියාණෝ පැහැදිලිවම පුනර්භවයක් දේශනා කර තිබියදීත් එවැනි දෙයක් නැත, නැවත උපතක් නැත, ඕපපාතික සත්වයෝ නැත, මවට පියාට සැලකීමේ විපාක නැත, මෙලොවක් නැත, පරලොවක් නැත, ආදී වශයෙන් මිථ්‍යාදෘෂ්ටිවලම ඇලී ගැලී සිටිති. මේ මිථ්‍යාදෘෂ්ටිය යනු ඉතාම භයානක දෙයකි. සත්වයාට මිථ්‍යාදෘෂ්ටිය ඇති විට ඒ සත්වයෝ අනිවාර්‍යයෙන්ම කෙළවර වෙන්නේ දුගතියෙනි හෙවත් අපායෙනි. ඒ බව ධම්මපදයේ නිරය වග්ගයේ අපේ බුදුහාමුදුරුවෝ අපට ''මිච්ඡාදිට්ඨි සමාදානා සත්තා ගච්ඡන්ති දුග්ගතිං'' යනුවෙන් ඉතාම පැහැදිලිව දේශනා කළහ. අපේ බුදුහාමුදුරුවෝ අපට දහම් දේශනා කර ඇත්තේ සම්මාදිට්ඨිය ඇති කිරීමටය. ධම්මපදයේ මේ නිරය වග්ගයේම අපේ බුදුහාමුදුරුවෝ අප කෙරෙහි අනුකම්පාවෙන් අපට දෙන මේ අවවාදය බලන්න.

''ඈත පිටිසර ප්‍රත්‍යන්තයක ඇති නගරයක් ඉතාම හොඳින් ඇතුළතින් හා පිටතින් දෙකෙන්ම දැඩි කොට ආරක්ෂාව සලසමින් ආරක්ෂා කරන්නේ යම්සේද, එමෙන් ඔබව ආරක්ෂා කරගන්න. ලැබුණ මේ ඉතාමත්ම අගනා

වටිනා මොහොත, (එනම් ධර්මයෙහි හැසිරීමට ධර්මය හැදෑරීමට, භාවනා කිරීමට ඇති උතුම් මොහොත) අපතේ අරින්න එපා. ගිලිහී යන්න දෙන්න එපා. මේ උතුම් මොහොත ගිලිහී යන්නට දුන් අය නිරයට ගොස් සෝක කරති.'' යනුවෙනි. නිරය ඇත්තේ කොහෙද කිය කියා ප්‍රශ්න කරන අය සමාජයේ සිටින බව අපි දනිමු. එසේ ප්‍රශ්න කිරීම හොඳ වුවත්, කළ යුත්තේ ප්‍රශ්න කරමින් කාලය නාස්ති කර ගැනීමට වඩා කුසල් වල නිරත වීමයි. නිරය හෝ දිව්‍ය ලෝක ඇතත් නැතත් හොඳ දේ කරන කෙනාට හොඳ විපාක හා නරක දේ කරන කෙනාට නරක විපාක ලැබෙන බව අපි තේරුම් ගනිමු. බුදුදහමින් තොරව නියම සැනසුමක් හෙවත් කෙලෙස් වලින් නිදහස් වු සැනසුමක් නැති බව තේරුම් ගනිමු.

නිමල බුදුදහම යනු අපේ සංස්කෘතිය හෝ ඉතිහාසය හෝ ශිෂ්ඨාචාරය හෝ දර්ශනය හෝ බුද්ධාගම ද නොවේ. බුදුදහම යනු බුදුපියාණන් වහන්සේ විසින් ඉතාමත්ම පැහැදිලිව, ප්‍රත්‍යක්ෂයෙන්ම අවබෝධ කරගනිමින් ඉතාමත්ම පැහැදිලි වචනවලින්, පැහැදිලි අර්ථවලින්, කිසිදු භේදයකින් තොරව, සෑම ජන කොටසකටම, සියලු දෙවියන්ටම, සියලු මිනිසුන්ටම, දේශනා කොට වදාළ ශ්‍රී සද්ධර්මයයි. මේ ශ්‍රී සද්ධර්මය ඇත්තෙන්ම 'සත් ධර්මයකි' හෙවත් මුලික ධර්ම කරුණු හතකි. සත් ධර්ම යන්නෙහි තේරුම ශ්‍රේෂ්ඨතම ධර්මය යන්නයි. එහෙත් සත් යන්නෙහි 'හත' යන අර්ථය ද ඇති බව ඔබත් දන්නවා නේද? එම ධර්ම කරුණු හතෙහි සද්ධර්ම හෙවත් ශ්‍රේෂ්ඨ ධර්ම කරුණු තිස් හතක් ඇත. ඒ සත් තිස් බෝධිපාක්ෂික ධර්මයන්ය. මේ ධර්ම කරුණු හත ගසක හරය හෙවත් අරටුව වගේ දෙයකි. අපේ

බුදුහාමුදුරුවෝ අවුරුදු හතළිස් පහක් තිස්සේ අපට දේශනා කළ හැම දෙයක්ම ඉදිරිපත් කරලා තියෙන්නේ මේ මූලික දහම් කරුණු හත නොහොත් තිස් හත මුල් කරගෙනයි. අද විවිධ උගතුන් බුදුදහම, බුද්ධාගම, බෞද්ධ ඉතිහාසය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ශිෂ්ටාචාරය, බෞද්ධ දර්ශනය, ආදී වශයෙන් විවිධ විෂයයන් ගැන කතා කරන, ලියන, හැම අවස්ථාවකමත් ඒ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාළ ධර්ම කරුණු වලින් එකක් හෝ සම්බන්ධ කරගෙන කතා නොකරන්නේ නම්, නොලියන්නේ නම් ඒ කතා කරන දේවල්, ලියන දේවල් බුදුරජාණන් වහන්සේගේ නිමල ධර්මයෙන් ඈත් වූ දේවල් බව තේරුම් ගනිමු.

එසේ බුදුදහම නමින් විවිධ දේවල් ගැන කතා කිරීම නිසා ඉස්මතු වෙන්නේ බැබළෙන්නේ බුදුදහමේ හරය නොවෙයි, ශ්‍රී සද්ධර්මය නොවෙයි. මේ නිසාම බුදුදහමේ හරයක් තියෙනවා ද කියාවත් කෙනෙකුට නොතේරෙන තරමටම අද ඒවාට විවිධ දේවල් එකතු වෙලා. බෞද්ධයෝ විවිධ පුද පූජා විධිවලට බාහිර ආටෝප සාටෝපයන්ට, විවිධ විස්චුර්ණ දේවල්වලට, සර්වපිත්තල දේවල් වලට, යොමුවෙලා. අපේ බුදුපියාණන් වහන්සේ විසින් කෙසේවත් අපේක්‍ෂා නොකල විවිධ මහා, මහා, මහා, කියාගන්නා පුදපූජා පෙරහැර ආදියට හා විවිධ උත්සව වලටම නිමල බුදුදහම යට වෙලා. බුදුහමේ හරය සීල සමාධි පඤ්ඤා වලින් සුසංයුත්ත බව අමතක වෙලා. දාන සිල භාවනා යන තුන් පුණ්‍යක්‍රියා වෙනුවට බොහෝ අය දානයට පමණක් සීමාවෙලා. එසේ නැතිනම් සීලයත් ව්‍යාපාර බවට පත්කරගෙන එක්කෝ සීලය එක්ක පමණක් ඔට්ටු වෙනවා. සීලය පමණක් මහා ලොකු කරගෙන ඉන්නවා.

එහෙම නැත්තම් සමහරු භාවනාවට පමණක් සීමා වෙලා. මේ දාන සීල භාවනා කියන තුනම අවශ්‍ය බව බොහෝ අයට අමතක වෙලා.

මජ්ඣිම නිකායේ මහා සාරෝපම සූත්‍රය නමින් විශේෂ සූත්‍ර දේශනයක් ඇත.[2] එම සූත්‍ර දේශනයට අනුව මෙය හරියට ගහක හරය සොයන්න යන අය වගෙයි. ගහේ හරය නොදන්නා සමහරු ගහ ළගට ගිහිල්ලා ඒ ගහේ හරය කියලා අරගෙන එන්නේ අතු ඉති රිකිලි, සමහරු පිට පොත්ත, සමහරු ඇතුළ් පොත්ත හෙවත් එළය, තවත් සමහරු ගහේ හරය කියලා බදාගන්නේ සිවිය. ඉතාමත්ම ටික දෙනෙක් තමයි නියම විදිහට දන්නේ ගහේ හරය කියන්නේ මොකක්ද කියලා.

බුදුදහම කියන්නේ මහා විශාල වෘක්ෂයක්, ගහක්. මේ ගහට දැන් අවුරුදු 2602 වයසයි. මේ ගස රෝපණය කළේ අපේ බුදුරජාණන් වහන්සේ විසිනි. මේ මහා වෘක්ෂයේ ද අතු ඉති රිකිලි, පිට පොත්ත, ඇතුළ් පොත්ත හෙවත් එළය, සිවිය මෙන්ම ඉතාමත්ම හොඳ වෙනත් කිසිම තැනකින් සොයාගැනීමට බැරි හරයක් ද තිබේ. ඉතින් මේ බුදුදහම නැමති ගසේ හරය සොයාගැනිමට නොහැකි සමහරු හරය කියලා බදාගෙන ඉන්නේ ලාභකීර්ති ප්‍රශංසා, විවිධ පුදපූජා, එනම් බුද්ධ පූජා, බෝධිපූජා, තෙසැත්තෑ ඤාණපූජා, සූවිසි බුද්ධ පූජා, අටවිසි බුද්ධපූජා, අසූහාර දහසේ පහන් පූජා වැනි පූජාවන්ය. සමහරු බුදුදහමේ හරය නොදත්කම නිසා බදාගෙන ඉන්නේ බුදුදහම නැමති මහා වෘක්ෂයේ පිට පොත්තයි. ඒ විවිධාකාරයෙන් දක්වන මහා මහා මහා යන අකුරු දෙක පෙරට යොදා ගන්න විවිධ පෙරහැර හා දානාදී පිංකම් පමණි. තවත් සමහරු මේ මහා වෘක්ෂයේ

හරය නොදත්කම නිසාම හරය යැයි සිතා බදාගෙන ඇත්තේ එළයයි. එනම් විවිධාකාරයෙන් පවත්වන සීලයයි. සමහර අය මෙය හඳුන්වන්නේ සීල ව්‍යාපාරය ක්‍රියලමයි. ඒ සීලයත් ව්‍යාපාරයක් කරගත්ත අයයි. තවත් සමහරුන්ට බුදුදහමේ හරය සමාධියයි. ඇත්තෙන්ම බුදුදහමේ හරය වෙන්නේ ප්‍රඥාවයි. එයත් අල්ලාගන ඉන්ඩ හෝ බදාගෙන මෙන්න මේකයි හරය කියා කියා කෑ ගහන්ඩ නෙවෙයි තියෙන්නේ. එය තේරුම් අරගෙන ප්‍රඥාවෙන් හෙවත් විපස්සනාවෙන් සියල්ල දැනගනිමින් දැක ගනිමින් සියලු දෙයින්ම නිදහස් වීමටයි මේ බුදුදහම තියෙන්නේ. ඒ නිසා අපි මේ බුදුදහමේ හරය තේරුම් ගතයුතුමයි. විපස්සනාව පාදක කරගත් මේ බුදුදහමේ හරය දත් කෙනා ලොව අනුපලිප්ත ජීවිතයක් ගත කරන හෙවත් නොඇලෙන ජීවිතයක් ගත කරන කෙනෙකි. බුදුදහමේ හරය තේරුම් ගෙන එය එදිනෙදා ජීවිතයේදී පුරුදු කරමින් පුහුණු කරමින් සරළ වුත් තෘප්තිමත් වුත් සාර්ථක මනුෂ්‍ය ජීවිතයක් ගත කරමින් එවන් අනුපලිප්ත ජීවිතයක් ගත කිරීමට අපිත් වෙහෙස ගනිමු.

බුදුදහම නැමති මහා වෘක්ෂයේ, ගසේ, හරය හෙවත් අරටුව ලෙස අපේ බුදුහාමුදුරුවෝ අපට දේශනා කළ ඒ දහම් කරුණු තිස් හත මොනවාද? ඒ දහම් කරුණු වලින් පැවසෙන මුලික අදහස් මොනවාද? ඒ දහම් කරුණු අනුගමනය කරන්නේ හෙවත් ප්‍රගුණ කරන්නේ කෙසේද? යන්න පැහැදිලි කරගැනීම මෙම පරිච්ජේදයෙන් අපේක්ෂා කෙරේ.

තථාගත බුදුරජාණන් වහන්සේ විසින් අවබෝධ කරගත් නියම ධර්මය යනු සත් තිස් බෝධිපාක්ෂික

ධර්මයන් හෙවත් ධර්ම කරුණු තිස් හතක් බව ඉහත සඳහන් කළෙමු. අපේ බුදුහාමුදුරුවෝ තමන් වහන්සේ විසින් ධර්මය වශයෙන් අවබෝධ කර ගත්තේ මේ සත්තිස් බෝධිපාක්ෂික ධර්ම බව මහා පරිනිබ්බාණ සූත්‍රයේ බ්‍රහ්මචරිය චිරට්ඨිතික ධම්ම දේසනා නම් කොටසෙහි පැහැදිලිවම දේශනා කොට දක්වා වදාළහ. එදා බුදුපියාණන් වහන්සේ විශාලා මහ නුවර මහාවනේ කූටාගාර ශාලාවට වැඩම කොට ආනන්ද හිමියන් අමතා ''ආනන්ද, යන්න ගිහින් මේ වේශාලිය ඇසුරු කරමින් යම් පමණ භික්ෂූන් වහන්සේලා වැඩ සිටිත් ද ඒ සියලුම භික්ෂූන් වහන්සේලා උපස්ථාන ශාලාවට කැඳවන්න.'' යැයි ආනන්ද හිමියන්ට කීහ. එවිට ආනන්ද හිමියෝ ''එසේය ස්වාමීනි'' කියා යම්තාක් වේශාලිය ඇසුරුකරමින් භික්ෂූන් වහන්සේලා වැඩ සිටියේ ද ඒතාක් භික්ෂූන් වහන්සේලා උපස්ථාන ශාලාවට රැස්කරවා බුදුරජාණන් වහන්සේ වෙත ගොස් ඒ බව සැළ කළහ. එවිට බුදුපියාණන් වහන්සේ උපස්ථාන ශාලාවට වැඩම කොට එහි පනවනලද ආසනයෙහි වැඩ සිටිසේක. එහි වැඩ සිට භික්ෂූන් වහන්සේලාට ආමන්ත්‍රණය කරමින් මෙසේ වදාළහ.

''පින්වත් මහණෙනි, මා විසින් මැනවින් අවබෝධකර ගනිමින් දේශනා කරන ලද යම් ධර්මයෝ වෙත් ද ඒ ධර්ම ඔබ වහන්සේලා විසින් ඉතාමත්ම හොඳින් ඉගෙන ගෙන පුරුදු කළ යුතුයි. භාවිතා කළ යුතුයි. නැවත නැවත බහුල වශයෙන් වැඩිය යුතුයි. එය බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙවි මිනිසුන්ට අර්ථය පිණිස, ඒකාන්තයෙන්ම හිත සුව පිණිස වන්නේය. පින්වත් මහණෙනි, මා විසින් ඒ මැනවින්

අවබෝධ කොට දේශනා කරනලද ධර්මයෝ මොනවාද? සතර සතිපට්ඨාන, සතර සම්මප්පධාන, සතර ඉද්ධිපාද, පඤ්ච ඉන්ද්‍රියයන්, පඤ්ච බල, සත්ත බොජ්ඣංග, සහ ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගයත්ය.'' යනුවෙන් දේශනා **කළහ.**

ඒ බුද්ධභාෂිත පාලි පාඨය මෙන්න. ''තස්මාතිහ භික්ඛවෙ යෙ තෙ මයා ධම්මා අභිඤ්ඤා දේසිතා, තෙ වො සාධුකං උග්ගහෙත්වා ආසෙවිතබ්බා, භාවෙතබ්බා, බහුලීකාතබ්බා, යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං. තදස්ස බහුජන හිතාය බහුජන සුඛාය ලෝකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙව මනුස්සානං. කතමේච තෙ භික්ඛවේ ධම්මා මයා අභිඤ්ඤා දෙසිතා, යෙ වො සාධුකං උග්ගහෙත්වා ආසේවිතබ්බා භාවේතබ්බා බහුලීකාතබ්බා යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරටඨිතිකං. තදස්ස බහුජන හිතාය බහුජන සුඛාය ලෝකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දේවමනුස්සානං. සෙයාථීදං, චත්තාරෝ සතිපට්ඨානා, චත්තාරෝ සම්මප්පධානා, චත්තාරෝ ඉද්ධිපාදා, පඤ්චින්ද්‍රියානි, පඤ්ච බලානි, සත්ත බොජ්ඣංගා, අරියෝ අට්ඨංගිකෝ මග්ගෝ''[3]

මේ නිමල බුදුවදන අනුව උන්වහන්සේ පැහැදිලිවම අපට පෙන්වා දෙන්නේ උන්වහන්සේගේ නියම ධර්මය හෙවත් නිමල ධර්මය මෙම සත් තිස් බෝධිපාක්ෂික ධර්මවල අඩංගුවෙන බවය. ඒ සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් යම් කෙනෙක් මැනවින් හදාරා ප්‍රගුණ කරන්නේ නම් ඒ අනුව දිවිගෙවන්නේ නම් හෙතෙම ඒකාන්තයෙන්ම නියම ආකාරයෙන් බුදුරජාණන් වහන්සේගේ බුද්ධ වචනය පිළිපදින

කෙනෙක් යැයි කිව හැකි බවය. නොවරදින බුදුමග එයයි. සැනසුමට මග බුදුදහමයි.

1. සත්තිස් බෝධිපාක්ෂික ධර්ම හා එවායේ සරළ අදහස

සත් තිස් යනු තිස් හත යන්නයි. තිස්හතක් වූ බෝධිපාක්ෂික ධර්මයෝ යනු සම්බුද්ධ සුභාෂිත ශ්‍රී සද්ධර්මය බව දීඝනිකායේ මහා පිරිනිබ්බාණ සූත්‍රයේ සඳහන් ඉහත පාඨයෙන් අපට පැහැදිලි කරගත හැකිවිය. එම සත්තිස් බෝධිපාක්ෂික ධර්මයෝ පිළිවෙලින් මෙසේය.

(අ). සතර සතිපට්ඨාන 4
(ආ) සතර සම්මප්පධාන 4
(ඇ) සතර ඉද්ධිපාද 4
(ඈ) පඤ්ච ඉන්ද්‍රිය 5
(ඉ) පඤ්ච බල 5
(ඊ) සත්ත බොජ්ඣංග 7
(උ)ආර්‍ය අෂ්ඨාංගික මාර්ගය 8 යනුවෙනි.

(අ). සතර සතිපට්ඨාන

අපේ බුදුහාමුදුරුවෝ මෙම සත්තිස් බෝධිපාක්ෂික ධර්මවල පළමුවෙන්ම දක්වා ඇත්තේ සතර සතිපට්ඨානයයි. සතර සතිපට්ඨාන යනු සිහිය පිහිටවිය යුතු ස්ථාන හතරකි. මේ සතර සතිපට්ඨාන යම් කෙනෙක් ප්‍රගුණ කරන්නේ නම් ඔහුට හෝ ඇයට මේ සත්තිස් බෝධිපාක්ෂික ධර්මයෝම දැන ගැනීමට මෙන්ම

දැක ගැනීමටත් හැකියාව ලැබේ. සත්වයන්ගේ පිරිසිදු වීම පිණිස, සෝක හැඬීම් වැළපීම් නැති කිරීම පිණිස, දුක් දොම්නස් සම්පූර්ණයෙන්ම නැති කිරීම පිණිස, මධ්‍යමප්‍රතිපදාවට පැමිණීම පිණිස, නිර්වාණ ධර්මය අවබෝධ කරගැනීම පිණිස බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාළ ඒකායන මාර්ගය හෙවත් එකම මාර්ගය මේ සතර සතිපට්ඨානයයි.

වරක් අපගේ ශාන්ති නායකයාණන් වූ, ශාන්තිදායකයාණන් වූ බුදුරජාණන් වහන්සේ විසින් අපට දේශනා කොට වදාළේ, ''ඔබ ඔබේ ඥාතියෙකුට හෝ මිත්‍රයෙකුට හෝ සහලේ කෙනෙකුට හෝ අනුකම්පාකරන්නේ නම්, යමක් ඇසීමට සලස්වන්නේ නම්, ඒ අය සතර සතිපට්ඨාන භාවනාවෙහි සමාදන් කරවන්න, එහි වාසය කරවන්න, එහිම පිහිටු වන්න.''[4] යනුවෙනි.

සතිපට්ඨානය හෙවත් සිහිය පිහිටුවීම ගැන හදාරණ විට අපට ප්‍රධාන වශයෙන් දීඝනිකායේ මහා සතිපට්ඨාන සූත්‍රය, මජ්ඣිම නිකායේ සතිපට්ඨාන සූත්‍රය, සංයුත්තනිකායේ සතිපට්ඨාන සංයුත්තය හා අංගුත්තර නිකායේ එන සතිපට්ඨාන වග්ගයෙන් ද තොරතුරු ලබාගත හැකිය.

(ආ). සතර සම්මප්පධාන

සතර සම්මපප්ධාන යනු සිතේ උත්සාහය, වීර්‍යය, ධෛර්යය ඇති කරගත යුතු පැති හතරකි. එනම්

1. සංවරප්පධාන (අකුසල් සංවර කිරීමට වීර්‍යය),

2. පහානප්පධාන (අකුසල් බැහැර කිරීමට වීර්‍ය්‍යය),
3. භාවනප්පධාන (කුසල් වැඩීමට වීර්‍ය්‍යය)
4. අනුරක්ඛනප්පධාන (වැඩූ කුසල් ආරක්‍ෂාකර ගැනීමට වීර්‍ය්‍යය) යන හතරයි.

සිත සංවර කරගත යුත්තේ නොඋපන් අකුසල් ඇති නොවීමටයි. සිතෙන් බැහැර කළ යුත්තේ සිතේ ඇතිවී තියෙන අකුසල චේතනාවන්ය. සිතේ වැඩිය යුත්තේ කුසල චේතනාවන්ය. එසේම අප විසින් ආරක්‍ෂා කරගත යුත්තේ සිතෙහි ඇති කරගත් එම කුසල චේතනාවන්ය. සතර සම්මප්පධාන වීර්‍ය්‍යය යනු මේවාය. අංගුත්තර නිකායේ හතර වෙනි නිපාතයේ එන පධාන සූත්‍රයට අනුව සම්‍යක් ප්‍රධාන වීර්ය ඇති කරගැනීමේදී නූපන් අකුසල් නොඉපදීමට ඡන්දය උපදවාගත යුතුයි. ඒ සඳහා වෑයම් කළ යුතුයි. වීර්‍ය්‍යය ආරම්භ කළ යුතුයි. සිත දැඩි කොට තබා ගතයුතුයි. ඒ අනුව වීර්‍ය්‍යය වැඩිය යුතුය (ඡන්දං ජනෙති, වායමති, විරියං ආරභති, චිත්තං පග්ගණ්හාති, පදහති)[5]. මෙලොව උපන් සැම මිනිසෙක් විසින්ම අකුසල් ප්‍රහාණය කළ යුතුය, කුසල් වැඩිය යුතුය. වරක් අපේ බුදුහාමුදුරුවෝ අපට මෙසේ දේශනා කළහ. ''මහණෙනි , අකුසලය අත්හරින්න. අකුසලය අත්හරින්න පුළුවනි. අකුසලය අත්හරින්නට බැරිනම් මම අකුසලය අත්හරින්න කියා කියන්නේ නැහැ. යම් හෙයකින් අකුසලය අත්හරින්න හැකි වේද ඒ නිසයි මම එසේ කියන්නේ. අකුසලය අත්හරනවිට එය අහිත පිණිස දුක් පිණිස පවතින්නේ නම් මම මෙහෙම කියන්නේ නැහැ. එය අත්හරින විට හිතසුව පිණිස පවතින නිසාමයි මම ඔබලාට මේ ආකාරයෙන් අකුසලය අත්හරින්න යැයි කියන්නේ.''[6] යනුවෙනි.

(ඇ). සතර ඉද්ධිපාද

ඉද්ධි හෙවත් ඍද්ධි යනු සාමාන්‍ය කෙනෙකුට කළ නොහැකි දේවල් හෙවත් අසාමාන්‍ය වූ දේවල්ය. උදාහරණයකට අහසින් ගමන් කිරීම, වතුර මතුපිට ඇවිදීම, බිත්ති පසාකරගෙන යාම වැනි දේවල්ය. යම් කෙනෙකු විසින් පළවෙනි ධ්‍යානය, දෙවෙනි ධ්‍යානය. තුන්වෙනි ධ්‍යානය, හා හතර වෙනි ධ්‍යානය යන ධ්‍යාන හතර වැඩීමෙන් අනතුරුව අභිඥාඥා හෙවත් විශේෂ ඥාණ පහක් ලබාගැනීමේ හැකියාව ඇත. ඒවානම් ඉද්ධිවිධ ඥාණය, දිබ්බ සෝත ඥාණය, පරචිත්ත විජානන ඥාණය, පුබ්බේ නිවාසානුස්සති ඥාණය හා දිබ්බචක්ඛු ඥාණය යන ඥාණයන්ය. මේ සියල්ලම ලෞකික ඥාණයන්ය. එහි අදහස මේ සියලු ඥාණ ලබාගත්තත් කෙනෙකුට කෙලෙස් නැති වීමක් සිදුවන්නේ නැත. එබැවින් නිවන් අවබෝධ කළ නොහැක. වෙනත් ඕනෑම ආගමක අනුගාමිකයන්ටත් මේ ඥාණයන් ලබාගත හැකිය. එහෙත් බුදුරජාණන් වහන්සේ විසින් සුවිශේෂයෙන් සොයාගත් ඥාණය වන ආසවක්ඛය ඥාණය වෙනත් කිසිම ආගමකින් සොයා ගත නොහැක, ලබාගත නොහැක.

ඒ කෙලෙස් නැති කිරීමේ ඥාණය සොයාගත්තේ අපගේ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසිනි. මෙය බුදුදහමට පමණක් ආවේනික වූ ඥාණයකි. මෙම දක්වන ලද සියලුම ඥාණ වල මුලින්ම ඇත්තේ ඍද්ධිවිධ ඥාණයයි. ඒ ඥාණයෙන් කරන්නේ විවිධ වූ ඍද්ධිප්‍රාතිහාර්‍යයන් පෑමයි. අර චූල පන්තක හාමුදුරුවෝ වගෙයි. ඔබටත් මතකද, චූල පන්තක හාමුදුරුවන්ගේ කතාව. චූල පන්තකගේ අයියාගේ නම මහා පන්තක. අයියා පැවිදි වෙලයි හිටියේ. අයියට

හිතුණා මල්ලිවත් පැවිදි කරවන්න. ඉතින් මල්ලිත් පැවිදි කළා. ඒත් මල්ලිට කිසිම දෙයක් පාඩම් හිටින්නේ නැහැ. එක ගාථාවක පද හතර පාඩම් කරගන්න මාස හතරකිනුත් බැරි වුණා. ඉතින් මහා පන්තක හාමුදුරුවෝ කීවා ''ඔය විදියට මේ සම්බුද්ධ ශාසනයේ ප්‍රතිපත්ති පුරන්න බැහැ ඒ නිසා සිවුරු ඇරලා ගෙදර යන්න'' කියලා. අනේ ඉතින් අඬ අඬා ගෙදර යන්න කියලා කුටියෙන් බැහැරට යනකොට ම අපේ බුදුහාමුදුරුවෝ දැක්කා. දැකලා කතා කළා කොහෙද යන්නේ කියලා ඇහුවා. සිද්ධිය කීවා. ''බණ දහම් පාඩම් හිටින්නේ නැති නිසා සහෝදර හාමුදුරුවෝ ගෙදර යන්න කීවා, ඒ නිසා මේ මම යනවා යන්න'' කියලා කීවා.

ඒ අවස්ථාවේ අපේ බුදුහාමුදුරුවෝ මේ හාමුදුරුවන්ට පිරිසිදු රෙදි කෑල්ලක් දීලා අවවාද කළා නැගීගෙන එන හිරු දිහා බලාගෙන ''රජෝහරණං රජෝහරණං'' (දූවිලි නැති කරනවා, දූවිලි නැති කරනවා) කිය කියා භාවනා කරන්න කියලා. මේ විදියට භාවනා කරනකොට මේ හාමුදුරුවන්ගේ සිතේ තිබුණ සියලුම රජස් හෙවත් කෙලෙස් දූවිලි නැති වුණා. මේ චූල පන්තක හාමුදුරුවෝ රහත් වුණා. ඊට පස්සේ උන්වහන්සේ තමන් වගේම හාමුදුරුවරු දහසක් මැව්වා තමන්ගේ ඍද්ධි බලයෙන්. ඒ වගේ දේවල් වලට තමයි ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය පෑම කියා කියන්නේ. මේ ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය පෑමට ඉතාමත්ම දක්ෂව වැඩ සිටියේ බුදුරජාණන් වහන්සේ ඇරුණාම මුගලන් මහරහතන් වහන්සේය. උන්වහන්සේ ඍධිමතුන් අතරින් අග්‍රයි කියා වරක් අපේ තථාගත වූ බුදුපියාණෝම දේශනා කළහ. එහෙත් මෙවැනි ප්‍රාතිහාර්‍ය්‍ය ගැන අපේ බුදුරජාණන් වහන්සේ ඒ තරම් අගය කළේ නැත. උන්වහන්සේ

දේශනා කළේ මේ සියලුම ප්‍රාතිහාර්‍ය වලට වඩා දේසනා ප්‍රාතිහාර්‍යයම උතුම් බවය. මේ සියලුම ලෞකික හා ලෝකෝත්තර ඍද්ධීන් ලබාගැනීමට ඍද්ධිපාද හතරක් තිබිය යුතුය. ඍද්ධිපාද යනු ඍද්ධි ලබාගැනීමට පාදයි, මාවතයි, අඩිතාලමයි හෙවත් අත්තිවාරමයි. එම ඍද්ධිපාද හතර මෙසේය.

1.ඡන්ද ඍද්ධිපාද
2.විරිය ඍද්ධිපාද
3. චිත්ත ඍද්ධිපාද
4. විමංසා ඍද්ධිපාද යන හතරයි.

(ඈ). පඤ්ච ඉන්ද්‍රියය

ඉන්ද්‍රිය කියනවාත් සමගම ඔබටත් සමහරවිට ඇස, කන, නාසය, දිව, ශරීරය සහ මනස යන ඉන්ද්‍රියයන් මතක් වේවි. අපට ඉන්ද්‍රියයන් කීයක් තියෙනවාද කියලා ඇමෙරිකාවේ, කැනඩාවේ හෝ බටහි ර ළමයෙකුගෙන් ඇහුවොත් එකපාරටම කියන්නේ ''පහයි'' කියලයි. අපට තියෙන්නේ ඉන්ද්‍රියයන් පහද? නැහැ අපට ඉන්ද්‍රියයන් හයක් තියෙනවා. ඒ සුවිශේෂ ඉන්ද්‍රිය හෙවත් හය වැනි ඉන්ද්‍රියය තමයි ඉතාමත්ම වැදගත් වෙන්නේ. ඉතින් ඒ ඉන්ද්‍රියය ගැන ලෝකයේ බොහෝ දෙනාට අවබෝධයක් නැහැ. ඒ ගැන අපට කියලා තියෙන්නේ අපේ බුදුහාමුදුරුවන් වහන්සේයි. ඒ හය වැනි ඉන්ද්‍රියය තමයි 'මනස'. ඒ ඉන්ද්‍රියයත් සමග තමයි අපි ඉන්ද්‍රියයන් හයක් තියෙනවා කියා කියන්නේ. මෙය බුදුදහමින් අපට කියාදෙන සුවිශේෂ දෙයකි. එය සුවිශේෂ දායාදයකි. එහෙත් මෙහිදී, මේ මාතෘකාවේදී, අපි ඉන්ද්‍රියයන් යැයි කතා කරන්නේ ඔය ඉන්ද්‍රියයන් හය

දෙනා ගැන නොවෙයි. මේ කතා කරන්නේ අපේ සිතේ ඇති කරගෙන, දියුණු කරගෙන අධිපතිභාවයට පත් කරගෙන ප්‍රධානියෙක් බවට පත් කරගන්නා මානසික කරුණු පහක් ගැනයි. ඒ මානසික කරුණු පහ මෙසේය.

1. සද්ධා ඉන්ද්‍රියය
2. විරිය ඉන්ද්‍රියය
3. සති ඉන්ද්‍රියය
4. සමාධි ඉන්ද්‍රියය
5. පඤ්ඤා ඉන්ද්‍රියය යන පහයි.

අපේ සිත දියුණු වෙන්ඩ, දියුණු වෙන්ඩ, මේ ඉන්ද්‍රිය ධර්ම පහ වැඩෙනවා. ඉන්ද්‍රිය ධර්ම වැඩෙන්න වැඩෙන්න ඒවාම බල බවටත් පත්වෙනවා. ඒවිට ඒවාට කියන්නේ ''බල ධර්ම කියලයි'' ඒ අනුව බල ධර්මත් පහක් තියෙනවා.

(ඉ) පඤ්ච බල

(ඉහත සඳහන් ඉන්ද්‍රිය ධර්ම ම වැඩී බලයක් බවට පත්වෙන විට ඒවා බල ධර්ම ලෙස හඳුන්වනු ලැබේ)

(ඊ) සත්ත බොජ්ඣංග

බොජ්ඣංග යන වචනයේ තේරුම බෝධියට උපකාර වෙන අංග කියන එකයි. බෝධිය යනු බුද්ධත්වයයි. සම්මා සම්බෝධිය, පච්චේක බෝධිය හා අරහන්ත බෝධිය යනුවෙන් බෝධිය හෙවත් බුද්ධත්වය ද ආකාර තුනකි. මේ ත්‍රිවිධ බෝධිය සඳහාම සෑම

යෝගාවචරයෙකුටම අවශ්‍යයෙන්ම වැඩිය යුතු හෙවත් දියුණු කළ යුතු මානසික ගුණ ධර්ම හතක් තියෙනවා. සත්ත බොජ්ඣංග නමින් මේ හඳුන්වන්නේ එම ධර්ම කරුණු හතය. මෙම ධර්ම කරුණු ඉතාමත්ම හොඳින් මැනවින් වැඩිය යුතු බැවින් ද ඒවා වැඩීම නිසාම චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් අවබෝධයට මග පෑදෙන බැවින් ද ඒවා ''සම්බොජ්ඣංග'' නමින් හැඳින්වේ. අපගේ ලොවුතුරු තථාගත සම්මා සම්බුදුපියාණෝ අපට දේශනා කොට වදාළ එම සම්බොජ්ඣංග ධර්මයෝ හත් දෙනෙකි. එම සම්බෝජ්ඣංග ධර්ම හත මෙසේය.

1. සති සම්බොජ්ඣංගය
2. ධම්ම විචය සම්බොජ්ඣංගය
3. විරිය සම්බොජ්ඣංගය
4.. පීති සම්බොජ්ඣංගය
5. පස්සද්ධි සම්බොජ්ඣංගය
6. සමාධි සම්බොජ්ඣංගය
7. උපේක්ඛා සම්බොජ්ඣංගය යනුවෙනි.

(උ) ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය

සම්බුද්ධශාසනයෙහි පමණක් අපට තියෙන තවත් සුවිශේෂ දෙයක් තමයි මේ. මෙය මධ්‍යම ප්‍රතිපදාවයි. මෙම මධ්‍යම ප්‍රතිපදාව අපේ බුදුහාමුදුරුවෝ තමන් වහන්සේගේ මංගල ධර්මදේශනය වූ ධම්මචක්කපවත්තන සූත්‍රයෙහි මුලින්ම දේශනා කොට වදාළහ. පස්වග භික්ෂූන් අමතා අන්ත දෙක අත හැර මධ්‍යම ප්‍රතිපදාවට පැමිණීමේ අවශ්‍යතාවය පැහැදිලි කළහ. මෙයින් නුවණැස ඇතිකරන බවත්, ඥාණය ඇතිකරන බවත්, සියලු

කෙලෙසුන් ව්‍යපසමනය කරමින් හෙවත් නැති කරමින් ශාන්තිය ඇති කරන බවත්, අභිඥා ඇති කරන බවත්, සම්බෝධිය ලබා දෙන බවත්, නිර්වාණය ලබා දෙන බවත් දේශනා කළහ.[7]

පුද්ගලයා නිවන කරා පමුණුවන සෝතය හෙවත් දිය දහර මෙයයි.[8] සෑම කෙනෙක්ම අරහත් තත්වයට පත්වෙන විට තමන් ලැබූ අත් දැකීම වචනයට පෙරළන්නේ ''ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති'' (ඉපදීම නැති කළා. බඹසර හැසුරුණා. කළයුතුදේ කළා. නැවත මෙලොවට පැමිණීමක් නැත) යනුවෙන් ප්‍රකාශයක් කරමින්ය. මෙහි වුසිතං බ්‍රහ්මචරියං යන්නෙන් අදහස් කරන්නේ බඹසර හැසිරුණෙමි හෙවත් බ්‍රහ්මචරියාවෙහි හැසිරුණෙමි යන්නය. මෙහි බඹසර යනු මෙම ආර්‍ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කිරීමමයි. මේ බව සංයුත්ත නිකායේ මග්ග සංයුත්තයේ භික්ඛු සූත්‍රයෙන් අපට පැහැදිලි කරගත හැකිය.

එම සූත්‍රය දේශනයට අනුව එක්තරා භික්ෂුවක් අපගේ භාග්‍යවන්ත වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ වෙත එළඹ මෙසේ ඇසුවේය. ''ස්වාමීනි, මේ ''බ්‍රහ්මචරිය'' ''බ්‍රහ්මචරිය'' කියා කියනවා. මොකක්ද මේ බ්‍රහ්මචරිය කියන්නේ, මොකක්ද බ්‍රහ්මචරිය අවසානය කියන්නේ?'' එවිට අපේ බුදුහාමුදුරුවෝ ''මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයම බ්‍රහ්මචරියාවයි. රාගක්ඛය, දෝසක්ඛය, මෝහක්ඛය, යැයි යමක් ඇද්ද මෙය බ්‍රහ්මචරිය අවසානයයි'' යැයි පැහැදිලිව දේශනා කළහ.[9]

තවද අපගේ බුදුපියාණන් වහන්සේ මෙම ආර්ය අෂ්ඨාංගික මාර්ගයම 'ධර්මයානය', 'බ්‍රහ්මයානය', 'අනුත්තර සංග්‍රාම විජය', වැනි සුවිශේෂ වචන වලින් ද හඳුන්වා දී ඇති බව පෙනේ. සංයුත්ත නිකායේ මහා වග්ගයේ මග්ග සංයුත්තයේ එන බ්‍රාහ්මණ සූත්‍රයට අනුව ආනන්ද හිමියන් දිනක් පිණ්ඩපාතයේ වඩින අතර ජාණුස්සෝණි නම් බ්‍රාහ්මණයෙක් සුදුම සුදු ඇඳුම් ඇඳගෙන හැම අතින්ම සුදෝ සුදු වූ සුදු අශ්වයන් ද බැඳි යානයක නැගී යන බවත් ඒ දැක මිනිස්සු මෙය නම් ශ්‍රේෂ්ඨ යානයකි. ඒකාන්තයෙන්ම මේ බ්‍රහ්මයාගේ යානය වැනි යානයක් තමයි.'' යනුවෙන් කියනු ඇසී විහාරයට පැමිණ බුදුරජාණන් වහන්සේ අමතමින් ''ස්වාමීනි මේ ශාසනයෙහි ද බ්‍රහ්මයානයක් පනවන්නට පුළුවන්ද?'' යැයි ඇසුහ. එවිට බුදුපියාණෝ ''ආනන්ද මේ ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගයම ''බ්‍රහ්මයානය'', ''ධම්මයානය'', ''අනුත්තර සංගාමවිජය'' යනුවෙන් ද හැඳින්විය හැකියි.'' යනුවෙන් දේශනා කළහ.[10]

නිවණ සඳහා ඇති එකම මාර්ගය මෙම මාර්ගයයි. එම ආර්ය අෂ්ඨාංගික මාර්ගය මෙසේය.

1. සම්මා දිට්ඨි
2. සම්මා සංකප්ප
3. සම්මා වාචා
4. සම්මා කම්මන්ත
5.සම්මා ආජීව
6. සම්මා වායාම
7. සම්මා සති
8. සම්මා සමාධි යන අංග අටය.

මජ්ඣිම නිකායේ මහා චත්තාරීසක සූත්‍රයට[11] අනුව මෙම අංග අටකින් යුත් මාර්ගය සේඛ හෙවත් අරහත් තත්වයට නොපත් එහෙත් සෝවාන් ආදී මග පිළිවෙලින් අනාගාමි දක්වා වැඩ සිටින උතුමන්ගේ මාර්ගයයි. මෙම අට ට තවත් කරුණු දෙකක් එකතුවී දස අංගයකින් සමන්නාගත වූ විට හෙවත් යුක්ත වූ විට එය රහතන් වහන්සේගේ මාර්ගය බවට පත්වෙන බව සඳහන් වේ. ඒ කරුණු දෙක මෙසේය.

1.සම්මා ඤාණ
2.සම්මා විමුක්ති.

''දස අඞගේහි සමන්නාගතෝ අරහාති වුච්චතීති'' යන ඛුද්දකනිකායේ කුමාරපඤ්හයේ[12] සඳහන් පාඨයෙන් ද එය තවදුරටත් අපට සනාථ කරගත හැකිය. මෙම ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය වෙනත් කිසිම ආගමකින් දර්ශනයකින් අපට හැදෑරිය නොහැක, ප්‍රගුණ කළ නොහැක. වරක් අපගේ තථාගත ලොවුතුරා සම්මා සම්බුදුපියාණන් වහන්සේ විසින්ම පැහැදිලිවම දේශනා කළේ ''මග්ගානට්ඨංගිකො සෙට්ඨෝ'' යනුවෙන් සියලුම මාර්ග අතරින් ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගයම ශ්‍රේෂ්ඨ වන බවය.

2. සත් තිස් බෝධි පාක්ෂික ධර්ම වඩන්නේ හෙවත් ප්‍රගුණ කරන්නේ කෙසේද?

බුදුදහම අදහනවා හෝ අනුගමනය කරනවා යන්නෙන් අදහස් කරන්නේ මෙම සත්තිස් බෝධිපාක්ෂික ධර්ම භාවිතා කිරීමයි, වැඩීමයි, ප්‍රගුණ කිරීමයි. අපේ

බුදුහාමුදුරුවෝ මෙසේ ඉතාමත්ම පැහැදිලිව අවබෝධ කරගෙන අපට දේශනා කොට වදාළ මෙම ධර්ම කරුණු උන්වහන්සේගේ අවවාදයටම අනුව අපි ඉතාමත්ම හොඳින් හැදෑරිය යුතුයි, තේරුම් ගතයුතුයි. අනුගමනය කළ යුතුයි. එය බොහෝ දෙනාගේ, දෙවිමිනිසුන්ගේ හිත සුව පිණිසම පවතින්නකි.

මෙම දහම් කරුණු තිස් හතෙහි මුලින්ම සඳහන්ව ඇත්තේ සතර සතිපට්ඨානයයි. සතර සතිපට්ඨානය යම් කෙනෙක් වඩන්නේ නම් පුහුණුවෙන්නේ නම් නැවත නැවත භාවිතා කරන්නේ නම් එයම නිවණට ඇති එකම මාර්ගය බව සම්බුද්ධ දේශනයයි. (සතර සතිපට්ඨානය යනු ආර්‍ය අෂ්ඨාංගික මාර්ගයේම කොටසකි, එනම් සත්වෙනි අංගයයි).

සතර සතිපට්ඨානය බුදුදහමේ උගන්වන භාවනාව හෙවත් මූලික භාවනා ශිල්පීය ක්‍රමයයි. බුදුදහමට අනුව භාවනාව කරද්දී සමථභාවනා විපස්සනා භාවනා යනුවෙන් භාවනාවේ ස්ථර දෙකක් හෙවත් මට්ටම් දෙකක් ඇත. මේවා සමහර විට ඔබ අසා ඇත්තේ භාවනා ක්‍රම දෙකක් ලෙසටය. එහෙත් මේවා භාවනා ක්‍රමදෙකක් ලෙසින් දකිනවාට වඩා යෝග්‍ය වන්නේ තල දෙකක් හෙවත් ස්ථර දෙකක් ලෙස දැකීමය. මේවා ඇත්තෙන්ම භාවනාවේ දියුණුවත් සමග ඇතිවෙන අවස්ථා දෙකකි. සතිපට්ඨාන සූත්‍රයෙන් අපට බුදුපියාණෝ දේශනා කළේ සමථ හා විපස්සනා යන දෙකම එකට වැඩීමේ සුවිශේෂ භාවනා ක්‍රමයකි. මෙය සූත්‍රදේශනාවල සඳහන් වෙන්නේ ''යුගනද්ධ''ක්‍රමය කියලයි. ඒ අනුව මෙය සමථවිපස්සනා යුගනද්ධයයි.

මෙම සතිපට්ඨාන සූත්‍ර දේශනය අපේ බුදුහාමුදුරුවෝ දේශනා කොට වදාළේ ඉන්දියාවේ අද වර්තමාන නව දිල්ලියට අයත් ස්ථානයකදීය. එදා බුදුපියාණන් වහන්සේගේ කාලයේ මේ ස්ථානයට කීවේ කුරු ජනපදය කියලයි. එහි තිබුණ කම්මාසදම්ම කියන නියම්ගමේ දී මෙම සූත්‍රය දේශනා කළබව වාර්තාවී ඇත. එහිදී මුලින්ම භික්ෂූන් අමතා '' ඒකායනෝ අයං භික්ඛවේ මග්ගෝ සත්තානං විසුද්ධියා... යනාදී වශයෙන් සත්වයන්ගේ විසුද්ධිය හෙවත් පිරිසිදු වීම පිණිසත්, සෝක හැඬීම් වැළපීම් නැති කිරීම පිණිසත්, දුක් දොම්නස් නැති කිරීම පිණිසත්, ආර්‍ය්‍ය මාර්ගයට පැමිණීම පිණිසත්, නිර්වාණ ධර්මය අවබෝධකර ගැනීම පිණිසත් ඇති එකම මාර්ගය මෙයයි'' යනුවෙන් සූත්‍රයේ ආරම්භය හෙවත් ආමුඛය දේශනා කළහ.

ඒ එකම මාර්ගය මොකක්ද? යනුවෙන් නැවත ප්‍රශ්න කළ බුදුපියාණෝ''මේ සතර සතිපට්ඨානය'' යැයි දේශනා කළහ. ඒ සතර සතිපට්ඨානය මෙසේය.

1. කයෙහි කය අනුව බලමින් වාසය කිරීම
2. වේදනාවන්හි වේදනා අනුව බලමින් වාසය කිරීම
3. සිතෙහි සිත අනුව බලමින් වාසය කිරීම
4. ධර්මයන්හි ධර්ම අනුව බලමින් වාසය කිරීම.

යම් කෙනෙක් මේ සතර සතිපට්ඨාන වඩන්නේ නම් ඒ තැනැත්තාට සත්තිස් බෝධිපාක්ෂික ධර්මයෝම වැඩන්නේය. සතර සතිපට්ඨානය නිවණට ඇති එකම මගයි. සෘජුවම, නිවණ අරමුණු කරගනිමින්, නිවන් අවබෝධය පිණිසම දේශනා කළ ධර්ම, හෙවත් නිවණ කරා අපව යොමු කරන, නිවණට පක්ෂව සිටින ධර්ම

බෝධිපාක්ෂික ධර්මයන්ය. ඒ මෙම සත් තිස් බෝධිපාක්ෂික ධර්මයෝය.

අපේ බුදුහාමුදුරුවෝ අපට දේශනා කළ මේ සත්තිස් බෝධිපාක්ෂික ධර්මයෝ චතුරාර්‍ය්‍ය සත්‍යය, පටිච්චසමුප්පාදය, ත්‍රිලක්‍ෂණය යන ප්‍රධාන ධර්ම කරුණු තුනට සම්පිණ්ඩනය කළ හැක. එය හරියට සැරියුත් මහරහතන් වහන්සේ මජ්ඣිම නිකායේ මහා හත්ථිපදෝපම සූත්‍රයේ මේ මහපොළොව මත ඇවිදින සියලු සත්වයන්ගේ පා සටහන් ඇතාගේ පා සටහනෙහි බහාලිය හැකි වන්නාසේ සියලු කුසල් දහම් චතුරාර්‍ය්‍ය සත්‍යයෙහි ගැබ් කළ හැකිය යනුවෙන් සියලු කුසල් දහම් සම්පිණ්ඩනය කළාක් මෙනි. සමස්ත සම්බුද්ධ දේශනයම එක වචනයකට ද සම්පිණ්ඩනය කළ හැකිය. ඒ ''සති'' යන වචනයටයි. ''සතිය'' පට්ඨානය කිරීම, පිහිටුවීම සතිපට්ඨානයයි. ඒ අනුව සතිපට්ඨාන යනු සිහිය පිහිටුවීමයි.

මේ චතුරාර්‍ය්‍ය සත්‍යය, පටිච්චසමුප්පාදය හා ත්‍රිලක්‍ෂණ සිද්ධාන්තය සම්බුද්ධ දේශනයේ සුවිශේෂ ධර්ම කරුණු තුනකි. මෙය ත්‍රිකෝණයක් ලෙස ද පෙන්වා දිය හැකිය. චතුරශ්‍රයට වඩා ත්‍රිකෝණය ශක්තිමත් බව ඔබත් දන්නවා නේද? ත්‍රිකෝණයේ පාද සම නිසා එකිනෙකට යැපෙමින් පවතියි. මේ ත්‍රිකෝණයේ මධ්‍යලක්‍ෂය සතියයි. එය සතිපට්ඨානයයි. මේ ත්‍රිකෝණය තේරුම් ගැනීමට නම් යම් කෙනෙක් කළ යුත්තේ මධ්‍යලක්‍ෂයේ සිට අධ්‍යයනය කිරීමයි. ප්‍රගුණ කිරීමයි. එනම් සතියෙන්, සිහියෙන් හෙවත් සතර සතිපට්ඨානයෙන් ආරම්භ කොට භාවනා කිරීමයි. භාවනාව හැම මොහොතකම වැඩෙන දෙයකි. අවශ්‍ය

වෙන්නේ සිහියෙන් ඉදීමයි. සතිමත්බව වැඩීමම භාවනාවයි.

සතිපට්ඨාන සූත්‍රයේ සඳහන් භාවනාව අනුව අපට අපේ බුදුහාමුදුරුවෝ දේශනා කළ ආකාරයට භාවනාව ප්‍රගුණ කරනවිට චතුරාර්‍ය සත්‍ය ධර්මය, පටිච්චසමුප්පාදය, ත්‍රිලක්ෂණය පමණක් නොව සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ම එනම් සමස්ත බුදුදහමම ඉතා හොඳින් වැඩහෙනු ඇත. බුදුදහම යනු අපේ බුදුහාමුදුරුවෝ අපට දේශනා කොට වදාළ නිමල ශ්‍රී සද්ධර්මයයි

3. සම්බුද්ධ සුදේශිත නිමල ශ්‍රී සද්ධර්මය

අද බුදුදහම වටා බුදුදහම නමින් මලකඩ නොහොත් විවිධ වූ කැලි කසල රාශියක් බැඳී ඇත. ඒ සියලු මලකඩ, කැලි කසල, ඉවත් කළ විට නිමල බුදුදහම බැබළෙයි. වරක් අපගේ අසහාය ශාස්තෘන් වහන්සේ වන සම්මා සම්බුදුපියාණන් වහන්සේම අපට දේශනා කොට වදාළේ ''තථාගතප්පවෙදිතො ධම්ම විනයෝ භික්ඛවේ විවටෝව විරෝචති නො පටිච්ඡන්නෝ''[13] යන්නෙන් ''පින්වත් මහණෙනි, මා විසින් දේසිත ධර්මය විවෘත වෙනවිට බබළයි, සැඟවෙන විට නොවේ.'' යනුවෙනි.

නිමල බුදුදහම යනු කුමක්දැයි තේරුම් යනවිට ඒ වටා ඇති මේ මල හෙවත් කැලි කසළ, බුදුදහමට අදාළ නොවන දේ, තමාගේ සිතින් ඉවත් වේ. බුදුදහමෙහි පිහිටන බැවින් තමන් බුදුදහමෙහි නියම කොටස් කාරයෙක් හෙවත් තථාගත බුදුරජාණන් වහන්සේගේ නිමය ශ්‍රාවකයෙක් බවට පත්වේ. මේ නිසා අපි මෙම සමස්ත නිමල ධර්මය වැටහෙන ආකාරයෙන්, සත්තිස් බෝධිපාක්ෂික ධර්ම වැටහෙන ආකාරයෙන්, සතර සතිපට්ඨාන සම්පූර්ණ කිරීමට උත්සාහවත් වෙමු, භාවනාව ආරම්භ කරමු.භාවනා කරමු. සසර අක් මුල් නොදැන අවිද්‍යා අන්ධකාරයේ ගිලී, තණ්හාවෙන් බැඳී බැඳී භවයෙන් භවයට සැරිසරන අසරණ සත්වයන්ට නියම සැනසුම ලබා ගත හැක්කේ භාවනාවෙන් පමණි.

4. සතර සතිපට්ඨාන භාවනාව ප්‍රගුණ කරනවිට සත්තිස් බෝධිපාක්ෂික ධර්ම සම්පූර්ණවෙන ආකාරය

සතිපට්ඨානය අනුව භාවනා කරනවිට ආරම්භයේ පටන්ම අවශ්‍ය කරන මුලිකම දෙය වන්නේ නැවත නැවතත් සිත වර්තමානයට හෙවත් භාවනා අරමුණට ගෙන එමින් වර්තමාන මොහොතෙහිම, හෙවත් භාවනා අරමුණෙහිම, සිත තැන්පත් කරගැනීමට උත්සාහවත්වීමයි. අතීතය ගැන හිතමින් විවිධ වූ කුණු කන්දල් ඇවිස්සීමත් අනාගතයේ විවිධ කුණු කන්දල් ඇදගැනීමට කරන වීරියත් හෙවත් සිහිපත් කිරීමත් නතර කිරීමට සිත දැඩි කරගත යුතුයි. එවිට වර්තමානයේ සිත පවත්වා ගත හැකිය. සිත නිදැල්ලේ අරින්න එපා. සිතට යම්කිසි කටයුත්තක නිරත වෙන්න අවශ්‍යයි. ඒ නිසා සිතට වැඩක් දෙන්න. මොකක්ද අපි සිතට දෙන වැඩේ. ''මෙන්න මේ හුස්ම රැල්ල දිහා බලාගෙන ඉන්න'' කියා

සිතට කියනවා. ඔන්න ඕකයි කරන්න තියෙන්නේ. හැබැයි මතක තියාගත යුතු දෙයක් තියෙනවා. ඔය වර්තමානයේ සිත පවත්වාගැනීමට උත්සුක වෙන්නේ වර්තමානයට ඇලීමටත් නෙවෙයි. අවශ්‍ය වෙන්නේම ඇලීම නොව අත හැරීමමයි. එහෙත් ඒ තත්වයට සිත සකස් කරගැනීමට හැකියාව ලැබෙන්නේ වර්තමානයේ සිත එකඟ කරගැනීමට සමත් කෙනෙකුට පමණි. සෑම ප්‍රඥාවන්තයෙකුටම මෙය කළ හැකි දෙයකි, ඔව් ඔබටත්.

මේ බලන්න ධම්මපදයේ අපේ බුදුහාමුදුරුවෝ අපට මේ ගැන දේශනා කර ඇති ආකාරය. ''අතීතයට ඇලෙන්න එපා, අතහරින්න. අනාගතයටත් ඇලෙන්න එපා, අතහරින්න. වර්තමානයටත් ඇලෙන්න එපා, අතහරින්න. භවයේ එතෙරට යන්න. එවිට ඔබේ මනස සම්පූර්ණයෙන්ම නිදහස් වේවි. ඉන්පසුව ඔබ නැවත ඉපදීමටවත් වයසට යාමටවත් පත්වෙන්නේ නැත.''

(මුඤ්ච පුරේ මුඤ්ච පච්ඡාතො
මජ්ඣෙ මුඤ්ච භවස්ස පාරගූ
සබ්බත්ථ විමුත්තමානසෝ
න පුනං ජාතිජරං උපෙහිසි.)[14]

ඔබ දන්නවා ද මේ කාරණයම එදා අපගේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් අර ගස්වල පොතු වලින් ඇඳුමක් හදාගෙන ඇඳගෙන බුදුරජාණන් වහන්සේ ළඟට ආව බාහිය දාරුචීරියටත් දේශනා කළ ආකාරය. බාහිය කියන්නේ ඉන්දියාවේ සුප්පාරක කියන ප්‍රදේශයේ සමුද්‍ර තීරයේ ජීවත්වුණ කෙනෙක්. ඔහු සමහර විට මුහුදේ යාත්‍රාකළ කෙනෙක් වෙන්න ඇති. එහෙමත් නැත්තම් අර විජය කුමාරයා වගේ මුහුදේ පා කරලා

එවපු කෙනෙක් වෙන්නත් ඇති. කෙසේ හෝ මොහු මුහුදේ යාත්‍රා කරමින් සිටිනවිට නැව විනාශවී යන්න ඇති. ගොඩට ආවේ ඇඳුම් කිසිවක් නැතිවයි. ඉතින් ඔහු කළේ ඇඳුම් වෙනුවට ගස්වල පොතු ටිකක් එකතු කරළා ඇඳුමක් හදාගෙන ඇඳගැනීමයි. ඊටපස්සේ ඔහු දකින දකින අය හිතුවේ මේ නම් උතුම් කෙනෙක් තමයි කියලයි. ඉතින් එයින් නැවතුණේ නැහැ. සිවුපසයෙන්ම ඔහුට සලකන්න පටන් ගත්තා. වඳින්න පුදන්න පටන් ගත්තා. බාහියට මේ ආකාරයෙන් බොහෝ දෙනා සතුටින් සිවුපසයෙන් සලකන විට දිනක් හුදකලාව සිටිද්දී ඔහුට මෙහෙම හිතුණා.

''මේ ලෝකයේ යම් කෙනෙක් අරහත් ද ඒ අරහත් මගට පිළිපන්නේ ද මමත් එවැනි රහතන් වහන්සේ කෙනෙක් තමයි'' කියලා. මෙසේ හිතනවාත් සමගම තමන්ගේ පෙර භවයක ඥාතියෙක් වූ දේවතාවෙක් ඔහු කෙරෙහි අනුකම්පාවෙන් ඔහුගේ සුභසිද්ධිය අපේක්ෂාවෙන් ඔහුවෙත පැමිණ මෙහෙම කීවා. ''බාහිය මේ... ඔබ නම් රහතන් වහන්සේ කෙනෙකුත් නොවෙයි. අරහත් මගට පිළිපන් කෙනෙකුත් නෙවෙයි. ඔබ අවම වශයෙන් අරහත් භාවයට පත්වීමට හේතුවෙන දහම් ප්‍රගුණ කරන කෙනෙකුත් නොවෙයි.'' කියලා. එවිට එයා ඇහුවා එහෙම නම් කොහෙද එවැනි රහතන් වහන්සේ කෙනෙක් ඉන්නේ කියලා. දේවතාවා කීවා ''උතුරු ප්‍රදේශයේ සාවත්ථි නමින් නගරයක් තියෙනවා. එහි අරහත් සම්මාසම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ වාසය කරනවා. බාහිය ඒ භාග්‍යවතුන් වහන්සේ අරහත් මෙන්ම අරහත් තත්වයට පත්වීම සඳහා දහම් දෙසන කෙනෙක්'' කියලා. මේ දේවතාවාගේ කතාව අහලා බාහිය ඉතාමත්ම සංවේගයට පත්ව ඒ ගමන්ම සුප්පාරක

ප්‍රදේශයෙන් නික්මී එක් රැයක් පමණක් එක තැනක ගතකරමින් ඉන්දියාවේ දකුණේ සිට උතුරට හෙවත් සැවත් නුවර ජේතවනාරාමයට ම පැමිණියේය.

මේ අවස්ථාව වනවිට බොහෝ භික්ෂූන් වහන්සේලා විහාරස්ථානයේ එළියේ සක්මන් කරමින් වැඩ සිටියහ. ඒ භික්ෂූන් ළගට පැමිණි බාහිය මෙසේ කීවේය. ''ස්වාමීනි, ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණෝ වැඩ සිටින්නේ කොහෙද? ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ දැක ගැනීමට කැමතියි.'' එවිට ඒ භික්ෂුහු ''බාහිය භාග්‍යවතුන් වහන්සේ පිණ්ඩපාතය සඳහා ඇතුළ්ගමට පිවිසියහ'' යැයි කීහ. එවිට බාහිය ඉක්මණින් ඉක්මණින්ම ජේතවනාරාමයෙන් පිටත්ව සැවත් නුවරට පිවිස මහ මඟ ඔස්සේ ගමන් කරද්දී, අතිශයින්ම සුසංවරව දුටු දුටු දනන් සිත් සතන් සනසන මහත් බැතියෙන් ඔකඳ කරවන ශාන්ත වූ කයින් මෙන්ම ශාන්ත වූ සිතින් ද යුතුව සුන්දර ගමනින් මැනවින් පා පියුම් තබ තබා මනාව හික්මුණු මහා හස්ථිරාජයෙක් මෙන් ගෙයින් ගෙට පිඬුසිගා වඩින අපගේ ශාන්තිනායක භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ දුටුවේය. දැක අමන්දානන්දයට පත් බාහිය බුදුරජාණන් වහන්සේ වෙත එළඹ දෙපා අභියස වැඳ වැටී මෙසේ කීවේය. ''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, බොහෝ කාලයක් හිතසුව පිණිස පවතින ආකාරයෙන් මට දහම් දේශනා කරන්න. සුගතයන් වහන්ස බොහෝ කාලයක් හිත සුව පිණිස හේතුවන ආකාරයෙන් මට දහම් දේශනා කරන්න.''

එවිට බුදුරජාණන් වහන්සේ බාහියට මෙසේ වදාළ සේක. '' බාහිය මේ ධර්ම දේශනා කිරීමට කාලය

නොවෙයි දැන් පිණ්ඩපාතයේ වඩින කාලයයි.'' දෙවෙනුව ද බාහිය මෙසේ කීය. '' ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේගේ ජීවිතයට අන්තරාවක් වෙයි ද මගේ ජීවිතයට අන්තරාවක් වෙයි ද කියා මම දන්නේ නෑ. භාග්‍යවතුන් වහන්සේ මට දහම් දේශනා කරන සේක්වා. සුගතයන් වහන්සේ මට දහම් දේශනා කරන සේක්වා.'' භාග්‍යවතුන් වහන්සේ දෙවෙනුව ද බාහියට '' බාහිය මේ දහම් දෙසීමට කාලය නොවෙයි පිණ්ඩපාතයේ වඩින කාලයයි'' කීහ. තෙවෙනුව ද බාහිය ''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ ජීවිතයට අන්තරාවක් වෙයිද මගේ ජීවිතයට අන්තරාවක් වෙයි ද කියා දන්නේ නැහැ. ඒ නිසා භාග්‍යවතුන් වහන්ස මට බොහෝ කාලයක් හිත සුව පිණිස දහම් දේශනා කරන්න. සුගතයන් වහන්ස මට බොහෝ කායක් හිතසුව පිණිස දහම් දේශනා කරන්න'' යැයි ඉල්ලා සිටියේය.

එවිට අපගේ බුදුරජාණන් වහන්සේ බාහියට මෙසේ දේශනා කළහ. '' බාහිය එහෙමනම් මෙසේ හික්මෙන්න. යමක් දකින කල්හී එහි ඇත්තේ දැකීම පමණයි. අසන කල්හී එහි ඇත්තේ ඇසීම පමණයි. ගඳ සුවඳක් ලබන කල්හී එහි ඇත්තේ ගඳ සුවඳ දැනීම පමණයි. රසයක් විඳින කල්හී එහි ඇත්තේ රසයක් විඳීම පමණයි. කයට යමක් ස්පර්ශ වෙන්නේ නම් එහි ඇත්තේ ඒ ස්පර්ශය පමණයි. සිතට යමක් දැනෙන කල්හී එහි ඇත්තේ ඒ දැනීම පමණයි. බාහිය ඔබ මෙසේ හික්මෙන්න. බාහිය ඔබ යම්සේ දකින විට දැකීම පමණක් ගන්නේ නම්, අසනවිට ඇසීම පමණක් අසන්නේ නම් ගඳ සුවඳ ලබන විට ද රස විඳින විටද ස්පර්ශයක් ලබන විට ද සිතට යමක් දැනෙන විට ද එය පමණක්ම ගන්නේ නම් බාහිය එවිට ඔබ එයින් නැත.

යම් විටක ඔබ එයින් නැත්නම් ඔබ එහි නැත. ඔබ එහි නැත්නම් මෙහිත් නැත. එහිත් නැත මෙහිත් නැත. මේ දෙක අතරත් නැත. මෙයම දුක නැති කිරීමයි.'' යනුවෙන් දේශනා කළහ.

අපේ බුදුහාමුදුරුවෝ බාහියට දහම් දේශනා කළේ මෙපමණයි. එය අසා ඒ වෙලාවේම බාහියගේ සිත සියලු උපාදානයන්ගෙන් මිදී සියලු ආශ්‍රව ධර්මයන්ගෙන් මිදුණේය. බුදුරජාණන් වහන්සේ මෙසේ ඉතාම කෙටියෙන් දහම් දෙසා එතැනින් දිගටම පිණ්ඩපාතයේ වැඩම කළ සේක. බාහිය වෙත පැමිණි ළදරු වසුපැටියෙක් සහිත එළ දෙනක් ඔහුට ඇණ ඔහු මරා දැමුවේය. පිඬු සිගා ආපසු වඩිද්දී බාහියගේ මළ සිරුර දුටු බුදුපියාණෝ භික්ෂූන් වහන්සේලාට බාහියගේ මළ සිරුර මැස්සක තබා ගෙන ගොස් දවා ස්ථූපයක් කරන්න යැයි අනුදැන වදාළහ. භික්ෂූහු එසේ කොට බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ තමන් එසේ කළ බව දැනුම් දී ඔහුගේ ගතිය හෙවත් ඉපදුණ තැන කොහේදැයි විචාළහ. එවිට බුදුහු ඔහු පණ්ඩිත කෙනෙක් , නුවණැති කෙනෙක් බවත්, ඉතාම ඉක්මණින් ධර්මය තේරුම්ගත් බවත්, තමන් වහන්සේ වෙහෙසට පත් නොකළ බවත්, හෙතෙම පිරිනිවන් පෑ බවත් දේශනා කළ සේක. සතිපට්ඨානය හෙවත් සිහිය පිහිටුවීමේ උපරිම ප්‍රතිඵලය එයයි, එනම් අරහත් තත්වයට පත්ව පිරිනිවීමයි. මේ අනුව සිත පිහිටවිය යුත්තේ අතීතයේත් නොව අනාගතයේත් නොව වර්තමානයේ බව පැහැදිලි වෙන අතර වර්තමානයේද සිත පිහිටුවිය යුත්තේ යමක් මම, මගේ, මගේ ආත්මය, යනුවෙන් අල්ලා ගැනීමට නොව ඇත්ත ඇතිසැටියෙන් දැකීමට බව ඉතාම හොඳින් තේරුම් ගනිමු.

සතිමත් වීම හෙවත් සතිපට්ඨානය යැයි කියන්නේ මෙයටයි. සිත වර්තමානයේ සිදුවෙන ක්‍රියාවකට යොමු කරගෙන සිටීමටයි. ඉතින් වර්තමානයේ සිදුවෙන ක්‍රියා අතර අනිත් හැම ක්‍රියාවකින්ම පාහේ බොහෝ විට සිදුවෙන්නේ ලෝභ දෝස මෝහාදී හිත කලඹන සිත තව තවත් ව්‍යාකුල තත්වයකට පත් කිරීමකි. මේ නිසා අපට සිත යොමු කිරීමට හොඳම අරමුණ තමයි අපේ මේ නිබඳවම නිරන්තරවම ක්‍රියාවක යෙදී තිබෙන හුස්ම රැල්ල. හුස්ම රැල්ල අපි උපන් මොහොතේ සිට මිය යන තෙක් ක්‍රියාවේ යෙදී තිබෙන දෙයකි. එසේම එහි අමුතුවෙන් ඇලෙන්නට ගැටෙන්නට දෙයකුත් නැහැ. අපි කළ යුත්තේ සිදුවෙන දෙය ඒ ආකාරයෙන් බලාගෙන සිටීම පමණයි. ඒ අනුව අපට අතීතයේ හෝ අනාගතයේ සතිය පට්ඨාන කල නොහැක හෙවත් සිහිය පිහිටුවිය නොහැක. එය කළ හැක්කේත් මෙන්ම කළ යුත්තේත් වර්තමාන යේය. එසේ නම් සතිපට්ඨාන භාවනාව යනු වර්තමානයේ සිහිය පිහිටුවමන් කරන භාවනාවක් බව පැහැදිලිව තේරුම් ගනිමු.

සතිපට්ඨාන භාවනාව කරනවිට මුලින්ම දක්වා ඇත්තේ ආනාපානසති භාවනාවයි. මෙහිදී කරන්නේ ඔබේ හුස්ම රැල්ල දෙස බලාසිටිමින් භාවනා කිරීමයි. ඔබ කළ යුත්තේ නිතරම ඔබේ සිත හුස්මරැල්ලේ හෙවත් අභ්‍යන්තර කයේ රඳවා ගනිමින් හුස්ම රැල්ලේ සිදුවෙන සෑම වෙනස් කමක්ම දැන ගැනීමයි එනම් සිතින් දැක ගැනීමයි. මෙහිදී හුස්ම කයේ සිදුවෙන කායික ක්‍රියා දැන ගනිමින් ඒවා ඉතාම හොඳින් තේරුම් ගන්නා අතර ඒ අනුව සිත සංසුන් කර ගන්න, සංවර කරගන්න. මේ සතිපට්ඨානයෙන් යුතුව භාවනාව ආරම්භ කිරීමයි.

ආරම්භය, ආරබ්භධාතු හෙවත් ආරම්භධාතු යන නම් වලින් ද හැඳින්වේ. ආරබ්භධාතු, නික්කමධාතු, පරක්කම ධාතු, යනුවෙන් වීර්‍ය්‍ය වැඩීමේ දී ඇති කරගත යුතු අවස්ථා තුනක් ඇත. ආරම්භධාතු හෙවත් ආරබ්භධාතු යනු මුලින් ඇතිකරගත යුතු උත්සාහයයි. ඒ ආරම්භ කළ උත්සාහය දිගටම කරගෙන යාම නික්කම ධාතුය. එසේ පවත්වාගෙන යන උත්සාහය මල්ඵල දරන අවස්ථාව හෙවත් අභිමතාර්ථය සම්පූර්ණවෙන අවස්ථාව දක්වාම අත් නොහැර උත්සාහයෙන් වියර්‍ය්‍යයෙන් කරගෙනයාම පරක්කමධාතු නම් වේ. භාවනා හොඳින් කරන විට යෝගාවචරයා තුළ මේ ගුණ එකින් එක තිබිය යුතුය. අපේ බුදුහාමුදුරුවෝ එදා ජය ශ්‍රී මහා බෝධි මුලයේදි නොසෙල්වෙන දැඩි වීර්‍ය්‍යයකින් යුතුව සම්බුද්ධත්වය සඳහා භාවනාවට වාඩිවු ආකාරය ඔබත් දන්නවා නේද? ඒ වීර්‍ය්‍ය අත්‍යවශ්‍යම දෙයකි.

සත්තිස් බෝධි පාක්ෂික ධර්මවල දෙවෙනි අංගයට දක්වා ඇත්තේ සතර සම්මප්පධාන වීර්‍ය්‍යයන්ය. යම් කෙනෙක් භාවනා කරනවා යන්නෙන් අදහස් කරන්නේ මෙම සම්මප්පධාන වීර්‍ය්‍යයන් ඇති කරගැනීමමයි. වීර්‍ය්‍යයෙන් තොරව කිසිවක් කළ නොහැකි බව සැමටම පැහැදිලි දෙයකි. දුක් නැති කිරීමටත් වීර්‍ය්‍ය අත්‍යවශ්‍යය. ''විරියේන දුක්ඛං අච්චේති'' කියලයි අපගේ තථාගත බුදුපියාණන් වහන්සේ මෙය දේශනා කළේ. එසේ නම් භාවනාවට අත්‍යවශ්‍යයෙන්ම තිබිය යුතු ගුණාංග හතරක් තමයි මේ සතර සම්පප්පධාන වීර්‍ය්‍ය කියන්නේ. මොනවද මේ සම්මපප්පධාන වීර්‍ය්‍ය හතර.

1. නොඋපන් අකුසල් නොඉපදීමට කරන වීර්‍ය්‍ය

2. උපන් අකුසල් නැති කිරීමට කරන වීයර්‍ය
3. නොඋපන් කුසල් ඇති කරගැනීමට කරන වීයර්‍ය
4. උපන් කුසල් වැඩි දියුණු කරමින් පවත්වා ගැනීමට කරන වීයර්‍ය.

මෙම වීයර්‍ය ඇති කරගැනීම බුදුරජාණන් වහන්සේ විසින් සතිපට්ඨාන සූත්‍රයේ මුලින්ම දක්වා ඇත්තේ ''ආතාපි'' යන වචනයෙනි. ආතාපි යනු කෙලෙස් තවන වීයර්‍යයයි. එසේනම් මෙහිදී මුලින්ම අපි තේරුම් ගත යුත්තේත් මෙන්ම වැඩිය යුත්තේත් මෙම කරුණු හතරයි. අපේ සිතෙහි ඇතිවෙන විවිධ අකුසල සිතුවිලි තේරුම් ගනිමින් ඒවා ඇතිවෙනවාත් සමගම ඒවා අකුසල් බව දැනගෙන ඒවාට සිතෙහි ලැග ගැනීමට හෙවත් පැලපදියම් වීමට ඉඩ නොදිය යුතුය. එසේම අපේ සිතෙහි ලැග ගත් අකුසල සිතුවිලි තිබේ නම් ඒවා ගැන නැවත නැවත හිත යොමු කර කර බලමින් කිසිම විටක පසුතැවිලි නොවී ඒවා වහ වහාම සිතින් බැහැර කළ යුතුය. එසේම සිතෙහි කුසල සිතුවිලි, යහපත් සිතුවිලි නිතර නිතර භාවිතා කළ යුතුය, බහුල වශයෙන් වැඩිය යුතුය. මේ භාවනාවයි. මෙසේ කුසල සිතුවිලි වඩන විට සිත සංවර වෙයි, සැහැල්ලුවෙයි, පිවිතුරුවෙයි, එක්තැන්වෙයි. මේ වැඩෙන්නේ සතිය හෙවත් සිහියයි, සතිමත් බවයි. මේ සතිපට්ඨානයයි.

අකුසල් සිත් බැහැර කරමින් කුසල් සිත් වැඩීමම භාවනාවයි. කුසල් සිත් වැඩීමේ දී බුදුගුණ සිහි කිරීම, දහම් ගුණ සිහිකිරීම, සඟ ගුණ සිහි කිරීම, මෛත්‍රිය වැඩීම, වැනි දෙයින් මහත් ආශ්වාදයක්, සැනසීමක් මෙන්ම සිත තැන්පත් කරගැනීමට, සිත සංවර කර ගැනීමට මහත් උපකාරයක් ද වේ. එබැවින් විශේෂ

යෙන්ම භාවනාවට හුරුවෙන ආධුනිකයන් විසින් බුද්ධානුස්සතිය, ධම්මානුස්සතිය, සංඝානුස්සතිය, මෙන්ම මෛත්‍රී භාවනාවත් ප්‍රගුණ කිරීම විශේෂයෙන්ම භාවනාවටත් බුදුදහම තේරුම් ගැනීමටත් අත්‍යවශ්‍යවන විශේෂ අංගයක් වන ශ්‍රද්ධාව ඇති කරගැනීම හා සිත සංසුන් කරගැනීමට මහත් සේ උපකාරී වේ.

මෙම භාවනා ක්‍රම මෙසේ වඩන විට තමන්ගේ සිත සංවර වී සමාධිගත වුවහොත් කෙනෙකුට සමාධි භාවනාවේ ප්‍රතිඵල වශයෙන් ලැබිය හැකි ධ්‍යාන හතර සහ සමාපත්ති මෙන්ම සතර ඍද්ධිපාද වඩමින් ලෞකික අභිඥා එනම් ඍද්ධිවිධ ඥාණය, දිබ්බසෝත ඥාණය, පරචිත්ත විජානන ඥාණය, පුබ්බේනිවාසානුස්සති ඥාණය සහ දිබ්බචක්ඛුඥාණය යන ඥාණ වුවද ලැබිය හැකිය. මෙම ඥාණ ලැබීම සඳහා ඉද්ධිපාද වැඩීම අවශ්‍යයි. සත්තිස් බෝධිපාක්ෂික ධර්මවල මීළගට ඇත්තේ ඉද්ධිපාදය.

ඉද්ධිපාද යනු මොනවාදැයි හඳුන්වාදුන් අවස්ථාවේ දී ඉහත අප විසින් ඉද්ධිපාද හෙවත් ඍද්ධිපාද හතරක් ඇති බව හඳුන්වා දී ඇත. නැවත ඒ හතර මෙසේ සිහි කරගනිමු.

1.ඡන්ද ඉද්ධිපාදය
2. විරිය ඉද්ධිපාදය
3. චිත්ත ඉද්ධිපාදය
4. විමංසා ඉද්ධිපාදය යන හතරය.

මහා පරිනිබ්බාණ සූත්‍රදේශනයට අනුවත් සංයුත්ත නිකායේ ඉද්ධිපාද සංයුත්තයේ චාපාල

සූත්‍රදේශනයට[15] අනුවත් අපගේ භාග්‍යවත් වූ අරහත්වූ සම්මා සම්බුදුපියාණන් වහන්සේ වසර හතළිස් පහක් තිස්සේ දෙව් මිනිසුන් ප්‍රමුඛ සියල් සතුන් වෙත දහම් අමා වැසි වස්වා, වසර අසූවක් ගත වෙද්දී, එදා චාපාල චේතිය නම් ස්ථානයේදී සිහියෙන් යුක්තව සිය ආයු සංස්කාරය හළ බවත් ඒ සමගම මහපොළොව කම්පාවූ බවත් සඳහන් වේ. (න චිරං තථාගතස්ස පරිනිබ්බානං භවිස්සති, ඉතො තිණ්ණං මාසානං අච්චයෙන තථාගතො පරිනිබ්බායිස්සතී. අථඛො භගවා චාපාලෙ චේතියෙ සතො සම්පජානො ආයුසඞ්ඛාරං ඔස්සජි.)

මෙසේ ආයුසංස්කාරය අත්හැරීමට පෙර ආනන්ද හිමියන් අමතා එහිදී බුදුරජාණන් වහන්සේ, ''යස්ස කස්සචි ආනන්ද ඉමෙ චත්තාරෝ ඉද්ධිපාදා භාවිතා බහුලීකතා යානිකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා. සෝ ආකඞ්ඛමානො කප්පං වා තිටෙඨය්‍ය කප්පාවසෙසං වා.'' යනුවෙන් ප්‍රකාශයක් කළහ. එහි අදහස මෙසේය. ''ආනන්ද යම් කිසි කෙනෙක් විසින් මේ සතර ඉද්ධිපාද වඩන ලද්දේද බහුල වශයෙන් නැවත නැවතත් කරන ලද්දේද, යානයක් මෙන් කරන ලද්දේද, වස්තුවක් මෙන් කරන ලද්දේද, තමන්ට අනුව සිටින සේ කරන ලද්දේද, පුරුදු කරන ලද්දේද, මැනවින් ආරම්භ කරන ලද්දේද, හෙතෙම කැමති නම් කල්පයක් හෝ ඊට ටිකක් වැඩියෙන් වුවද සිටිය හැකිය'' යන්නය. මෙහි කල්පයක් යන්නෙන් අදහස් කරන්නේ ආයුෂ්කල්පය යැයි සැලකිය හැක. එනම් ඒ කාලයේ මිනිසුන් ජීවත්වෙන උපරිම ප්‍රමාණයයි, පරමායුෂයයි. ඒ අනුව බුදුරජාණන් වහන්සේගේ කාලයේ කෙනෙකුගේ පරමායුෂ අවුරුදු එකසිය විස්සකි.

නමුත් මෙහිදී බුදුපියාණෝ මෙසේ සඳහන් කරද්දීත් ආනන්ද හිමියන්ට ''ස්වාමීනි කල්පයක් වැඩ සිටින්න'' යැයි කියා ආරාධනා කිරීමට අමතක විය. එසේ සිදුවුයේ මාරාවේෂයක් නිසා යැයි මෙම සූත්‍රදේශනා වල සඳහන් වේ. එය කෙසේ වුවද අපට මෙහිදී වැදගත් වන්නේ බුදුපියාණන් වහන්සේ විසින් දේශනා කොට වදාළ මෙම පාඨයයි. එහිදී ''සතර ඉද්ධිපාද වැඩූ කෙනෙකුට කල්පයක් ජීවත්විය හැකිය'' යන අදහස ඉදිරිපත් කළහ.

බුදුරජාණන් වහන්සේ විසින් සංයුත්ත නිකායේ ඉද්ධිපාද සංයුත්තයේ අපාර සූත්‍රයෙහි මෙම සතර ඉද්ධිපාද වඩන ආකාරය දක්වා ඇත්තේ ''ඡන්දසමාධිපධාන සංඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරිය සමාධිපධාන සංඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. චිත්තසමාධි පධාන සංඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විමංසා සමාධිපධානසංඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති.'' යනුවෙනි. මෙයින් කියවෙන්නේ මෙම ඉද්ධිපාද වැඩීමේදී පිළිවෙලින් සමාධියත් ඒ සමාධිය සඳහා උත්සාහයත් එමෙන්ම ඒ සඳහා සිතත් ඇතිකරගත යුතු බවය. මෙහි ඡන්දය යනු කුසලඡන්දයයි. යම් කුසලයක් කිරීමට ඇති කැමැත්තයි. සතර ඉද්ධිපාද වැඩීමේදී අගතිවලට නොවැටී එනම් ඡන්ද, දෝස, භය, මෝහ යන හතරට නොවැටී සම්පූර්ණයෙන්ම තම සිත පිරිසිදු කරගැනීමේ අපේක්ෂාවෙන්ම පමණක් භාවනා කළයුතුය. මෙසේ භාවනා කර සිවුවැනි ධ්‍යානයට පත්විය හැකිය. ලෝභ, ද්වේෂ, මෝහ, වලින් යුතුව ධ්‍යානවලට පත්විය නොහැක. එසේ හතර වැනි ධ්‍යානය උපදවා ගත් පසු එය ඡන්ද සමාධිය යැයි කියනු

ලැබේ. එසේම විරිය සමාධිය, චිත්ත සමාධිය විමංසා සමාධිය යැයි ඒ හතරට ද නම් කළ හැක. ඒ ඡන්ද සමාධිය ලබාගැනීමට උත්සාහය තිබිය යුතුමය. එය පධාන යන්නෙන් මෙහිදී පැහැදිලි කරයි. සංඛාර යන්නෙන් මෙහි අදහස් කරන්නේ ඉද්ධියක් ලබාගැනීමට අවශ්‍යකරන සිතුවිලිය. ඒ අනුව කැමැත්ත, සමාධිය, උත්සාහය හා ඒ පිළිබඳව සිතුවිලි, යොදා ගැනීම අවශ්‍යවේ. මෙසේ ක්‍රියාකරනවිට එය පදනමක් වශයෙන් සිට ක්‍රියාත්මක වීම නිසා ඉද්ධියක් ලබා ගතහැක.

චිත්ත යනු සිතයි. මෙහිදී චිත්ත යන්නෙන් අදහස් කරන්නේ ඉද්ධියක් ලබාගැනීමට ඇතිකරගන්නා සිතයි. මෙසේ සිතූ පමණින් ඉද්ධි නොලැබේ. ඒ සඳහා උත්සාහය අවශ්‍යයි. මෙය ඇත්තෙන්ම අධිෂ්ඨානයයි.

විරිය යන්නෙන් අදහස් කරන්නේ උත්සාහයයි. මෙසේ උත්සාහයෙන් භාවනාකර සමාධිය ලබාගෙන ධ්‍යාන හතර ලබාගත් පසු ඉද්ධි ඇති කරගත හැක.

විමංසා යන්නෙන් අදහස් කරන්නේ සිහිනුවණින් යුතුව ඒ ගැන සොයා බැලීමයි. සිහිනුවණින් තොරව ඉද්ධි ලබාගත නොහැක. සිහිනුවණින් තොරව ලබාගන්නා ධ්‍යාන වලින් සිද්ධවෙන්නේ තමන් ඒ ධ්‍යාන වැරදි ලෙස භාවිතා කිරීමයි. සිහිනුවණ අවශ්‍යවෙන්නේ ඒවා නිවැරදිව භාවිතා කිරීමටයි. දේවදත්තට මෙන් විමසීමේ නුවණ නැති විට ධ්‍යානවලින් අයුතු ප්‍රයෝජන ගන්නා අතර ඒ නිසාම ඒවායින් පිරිහීමට ද ලක්වේ.

මෙසේ සතර ඉද්ධිපාද වඩන කෙනෙකුට

16

මෙතෙරින් එතෙරට යාහැකි බව සංයුත්ත නිකායේ අපාර සූත්‍රයෙන් දේශනා කරති (අපාරා පාරං ගමනාය සංවත්තන්ති).[16] එහිම 'විරද්ධ' සූත්‍රයෙන් පෙන්වා දෙන්නේ යම් කෙනෙක් මේ සතර ඉද්ධිපාද වරද්දා ගත්තොත් හෙතෙම දුක් නැති කිරීමට යන ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගයම වරද්දා ගන්නා බවයි. (යෙසං කෙසඤ්චි භික්ඛවේ චත්තාරෝ ඉද්ධිපාදා විරද්ධා, විරද්ධෝ තෙසං අරියො මග්ගෝ සම්මාදුක්ඛක්ඛයගාමී.) එසේම යම් කෙනෙක් මේ ඉද්ධිපාද අරම්භ කරන ලද්දේ ද හෙතෙම මැනවින් දුක් නැතිකරන මාර්ගය අරම්භ කරන ලද්දේය (යෙසං කෙසඤ්චි භික්ඛවේ චත්තාරෝ ඉද්ධිපාදා ආරද්ධා ආරද්ධෝ තෙසං අරියො මග්ගෝ සම්මාදුක්ඛක්ඛයගාමී.)

මෙම සංයුත්තයෙහිම නිබ්බිදා සූත්‍රයෙන් පෙන්වා දෙන්නේ මේ සතර ඉද්ධිපාද වැඩීම නිසා, භාවිතා කරන නිසා, බහුල වශයෙන් කිරීම නිසා, එය ඒකාන්තයෙන්ම නිබ්බිදාව හෙවත් අවබෝධයෙන්ම කළකිරීමට පත්වීම පිණිස, විරාගය හෙවත් රාගයෙන් තොරවීම පිණිස, නිරෝධය පිණිස, තමා තුළ ශාන්තිය ඇතිකරගැනීම පිණිස, විශේෂ ඤාණ ලබාගැනීම පිණිස, සම්බෝධිය පිණිස, නිර්වාණය පිණිස හේතුවෙන බවයි. (ඒකන්ත නිබ්බිදාය විරාගාය නිරෝධාය උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.)

සංයුත්ත නිකායේ මහාවග්ගයේ එන මෙම ඉද්ධිපාද සංයුත්තයේ පදේස සූත්‍රයෙන් ද ඉතාම වැදගත් කරුණක් පැහැදිලි කෙරේ. එහිදී බුදුපියාණන් වහන්සේ දේශනා කරන්නේ මෙසේය. ''පින්වත් මහණෙනි, අතීතයේ සිටි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ මේ

ඉද්ධිපාද වලින් කොටසක් වැඩුවේ ද ඒ සියල්ලෝම මෙම ඉද්ධිපාද වැඩූ නිසා එසේ වූහ. අනාගතයේදී යම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ මේ ඉද්ධිපාද වලින් කොටසක් හෝ වැඩුවේ නම් එසේ වූයේ මේ ඉද්ධිපාද වැඩූ බැවිනි. එසේම වර්තමානයේ යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් මේ ඉද්ධිපාද කොටසක් හෝ වඩන්නේ නම් ඒ මේ ඉද්ධිපාද වැඩීම නිසයි. එහි 'සමත්ත' සූත්‍රයෙහි දක්වා ඇත්තේ අතීතයේ යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් මේ ඉද්ධිපාද සම්පූර්ණ කරයි නම් ඒ ඉද්ධිපාද වැඩීම නිසයි. අනාගතයේදී යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් මේ ඉද්ධිපාද සියල්ලම සම්පූර්ණ කරයි ද, ඒ මෙම ඉද්ධිපාද වැඩීම නිසයි. වර්තමානයේදී යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් මේ ඉද්ධිපාද සම්පූර්ණ කරයි ද, ඒ මෙම ඉද්ධිපාද වැඩීම නිසයි. යනුවෙනි.

මෙම ඉද්ධිපාද වැඩීම නිසා ඇති කරගත හැක්කේ ඉද්ධි වශයෙන් දක්වන ලෞකික ඉද්ධි එනම් ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍යපෑම, පෙර භවයන් ගැන කීම, අන් අයගේ සිත් කීම, අන් අයගේ දුර වූ ද ළඟ වූ ද විවිධ ශබ්ද වලට සවන් දීම, ආදිය පමණක් නොව ලෝකෝත්තර වශයෙන් ද ඍද්ධිබල ඇති කරගත හැක. ලෝකෝත්තර ඍද්ධිලෙස සලකන්නේ 'ආසවක්ඛයඤාණය' ලබාගනිමින් සියලු කෙලෙස් නැති කිරීමය. ඉද්ධි පාද වැඩීම නිසා සියලු ආශ්‍රව ධර්මයන් නැති කොට චේතෝ විමුත්තියටත් පඤ්ඤාවිමුත්තියටත් පත් වෙන බව මෙම සංයුත්තයේම සඳහන් 'භික්ඛු' සූත්‍රයෙන් පැහැදිලි කරති.

බුදුහු මෙසේ වදාරති. '' පින්වත් මහණෙනි, අතීතයේ යම් කිසි භික්‍ෂුවක් සියලු ආශ්‍රව ධර්මයන් නැති

කොට චිත්ත විමුත්තියටත් ප්‍රඥාවිමුත්තියටත් පත්වූයේ ද ඒ සියලු දෙන මේ ඉද්ධිපාද නැවත නැවත වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් එසේ වූහ. අනාගතයේදී යම් කිසි භික්‍ෂුවක් සියලු ආශ්‍රව ධර්මයන් නැති කොට චිත්ත විමුත්තියටත් ප්‍රඥාවිමුත්තියටත් පත් වන්නාහු ද ඒ සියලු දෙන මේ ඉද්ධිපාද නැවත නැවත වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් එසේ වන්නාහුය. එසේම දැන් වර්තමානයේදී යම් කිසි භික්‍ෂුවක් සියලු ආශ්‍රව ධර්මයන් නැති කොට චිත්ත විමුත්තියටත් ප්‍රඥාවිමුත්තියටත් පත්වන්නේ ද ඒ සියලු දෙන මේ ඉද්ධිපාද නැවත නැවත වඩන බැවින් බහුල වශයෙන් වඩන බැවින් එසේ වන්නෝය.'' යනුවෙනි.

(යෙහි කෙචි භික්ඛවේ අතීතමද්ධානං භික්ඛූ ආසවානං ඛයා අනාසවං චේතෝවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිංසු සබ්බේ තෙ චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා. යේහි කේචි භික්ඛවේ අනාගත මද්ධානං භික්ඛූ ආසවානං ඛයා අනාසවං චේතෝවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකරිත්වා උපසම්පජ්ජ විහරිස්සන්ති සබ්බේ තෙ චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා. යේහි කේචි භික්ඛවේ එතරහි භික්ඛූ ආසවානං ඛයා අනාසවං චේතෝ විමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති සබ්බේ තෙ චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා).

අපගේ ශාස්තෲ වූ භාග්‍යවත්වූ අරහත් වූ ඒ තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේට මේ සතර ඉද්ධිපාද පිළිබඳව පෙර නො ඇසූ විරූ අවබෝධය

ලැබීමත් සමගම නුවණැස පහළ වූ බවත්, ඥාණය පහළ වූ බවත්, ප්‍රඥාව පහළ වූ බවත්, විද්‍යාව පහළ වූ බවත්, ආලෝකය පහළ වූ බවත්, මෙම සංයුත්තයේ නව වැනි ඥාණ සූත්‍රයෙන් පෙන්වා දෙන්නේ මෙසේය. ''අයං ඡන්දසමාධිපධාන සංඛාරසමන්නාගතං ඉද්ධි පාදෝති මේ භික්ඛවෙ පුබ්බේ අනනුස්සුතෙසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.අයං විරිය සමාධිපධාන සංඛාරසමන්නාගතෝ ... අයං චිත්ත සමාධිපධාන සංඛාරසමන්නාගතෝ ... අයං විමංසා සමාධිපදාන සංඛාරසමන්නාගතෝ ඉද්ධි පාදොති මේ භික්ඛවෙ පුබ්බේ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි'' යනුවෙනි.

මෙසේ ඉද්ධිපාද වැඩීම සෘද්ධිවලට පාද හෙවත් පදනමක් පමණක් නොව සියලු කෙලෙස් නැති කොට සම්මා සම්බුද්ධත්වය ලබා ගැනීමටත් හේතු වෙන බව මෙම සංයුත්තයේම එන අරහන්ත සූත්‍රයෙහි ''ඉමෙසං ඛො භික්ඛවෙ චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා බහුලීකතත්තා තථාගතො අරහං සම්මා සම්බුද්ධොති වුච්චති'' යන්නෙන් දක්වා වදාළහ.

මෙසේ ඉද්ධිපාද වැඩීම නිසා ලෞකික ඉද්ධි මෙන්ම ලෝකෝත්තර ඉද්ධි ද ලබා ගැනීමට හැකිබව මෙයින් පෙනේ. මේ ආකාරයෙන් ඉද්ධිපාද වැඩීමෙන් ධ්‍යාන ලබා අනතුරුව විවිධ ඥාණ ලැබීම හා නිවන් මගට යොමු වීම එක් ක්‍රමයකි. එහෙත් සතිපට්ඨාන භාවනාවෙන් අපේ බුදුහාමුදුරුවෝ අපට උගන්වන්නේ මේ ලෞකික ඥාණ නොලබා නිවන් අවබෝධ

කරගන්නා ක්‍රමයකි. අපේ බුදුපියාණෝ මේ සූත්‍රදේශනය හෙවත් සතිපට්ඨාන සූත්‍රය දේශනා කර අවසන් කරන්නේ, ''පින්වත් මහණෙනි, යම් කෙනෙක් මේ භාවනාව හරියට කළොත් දවස් හතකින් නිවන් අවබෝධ කරගෙන රහතන් වහන්සේ නමක් විය හැකියි. එසේ නැතිව කෙලෙස් ටිකක් හෝ ඉතිරි වුවහොත් අනාගාමි විය හැකිය.'' යනුවෙන් සහතික වෙමිනි.

සතර සතිපට්ඨානය අනුව භාවනා කිරීම සමථ විපස්සනා දෙකම එකවිට වඩමින් පියවරෙන් පියවරට නිවණ කරා යොමුවෙන භාවනා ක්‍රමයකි. මෙහිදී ඉහත දක්වන ලද අනුපස්සනා හතර වැඩීම උගන්වයි. ''කතඤ්ච භික්ඛවේ භික්ඛු කායේ කායානුපස්සී විහරති'' පින්වත් මහණෙනි, භික්ෂුව කයෙහි කයඅනුව බලමින් වාසය කරන්නේ කෙසේද? යනුවෙන් ප්‍රශ්නකරන බුදුපියාණෝ යෝගාවචරයා විසින් කය අනුව බලමින් වාසය කිරීම සඳහා කළයුත්තේ කුමක්ද යන්න පෙන්වා දෙති. එහිදී පෙන්වා දෙන්නේ අරණ්‍යයකට හෝ රුක් මුලකට හෝ හිස් නිවසකට හෝ ගොස් කය ඍජු කරගෙන වාඩිවී මුහුණ ඉදිරිපිටට හෙවත් නාසය අගට හිත යොමුකරමින් හොඳ සිහියෙන් යුතුව ආශ්වාස ප්‍රශ්වාසය හෙවත් හුස්මරැල්ල බලන්න, යන උපදේශයයි.

කය අනුව බලනවා යන මෙහි 'අනුපස්සනා' යන්නෙහි තේරුම අනුව බලනවා යන්නයි. අනුව බැලීම නම්, යම් දෙයක් සිදුවේද එය ඒ සිදුවෙන ආකාරයෙන්ම බැලීමයි. අනුව යනවා, අනුගමනය කරනවා, අනුකරනය කරනවා වැනි වචන වලින් ද මෙය තේරුම් ගත හැකිය. එහෙත් භාවනාවේදී කරන්නේ කිසිවක් අනුගමනය කිරීම හෝ අනුකරනය කිරීම නොව අනුව බැලීමයි.

ඇත්ත ඇති සැටියෙන් බැලීමයි හෙවත් සිදුවෙන දේ සිදුවෙන ආකාරයෙන්ම බැලීමයි. ඒ අනුව මේ භාවනාව කිරිමේදී යෝගාවචරයා විසින් කිසිවක් කළ යුතු නොවේ හෙවත් හුස්ම පාලනය කිරීම වැනි කිසිම ක්‍රියාකාර කමක් නොකළ යුතුය. කළ යුතු එකම දෙය වන්නේ සිදුවෙන දේ ඒ ආකාරයෙන්ම දැනගෙන, දැකගෙන තේරුම් ගැනීමයි. මෙය විෂයානුබද්ධව බැලීමයි.

සෑම විද්‍යාඥයෙක් විසින්ම කරන්නේ මෙයයි. යම් දෙයක් පුද්ගල බද්ධව බලන්නේ නම් හෝ අධ්‍යයනය කරන්නේ නම් එයින් ලැබෙන ප්‍රතිඵල අසාර්ථකයි. එහි පුද්ගල කේන්ද්‍රීයයත්වයක් ඇති නිසා නිවැරදිව දැකිය නොහැක. මගේ, මම, මම වෙමි යන අදහස් එහි ඇත. එවිට එහි පවතින්නේ ඇලීමය. ඇලීම ඇති හැම තැනකම ගැටීම ඇත. එහිදී ඇලීමත් ගැටීමත් දෙකට අසුවී පැති දෙකකට දෝලනය වෙමින් අවිද්‍යාවෙන් මුලාවෙවී තණ්හාවෙන් බැඳි බැඳී සිටිය හැකිය. එය භාවනාව නොවේ.

බුදුරජාණන් වහන්සේ විසින් අපට දේශනා කොට ඇති මේ භාවනා ක්‍රමය පුද්ගල නිශ්‍රිත නොහොත් පුද්ගල බද්ධ වු ක්‍රමයක් නොව විෂයනිශ්‍රිත වු හෙවත් විෂයානුබද්ධ වු (objective) පිවිතුරු භාවනා ක්‍රමයකි. සතිපට්ඨාන සූත්‍ර දේශනයේ මුල සිට අග දක්වාම ඇත්තේ විෂයානුබද්ධ නිරීක්ෂණයකි (objective observation). යම් කෙනෙක් යමක් විෂයානුබද්ධව නිරීක්ෂණය කරනවිට එහි අස්ථිර ස්වභාවය හෙවත් වෙනස් වෙන ස්වභාවය දැක ගත හැකිය. එහෙත් අපේ බුදුහාමුදුරුවෝ අපට පෙන්වා දෙන්නේ මේ

දැනගැනීම හා අවබෝධකරගැනීම මුලින්ම බාහිර දේවල් වලින් නොව තමා තුළින් දැක ගත යුතුබවය. බාහිර වස්තුවල වෙනස් කම් කොපමණ දැන ගත්තත්, දැක ගත්තත් තමා තුළින් එය නොදුටු තැනැත්තාට සත්‍යාවබෝධය හෙවත් කෙලෙස් නැති කිරීම ගැන අවබෝධය ඇති නොවේ. අවශ්‍ය වන්නේ කෙලෙස් නැති කිරීමයි. අපේ බුදුහාමුදුරුවෝ අපට මග පෙන්වන්නේ කෙලෙස් වලින් නිදහස් වීමටය. සියලු දුක් දොම්නස් නිවාලීමටය. ඒ සඳහා එකම මග ලෙස සතර සතිපට්ඨානය දේශනා කළහ.

මෙම භාවනාව ආරම්භ කරමින් සැහැල්ලු මනසින් සැහැල්ලු ශරීරයකින් යුතුව සැනසිල්ලේ භාවනාව කරගෙන යන යෝගාවචරයා විසින් විඩෙන් විඩේට නැවත නැවතත් සිහිපත් කොට ඒවා තමා තුළ තිබේදැයි සිතා බැලිය යුතු විශේෂ ධර්ම කරුණු හතරක් බුදුපියාණෝ සතර සතිපට්ඨාන හෙවත් කායානු පස්සනාව, වේදනානුපස්සනාව, චිත්තානු පස්සනාව හා ධම්මානුපස්සනාව හඳුන්වා දෙන්නාවූ මුල් අවස්ථාවේ දීම දේශනා කළහ. ඒ කරුණු හතර මෙසේය.

1. ආතාපි : උත්සාහයෙන් යුක්ත වෙන්න (කෙලෙස් අවම කරගැනීමට, සම්පූර්ණයෙන්ම නැති කරගැනීමට යෝගියා විසින් මනා උත්සාහයකින් යුතුව භාවනාව දිගට කළයුතුය හෙවත් උත්සාය ඇති කරගත යුතුය)

2. සම්පජානෝ : හොඳ සිහියෙන් නුවණින් යුතුව ඉතාමත්ම හොඳින් අරමුණෙහි සිදුවෙන දෙය දැනගන්න (මේ වචනයේ අර්ථය අනුවම සම්පජාන යනු ඉතාමත්ම හොඳින් දැනගත යුතුය. මොකක්ද? තමන්ගේ

භාවනා අරමුණ. දැන් සිදුවෙන්නේ මොකක්ද, දැන් සිදුවෙන්නේ මොකක්ද? යනුවෙන් නිබඳවම, නිරතුරුවම භාවනා අරමුණෙහි සිත පවත්වමින් සිදුවෙන දේ ඒ ඒ ආකාරයෙන්ම තේරුම් ගත යුතුය)

3. **සතිමා** : සතිමත් වූ හෙවත් සිහියෙන් යුක්ත වූ කෙනෙක් වෙන්න (සිහියෙන් යුතුවම භාවනාව කළයුතුය. සති හා සම්පජඤ්ඤ යන දෙකම එකට ගමන් කරන ධර්ම දෙකකි. මේ අනුව යෝගියා තුළ මේ කරුණු දෙකම ඉතා හොඳින් ඇතිවිට භාවනාව අනිවාර්ය යෙන්ම සාර්ථක වේ)

4. **විනෙය්‍ය ලෝකේ අභිජ්ඣා දොමනස්සං**: ලෝභයත් ද්වේශයත් දෙකම අතහැර උපේක්ෂාවෙන් භාවනා කරන්න (මෙයින් කියවෙන්නේ කරුණු දෙකක් හෙවත් අන්ත දෙකක් බැහැර කිරීමයි. අන්ත දෙක නම් දැඩි ලෝභය සහ ක්‍රෝධයයි. අභිජ්ඣා යනු දැඩි ලෝභයයි එනම් අනුන්ගේ වස්තු තමන්ගේ බවට පත් කරගැනීමට ඇති ආශාවයි. දෝමනස්ස යනු හිතේ ඇතිවෙන ව්‍යාපාදය හෙවත් තරහයි. මේ දෙකම භාවනාවට ඇති හතුරෝ දෙදෙනෙකි. මේ අන්ත දෙකකි. මේ දෙකෙන්ම ඉවත් වෙන්න කියන එකයි විනෙය්‍ය යන්නෙන් අදහස් කරන්නේ. ලෝක කියන්නේ බාහිර ලෝකය නොව තමාමය. තමා නැමති ලෝකයයි. භාවනා අත්දැකීම් සියල්ලම තමා තුළින් ලැබිය යුතු නිසා තමාටම අවධානය යොමුකර ගනිමින් භාවනා කළයුතුය. මෙහිදී මේ අන්ත දෙකම ඉවත් කරන විට ඇතිවෙන්නේ උපේක්ෂා සහගත ස්වභාවයකින්යුත් මනසකි. එය භාවනාවට අවශ්‍යම පසුබිමය).

මෙසේ මෙම කරුණු හතරින් යුතුව භාවනාව කරන විට තමන් ඉන්නේ කොහොද, කරන්නේ මොකක්ද? යන්න තමන්ටම ඉතාම හොඳින් වැටහේ. එවිට විවිධ වූ කම්මට්ඨානාචාර්යවරු පසුපස දිවීමට අවශ්‍ය වෙන්නේ ද නැත. තථාගතයන් වහන්සේ විසින් දේශනා කොට වදාළ ශ්‍රී සද්ධර්මයම ගුරුවරයා කරගන්න. ධර්මය ගුරුවරයා කරගත් කිසිවෙකුට වරදින්නේ නැත. බුදුරජාණන් වහන්සේගේ ගුරුවරයාවූයේ ද ධර්මය බවත්, තමන් වහන්සේගෙන් පසුව ගුරුවරයා කරගත යුත්තේත් ධර්මයම බවත් බුදුපියාණන් වහන්සේ විසින්ම දේශනා කර ඇතිබව අමතක නොකරන්න.

සතර සතිපට්ඨාන යනු මොනවාදැයි සඳහන් කරන අවස්ථාවේ මුලින්ම දක්වා ඇත්තේ කයෙහි කය අනුව බලමින් වාසය කිරීමය. මෙය ප්‍රගුණ කරන්නේ කෙසේදැයි දැන් බලමු.

කය ගැන කතා කිරීමේ දි කයවල් දෙකක් ඇති බව මුලින්ම තේරුම් ගත යුතුයි. එනම් මේ අපේ බාහිර ව දක්නට ඇති කය සහ ආශ්වාස ප්‍රශ්වාස කයත්ය. බුදුරජාණන් වහන්සේ මේ ආශ්වාස ප්‍රශ්වාස යනු ද එක්තරා කයක් බව මජ්ඣිම නිකායේ ආනාපාන සති සූත්‍රයේ[17] ඉතාමත්ම පැහැදිලිව දේශනා කළහ. මෙසේ මෙම සතිපට්ඨාන භාවනාව කරන විට මුලින්ම ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ධර්ම වැඩී බල ධර්ම බවට පත්ව පුද්ගලයා නිවන් මගට යොමුවෙයි. සතිපට්ඨාන සූත්‍රයේ දක්වා ඇති භාවනා ක්‍රම එකිනෙක ගෙන ඒවා වඩන ආකාරය දැනගත යුතුය. ඒවා එකිනෙක කතා කිරීමට පෙර අපි මේ පඤ්ච ඉන්ද්‍රියයන් යනු මොනවාද ඒවා වැඩෙන්නේ

කෙසේද යන්න ටිකක් සොයා බලමු. මෙහිදී අපි විශේෂයෙන්ම පඤ්ච ඉන්ද්‍රියයන්ගේ වැඩීම හා ඒවා බල බවට පත්වීම ගැන කථා කළ යුත්තේ සත්තිස් බෝධිපාක්ෂික ධර්ම වල මීළඟට ඇත්තේ පඤ්ච ඉන්ද්‍රිය ධර්ම සහ පඤ්චබල ධර්ම වන බැවිනි.

පඤ්ච ඉන්ද්‍රිය ධර්ම හෙවත් පඤ්ච ඉන්ද්‍රියයෝ මොනවාදැයි ඉහත දී අපි හඳුන්වා දුනිමු. ඉන්ද්‍රියයක් කියන්නේ ප්‍රධානත්වයක් දැරිය හැකි නායකත්වයක් දැරිය හැකි වෙනත් කෙනෙකුට කළ නොහැකි දෙයක් කරන යන අර්ථයෙනි. ඉන්ද්‍ර කියලා වචනයක් සක්‍රයාටත් භාවිතා කරන බව ඔබත් දන්නවා නේද? ඒ කියන්නේ සක්‍රයා සියලු දෙවියන්ට ප්‍රධානියා කියන අර්ථයෙනි. ඉතින් උදාහරණයකට අපි අපේ ඇස ගනිමු. අපේ ඇස ඉන්ද්‍රියයකි. ඇසින් කළ හැක්කේ දැකීමයි. එය වෙනත් කිසිම ඉන්ද්‍රියයකින් කළ නොහැක. කණ ඉන්ද්‍රියයකි. කණින් කළ හැක්කේ ඇසීමයි. එය වෙනත් කිසිම ඉන්ද්‍රියයකින් කළ නොහැක. නාසය, දිව , ශරීරය, හා මනස යන මේ සියල්ලම අපි ළඟ තියෙන ඉන්ද්‍රියයන්ය. මේවාට සහායකයෝ නොහොත් දෙවෙනියෝ නැත. මෙම ඉන්ද්‍රියයන් හසුරුවන හැටි හෙවත් පාලනය කරගන්නා හැටි විවිධ සූත්‍රදේශනා වල අපේ බුදුහාමුදුරුවෝ අපට ඉතාමත්ම ලස්සනට දේශනා කොට පෙන්වා දී වදාළහ. මේ බලන්න ධම්මපදයේ එන මේ ගාථාවඃ

'' චක්ඛුණා සංවරෝ සාධු- සාධු සොතේන සංවරෝ
ඝානේන සංවරෝ සාධු - සාධු ජිව්හාය සංවරෝ
කායේන සංවරෝ සාධු - සාධු වාචාය සංවරෝ
මනසා සංවරෝ සාධු - සාධු සබ්බත්ථ සංවරෝ
සබ්බත්ථ සංවුතෝ භික්ඛු - සබ්බදුක්ඛා පමුච්චති.''

(ඇසින් සංවරවීම හොඳයි. කණින් සංවරවීම හොඳයි. නාසයයෙන් සංවරවීම හොඳයි. දිවෙන් සංවරවීම හොඳයි. කයින් සංවරවීම හොඳයි. වචනයෙන් සංවරවීම හොඳයි. මනසින් සංවරවීම හොඳයි. හැමතැනම සංවරවීම හොඳයි. හැමතැනම සංවරවූ භික්ෂුව සියලු දුක්වලින් නිදහස් වෙයි.)[18]

තවත් ඉතාමත්ම ලස්සන දේශනයක් කියවන්න කැමති නම් අන්න මජ්ඣිම නිකායේ අවසාන සූත්‍රය ''ඉන්ද්‍රිය භාවනා සූත්‍රය'' කියවන්න. මෙය ඉතාමත්ම ලස්සන සූත්‍ර දේශනයකි.

එහෙත් අපි මෙහිදී මේ කතා කරන්නේ මේ කියන ඇස, කණ, නාසය ආදී ඉන්ද්‍රියයන් ගැන නොවේ. මේවා කායික ඉන්ද්‍රියයන්ය. මේවා අපි බොහෝ දෙනෙක් කතා කරන, දන්න, දේවල්ය. අපට කතා කරන්න අවශ්‍ය වී ඇත්තේ මානසික හෙවත් ආධ්‍යාත්මික ඉන්ද්‍රියයන් ගැනය. මේවා අප විසින් ආද්ධ්‍යාත්මිකව හෙවත් මානසිකව ගොඩ නගාගතයුතු මෙන්ම ගොඩනගා ගතහැකි ශක්තීන් පහකි. එනම් සද්ධා, විරිය, සති, සමාධි, හා පඤ්ඤා යන පහයි. මේ පහ නිකම්ම නිකම් ජීවිතය ඔහේ තල්ලු කරන අයට, ජීවිතය ඇදගෙන යන අයට ජීවිතය ගැට ගහන අයට, අනායාසයෙන් හෙවත් ඉබේම ලැබෙන දේවල් නොව, උත්සාහයෙන් ධෛර්යයෙන්, වීර්යයෙන්ම ප්‍රගුණ කිරීම නිසාම හෙවත් භාවනා වශයෙන් සිත වැඩීම නිසාම තම තමා තුළ දියුණු වෙන ගුණ ධර්මයන්ය.

ශ්‍රද්ධා

මෙම ගුණ ධර්මවල මුලින්ම සඳහන් වෙන්නේ අපි හැමෝටම මුලින්ම දියුණු කරගත යුතු මෙන්ම අත්‍යවශ්‍යයෙන්ම තිබිය යුතු දෙය තමයි. ඒ සද්ධා හෙවත් ශ්‍රද්ධාවයි. ශ්‍රද්ධාව ධනයක් බව ඔබත් දන්නවා නේද? (සද්ධා ධනං). සද්ධා යන්න නිර්වචනය කරන්නේ ''සද්දහති බුද්ධස්ස බෝධිං'' යනුවෙනි. එහි තේරුම බුදුරජාණන් වහන්සේගේ බුද්ධත්වය ඇදහීම හෙවත් පිළිගැනීම යන්නය. ඒ අනුව යම් කෙනෙක් තුළ ශ්‍රද්ධාව ඇතිවෙන්නේ බුදුරජාණන් වහන්සේ පිළිගැනීම හෙවත් බුදුරජාණන් වහන්සේගේ බුද්ධත්වය පිළිගැනීම, විශ්වාස කිරීම මතයි. බුදුරජාණන් වහන්සේ විශ්වාස කිරීම හෙවත් බුද්ධත්වය විශ්වාස කිරීම නිසාම ධර්ම රත්නය කෙරෙහි ද සංඝ රත්නය කෙරෙහි ද විශ්වාසය, පිළිගැනීම, ඇතිවේ. ශ්‍රද්ධාවේ පැති දෙකක් තියෙන බව ඔබත් දන්නවා නේද?

1. අමුලිකා සද්ධා (මුලයක් හරයක් නැති ශ්‍රද්ධාව)
2. ආකාරවතී සද්ධා (ප්‍රඥාවෙන් යුක්තවූ ශ්‍රද්ධාව)

බෞද්ධයාට තිබිය යුත්තේ ආකාරවතී ශ්‍රද්ධාවය. අමූලිකා සද්ධා යනු අන්ධ ශ්‍රද්ධාවයි, භක්තියයි. ඔහේ යම් කෙනෙක් යමක් කියපු පළියට විශ්වාස කරනවා. ආකාරවතී ශ්‍රද්ධාවට අත්‍යවශ්‍යම දෙය තමයි නිවැරදිව කරුණු තේරුම් ගැනීමේ හැකියාව. ඒ සම්මා දිට්ඨියයි. ආකාරවතී ශ්‍රද්ධාව නිසාම තමයි යම් කෙනෙක් කෙමෙන් කෙමෙන් බුදුදහම තේරුම් ගනිමින් නිවන් මගට පිවිසෙන්නේ. එසේ පිළිවෙලින් නිවන් මගට පිළිපන් කෙනා හෙවත් සෝවාන් තත්වයට පත් වූ කෙනාගේ ශ්‍රද්ධාව අචල ශ්‍රද්ධාවක් හෙවත්

අවෙච්චප්පසාදයක් බවට පත්වෙයි. ඒ ශ්‍රද්ධාවට පත්වන්නේ මෙසේ මේ ආකාරවතී ශ්‍රද්ධාව ටිකෙන් ටික වැඩීමෙන් එය ඉන්ද්‍රියයක් වී අනතුරුව ශ්‍රද්ධාබලයක් වීමේ ප්‍රතිඵලයක් වශයෙනි. මේ නිසා සෑම කෙනෙක් විසින්ම ශ්‍රද්ධාව වැඩිය යුතුමය. ධම්මපදයේ චිත්ත වර්ගයේ අපට අපේ බුදුහාමුදුරුවෝ දේශනා කරන්නේ යම් කෙනෙකුගේ සිත ත්‍රිවිධ රත්නය කෙරෙහි ස්ථිරව පිහිටලා නැත්තම්, එයා හරිහැටියට ධර්මය දන්නේත් නැත්තම් එයාගේ තියෙන්නේ පාවෙන හෙවත් එහා මෙහා වැනෙන ශ්‍රද්ධාවක් බවයි. එයාගේ ප්‍රඥාව පිරිපුන් බවට පත්වන්නේ නැහැ.

(අනවට්ඨිත චිත්තස්ස
සද්ධම්මං අවිජානතෝ
පරිප්ලව පසාදස්ස
පඤ්ඤා න පරිපූරති)[19]

ශ්‍රද්ධාව ඇතිවීම නිසා පුද්ගලයා පිළිවෙලින් නිවන් මගට පිවිසෙන ආකාරය අපේ බුදුහාමුදුරුවෝ අපට විවිධ අවස්ථාවල දේශනා කර ඇත. මජ්ඣිම නිකායේ චංකී සූත්‍රයේ එන මේ පාඨය බලන්න. ''යම් හෙයකින් ඔහු සොයා බලන්නේ ද එවිට මෝහයෙන් තොරවී, නුවණින් දකින්නේය. එවිට ශ්‍රද්ධාව පිහිටන්නේය. එසේ ශ්‍රද්ධාව ඇතිවිට ගුණවතුන් කරා එළඹෙයි. එළැඹෙන කල්හී පයුරුපාසනය කරයි, හෙවත් සේවනය කරයි. එසේ සේවනය කරන කල්හී පයුරුපාසනය කරන කල්හී, කන් යොමු කරයි. කන් යොමු කොට ධර්මය අසයි. අසා ඒ දහම් සිත් හි දරා ගනියි. ධාරණය කළ දහම් වල අර්ථය විමසයි. අර්ථය විමසනවිට ධර්මයෝ වැටහෙති. ඒ ධර්ම වැටහීම ඇති

කල්හී ඡන්දය හෙවත් කැමැත්ත ඇතිවෙයි. ඒ කැමැත්ත නිසාම උත්සාහය ඇතිවෙයි. ඒ උත්සාහය නිසා තුලනය කරයි. තුලනය කිරීම නිසා වීයර්‍යය ඇතිවෙයි. එවිට නිවණට යොමු වූ සිත් ඇතිව සත්‍යය ප්‍රත්‍යක්‍ෂ කරයි. එය ප්‍රඥාවෙන් විනිවිද දකියි. මෙයින්ම සත්‍යානුබෝධය වෙයි.'' (සද්ධාජාතෝ උපසංකමති උපසංකමන්තෝ පයිරුපාසති. පයිරුපාසන්තෝ සොතං ඕදහති. ඔහිත සෝතෝ ධම්මං සුණාති. සුත්වා ධම්මං ධාරේති. ධතානං ධම්මානං අත්ථං උපපරික්ඛති. අත්ථං උපපරික්ඛතෝ ධම්මනිජ්ඣානං ඛමන්ති. ධම්මනිජ්ඣානක්ඛන්තියා සති ඡන්දෝ ජායති. ඡන්දජාතො උස්සහති. උස්සහිත්වා තුලයති. තුලයිත්වා පදහති. පහිතත්තෝ සමානො කායෙන චෙව පරමසච්චං සච්ජිකරෝති. පඤ්ඤාය ච නං අතිවිජ්ඣ පස්සති. එත්තාවතා ඛො භාරද්වාජ සච්චානුබෝධෝ හෝති.)[20]

විරිය

දෙවෙනි ඉන්ද්‍රියය විරිය ඉන්ද්‍රියයයි. යම් කෙනෙක් තුළ බුදුරජාණන් වහන්සේ කෙරෙහි ධර්ම රත්නය කෙරෙහි හා ආයර්‍ය මහා සංඝරත්නය කෙරෙහි ශ්‍රද්ධාව ඇතිවන විට අනිවාර්‍යයෙන්ම ඔහු හෝ ඇය තුළ දහම් සෙවීමට, දහම් ප්‍රගුණ කිරීමට, විර්යර්‍යය ඇතිවේ. විරිය යනු උත්සාහවත් වීමයි. මෙහිදී අවශ්‍ය වෙන්නේ කායික විරියට වඩා මානසික වීයර්‍යයකි. වීරියෙන් තොරව උත්සාහයෙන් තොරව අපට කිසිම දෙයක් හරියන්නේ නැහැ. ඕනෑම දෙයක් සාර්ථක වෙන්න නම් අත්‍යවශ්‍යම දෙයක් තමයි වීයර්‍යය. මේ ලෝකයේ ජීවත් වුණ සියලුම මනුෂ්‍යයන්ගෙන් මහා වීරවන්තයාණෝ නම් අසහාය වූ හෙවත් කිසිම කෙනෙකුට සම කළ නොහැකි වීරවන්තයාණෝ නම්

වෙනත් කිසිවෙක් නොව අපි සරණ ගිය අපගේ අසහාය ශාස්තෘවරයාණන් වහන්සේ වන ලොවුතුරා සම්මා සම්බුදු පියාණන් වහන්සේය. අපේ බුදුහාමුදුරුවෝය.

උන්වහන්සේගේ ඒ අසහාය වීර්‍යය ධෛර්‍යය ඇති කරගත්තේ සම්මා සම්බුද්ධත්වය ලබාගැනීමටය. මේ ලෝකයේ ජීවත් වෙන කෝටි සංඛ්‍යාත මනුෂ්‍යයන් අතුරින් කලාතුරකින් කෙනෙක් විසින් ලබාගන්නා ඒ උතුම්ම පදවිය අනායාශයෙන් ලැබෙන්නක් නොව කල්ප ගණන් උත්සාහයෙන් ධෛර්‍යයෙන් වීර්‍යයෙන් දහම් ප්‍රගුණ කිරීම නිසාම ලැබෙන්නකි. අපේ බුදුහාමුදුරුවන් වහන්සේගේ ඒ නොපසුබස්නා වීර්‍යය කොතෙක් දැයි කියා දැනගැනීමට කැමති ඕනෑම කෙනෙකුට මජ්ඣිම නිකායේ මහා සීහනාද සූත්‍රය, මහා සච්චක සූත්‍රය සංගාරව සූත්‍රය වැනි සූත්‍රදේශනා කියවන්න යැයි අපි කරුණාවෙන් මතක් කර සිටිමු.

භාවනාවට අවශ්‍යම දෙයක් තමයි මේ වීර්‍යය. අපේ බුදුහාමුදුරුවෝ මාරසේනාව පරාජය කරමින් සම්මා සම්බුද්ධත්වයට පත්වුයේ මේ උන්වහන්සේ තුළ පැවති අසහාය වු මහා වීර්‍යය නිසාය. ඔබත් දන්නා පරිදි අපගේ සම්මා සම්බුදුරජාණන් වහන්සේට ''මහාවීරයන් වහන්සේ'' යනුවෙන් සුවිශේෂ නාමයක් ද තිබුණි. මෙසේ මහාවීර යැයි මිනිසුන් විසින් නම් කිරීමටත් පෙර දෙවියන් විසින් උන්වහන්සේ හඳුන්වනු ලැබුවේ ''මහාවීර'' නමිනි. උන්වහන්සේ තුසිත දෙව්ලොව වැඩ සිටිද්දී, බුදුවීමට සුදුසු කාලය එළඹෙද්දී, සන්තුසිත නම් අපමහා බෝසතාණෝ වෙත පැමිණි දෙවිවරු උන්වහන්සේට ආරාධනා කළේ මෙසේය.

''කාලෝයං තේ මහාවීර උප්පජ්ජ මාතුකුච්ජියං'' (මහා වීරයන් වහන්ස, දැන් ඔබතුමාට මව්කුසයෙහි පිළිසිඳගැනීමට සුදුසු කාලයයි මේ) යනුවෙනි. එසේම බුදුපියාණන් වහන්සේ හැඳින්වීමට ''බුද්ධවීර'' යන නමද යෙදේ. මජ්ඣිම නිකායේ අරියපරියේසන සූත්‍රයට අනුව එදා බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ විසින් අවබෝධ කරගත් ධර්මය මුලින්ම දේශනා කිරීමට මන්දෝත්සාහී වෙද්දී උන්වහන්සේ වෙත පැමිණි සහම්පතී මහා බ්‍රහ්මයා ද බුදුරජාණන් වහන්සේට ආමන්ත්‍රණය කළේ ''මාරසංග්‍රාමය දිනූ වීරයාණන් වහන්ස'', සාර්ථවාහකයාණන් වහන්ස, ණය නැතියාණන් වහන්ස, නැඟීසිටිනු මැනවි, ලෝකයෙහි හැසිරෙනු මැනවි, භාග්‍යවතුන් වහන්සේ ධර්මය දේශනා කරන සේක්වා. අවබෝධ කරගැනීමට සුදුස්සෝ ඇති වෙන්නාහුය''(උට්ඨෙහි මහාවීර විජිත සඞගාම සත්ථවාහ අනණ විචර ලෝකේ දෙසස්සු භගවා ධම්මං අඤ්ඤාතාරෝ භවිස්සන්තිති) යනුවෙනි.

විරිය යන්නට ම අප්පමාද යන වචනය ද පර්යාය වචනයක් හෙවත් සමාන වචනයක් ලෙස යොදාගත හැකිය. අප්පමාදය, විරිය හැම විටම හැම තැනම අවශ්‍යයි. මෙම වීර්‍යය ද මෙසේ භාවනාවක් වශයෙන් වඩන විට එය ඉන්ද්‍රියයක් බවට පත්වී බලයක් බවට පත්වී බොජ්ඣංගයක් බවට පත්වී නිවන් මගට යොමුවෙන හැමටම මහා ආලෝකයක් සපයන මහා පහන් කණුවක් බවට පත්වේ.

සති

තෙවෙනි ඉන්ද්‍රියය වන්නේ සතියයි. ඔබේ භාවනාව පටන් ගත් දවසේ පටන්ම සතිය හෙවත් සිහිය

වැඩෙන බව සිතට ගන්න. ඒ ගැන සිහියේ තබාගෙන සතිය වඩන්නට දිනපතාම ටික ටික හෝ භාවනාවේ නිරත වෙන්න. භාවනාව කියන්නේම සතිය දියුණු කිරීමයි. සති කියන වචනය අපේ බුදුහාමුදුරුවෝ විවිධ සූත්‍රදේශනා වල භාවිතා කර ඇති බව ඔබත් දන්නා කරුණකි. සති ඉන්ද්‍රියය, සතිබලය, සතිපට්ඨානය, සම්මා සතිය, මරණ සතිය, සතිසම්බොජ්ඣංගය, ආනාපානසතිය වැනි අවස්ථා සිහිකරගන්න.

සතිය මේ ආකාරයෙන් වඩන විට හෙවත් භාවනා කරනවිට කෙමෙන් කෙමෙන් ටිකෙන් ටික වැඩෙයි. එය හරියට මෙන්න මේ වගේ දෙයක්. හිතන්න ඔබ අලුතෙන්ම ගත්ත දෑකැත්තක් හෝ පොරවක් හෝ වෑයක් එසේත් නැත්තම් සෙරෙප්පු දෙකක් පාවිච්චි කරනවා කියලා. මුල්ම දවසේ දවස පුරාම ඔබ එය පාවිච්චි කලත්, එහෙම නැත්තම් දවස් කීපයක්ම ඔබ එය පාවිච්චි කලත් සමහර විට සති කීපයක් මාස කීපයක් යනතෙක් වත් ඔබට ඒහි ගෙවී ගිය ප්‍රමාණය ගැන අවබෝධයක් නැතිවේවි. ඒත් මාස කීයපයක් හෝ අවුරුද්දක් විතර ගියාම ඔබටම තේරෙනවා මෙන්ම ඉතාමත්ම හොඳට පේනවා කොච්චර දුරට එය ගෙවිලද කියලා නේද? අන්න ඒ වගේ තමයි භාවනා කරනකොටත් දවසක්, දෙකක්, හෝ සතියක් හමාරක් භාවනා කළ පමණින් ඔබේ සතිය කොතෙක් දුරට දියුණුවෙලා තිබෙනවාදැයි ඔබට දැනගැනීමට නොහැකිවේවි. එහෙත් පසුබට වෙන්න එපා, කම්මැලි වෙන්න එපා, ඉතාමත්ම හොඳට සිතට වීයර්‍ය අරගෙන භාවනා කරන්න. වීයර්‍ය නැති වෙන කොට, කම්මැලි වෙනකොට, හිතන්න අපේ බුදුහාමුදුරුවෝ අවුරුදු හයක් තිස්සේ දුෂ්කර ක්‍රියා කරද්දී මේ හිත හදන්න

කියලා කොයි තරම් නම් මහන්සි වුණා ද, දුක්වින්ද ද කියලා.

අපේ බුදුහාමුදුරුවෝ මේ සූත්‍රදේශනා වල ඉතාමත්ම පැහැදිලිව දේශනා කරනවා කොච්චර මහන්සියෙන් වීර්‍යයෙන් උත්සාහයෙන් යුතුව විවිධාකාර වු ව්‍රත පුහුණු කළත්, උන්වහන්සේගේ සතිය හෙවත් සිහියට නම් කිසිම පලුද්දක් වුණේ නැහැ. ඉතාමත්ම හොඳ සිහියෙන් තමයි උන්වහන්සේ ඒ අවුරුදු හයක් තිස්සේ දුෂ්කර ක්‍රියාවන් කළේ. මේ බුදුපියාගේ අසහාය ගුණ ගැන නිතර නිතර සිතන්න. එසේ සිතා ධෛර්‍යමත්ව භාවනා කරන්න. එවිට ඔබේ සතිය දිනෙන් දිනම වැඩෙයි. සතිය වැඩෙන තරමටම ඔබ ද නිවණට ළංවෙයි, සමීප වෙයි. සතිය ගිලිහෙන තරමටම ඔබ නිවණින් ඈත්වෙයි. ධර්මයෙන් ඈත්වෙයි. ධර්මයෙන් තොරවු විට අපි ළංවෙන්නේ, වැටෙන්නේ තිරිසන්ගත සමාජයටයි. තිරිසනාත් මිනිසාත් අතර ඇති එකම වෙනස මිනිසා ධර්මයෙන් යුක්තවීමයි. ඒ එකම ගුණය නැතිනම් සිතා බලන්න ආහාරගැනීම, නිදාගැනීම, භය වීම, මෛථුන සේවනය කිරීම අතින් මිනිසාත් තිරිසනාත් සමානයි නේද? ධර්මය හා සමාන වෙනත් ඖෂධයක් නැත. ධර්මය රැකෙන්නේ සතිය හෙවත් සිහිය ඇතිවිටය. සතිය යනු වර්තමානයේ, මේ මොහොතේ කරන ක්‍රියාවට සිත යොමුකිරීමයි.

සමාධි

සමාධිය වැඩිය යුතු දෙයකි. එය වඩන විට ඉන්ද්‍රියයක් බවට පත්ව බලයක් බවට පත්ව බොජ්ඣංගයක් බවට පත්ව අරිඅටගිමගෙහි සුවිශේෂ අංගයක් බවට පත්ව යෝගාවචරයාට නිවන් මග

හෙළිකරයි. සමාධිය සම්මා සමාධිය හා මිච්ඡා සමාධිය යැයි කොටස් දෙකකි. මිච්ඡා සමාධියෙන් අපට ප්‍රයෝජනයක් නැත. අපට අවශ්‍යවන්නේ සම්මා සමාධියයි. එසේම අපි දියුණු කළ යුත්තේ, වැඩිය යුත්තේ, සම්මා සමාධියයි. සමාධිය වැඩෙනවිට ප්‍රඥාව ද වැඩෙයි. සමාධි යන්නම සමථ යන්නෙන් ද අදහස් කරයි. එසේම ප්‍රඥා යන්නට විපස්සනා යන්න ද යොදයි. ඒ අනුව සමාධි හා පඤ්ඤා යන්න සමථ විපස්සනා යන්නෙන් ද හඳුන්වනු ලැබේ. මේ අපේ බුදුහාමුදුරුවෝ අපට දේශනා කර ඇති භාවනා ක්‍රමයයි.

සංයුත්ත නිකායේ ඛන්ධ සංයුත්තයේ පස්වෙනි සූත්‍රය වන ''සමාධි භාවනා'' සූත්‍රයෙහි අපේ බුදුහාමුදුරුවෝ මෙසේ වදාරති. ''සමාධිං භික්ඛවේ භාවෙථ. සමාහිතෝ භික්ඛු යථාභූතං පජානාති. කිඤ්ච යථාභූතං පජානාති? රූපස්ස සමුදයඤ්ච අත්ථගමඤ්ච, වේදනාය සමුදයඤ්ච අත්ථගමඤ්ච, සඤ්ඤාය සමුදයඤ්ච අත්ථගමඤ්ච, සංඛාරානං සමුදයඤ්ච අත්ථගමඤ්ච, විඤ්ඤාණස්ස සමුදයඤ්ච අත්ථ ගමඤ්ච.''[21] යනුවෙනි.

මෙහි තේරුම මෙසේය. ''පින්වත් මහණෙනි, සමාධිය වඩන්න. සමාධියටපත් භික්ෂුව ඇත්ත ඇතිසැටියෙන් දකියි. ඇත්ත ඇතිසැටියෙන් දකින්නේ කුමකද? රූපයේ ඇතිවීම දකියි, නැතිවීම දකියි, වේදනාවේ ඇතිවීම දකියි, නැතිවීම දකියි, සඤ්ඤාවේ ඇතිවීම දකියි, නැතිවීම දකියි, සංඛාරවල ඇතිවීම දකියි නැතිවීම දකියි, විඤ්ඤාණයේ ඇතිවීම දකියි, නැතිවීම දකියි'' යන මේවායේ ඇත්ත ඇති සැටියෙන් දකියි.

අනතුරුව බුදුරජාණන් වහන්සේ රූපයේ ඇතිවීම සිදුවන්නේ කෙසේද? වේදනාවේ ඇතිවීම සිදුවන්නේ කෙසේද? සඤ්ඤාවේ ඇතිවීම සිදුවන්නේ කෙසේද? සංඛාරවල ඇතිවීම සිදුවන්නේ කෙසේද? විඤ්ඤාණයේ ඇතිවීම සිදුවන්නේ කෙසේද යන්න ද පැහැදිලි කළහ. බුදුපියාණෝ මෙහිදී දේශනා කළ ආකාරයෙන් ඇතිවීම සිදුවන්නේ ඇලීම නිසයි. ඇලීම නිසාම, දැඩි සේ එයට බැඳි ඒ ගැනම කතා කරයි, එහි බැස ගනියි. මොකේටද ඇලෙන්නේ? මොකක් ගැන ද කතාකරන්නේ? මොකේටද දැඩි සේ බැඳී සිටින්නේ, බැසගෙන සිටින්නේ? රූපයට, වේදනාවට, සඤ්ඤාවට, සංඛාරවලට සහ විඤ්ඤාණයටයි. එසේ බැඳීම නිසා ඇලීම ඇතිවේ. එවිට එයම උපාදානයයි. ඒ උපාදානය නිසා තමයි භවය හටගන්නේ. ඒ භවය නිසා තමයි ජාතිය හටගන්නේ. ඒ ජාතිය හෙවත් ඉපදිම නිසා තමයි ජරාමරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාසාදී සියලුම දුක් ඇතිවෙන්නේ. ඒ ඇලීමම නැති කිරීමෙන් තමයි උපාදාන නැතිවෙන්නේ. ඒ අනුව පිළිවෙලින්, භව, ජාති, ජරාමරණ ආදී සියලු දුක් නැතිවෙන්නේ ඇලීම හෙවත් බැඳීම නැති වීමෙනි. යම් කෙනෙකුට සමාධිය වැඩෙන්නේ නම් මේ සියල්ල අවබෝධ කරගැනීමට හැකියාව ඇත. ඒ නිසාම අපගේ භාග්‍යවත් වූ බුදුපියාණන් වහන්සේ අපට භාවනා කරන්න, සමාධිය වඩන්න යැයි නිතර නිතර උපදෙස් දුන්හ.

සමථයෙන් තොරව විපස්සනාව කිරීම අපහසුය. එබැවින් යම් යෝගාවචරයෙක් විසින් මුලින්ම සමථ භාවනාව කිරීම ඉතා යෝග්‍යයි. විපස්සනාවට යොමුවිය හැක්කේ අවම වශයෙන් දින දෙක තුනක් හෝ සමථය

වැඩීමෙනි. සමථයෙන් කෙරෙන්නේ සිත සමනය කිරීමයි. ඒ සඳහා නීවරණ ධර්ම යටපත්විය යුතුය. සමථය දිනෙන් දින වැඩීම නිසා සිත ශාන්ත බවට, සැහැල්ලුබවට, පැහැදිලි බවට, සන්සුන් බවට, පත්වේ. ඒ ශාන්ත සිත පිවිතුරු බවට පත්වේ. ඒ පිවිතුරු සිතින් විවිධ දේ කිරීමේ හැකියාව ඇතිවේ. ඒ යමක් කිරීමේ හැකියාවන් අතර සුවිශේෂ හැකියාව වන්නේ සිත විදර්ශනයට හෙවත් අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ලක්‍ෂණ තුන දැකීමට යොමුකිරීමය.

මේ සමාධිමත් සිත යොමුකොට, කෙනෙකුට විවිධ වු ප්‍රාතිහාර්‍යයන් පෑම, පෙර භවයන් ගැන කීම, අන් අයගේ සිත් දැකීම, සතුන් විවිධ ලෝක වල ඉපදෙන ආකාරය බැලීම වැනි බොහෝ දේ කළ හැකි වුවද, ඒ සියල්ලටම වඩා වටින්නේ සිත විදර්ශනයට යොමුකිරීමය. නිවණට ඇති නොවරදින මෙන්ම ඍජු මග එයයි. ඒ මග පෙන්වා දෙන්නේ අපගේ තථාගත ලොවුතුරා බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාළ මේ සතිපට්ඨාන භාවනා ක්‍රමයෙනි.

පඤ්ඤා

පඤ්ඤා යනු පාලි වචනයයි. අපි බොහෝ දෙනාට හුරු පුරුදු තවත් වචනයක් ඇත. ඒ ''ප්‍රඥා'' යන්නයි. ඒ සංස්කෘත භාෂාවෙනි. පඤ්ඤා හෙවත් ප්‍රඥා යන්නෙන් අදහස් කරන්නේ ඇත්ත ඇතිසැටියෙන් දැකීමයි. යමක් නිවැරදිව, පැහැදිලිව, පිරිසිදුව දැකීමයි. මේ සඳහා අත්‍යවශ්‍ය කරුණු දෙකකි. එනම් සතිය හෙවත් එළඹ සිටි සිහිය සහ නුවණයි. මේ නුවණ යන්නට බුදුපියාණන් වහන්සේ විසින් දේශනා කොට

ඇත්තේ ''සම්පජඤ්ඤ'' යන වචනයයි. සති හා සම්පජඤ්ඤ යන වචන දෙකම අපට සූත්‍රදේශනා වල හමුවෙන්නේ බොහෝ විට එකම තැනකයි. ඒ ''සතිසම්පජඤ්ඤ'' වශයෙනි. ඒ අනුව සතිය හා සම්පජානය ඇතිවිට ප්‍රඥාව ඇතිවෙයි, විසදවෙයි, වැඩෙයි, යෝගාවචරයාට අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ලක්‍ෂණ තුන වැටහීමෙන් නිවණ සාක් ක්‍ෂාත් වෙයි. මේ ප්‍රඥාව ලබාගැනීමේ උපරිම ප්‍රතිඵලයයි. ප්‍රඥාව මිනිසාට ඇති උතුම් රත්නයයි (පඤ්ඤා නරානං රතනං), ශ්‍රේෂ්ඨතම ජීවිතය නම් ප්‍රඥාවෙන් යුක්තව ජීවත්වීමයි (පඤ්ඤා ජීවිං ජීවිතමාහු සෙට්ඨං), මිනිසාගේ පිරිසිදුබව ඇතිවෙන්නේ ප්‍රඥාවෙනි (පඤ්ඤාය පරිසුජ්ඣති) යනාදී වශයෙන් අපේ බුදුහාමුදුරුවෝ අපට දේශනා කළහ. මේ අප කතා කළේ පඤ්ච ඉන්ද්‍රියයන් හා පඤ්ච බලයන් ගැනය. පඤ්ච ඉන්ද්‍රිය ධර්මම වැඩීම නිසා පඤ්ච බල බවට ද පත්වේ.

මෙසේ ඔබ භාවනාව ආරම්භකළ දවසේ පටන් ඔබේම හුස්ම රැල්ලට සිත යොමු කරමින් භාවනා කළ නිසාම මේ ඉන්ද්‍රිය ධර්ම හා බල ධර්ම වැඩේ. මේවා බෞද්ධයන්ට පමණක් හෙවත් බුදුදහමට පමණක් සීමා වූ දේවල් නොවේ. අර ආළාර කාලාම, උද්දක රාම පුත්ත, වැනි ගුරුවරුන් පවා මේවා වැඩූ බව මජ්ඣිම නිකායේ අරිය පරියේසන සූත්‍රය, මහා සච්චක සූත්‍රය වැනි සූත්‍රදේශනා වලින් අපට පැහැදිලි කරගත හැකිවිය.

සත්තිස් බෝධිපාක්ෂික ධර්ම වල මීළගට ඇත්තේ සත්ත බොජ්ඣංග ධර්මයන්ය. යම් කෙනෙක් මෙසේ උත්සාහයෙන් වීර්‍ය්‍යයෙන් භාවනාවේ යෙදෙන විට මෙම ඉන්ද්‍රිය ධර්මයන් වැඩී බල ධර්මයන් වැඩී යොමු

වෙන්නේ බොජ්ඣංග ධර්මයන්ට හෙවත් බුදුබව, අරහත් බව, ලැබීම සඳහා ප්‍රධාන අංග බවට පත්වෙන බොජ්ඣංග ධර්මයන්ටය. මෙම බොජ්ඣංග ධර්ම පිළිවෙලින් සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි සහ උපේක්ඛා යනුවෙන් වැඩෙයි. විශේෂයෙන්ම උපෙක්ඛා සම්බොජ්ඣංගය වැඩෙන විට දුක තේරුම් ගැනීමට මධ්‍යස්ථ මනසක් ඇතිවේ. ඒ අනුව චතුරාර්‍ය සත්‍ය ධර්මයන්ගේ පළවෙනි සත්‍යය වන දුක්ඛ ආර්‍යසත්‍යය යනු කුමක්දැයි වටහා ගැනීමට හැකිවේ. ඒ අනුව එකක් අවබෝධ වන විට අනිත් තුනම අවබෝධ වේ. ඒ නිසාම යෝගාවචරයාට මෙසේ චතුරාර්‍ය සත්‍ය ධර්මය අවබෝධයෙන්, ආර්‍ය අෂ්ඨාංගික මාර්ගය අවබෝධ වීමෙන් ඒ මාර්ගය දස අංගයෙන් සමන්විතව යෝගාවචරයා සියලු කෙලෙස් නැති කොට උතුම් වූ නිවණට පත්වෙයි.

දැන් අපි සතිපට්ඨාන සූත්‍ර දේශනයට අනුව සමථ හා විදර්ශනා යන දෙකම එකට වැඩෙන මේ අපේ බුදුරජාණන් වහන්සේගේ සුවිශේෂ භාවනා ක්‍රමය දැනගනිමු. ඒ සමථ විපස්සනා යුගනද්ධයයි

4 පරිච්ඡේදය

බුදුරජාණන් වහන්සේගේ සුවිශේෂ භාවනා ක්‍රමය හෙවත් සමථ විපස්සනා යුගනද්ධය

(1). කායානුපස්සනාව හෙවත් කයෙහි කයට අනුව බලමින් වාසය කිරීම

අපේ බුදුහාමුදුරුවෝ අපට දේශනා කර ඇති පරිදි සතිපට්ඨාන සූත්‍රයේ මුල සිට අග දක්වාම ඇත්තේ මේ සමථ විපස්සනා යුගනද්ධයයි. දැන් අපි මෙම සතිපට්ඨාන සූත්‍රයට අනුව කයෙහි කය අනුව භාවනා කරන්නේ කෙසේද යන්න හදාරමු. අපේ බුදුහාමුදුරුවෝ මෙම සතිපට්ඨාන සූත්‍රයේ මුලින්ම පැහැදිලි කර දෙන්නේ කයෙහි කය අනුව බලමින් වාසය කරන්නේ කෙසේද යන්නය. කයෙහි කය අනුව භාවනා කරන විට ප්‍රධාන වශයෙන් අනුගමනය කිරීමට සුදුසු ක්‍රම හයක් පෙන්වා දෙති. ඒ මෙසේය.

1. ආනාපානය ගැන සිහියෙන් යුක්ත වීම

2. සතර ඉරියව් වලම සිහියෙන් යුක්ත වීම

3. කරන සෑම ක්‍රියාවක්ම සිහිනුවණින් කිරීම හෙවත් සම්පජානයෙන් යුක්තව කිරීම

4. ශරීරයේ විවිධ කොටස් හෙවත් දෙතිස් කුණප සිහියෙන් යුතුව බැලීම

5. පඨවි, ආපෝ, තේජෝ, වායෝ යනධාතු
   කොටස් මනා සිහියෙන් තේරුම් ගැනීම

6. මනා සිහියෙන් යුතුව මළ සිරුරක ඒ ඒ අවස්ථා
   දැක ගැනීම.

දැන් අපි මේ එකක් එකක් ගෙන ඒ ඒ කොටස් පිළිබඳව භාවනා කරන්නේ කෙසේදැයි යන්න අපේ ශක්ති පමණින් විවිධ අවස්ථාවල අපටත් දැනුන ආකාරයෙන් හෙවත් අත්දැකීම් වලට හසුවී ඇති ආකාරයෙන් විමසා බලමු.

අ. ආනාපානය ගැන සිහියෙන් යුක්තවීම.

වරක් බුදුපියාණන් වහන්සේ වෙත පැමිණි ආනන්ද හාමුදුරුවන් වහන්සේ '' ස්වාමීනි බුදුරජාණන් වහන්ස, එකක් වඩනවිට, හතරක් සම්පුර්ණ වෙන, හතරක් වඩනවිට, හතක් සම්පුර්ණවෙන, හතක් වඩන විට දෙකක් සම්පුර්ණ වී මුක්තිය සාක්ෂාත් වෙන ක්‍රමයක් තියෙනවාද?'' යැයි ඇසුහ. එවිට බුදුපියාණෝ ආනන්ද හිමින්ට ''එහෙමයි ආනන්ද එවැනි දෙයක් තිබේ'' යැයි පිළිතුරු දී වදාළහ. එවිට ආනන්ද හිමියෝ ඒ කුමක්දැයි විචාළ කල්හී බුදුපියාණන් වහන්සේ ''ආනන්ද යම් කෙනෙක් ආනාපානසතිය වඩන්නේ නම් සතර සතිපට්ඨාන වැඩී සම්පුර්ණ බවට පත්වේ. සතර සතිපට්ඨාන වඩන්නේ නම් සත්ත බොජ්ඣංග ධර්ම වැඩී සම්පුර්ණ බවට පත්වේ. සත්ත බොජ්ඣංග ධර්ම වඩන්නේ නම් විජ්ජා විමුක්ති සම්පුර්ණ බවට පත්වේ.'' යනුවෙන් දේශනා කළහ.[1]

අපි අපේ බුදුහාමුදුරුවෝ අපට දෙන මෙම උපදෙස්ම අනුගමනය කරමු. ආනාපාන සති භාවනාව කරනවිට පළමුවෙන්ම සුදුසු ස්ථානයක් තෝරාගත යුතුය. බුදුපියාණෝ ස්ථාන තුනක් අනුමත කළහ. එනම් ''ආරණ්‍යයකට හෝ ගසක් මුලකට හෝ හිස් කුටියකට (නිවසකට) යන්න'' යනුවෙනි. ආනාපානසති භාවනාව සඳහා මේ ස්ථාන තුනෙන් එකක් තෝරාගත්විට භාවනාව සාර්ථක වේ. අනතුරුව ආසනය ගැන උපදෙස් දෙති. ආසනය යනු තමන් වාඩිවෙන ආකාරයයි. භාවනාවට වාඩිවෙනවිට බද්ධ පරියඞකයෙන් වාඩිවෙන්න යනු බුද්ධ වචනයයි. ඉතින් අපි දන්නවා බොහෝ අයට එසේ වාඩිවෙන්න අමාරුයි. බුදුපියාණන් වහන්සේ දක්වන්නේ සාර්ථක ප්‍රතිඵල ලැබෙන ආකාරයයි. ඉතින් ඔබට අර්ධ බද්ධපරියඞකයෙන් හෝ වාඩිවීමට හැකි නම් වඩා හොඳයි. එසේත් නැත්නම් ඔබේ උඩුකය කෙලින් තියෙන ආකාරයට පුටුවක් මත හෝ පහසු ආකාරයට වාඩිවෙන්න. දැන් ඇස් දෙක පියා ගත්තොත් පහසුයි. එසේ නැත්නම් ඇස් දෙක අඩවන්ව තියාගන්න. ඒ කියන්නේ භාගෙට පියාගන්න. දැන් මුහුණ ඉදිරියට ඔබේ සිත ගෙනෙන්න හෙවත් අවධානය යොමු කරන්න.අපට අවශ්‍ය වෙන්නේ අපේ හුස්මරැල්ල දැක ගැනීමට නිසා ඇත්තෙන්ම සිත යොමු කළ යුත්තේ නාස් පුඩු වලටය. දැන් නාස්පුඩු වලට සිත යොමු කරන්න. දැන් හුස්ම රැල්ල හොඳින් තේරුම් ගන්න. සිහියෙන් යුක්තවම හුස්ම ඉහළට යන හැටි සිතින් දැක ගන්න. සිහියෙන් යුක්තවම හුස්ම පහළට යන හැටි සිතින් දැකගන්න.

ඔබේ හුස්ම රැල්ල ස්වභාවිකව යන්න දෙන්න. කිසිම ආකාරයකින් හුස්ම රැල්ල පාලනය කරන්න

හෙවත් අඩු වැඩි කරන්න යන්න එපා. සුවසේ, ස්වභාවිකවම, හුස්ම රැල්ලට යන්න දෙන්න. හොඳට හුස්ම රැල්ලටම හිත යොමුකරන්න. නැවත නැවතත් සිත යොමුකරන්න. එසේ හිත යොමුකරගෙන හොඳ ඉවසීමෙන් බලා සිටින්න. එවිට එක් අවස්ථාවකදී, ඔබ දිගට හුස්මක් ගන්න ආකාරය ඔබට දැනේවි. එවිට තේරුම් ගන්න මෙන්න දිග හුස්මක් කියලා. මෙය ඉතාමත්ම වැදගත් අවස්ථාවකි. මෙය තේරුම් නොගත්තොත් ඉදිරියට යා නොහැක. දිග කියලා යමක් තියෙන හැම තැනකම කෙටි කියලා යමක් ද තියෙන බව ඔබත් දන්නවා නේද? එහෙනම් මේ ඔබේ හුස්ම රැල්ලේත් දැන් ඔබට දැනේවි කෙටි හුස්ම රැල්ලත්. දැන් දිග හා කෙටි කියන අවස්ථා දෙකම විඩෙන් විඩේට දැනේවි. හොඳට ඒ දෙසම බලාගෙන දැන් භාවනාව දිගට කරන්න. මෙහි දැනගත යුතු පියවර හතරක් තිබේ.

මෙන්න බුදුපියාණෝ අපට මේ සතිපට්ඨාන සූත්‍රයෙන් දේශනා කරන ආනාපානයේ පියවර හතර.

1. දිගට හුස්මක් ගන්නවිට ඒ බව ඉතාම හොඳින් තේරුම් ගන්න. දිගට හුස්මක් හෙළනවිට ඒබව ඉතාම හොඳින් තේරුම් ගන්න.

2. කෙටියට හුස්මක් ගන්නවිට ඒ බව ඉතාම හොඳින් තේරුම් ගන්න. කෙටියට හුස්මක් හෙළනවිට ඒබව ඉතාම හොඳින් තේරුම් ගන්න.

3. සම්පූර්ණ හුස්ම රැල්ල ඇතුල්වෙන හැටි සහ සම්පූර්ණ හුස්ම රැල්ල පිටවෙන හැටි මුල සිට අග දක්වාම (ඒ කියන්නේ හුස්මරැල්ල නාසයේ අග වැදෙන තැන පටන්

දිගට ඇදීගෙන ගොස් පෙනහලූ පිරී අවසන් වෙන තෙක්ම හුස්මරැල්ල දිහා ඉතාම හොඳින් බලාගෙන සිත සංවරවෙන හැටි තේරුම් ගැනීමයි. එසේම පිට වෙන විටත් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ හුස්ම රැල්ල දෙස බලාගෙන සිටිමයි. මෙහිදී ඔබේ අවධානය හෙවත් සිත තබා ගත යුත්තේ නාසය අග පමණක් බව අමතක නොකරන්න. ඒ කියන්නේ හුස්ම රැල්ල එක්ක හිත පෙනහලු දක්වා හෝ පෙකනිය දක්වා ගෙනියන්නේ නෑ)

4. හුස්ම රැල්ල පස්සම්භනය වෙන ආකාරය හෙවත් කෙමෙන් කෙමෙන් අඩුවී යන ආකාරය ඔබට දැනේවි. ඒ හුස්ම රැල්ල දෙස බලාගෙන සිටින්න. ඔබේ ගත සිත සැහැල්ලූ වෙනු ඇත. මහත් ප්‍රමුදිත බවක් ඇති වෙනු ඇත.

දැන් මේ වනවිට ඔබේ භාවනාව සාර්ථක නම් ඔබට හොඳ සමාධියක් හෙවත් සමථයක් ඇත. එවිට එය විදර්ශනයට යොමුකළ හැක. සමථ භාවනාව කරන හැම විටම ඔබ සිත යොමුකරන්නේ එක් අරමුණකටය. දැන් ඔබ මෙය විදර්ශනයට යොමු කළ යුතුයි. එවිට ඔබේ ඉන්ද්‍රිය හයෙන්ම සිතට දැනෙන ඕනෑම දෙයක් පිළිබඳව සිත යොමුකළ හැක. සිත යොමු කොට ඇතිවීම නැතිවීම හෙවත් සමුදය වය සිදුවෙන ආකාරය සිතින් දකින්න. දැන් ඔබ කළ යුත්තේ ඔබේ ඇතුළත කය හෙවත් හුස්ම කයේ සිදුවෙන සියලූ වෙනස් කම් එනම් ඇතිවිම නැති වීම ආදිය තේරුම් ගැනීම සහ බාහිර කයේ ඇතිවීම නැතිවීම ආදී වූ විවිධ වින්දන සියල්ල හඳුනාගැනීමයි. මෙය බුදුපියාණෝ දේශනා කරන්නේ ''ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති. බහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති. සමුදය ධම්මානුපස්සී වා

කායස්මිං විහරති. වය ධම්මානුපස්සී වා කායස්මිං විහරති.'' යනුවෙනි. මේ විදර්ශනයයි. මේ ආකාරයෙන් මේ සූත්‍රදේශනයේ සඳහන් වෙන සෑම භාවනා අරමුණකම අවසානයට කළ යුත්තේ විදර්ශනයට යොමුකිරීම බව දේශනා කළහ. (ඒ අනුව සෑම භාවනා අරමුණකම මුල සමථයයි, අනතුරුව විපස්සනාවයි. මේ සමථ විපස්සනා යුගනද්ධයයි.)

මේ සතිපට්ඨාන සූත්‍රයේ ආනාපානසතිය වඩන ආකාරයයි. මේ පියවර හතර මැනවින් ප්‍රගුණ කරන්න. මේ හතරෙන් පමණක් වුවද ඔබටත් සමථ භාවනාවේ හා විපස්සනා භාවනාවේ විශාල දියුණුවක් ඇතිකරගත හැකි වෙන අතර ඒ තුළින්ම භාවනාවේ සෑහෙන කොටසක් සම්පූර්ණ කළ හැකි බවද තේරුම් ගන්න. ආනාපාන සතිය වැඩීමේදී පියවර දාසයක් වැඩෙන ආකාරය පිළිබඳව පැහැදිලි විස්තරයක් අපේ බුදුහාමුදුරුවෝ අපට මජ්ඣිම නිකායේ ආනාපානසති සූත්‍රය, කායගතාසති සූත්‍රය, හා සංයුත්ත නිකායේ ආනාපානසති සංයුත්තයේ ආනන්ද සූත්‍රය, කිම්බිල සූත්‍රය වැනි සූත්‍ර දේශනාවලින් දේශනා කොට දක්වා වදාළහ.

ආ. සතර ඉරියව් ගැනම සිහියෙන් යුක්තවීම

අපි මොන දේ කළත් මොන ගමනක් බිමනක් ගියත් මොන තැනක හිටියත් අවම වශයෙන් නිදාගත්තත් අපි හැමෝම, මනුෂ්‍ය අමනුෂ්‍ය සියලුම සත්වයෝ කරන්නේ ඉරියව් හතරක් පැවැත්වීමයි හෙවත් ප්‍රධාන ක්‍රම හතරකට අනුව ජීවිතය ගත කිරීමයි. ඒ ක්‍රම හතර නම්:

1. යැම හෙවත් ඇවිදීම
2. හිටගෙන සිටීම
3. ඉදගෙන සිටීම
4. නිදාගැනීම.

ඉතින් අපට අපේ බුදුහාමුදුරුවෝ දේශනා කරන්නේ මේ ඉරියව් පැවැත්වීමේ දී සිහියෙන් ඉන්න හෙවත් සතිමත් වෙන්න කියන එකයි. එයම භාවනාවයි. ඒ දෙවෙනි කාරණයි.

ඇ. කරන සෑම ක්‍රියාවක්ම සිහිනුවණින් කිරීම හෙවත් සම්පජානයෙන් යුක්තව කිරීම

සිහි නුවණ ඇති කරගැනීම හෙවත් සම්පජානය ඇතිකරගැනීම ගැන බුදුපියාණෝ අවස්ථා හතක් මෙම සූත්‍රයේ දේශනා කර ඇත. ඒ අවස්ථා හත පමණක් නොව අපි එදිනෙදා කරන හැම දෙයකම සිහිනුවණ ඇති කරගැනීම මෙයින් අදහස් කෙරේ. එම අවස්ථා හත මෙසේය.

1. ඉදිරියට යනවිට ද, ආපසු එනවිට ද, සිහිනුවණින් යුක්ත වෙන්න.

2. බෙල්ල එහා මෙහා හරවමින් ඒ පැත්ත මේ පැත්ත බලන විට සිහිනුවණින් යුක්ත වෙන්න.

3. අත් පා දිග හරිනවිට ද, හකුළන විටද, සිහි නුවණින් යුක්ත වෙන්න.

4. ඇඳුම් පැළඳුම් අඳින විටද, යම් කිසි භාජනයක්

පරිහරණය කරනවිට හෝ එහා මෙහා ගෙන යන විටද, සිහිනුවණින් යුක්ත වෙන්න.

5. කෑම කන විටද, වතුර ආදී යමක් බොනවිටද, යමක් හපන විටද, රස විඳින විටද, සිහිනුවණින් යුක්ත වෙන්න.

6. වැසිකිළියට කෙසිකිළියට යනවිට ද හෙවත් මල මුත්‍ර පහකරන විටද සිහිනුවණින් යුක්ත වෙන්න.

7. එහා මෙහා යන කල්හීත්, හිටගෙන සිටින කල්හීත්, වාඩිවී සිටන කල්හීත්, නිදාගෙන සිටින කල්හීත්, නිදිවරන කල්හීත්, කතාකරන කල්හීත්, නිශ්ශබ්දව සිටින කල්හීත් සිහිනුවණින් යුක්ත වෙන්න. යනු සම්බුද්ධ දේශනයයි.

ඈ. ශරීරයේ විවිධ කොටස් හෙවත් දෙතිස් කුණප සිහියෙන් යුතුව බැලීම

බුදුපියාණෝ මේ ශරීරය කොටස් තිස් දෙකකට බෙදා දක්වා වදාළහ. මෙහිදී භාවනානුයෝගියා විසින් කළ යුත්තේ ඒ එක් එක් කොටස් ගැන බලමින් ඒවායේ අනිත්‍යබව, දුර්ගන්ධවත් බව, පිළිකුල් සහගත බව තේරුම් ගනිමින් සත්‍යය දකිමින් තමා තුළ උපේක්ෂාව ඇති කරගැනීමය. එම කොටස් තිස් දෙක මෙසේය.

1. කෙස් 2. ලොම් 3. නිය 4. දත් 5. සම් 6.මස් 7. නහර 8. ඇට 9. ඇටමිදුළු 10. වකුගඩු 11. හදවත 12. අක්මාව 13. පිත්තාශය 14. බඩදිව 15. පෙනහලු 16. කුඩා බඩවැල 17. මහ බඩවැල 18. උදරය 19. අසුචි 20.මොළය 21 පිත 22. සෙම 23. සැරව 24. ලේ 25. දහදිය 26. තෙල්මන්ද 27.

කඳුළු 28. වුරුණු තෙල් 29. කෙළ 30. සොටු 31. සඳමිදුලු 32. මුත්‍ර යන මේවාය.

මේවා බැලීමේදී බුදුරජාණන් වහන්සේ අපට විශේෂ උපමාවක් ඉදිරිපත් කොට ඇත. එනම් දෙපැත්තෙන්ම කටවල් තියෙන ගෝනියක උපමාවයි. හිතන්න දෙපැත්තෙන්ම කටවල් තියෙන ගෝනියක් තියෙනවා කියලා. ඉතින් යම් කෙනෙක් ඒ ගෝනියට විවිධාකාරයේ ධාන්‍ය වර්ග දමනවා කියලා හිතන්න. ඒ කියන්නේ ඇල් වී, වී, මුං ඇට, මෑ ඇට, තල ඇට, සහල් වැනි ජාති වර්ග. ඉතින් ඇස් ඇති කෙනෙක් මේ ගෝනියේ කට ඇරලා බලනවා හොඳට. එතකොට එයාට පේනවා මෙහි තියෙන ඇල් වී, වී, මුං ඇට, මෑ ඇට, ආදී දේවල්. එයා ඒවා ඒ ඒ ආකාරයෙන්ම දැක ගන්නවා. මේ ඇල් වී, මේ වී, මේ තල, මේ මුං, ආදි වශයෙනි. අන්න ඒ වගේම මේ මනුෂ්‍යා නැමති දෙපැත්තෙන්ම කට තියෙන ගෝනියේ මොනවද තියෙන්නේ කියලා යෝගාවචරයා විසින් දැක ගත යුතුයි. එසේ දැක ගනිමින් මේ කුණු ගොඩ තේරුම් ගෙන උපේක්ෂාව ඇතිකර ගතයුතුය.

ඉ. පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන ධාතු කොටස් මනා සිහියෙන් තේරුම් ගැනීම

මීළඟට මෙම සූත්‍රයේ දේශනා කර ඇත්තේ ධාතු කොටස් බැලීමයි. ධාතු කොටස් හතරක් තියෙනවා. ඒ පඨවි ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන ධාතු කොටස්ය. මේවා බැලීමේදී හෙවත් දැනගැනීමේ දී භාවනානුයෝගියා විසින් තමන්ගේ ශරීරය යම් යම් ආකාරයකින් ද පිහිටා තිබෙන්නේ ඒ ඒ ආකාරයෙන්

මෙම ධාතු කොටස් වෙන් වෙන් වශයෙන් තේරුම් ගනිමින් භාවනා කළ යුතුය.

ඊ. මනා සිහියෙන් යුතුව මළ සිරුරක ඒ ඒ අවස්ථා දැක ගැනීම

මියගිය කෙනෙකුගේ මළ සිරුරෙහි ඇති ඒ ඒ අවස්ථා තේරුම් ගැනීම මෙයින් අදහස් කෙරේ. අවස්ථා නවයක දී සොහොනට ගොස් මළ සිරුරක් දෙස බලා තමන්ටත් මේ ටිකම තමයි වෙන්නේ කියන අදහස ඇති කරගනිමින් භාවනා කරන ලෙස බුදුපියාණෝ උපදෙස් දුන්හ. එහෙත් වර්තමාන කාලයේ මෙසේ භාවනා කිරීමට ඉඩක් සැලසෙන්නේ ඉතාමත්ම කළාතුරකිනි. එබැවින් මේ ගැන විස්තර කිරීම සඳහා අපි කාලය හා අවකාශය මිඩංගු නොකරමු.

ඔය අපි මේ දක්වා කතා කළේ සතර සතිපට්ඨාන අතුරින් පළමුවෙනි සතිපට්ඨානය පිළිබඳවය. එනම් කයෙහි කය අනුව බලමින් භාවනා කරන්නේ කෙසේද යන්නය. භාවනානුයෝගියා විසින් මේ සියලුම භාවනා ක්‍රම කළ යුතුයැයි නියමයක් නැත. මේ දක්වන ලද භාවනා ක්‍රම හයෙන් එකක් තෝරාගෙන දිගට භාවනාව කරනවිට ඔබේ බලාපොරොත්තුව අනුව සාර්ථකව භාවනාව කරගැනීමට හැකිවෙනු ඇත.

මෙසේ දක්වන ලද භාවනා අරමුණු හයෙහිම සමථ වශයෙන් ද විදර්ශනා වශයෙන් ද භාවනාව ප්‍රගුණ කළ යුතුය. ඒ යුගනද්ධයයි.

(2). වේදනානුපස්සනාව හෙවත් වේදනාවන්හි වේදනාවන්ට අනුව බලමින් වාසය කිරීම

මේ දෙවෙනි සතිපට්ඨානයයි. මේ භාවනාව කරන විට භාවනානුයෝගියා විසින් ටික වේලාවක් ආනාපාන සති භාවනා කොට අනතුරුව විවිධ වේදනා බැලීම කළ යුතුය. වේදනා යනු රිදීම හෝ කැක්කුම පමණක් නොවෙයි. වේදනා යන්නෙන් අදහස් කරන්නේ මේ මුලු මහත් ශරීරයේම ඇති කායික හෝ මානසික විවිධ වූ වින්දනයන්ය. අපේ ශරීරයේ විවිධ වින්දන ඇත. සැප වින්දන, දුක් වින්දන, සැපත් දුකත් නැති වින්දන යනුවෙන් වේදනා හෙවත් වින්දන ප්‍රධාන වශයෙන් කොටස් තුනකි. මෙම සතිපට්ඨාන සූත්‍ර දේශනයට අනුව නැවත බුදුපියාණන් වහන්සේ අපට වේදනාව සාමිස වේදනා නිරාමිස වේදනා යනුවෙන් කොටස් දෙකකට බෙදා දක්වති. ඊළඟට ඒ සාමිස හා නිරාමිස වේදනාද නැවත, සාමිස සැප වේදනා, සාමිස දුක් වේදනා, සාමිස සැපත් දුකත් නැති වේදනා යනුවෙන් ද නිරාමිස සැප වේදනා, නිරාමිස දුක් වේදනා, නිරාමිස සැපත් දුකත් නැති වේදනා යනුවෙන් ද බෙදා දක්වමින් වේදනාවේ කොටස් නවයක් ඇති බව පෙන්වා වදාළහ.

විවිධ වේදනාවන් ගැන කතා කරන අපේ බුදුහාමුදුරුවෝ මජ්ඣිම නිකායේ බහුවේදනීය සූත්‍රයට[2] අනුව වේදනාවන් එකසිය අටක් බව පෙන්වා දෙති. භාවනානුයෝගියා විසින් මේ එක් එක් වේදනාවන් හෙවත් වින්දන ඇති අවස්ථාවේදී ඒ ඒ වින්දන ඒ ඒ ආකාරයෙන් දැනගනිමින් භාවනා කළ යුතුය. මෙහිදී මේ වින්දන ඇත. එහෙත් 'මගේ වින්දන' කියා හෝ 'මම විඳිනවා' කියා හෝ ගන්නට කිසිත් නැති බව තේරුම්

ගත යුතුය. එසේම සියලු වින්දන ''මගේ නොවෙයි, මම නොවෙයි, මගේ ආත්මය නොවෙයි'', ''අනිත්‍යයි, දුක්ඛයි, අනාත්මයි'' යනුවෙන් දැකීමටම උත්සුක විය යුතුය. මෙසේ දැකීම සුද්ධ විදර්ශනයයි.

මෙහිදී ද මුලින් ආනාපාන සතිය කරන්නේ සමථය විදිහටය. අනතුරුව එය විවිධ වින්දන ඔස්සේ බලනතාක් ඇතිවෙන්නේ විදර්ශනයයි. ඒ අනුව සමථය වඩන විට විපස්සනාව ද විපස්සනාව වඩනවිට සමථය ද යනුවෙන් යුගනද්ධව මේ දෙකම එකටම වැඩෙන බව තේරුම් ගන්න.

(3). චිත්තානුපස්සනාව හෙවත් සිතෙහි සිත්වලට අනුව බලමින් වාසය කිරීම

මේ තුන්වෙනි සතිපට්ඨානයයි. මෙහිදී ද මුලින්ම ටික වේලාවක් ආනාපානසති භාවනාව කොට අනතුරුව සිත දෙස බලා සිටිමින් සිතේ ඇති විවිධ සිතුවිලි තේරුම් ගැනීම අපේක්ෂා කෙරේ. සිත දෙස බලා සිටින යෝගාවචරයාට තමන්ගේ සිතෙහි ඇති විවිධ සිතුවිලි තේරුම්ගත හැකි වේ. සිතේ ඇත්තේ රාග සහිත සිතක් නම් එය රාග සහි ත සිතක් බව තේරුම් ගන්න. රාගයෙන් තොර සිතක් නම් රාගයෙන් තොර සිතක් බව තේරුම් ගන්න . ද්වේෂ සහිත හෙවත් තරහෙන් යුත්ත සිතක් නම් ද්වේෂ සහිත සිතක් බව දැනගන්න. ද්වේෂ රහිත සිතක් නම් ද්වේෂ රහිත සිතක් බව දැනගන්න. මෝහය හෙවත් මුළා ස්වභාවයෙන් යුත් සිතක් නම් මෝහයෙන් යුත් සිතක් බව දැනගන්න. මෝහ රහිත සිතක් නම් මෝහ රහිත සිතක් බව දැනගන්න. ඔබේ සිත විසිරී ඇත්නම් විසිරුණු සිතක් බව දැනගන්න. හැකිලුණු සිතක් නම්

හැකිලුණු සිතක් බව දැනගන්න. සිත එක්තැන්ව ධ්‍යානාදිය ලබමින් වඩාත් බලවත් බවට පත් සිතක් නම් හෙවත් මහග්ගත භාවයට පත් සිතක් නම් මහග්ගත සිතක් බව දැනගන්න. අමහග්ගත සිතක් හෙවත් එවැනි තත්වයකට පත්නොවූ සිතක් නම් අමහග්ගත සිතක් බව දැනගන්න. පඤ්චනීවරණ යටපත්ව එහෙත් ධ්‍යානයකට පත්නොවූ සිතක් නම් හෙවත් සඋත්තර සිතක් නම් සඋත්තර සිතක් බව දැනගන්න. පඤ්චනීරවරණ යටපත්ව ධ්‍යාන තත්වයට පත් වූ සිත අනුත්තර සිත අනුත්තර සිතක් ලෙස දැනගන්න. සිත සමාහිත වූ විට සමාහිත සිතක් බව දැනගන්න. සමාහිත නොවූ සිත සමාහිත නොවූ සිතක් හෙවත් අසමාහිත සිතක් බව දැනගන්න. විමුක්තියට පත් සිත විමුක්තියට පත් සිත සේ දැනගන්න. විමුක්තියට පත්වී නැති සිත විමුක්තියට නොපත් සිත සේ දැනගන්න.

මේ අපේ බුදුහාමුදුරුවෝ චිත්තානුපස්සනාව කරන පිළිවෙල අපට උගන්වා ඇති ආකාරයයි. මේ බුද්ධාවවාදය අනුව අපිත් හොඳින් භාවනා කරමු.

(4). ධම්මානුපස්සනාව හෙවත් ධර්මයන්හි ධර්මවලට අනුව බලමින් වාසය කිරීම

භාවනානුයෝගියා විසින් පිළිවෙලින් මුලින් සඳහන් කළ කායානුපස්සනාව, වේදනානුපස්සනාව හා චිත්තානුපස්සනාව යන භාවනාවන් කරන කල්හී සිත සංවර වී නීවරණ ධර්ම සම්පූර්ණයෙන්ම නැතිව යයි. ඉහත භාවනා ක්‍රම කරන අවස්ථාවේ දී භාවනානු යෝගියාට ධ්‍යාන ලබාගත හැකිවුයේ නම් එහිදී සිදුවන්නේ පඤ්චනීවරණ ධර්මවල යටපත් වීමක්

පමණි. සම්පූර්ණයෙන්ම නැතිවීමක් සිදුනොවේ. එබැවින් එම භාවනාව සමථ භාවනාව නමින් හැඳින්වේ. එහෙත් මුලින් සඳහන් කළ භාවනා ක්‍රම කරන කල්හී වුවද විදර්ශනාව ඇතිවුයේ නම් හෙවත් ඇතිවීම නැතිවීම මනසින් දැකීමට හැකි වුයේ නම් පඤ්චනිවරණ ධර්මයෝ සම්පූර්ණයෙන්ම නැති කිරීමේ හැකියාව තිබුණි.

(අ). නීවරණ සහමුලින් ම නැති වීම

මෙම ධම්මානුපස්සනාවට එනවිට යෝගාවචරයාගේ සිතේ තිබුණ පඤ්ච නීවරණ ධර්මයෝ සම්පූර්ණයෙන්ම නැතිව යයි. එසේ නැතිවයන්නේ ඒවා ඒ ඒ ආකාරයෙන්ම දැකීම නිසාය. ඒ යම් නීවරණයක් සිතෙහි ඇතිවිට ඇති බව දනියි. නැතිවිට නැතිබව දනියි. නොඋපන් නීවරණයක් ඇතිවෙනවිට එය දනියි, උපන් නීවරණයක් නැතිවෙනවිට එය දනියි. නැවතත් ඉදිරියේදී ඒ නීවරණය කෙසේවත් ඇති නොවේ යන්න ද දැනගනියි. මේ අනුව යෝගාවචරයා විසින් කාමච්ඡන්ද, ව්‍යාපාද, ථිණමිද්ධ, උද්දච්ච කුක්කුච්ජ, විචිකිච්ජා යන නීවරණ ධර්ම පහම පස් ආකාරයකින් දකිමින් සම්පූර්ණයෙන්ම නැති කර දමයි. එසේ සිදුවන්නේ විදර්ශනය හෙවත් ඒවා ඇතිසැටියෙන් දැකිමට හැකියාව ලැබුණ නිසයි.

(ආ). පඤ්චස්ඛන්ධය අවබෝධකරගැනීම

අනතුරුව යෝගාවචරයා මේ පඤ්චස්ඛන්ධය යනු කුමක්දැයි නුවණින් බලයි. එවිට පඤ්චස්ඛන්ධයේ ඇති තතු අවබෝධවෙයි. මේ රූපයයි, මේ රූපයේ

ඇතිවීමයි, මේ රූපයේ නැතිවීමයි. මේ වේදනාවයි, මේ වේදනාවේ ඇතිවීමයි, මේ වේදනාවේ නැතිවීමයි. මේ සඤ්ඤාවයි,මේ සඤ්ඤාවේ ඇතිවීමයි, මේ සඤ්ඤාවේ නැතිවීමයි. මේ සංඛාරයි, මේ සංඛාරවල ඇතිවීමයි, මේ සංඛාරවල නැතිවීමයි. මේ විඤ්ඤාණයයි මේ විඤ්ඤාණයේ ඇතිවීමයි, මේ විඤ්ඤාණයේ නැතිවීමයි. යනුවෙනි. ඒ අනුව යෝගාවචරයාට පඤ්චස්ඛන්ධයේ ඇතිවීම නැතිවීම දැකීමට හැකියාව ලැබේ. ඒ විදර්ශනයයි. යම් කෙනෙකුට පඤ්චස්ඛන්ධය මැනවින් අවබෝධ වේද එයම දුක අවබෝධවීමයි. මේ පඤ්චස්ඛන්ධයම දුක්ඛකඛන්ධයක් හෙවත් දුක් ගොඩක් බව තේරුම් ගත් විට එම යෝගාවචරයාට වැටහෙන්නේ දුක්ඛ සත්‍යය හෙවත් චතුරාර්‍යසත්‍ය ධර්මයන්ගේ පළමුවැන්නයි. මේ විදර්ශනය සඳහා අනිවාර්‍යයෙන්ම හොඳ සමථයක් ද තිබිය යුතුය. ඒ අනුව සමථවිපස්සනා යුගනද්ධය මැනවින් පරිපූර්ණ බවට පත්වේ.

(ඇ). දොළොස් ආකාර ආයතන අවබෝධ කරගැනීම

මීළගට යෝගාවචරයාට අභ්‍යන්තර හා බාහිර ආයතන ගැන අවබෝධය ලැබේ. අභ්‍යන්තර ආයතන යනු ඇස, කණ, නාසය, දිව, ශරීරය හා මනස යන හයයි. බාහිර ආයතන යනු රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම යන හයයි. මේ අනුව මේ දොළහට ද්වාදස ආයතන යැයි කියති. ද්වාදස යනු දොළහ යන්නයි. මේ දොළොස් ආකාර ආයතන ගැන යෝගාවචරයා සිත මෙහෙයවද්දී ඒවායේ යථා ස්වභාවය හෙවත් ඇතිසැටිය අවබෝධ වේ. මෙහිදී යෝගාවචරයා ඇස යනු කුමක්දැයි දැනගනියි, ඇසට ආපාත වෙන හෙවත් යොමුවෙන, රූපය කියන්නේ කුමක්දැයි දැනගනියි. මේ දෙක එනම්

ඇස හා රූපය නිසා ඇතිවෙන සංයෝජනය හෙවත් බැඳීම ද දැනගනියි. ඇත්තෙන්ම ඉතාම හොඳින් තේරුම් ගත යුත්තේ මේ සංයෝජනය තමයි. යෝගාවචරයාගේ සිත දියුණුවී ඇති බැවින් දැන් නොඋපන් සංයෝජනය උපදිනවිට එය දැනගනියි. උපන් සංයෝජනය නැතිවෙනවිට එය ද දැනගනියි. එසේම ප්‍රහීන වු නැතිවු සංයෝජනය නැවත උපදින්නේ නැති බව ද දැනගනියි. මෙසේ යෝගාවචරයා විසින් ඇස නිසා ඇතිවෙන, කණ නිසා ඇතිවෙන, නාසය නිසා ඇතිවෙන, දිව නිසා ඇතිවෙන, කය නිසා ඇතිවෙන, මනස නිසා ඇතිවෙන සංයෝජනයන් මනාව දැනගනිමින් ඒ සියලු සංයෝජනවලින් හෙවත් බැම්වලින් නිදහස් වේ.

මේ සංයෝජන හෙවත් බැමි ගැන අපේ පූජනීය වු ධර්ම සේනාපති සැරියුත් මහරහතන් වහන්සේත් කොට්ඨිත මහ රහතන් වහන්සේත් අතර ඇතිවු ඉතාමත්ම ලස්සන ධර්ම සාකච්ජාවකට දැන් අපි හිත යොමු කරමු. සංයුත්ත නිකායේ සළායතන සංයුත්තයේ කොට්ඨිත සූත්‍රයේ සඳහන් මෙය ඉතාමත් සිත්ගන්නා සුළු හෙළිදරව්වකි.

මෙම සූත්‍රදේශනයට අනුව වරක් අපේ සැරියුත් මහරහතන් වහන්සේත් මහා කොට්ඨිත මහ රහතන් වහන්සේත් බරණැස ඉසිපතනාරාමයේ වැඩ සිටිද්දී දිනක් මහා කොට්ඨිත මහරහතන් වහන්සේ සන්ධ්‍යා කාලයේ භාවනාවෙන් නැඟිට සැරියුත් මහරහතන් වහන්සේ වෙත පැමිණ සතුටු සාමීචිව කතා කොට මෙම සාකච්ජාවට පිවිසියහ. මේ සම්බුදු සසුන බැබළ වු මහ රහතන් වහන්සේලා දෙනමක් විසින් කළ ඒ ධර්ම සාකච්ජාව අපි දැන් දෙබසක් විදිහට දකිමු.

මහා කොට්ඨිත මහ රහතන් වහන්සේ:

පින්වත් සාරිපුත්ත ස්වාමින් වහන්ස, මේ ඇස රූපයන්ට බැඳිලද තියෙන්නේ රූප ඇසට බැඳිලද තියෙන්නේ? කණ ශබ්දයන්ට බැඳිලද තියෙන්නේ ශබ්ද කණට බැඳිල ද තියෙන්නේ? නාසය ගඳ සුවඳවලට බැඳිලද තියෙන්නේ ගඳ සුවඳ නාසයට බැඳිලද තියෙන්නේ ? දිව රසයන්ට බැඳිල ද තියෙන්නේ රසයන් දිවට බැඳිල ද තියෙන්නේ? කය පහසන්ට බැඳිල ද තියෙන්නේ පහසයන්ට කය බැඳිල ද තියෙන්නේ? මනස අරමුණුවලට බැඳිල ද තියෙන්නේ අරමුණු මනසට බැඳිල ද තියෙන්නේ?

මහා සැරියුත් මහ රහතන් වහන්සේ:

පින්වත් කොටඨිත ස්වාමින් වහන්ස, ඇස රූපයන්ට බැඳිලා නෑ, රූප ඇසට බැඳිලත් නෑ. ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදී නම් ඒක තමයි එහි බැඳීම. කණ ශබ්දයන්ට බැඳිලා නෑ, ශබ්ද කණට බැඳිලත් නෑ. ඒ දෙක නිසා එහි යම් ඡන්දරාගයක් උපදී නම් ඒක තමයි එහි බැඳීම. නාසය ගඳසුවඳට බැඳිලා නෑ, ගඳ සුවඳ නාසයට බැඳිලත් නෑ. ඒ දෙක නිසා එහි යම් ඡන්දරාගයක් උපදී නම් ඒක තමයි එහි බැඳීම. දිව රසයන්ට බැඳිලා නෑ, රස දිවට බැඳිලත් නෑ. ඒ දෙක නිසා එහි යම් ඡන්දරාගයක් උපදී නම් ඒක තමයි එහි බැඳීම. කය ස්පර්ශයන්ට බැඳිලා නෑ, ස්පර්ශ කයට බැඳිලත් නෑ. ඒ දෙක නිසා එහි යම් ඡන්දරාගයක් උපදී නම් ඒක තමයි එහි බැඳීම. මනස අරමුණු වලට බැඳිලා නෑ, අරමුණු මනසට බැඳිලත් නෑ. ඒ දෙක නිසා එහි යම් ඡන්දරාගයක් උපදී නම් ඒක තමයි එහි බැඳීම.

''ආයුෂ්මතුනි, හිතන්න මෙහෙම, ඔන්න කළු ගොණෙකුයි සුදු ගොණෙකුයි එකට ඇඳලා ඉන්නවා කියලා එකම යොතකින්, ලණුවකින්. මේක දැකලා යම් කෙනෙක් කියනවා නම් කළු ගොණා සුදුගොණාට බැඳිලයි ඉන්නේ කියලා හෝ සුදු ගොණා කළු ගොණාට බැඳිලයි ඉන්නේ කියලා හෝ එය නිවැරදිව කියන දෙයක්ද? 'නැහැ.' කළු ගොණා සුදුගොණාගේ බන්ධනය නොවේ. සුදුගොණා කළු ගොණාගේ බන්ධනය නොවේ. යම් යොතකින්, ලණුවකින්, මේ දෙන්නා එකට ඇඳලා තියෙනවා ද අන්න ඒකයි, ඒ ලණුවයි බන්ධනේ.

''අන්න ඒ වගේම තමයි, ඇස රූපයන්ට බන්ධනය නොවේ. රූපයන්ට ඇස බන්ධනය නොවේ. ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදී නම් එයයි බන්ධනේ. කණ ශබ්දයන්ට බන්ධනය නොවේ. ශබ්ද කණට බන්ධනය නොවේ. ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදී නම් එයයි බන්ධනේ. නාසය ගඳ සුවඳට බන්ධනය නොවේ. ගඳ සුවඳ නාසයට බන්ධනය නොවේ. ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදී නම් එයයි බන්ධනේ. දිව, රසයන්ට බන්ධනය නොවේ. රසය දිවට බන්ධනය නොවේ. ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදී නම් එයයි බන්ධනේ. කය පහසට බන්ධනය නොවේ. පහස කයට බන්ධනය නොවේ. ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදී නම් එයයි බන්ධනේ. මනස අරමුණුවලට බන්ධනය නොවේ. අරමුණු මනසට බන්ධනය නොවේ. ඒ දෙක නිසා යම් ඡන්දරාගයක් උපදී නම් එයයි බන්ධනේ.

''යම් හෙයකින් ආයුෂ්මතුනි, ඇස රූපවල බැඳීම වුයේ නම් හෝ රූප ඇසේ බැඳීම වුයේ නම් මැනවින්

දුක් නැති කිරීම පිණිස පුරණ මේ ශාසන බ්‍රහ්මචරියාව පැහැදිලි වෙන්නේ නැත, ප්‍රකට වෙන්නේ නැත. (කණ, නාසය, දිව, කය හා මනසයට ද මෙසේම බව තේරුම්ගන්න)

''ආයුෂ්මතුනි, භාග්‍යවතුන් වහන්සේටත් ඇස තිබේ. භාග්‍යවතුන් වහන්සේත් ඇසින් රූප දකියි. එහෙත් භාග්‍යවතුන් වහන්සේට ඡන්දරාගයක් නැහැ. භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටින්නේ මනාව මිදුන සිතින් යුතුවයි. භාග්‍යවතුන් වහන්සේටත් කණ තිබේ. භාග්‍යවතුන් වහන්සේත් කණින් ශබ්ද අසයි. එහෙත් භාග්‍යවතුන් වහන්සේට එහි ඡන්දරාගයක් නැහැ. භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටින්නේ මනාව මිදුන සිතින් යුතුවයි. භාග්‍යවතුන් වහන්සේටත් නාසය තිබේ. භාග්‍යවතුන් වහන්සේත් නාසයෙන් ගඳ සුවඳ දැනගනියි. එහෙත් භාග්‍යවතුන් වහන්සේට එහි ඡන්දරාගයක් නැහැ. භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටින්නේ මනාව මිදුන සිතින් යුතුවයි. භාග්‍යවතුන් වහන්සේටත් දිව තිබේ. භාග්‍යවතුන් වහන්සේත් දිවෙන් රස විඳියි. එහෙත් භාග්‍යවතුන් වහන්සේට එහි ඡන්දරාගයක් නැහැ. භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටින්නේ මනාව මිදුන සිතින් යුතුවයි. භාග්‍යවතුන් වහන්සේටත් කය තිබේ. භාග්‍යවතුන් වහන්සේත් කයින් පහස ලබයි. එහෙත් භාග්‍යවතුන් වහන්සේට එහි ඡන්දරාගයක් නැහැ. භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටින්නේ මනාව මිදුන සිතින් යුතුවයි. භාග්‍යවතුන් වහන්සේටත් මනස තිබේ. භාග්‍යවතුන් වහන්සේත් මනසින් අරමුණු ගනියි. එහෙත් භාග්‍යවතුන් වහන්සේට එහි ඡන්දරාගයක් නැත. භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටින්නේ මනාව මිදුන සිතින් යුතුවයි.'' මෙන්න මේ ආකාරයෙන්

යෝගාවචරයා විසින් මැනවින් තේරුම් ගත යුත්තේ මේ ආයතනවල ඇති බැම්ම පිළිබඳවයි. ඒ බැම්ම තේරුම් ගත් කළ ආයතන කියා අමුතු දෙයකුත් නැහැ. මේ ආයතන යනු වෙනත් කිසිවක් නොව හේතූන් නිසා හටගත් දේවල් බවත් හේතු නැතිවීමෙන් ඒවා සියල්ලම නැතිවී යන බවත් තේරුම් ගත හැකි වේ.

(ඈ) සත්ත බොජ්ඣංග ධර්ම අවබෝධ කරගැනීම

මීළඟට යෝගාවචරයාගේ සිත යොමු වෙන්නේ සත්ත බොජ්ඣංග ධර්ම වෙතටය. එනම් සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි හා උපේක්ඛා යන හතය. මේවාට බොජ්ඣංග යන නම යොදා ඇත්තේ මේ ධර්ම ප්‍රගුණ කරනවිට යෝගාවචරයා බුදුබවට පත්වෙන නිසයි. බෝධි අංග යන්න බොජ්ඣංග වී ඇත. බෝධියට හෙවත් බුදුබවට පුරණ අංගයි මේ.

දිනක් එක්තරා භික්ෂුන් වහන්සේ නමක් අපගේ භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ වෙත ගොස් ''ස්වාමීනි මේ බොජ්ඣංග, බොජ්ඣංග, කියා කියනවා. මොනවද මේ බොජ්ඣංග කියන්නේ'' කියා ඇසුවේය. එවිට බුදුපියාණෝ ''පින්වත් භික්ෂුව, අවබෝධය පිණිස පවතින බැවින් මෙසේ බොජ්ඣංග කියා කියති. මෙහිදී භික්ෂුව විවේකයෙන් යුතුව, විරාගයෙන් යුතුව, නිරෝධයෙන් යුතුව, නිවණටම නැමෙන සුළුව සති සම්බොජ්ඣංගය වඩයි, ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයි, විරිය සම්බොජ්ඣංගය වඩයි, පීති සම්බොජ්ඣංගය වඩයි, පස්සද්ධිසම්බොජ්ඣංගය වඩයි, සමාධි සම්බොජ්ඣංගය වඩයි, උපේක්ඛා සම්බොජ්ඣංගය වඩයි. මෙසේ මේ සත්

බොජ්ඣංගයෝ වඩන කල්හී ඔහුගේ සිත කාමාශ්‍රවයන්ගෙන් ද මිදෙයි, භවාශ්‍රවයන්ගෙන් ද මිදෙයි, අවිද්‍යාශ්‍රවයන්ගෙන් ද මිදෙයි. මිදුණු කල්හී සිත මිදුණේ යැයි දැනීම ඇතිවෙයි. ඒ අනුව ඉපදීම නැතිවෙයි, ඹබසර වැස නිමකළ කෙනෙක් බවට පත්වෙයි, කළයුතු සියල්ල කළ කෙනෙක් බවට පත්වෙයි, තව දුරටත් කළ යුතු දෙයක් නැති බවට පත්වෙයි.'' යැයි අපේ බුදුහාමුදුරුවෝ ඉතාම පැහැදිලිව වදාළහ.[4]

අපේ බුදුහාමුදුරුවෝ මේ බෝධි අංග හෙවත් බොජ්ඣංග සම්පූර්ණ වෙන ආකාරය ඉතාම ලස්සන උපමාවකින් සංයුත්ත නිකායේ බොජ්ඣංග සංයුත්තයේ එන හිමවන්ත සූත්‍රයෙන් මෙසේ පැහැදිලි කළහ. ''පින්වත් මහණෙනි, හිමවන්ත පර්වත රාජයන්ගේ ඇසුරෙහි නාගයෝ කයින් වැඩෙති. කාය ශක්තිය ලබා ගනිති. ඔවුහු එහි කයින් වැඩී කාය බලය ලබාගෙන කුඩා දිය වළවල් වලට බසිති. කුඩා දිය වළවල් වලින් මහ දිය වළවල් වලට බසිති. මහ දිය වළවල් වලින් කුඩා ගංගා වලට බසිති. කුඩා ගංගා වලින් මහ ගංගා වලට බසිති.මහ ගංගා වලට බැස මහ මුහුදට බසිති. එහිදී ඔවුහු කයින් මහත් බවට විපුල බවට පත්වෙති. අන්න ඒ ආකාරයෙන්ම පින්වත් මහණෙනි, භික්ෂුව ද සීලය නිසා සීලයෙහි පිහිටා සත්ත බොජ්ඣංග ධර්ම වඩනකල්හී සත්ත බොජ්ඣංග බහුල වශයෙන් කරන කල්හී ධර්මයන්හි මහත්බවට විපුල බවට පත්වෙයි. හෙතෙම විවේකයෙන් යුක්තවූ විරාගයෙන් යුක්ත වූ නිරෝධයෙන් යුක්ත වූ අතහැරීම පරම කොට ඇති සති සම්බොජ්ඣංගය වඩයි, විරිය සම්බොජ්ඣංගය වඩයි, පීති සංබොජ්ඣංගය වඩයි, පස්සද්ධිසම්බොජ්ඣංගය වඩයි, සමාධි සම්බොජ්ඣංගය වඩයි, උපේක්ඛා

සම්බොජ්ඣංගය වඩයි.''යනුවෙනි.

මෙම සත්ත බොජ්ඣංග ධර්මයන් වැඩීම නිසා දියුණු කිරීම නිසා කෙනෙකුට තමා කැමති පරිදි ඒ ඒ අවස්ථාවේ ඒවා උපයෝගී කරගත හැකිය. එය හරියට රෙදි අල්මාරියක ඇති රෙදි වලින් තමා කැමති පරිදි ඇඳුමක් තෝරාගෙන ඒ ඒ වෙලාවට ඒ ඒ ඇඳුමෙන් සැරෙන්නාක් මෙනි යැයි වරක් අපේ සාරිපුත්ත මහරහතන් වහන්සේම භික්ෂූන් අමතා දේශනා කළහ. සංයුත්ත නිකායේ බොජ්ඣංග සංයුත්තයේ හතර වැනි වත්ථු සූත්‍රයෙන් සඳහන් වන පරිදි අපගේ පූජනීය සැරියුත් මහරහතන් වහන්සේ මෙසේ වදාරති. ''ආයුෂ්මතුන් වහන්ස, මේ බොජ්ඣංග ධර්මයෝ හතක් තියෙනවා. එනම් සති සම්බොජ්ඣංගය, ධම්මවිචය සම්බොජ්ඣංගය, විරිය සම්බොජ්ඣංගය, පීති සම්බොජ්ඣංගය, පස්සද්ධිසම්බොජ්ඣංගය, සමාධිසම්බොජ්ඣංගය සහ උපේක්ඛා සම්බොජ්ඣංගය යන මේවාය. පින්වත් ආයුෂ්මතුන් වහන්ස, මම උදේ කාලයේ මේ බොජ්ඣංගවලින් යම් බොජ්ඣංගයකින් වාසය කිරීමට කැමති ද එයින් උදේ කාලයේ වාසය කරනවා. යම් බොජ්ඣංගයකින් මධ්‍යාහ්න කාලයේ වාසය කිරීමට කැමති ද එයින් මධ්‍යාහ්න කාලයේ වාසය කරනවා. සවස් කාලයේ යම් බොජ්ඣංගයකින් වාසය කිරීමට කැමති ද එයින් සවස් කාලයේ කැමති පරිදි වාසය කරනවා.'' යනුවෙනි.

සංයුත්ත නිකායේ බොජ්ඣංග සංයුත්තයේම සීල සූත්‍රයෙහි අපගේ ශාන්ති නායක වූ ලොවුතුරා බුදුපියාණන් වහන්සේම මෙසේ ප්‍රකාශ කරති. '' පින්වත් මහණෙනි, යම්සේ භික්ෂූහු සීල සම්පන්න ද සමාධි

සම්පන්න ද ප්‍රඥා සම්පන්න ද විමුක්ති සම්පන්න ද විමුක්ති ඥාන දර්ශන සම්පන්න ද ඒ භික්ෂූන්ගේ දැක්මත් බොහෝ උපකාර යැයි මම කියමි. ඒ භික්ෂූන්ගේ වදන් ඇසීමත් බොහෝ උපකාර යැයි මම කියමි. ඒ භික්ෂූන් වෙත එළඹීමත් බොහෝ උපකාර යැයි මම කියමි. ඒ භික්ෂූන් ඇසුරු කිරීමත් බොහෝ උපකාර යැයි මම කියමි. ඒ භික්ෂූන් සිහි කිරීමත් බොහෝ උපකාර යැයි මම කියමි. ඒ භික්ෂූන් අනුව පැවිදිවීමත් බොහෝ උපකාර යැයි මම කියමි. ඒ කුමක් නිසාද යත්, පින්වත් මහණෙනි, එබඳු භික්ෂූන්ගේ දහම් අසා කාය විවේකය චිත්ත විවේකය යන උභය විවේකයෙන් යුතුව වාසය කරයි. හෙතෙම එසේ වෙන්ව වාසය කරන කල්හී ඒ දහම සිහිකරයි, පුන පුනා සිතයි.

''පින්වත් මහණෙනි, යම් කලෙක හෙතෙම මෙසේ වෙන්ව වාසය කරනවිට ධර්මය සිහි කරන විට පුන පුනා සිතයි ද එවිට ඒ භික්ෂුව විසින් සතිසම්බොජ්ඣංගය පටන් ගන්නා ලද්දේ වෙයි. යම් කලෙක සතිසම්බොජ්ඣංගය වඩයි ද එවිට සති සම්බොජ්ඣංගය පිරිපුන් බවට පත්වෙයි. එසේ සිහියෙන් සිටින විට ඒ දහම නුවණින් සොයයි. නුවණ හසුරුවයි. විමසීමට පැමිණෙයි.

''පින්වත් මහණෙනි, ඒ භික්ෂුව යම්කලෙක එසේ සිහිඇතිව වසන්නේ ද දහම නුවණින් සොයයි ද නුවණ හසුරුවා ද විමසීමට පැමිණේ ද එසමයෙහි ඒ මහණහු විසින් ධම්ම විචය සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. යම් කලෙක ධම්මවිචය සම්බොජ්ධංගය වඩයි ද එවිට ධම්මවිචය සම්බොජ්ඣංගය පිරිපුන් බවට පත්වේ. එසේ දහම නුවණින් සොයන නුවණ හසුරුවන

විමසීමට පැමිණෙන ඔහුගේ වීර්‍ය්‍යය අරඹන ලද්දේ වෙයි. කම්මැලිකම නොවේ. යම් කලෙක ඒ දහම නුවණින් සොයන නුවණ හසුරුවන විමසීමට පැමිණෙන භික්ෂුවගේ වීර්‍ය්‍යය අරඹන ලදද කම්මැලි කම නැද්ද එවිට විරිය සම්බොජ්ඣංගය වැඩෙයි එවිට එය වැඩීමෙන් පිරිපුන් බවට පත්වෙයි. එසේ පිරිපුන් විරිය ඇති විට නිරාමිස ප්‍රීතියක් උපදියි.

''මහණෙනි, යම් කලෙක අරඹන ලද වීර්‍ය්‍යය නිසා නිරාමිස ප්‍රීතියක් උපදියි ද එවිට ප්‍රීතිසම්බොජ්ඣංගය අරඹන ලද්දේ වෙයි. එම ප්‍රීතී සම්බොජ්ඣංගය වඩන විට එය පිරිපුන් බවට පත්වේ. ප්‍රීති සිත ඇතිවිට නාම කයත් සැහැල්ලුවේ. සිතත් සැහැල්ලු වේ. එසේ කයත් සිතත් සැහැල්ලු වෙනවිට පස්සද්ධිසම්බොජ්ඣංගය අරඹන ලද්දේ වෙයි. එම පස්සද්ධිසම්බොජ්ඣංගය වඩනවිට එය පිරිපුන් බවට පත්වේ. පස්සද්ධිය ඇතිවනවිට කයට හා සිතට සුවය දැනේ. සුවය ඇතිවිට සිත එකඟ බවට පත්වේ. යම් අවස්ථාවක සැහැල්ලු කය ඇතිව සිත එකඟවේ ද එවිට සමාධිසම්බොජ්ඣංගය අරඹන ලද්දේ වෙයි. යම් විටක සමාධි සම්බොජ්ඣංගය වඩයි ද එවිට සමාධි සම්බොජ්ඣංගය පිරිපුන් බවට පත්වේ. එසේ එකඟ වූ සිත ඇති කල්හී මැනවින් ඇතුළත බලන්නේ වෙයි. යම් කලෙක එසේ මැනවින් සමාහිත සිතින් ඇතුළත බලන්නේ ද ඒ උපේක්ෂාවයි. එවිට උපෙක්ඛා සම්බොජ්ඣංගය අරඹන ලද්දේ වෙයි. යම් කලෙක උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩන්නේ ද එවිට උපෙක්ඛා සම්බොජ්ඣංගය පිරිපුන් බවට පත්වේ. පින්වත් මහණෙනි, මෙසේ සත්ත බොජ්ඣංග ධර්මයන් වැඩු කල්හී බහුල කළ කල්හී, ඵල හතක් හෙවත් අනුසස් හතක් ලැබිය හැකිය.'' යනුවෙනි. එම අනුසස් හෙවත්

ඵල හත මෙසේය.

1. මෙලොවදීම මරණයට පෙර රහත් බව ලැබේ.

2. මරණයට පෙර රහත් බව නොලැබුණොත් මැරෙන අවස්ථාවේ දී රහත්බව ලැබේ.

3. මෙලොව දී මරණයට පෙර හෝ මරණාසන්න අවස්ථාවේ දී රහත් බව නොලැබුණොත් සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාමරාග, පටිඝ, යන සංයෝජන ධර්ම පහ නැති කොට අවිහ නම් වූ සුද්ධාවාස බඹලොව ඉපිද ආයු අඩක් ගෙවා රහත්ව අන්තරා පරිනිබ්බායි තත්වයට පත්වෙයි.

4. එසේ මෙලොව දී මරණයට පෙර හෝ මරණාසන්න අවස්ථාවේදී හෝ ඕරම්භාගිය සංයෝජන පහ නැති කොට අවිහ බඹ ලොව ඉපිද ආයු අඩක් ගෙවා හෝ රහත් බව නො ලබයි නම් ඒ බඹලොව ආයු ගෙවා කෙළවරට පැමිණිවිට රහත්ව උපහච්චපරිනිබ්බායි තත්වයට පත්වෙයි.

5. එසේ නැතිනම් එහිදීම හෙවත් අවිහ සුද්ධාවාස බඹලොව දීම උත්සාහයකින් තොරවම (අසංඛාර පරිනිබ්බායී ලෙස) අරහත් බවට පත් වී පිරිනිවනට පත්වෙයි.

6. එසේ නැතිනම් උත්සාහයෙන් යුක්තව (සසංඛාර පරිනිබ්බායී ලෙස) එහිදීම අරහත් බවට පත් වී පිරිනිවනට පත්වෙයි.

7. එසේත් නැතිනම් ඒ අවිහ බඹලොවින් චුතව උද්ධංසෝතව එනම් අතප්ප, සුදස්ස, සුදස්සී, යන බඹලොව වල ඉපිද ඒවායින් චුතව අකනිට්ඨක නම් බඹලොව උපත ලබා ඉතිරි සංයෝජන පහ නැති කරමින් රහත් භාවයට පත්වෙයි.[5]

සංයුත්ත නිකායේ බොජ්ඣංග සංයුත්තයේ සඳහන් වෙන කූටාගාර සූත්‍රයෙහි ඉතාමත්ම ලස්සන මෙන්ම ඉතාමත්ම අර්ථවත් උපමාවක් ගෙන හැර දක්වන අපේ බුදුහාමුදුරුවෝ මේ බොජ්ඣංග ධර්ම හත වැඩෙන ආකාරය කූටය සහිත ගෙයක ඒ කූටයට හෙවත් මුදුන් ලීයට වහළයේ පරාළ සියල්ලම එක්වෙන්නේ යම්සේද එසේම මේ බොජ්ඣංග ධර්ම හත වඩන කල්හී, බහුල කරන කල්හී, නිවණට නැඹුරු වෙන බව, නිවණටම යොමු වෙන බව නිවණටම බර වෙන බව, දේශනා කළහ.

මෙසේ වදාරණ ලද බොජ්ඣංග ධර්මයෝ අප තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ පහළ වීමක් නැති කළෙක කෙසේවත් ඇති නොවන බවත්, මේවා බුදුකෙනෙක් විසින්ම දේශනා කළ යුතුබවත් එසේම වෙනත් කිසිම සසුනක මේවා වැඩිමට නොහැකි බවත් සංයුත්ත නිකායේ බොජ්ඣංග සංයුත්තයේ එන උප්පාද සූත්‍රයෙන් අපගේ තථාගත ලොවුතුරා සම්මා සම්බුදුපියාණන් වහන්සේ විසින්ම ඉතාමත්ම පැහැදිලිව දේශනා කොට වදාළහ.

මේ ආකාරයෙන් බොජ්ඣංග ධර්ම වඩන කල්හී බහුල කරන කල්හී පිළිවෙලින් බොජ්ඣංග ධර්මවල හත්වෙනි බොජ්ඣංගය වන උපේක්ෂාව ද දියුණුවෙයි

වැඩෙයි. උපේක්ෂාව වැඩෙනවිට චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන්ගේ පළමුවෙනි සත්‍යය වන දුක්ඛ සත්‍යය යනු කුමක්දැයි නිවැරදිව නිරවුල්ව අවබෝධ කරගැනීමට හැකියාව ලැබේ. මේ උපේක්ෂාව ඇති නිසාම දුක යනු කුමක්ද දුකට හේතුව කුමක්ද දුක නැති කිරීම යනු කුමක්ද දුක නැති කිරීමේ මග කුමක්ද යන චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් අවබෝධ කරගැනීමට විශේෂයෙන්ම දුක දුක ලෙසින් දැකීමට මැදිහත් සිතින් බැලීමට හැකියාව ලැබේ.

(ඉ). චතුරාර්‍ය්‍ය සත්‍යය ධර්මයන් අවබෝධකරගැනීම

චතුරාර්‍ය්‍ය සත්‍යය ධර්ම යනු ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම ආර්යයන් වහන්සේ වන අපගේ සම්මා සම්බුදුපියාණන් වහන්සේ විසින් ප්‍රථම වරට අවබෝධකරගත් මෙන්ම යම් කෙනෙක් විසින් අවබෝධකරගත් කල්හී හෙතෙම ද ආර්යයන් වහන්සේ කෙනෙක් බවට පත් වෙන මේ ලෝකයේ සදාතනික වශයෙන්ම සෑම සත්වයෙක් තුළම දක්නට ලැබෙන සත්‍ය හතරකි. අපගේ ශාස්තෘන් වහන්සේ වන සම්මා සම්බුදුපියාණන් වහන්සේ විසින් මේවා ප්‍රත්‍යක්ෂ වශයෙන්ම අවබෝධකර ගනිමින් මේ සත්‍ය හතර ලොවට හෙළිකොට වදාළහ. මෙම සත්‍ය හතර බුදුදහමේ ඇති මූළික මෙන්ම ප්‍රධානතම ධර්මයයි. මෙම සත්‍ය හතර අවබෝධකර නොගෙන කිසිම කෙනෙකුට නිවන් අවබෝධකරගත නොහැක. යම් කෙනෙක් සෝවාන් සකදාගාමි අනාගාමි අරහත් යන මාර්ගවලට ඵලවලට පත්වෙන්නේ මේ හතර පිළිබඳව ඇත්ත ඇතිසැටියෙන් දැන දැක ප්‍රත්‍යක්ෂකර ගැනීමෙන් හෙවත් අවබෝධකරගැනීමෙන් පමණි.

ලොව සත්‍යය ඇත්තේ එකකි. එම සත්‍යය නොදැනීම නිසා සත්‍යය සොයමින් සත්‍යයේ නාමයෙන් මිනිසා විවිධ දේ සත්‍යයැයි ගැනීමට විශ්වාස කිරීමට පෙළඹෙයි. ''එකංහි සච්චං න දුතියමත්ථි'' යන පාඨයෙන් ද කියන්නේ සත්‍යය ඇත්තේ එකක් බවය. සත්‍යය සදාතනික විය යුතුය. සත්‍යය සැමටම, සැම සත්වයෙකුටම සාධාරණවිය යුතුය. සත්‍යය සැම විටම සත්‍යයක්ම විය යුතුය. එසේනම් මෙහි සත්‍ය හතරක් යැයි දක්වන්නේ කෙසේද?

සත්‍යය හතරක් නැත. ඇත්තේ එකම සත්‍යයකි. ලොව ඇති ඒ එකම සත්‍යය නම් ලොව දුකමත පිහිටා ඇති බවය හෙවත් ලෝකයේ සියලු සත්වයන්ට දුකට මුහුණ දීමට සිදුවෙන බවය. දිනක් එක්තරා දේවතාවෙක් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ ''මේ ලෝකය අටවලා තියෙන්නේ කුමකින්ද? ලෝකය පිරිවර කරගෙන සිටින්නේ කුමකින්ද? ලෝකය වහලා තියෙන්නේ කුමකින්ද? මේ ලෝකය පිහිටා ඇත්තේ කුමක් මතද?''

(කෙනස්සු උඩ්ඩිතො ලොකෝ,
කේනස්සු පරිවාරිතෝ,
කේනස්සු පිහිතො ලෝකෝ,
කිස්මිං ලෝකෝ පතිට්ඨිතෝ) යැයි ඇසුවේය.

එවිට අපගේ තථාගත බුදුරජාණන් වහන්සේ ''මේ ලෝකය අටවලා තියෙන්නේ තණ්හාවෙන්, පිරිවරකරගෙන සිටින්නේ ජරාවෙන්, වසාගෙන සිටින්නේ මරණයෙන්, ලෝකය පිහිටා තියෙන්නේ දුක මතයි''. යනුවෙන් මේ ලෝකය නැමති සත්වයාගේ යථා

ස්වභාවය පෙන්වා වදාළහ.

(තණ්හාය උඩ්ඩිතො ලොකො
ජරාය පරිවාරිතො
මච්චුනාපිහිතො ලොකො
දුක්ඛ ලොකො පතිට්ඨිතො)[6]

තවත් අවස්ථාවක අජිත නම් වූ එක්තරා ශිෂ්‍යයෙක් බුදුරජාණන් වහන්සේගෙන් '' මේ ලෝකය වසා තිබෙන්නේ කුමකින්ද?, එසේ වසාගෙන සිටින බව නොතේරෙන්නේ කුමක් නිසාද?, ලෝකය අභිලේපනය හෙවත් සම්පූර්ණයෙන්ම තවරාගෙන සිටින්නේ කුමකින්ද? ලෝකය නැමති පුද්ගලයාට තියෙන මහා භය මොකක්ද?'' යැයි ඇසූ විට බුදුරජාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ.

''ලෝකය වසාගෙන සිටින්නේ අවිද්‍යාවෙනි, මසුරු බවත් ප්‍රමාදයත් නිසා ඒ බව නොතේරෙයි, ලෝකය සම්පූර්ණයෙන්ම තවරාගෙන සිටින්නේ තණ්හාවෙනි, ඔහුට තියෙන මහා භය දුකය.''[7] (මෙහි ලෝකය යනු පුද්ගලයාය)

මෙම කරුණු වලට අනුව ද අපට පැහැදිලි වෙන්නේ ලොව හැම දෙනාටම ඇති මහා බිය දුක බවයි. මේ දුක ඇතිවෙන්නේ කෙසේ ද නැතිවෙන්නේ කෙසේද යන්න ඉතාමත්ම පැහැදිලිව හා නිවැරදිව මෙන්ම නිරවුල්ව අපට දේශනා කළේ අපගේ අසහාය ශාස්තෘන් වහන්සේ වන තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසිනි. ඒ පටිච්ච සමුප්පාද ධර්මයෙනි. අපේ බුදුහාමුදුරුවෝ අපට දේශනා කළ ශ්‍රී

සද්ධර්මයේ ගැඹුරුම දේශනය මෙයයි.එනම් පටිච්චසමුප්පාද ධර්මයයි.

මෙම සුවිශේෂ දේශනයට අනුව අප තුළ නිතරම ඇතිවෙන්නේ පඤ්චනීවරණ ධර්මයන්ය. ඒ පඤ්චනීවරණ ධර්ම නිසා අවිද්‍යාව ඇතිවේ. අවිද්‍යාව නිසා සංඛාර ඇතිවේ. සංඛාර නිසා විඤ්ඤාණය ඇතිවේ. විඤ්ඤාණය නිසා නාම රූප ඇතිවේ. නාමරූප නිසා සළායතන ඇතිවේ, සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ, වේදනාව නිසා තණ්හාව ඇතිවේ, තණ්හාව නිසා උපාදාන ඇතිවේ, උපාදාන නිසා භවය ඇතිවේ, භවය නිසා ජාතිය හෙවත් ඉපදීම ඇතිවේ, ඉපදීම නිසා ජරාවට, මරණයට, සෝක හැඬීම් වැළපීම්, දුක් දොම්නස් උපායාසාදී සියලු දුක් ගොඩම ඇතිවේ. දුක ඇතිවෙන්නේ එසේය.

දුක නැතිවීමට නම් ඒ අවිද්‍යාව නැති කළ යුතුය. අවිද්‍යාව නැති වීමෙන් සංඛාර නැතිවේ, සංඛාර නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේ. විඤ්ඤාණය නැතිවිමෙන් නාම රූප නැතිවේ, නාමරූප නැති වීමෙන් සළායතන නැතිවේ, සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවේ, ස්පර්ශ නැති වීමෙන් වේදනා නැතිවේ, වේදනා නැතිවීමෙන් තණ්හා නැතිවේ, තණ්හා නැතිවීමෙන් උපාදාන නැතිවේ, උපාදාන නැතිවීමෙන් භවය නැතිවේ, භවය නැතිවීමෙන් ජාතිය හෙවත් උපත නැතිවේ. උපතක් නැති විට ජරා මරණ සෝක පරිදේව දුක් දොම්නස් උපායාසාදී සියලුම දුක් ගොඩ නිමාවට පත්වේ.

චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයේ සඳහන් වන පරිදි මේ සියලු දුක් ඇතිවෙන්නේ තණ්හාව නිසා හෙවත් තණ්හාව මුල්කරගෙන බව ඉතාම පැහැදිලිය. ඒ තණ්හාව නැති කිරීම නිසා දුක නැතිවෙයි. ඒ සඳහා මාර්ගය අන්කිසිවක් නොව අරිඅටඟි මග පමණයි. එය අනුගමනය කිරීම නිසා අෂ්ඨාංගික මාර්ගය දසාංගික මාර්ගයක් බවට පත්ව නිවණ ප්‍රත්‍යක්ෂ කරගැනීමට හෙවත් අවබෝධ කරගැනීමට ඕනෑම කෙනෙකුට හැකියාව ලැබේ.

අපේ බුදුහාමුදුරුවෝ සම්මා සම්බුද්ධත්වයට පත්ව පළමු ධර්මදේශනය දේශනා කරද්දී මේ දුක මුල්කරගත් චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මය ඉතාම පැහැදිලිව දේශනා කළහ. එහිදී දුක යනු කුමක්දැයි පැහැදිලි කරන තිලෝගුරු සම්මා සම්බුදුපියාණන් වහන්සේ ''ජාතිය හෙවත් ඉපදීම දුකකි, ජරාවට පත්විම දුකකි, ලෙඩ වීම දුකකි, මරණයට පත්වීම දුකකි, අප්‍රිය අය සමග එකතුවීම දුකකි, ප්‍රිය අයගෙන් වෙන්වීම දුකකි, තමන් කැමති දේ නොලැබීම දුකකි, කෙටියෙන් කියතොත් මේ උපාදානස්ඛන්ධ පහම දුකකි.'' යැයි දේශනා කළහ. යම් මේ නන්දිරාගයෙන් යුක්තව තැන තැන ඇලෙමින් නැවත නැවත භවයක් හෙවත් පුනර්භවයක් ඇතිකරන කාම තණ්හා වශයෙන් ද භව තණ්හා වශයෙන් ද විභව තණ්හා වශයෙන් ද ඇතිවෙන තණ්හාවක් ඇද්ද එයම දුකෙහි හටගැනීම යැයි දේශනා කළහ. එසේම එම තණ්හාව ඉතිරි නැතිව සහමුලින්ම නැති කොට දැමීමම දුකෙහි නිරෝධය හෙවත් නිර්වාණ ධර්මය අවබෝධ කර ගැනීම බවත් ඒ සඳහා වු මාර්ගය ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය බවත් දේශනා කළහ.[8]

දුක ඉතාමත්ම හොඳින් අවබෝධ කරගත යුතුය හෙවත් පිරිසිඳ දැනගත යුතුය (පරිඤ්ඤෙය්‍යං). දුකට හේතුව ඉතාමත්ම හොඳින් අවබෝධකරගෙන ප්‍රහාණය කළ යුතුය (පහාතබ්බං). දුක්ඛ නිරෝධය ප්‍රත්‍යක්‍ෂකරගත යුතුය (සච්චිකාතබ්බං). ඒ සඳහා වූ මාර්ගය ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය වැඩිය යුතුයි(භාවේතබ්බං).

දුක අවබෝධකරගත යුත්තේ අපගේ මෙම පංචස්ඛන්ධයෙන්මය. දුක ඇත්තේ බාහිර ලෝකයේ නොව තමා තුළමය. අපගේ බුදුපියාණන් වහන්සේ ලෝක යන වචනයෙන් බොහෝ අවස්ථාවල කතා කර ඇත්තේ තමා හෙවත් මේ පුද්ගලයා ගැනය. ඒ අනුව ලෝකයේ දුක පිහිටා ඇතැයි ප්‍රකාශ කරන්නේ මිනිසා සත්වයා තුළ දුක ඇති බවය. වරක් බුදුපියාණෝ රෝහිතස්ස නම් වූ එක්තරා දේවතාවෙකුට දේශනා කළේ, ''මේ බඹයක් පමණ වූ සඤ්ඤාසහිත මනස සහිත සිරුරෙහි ලෝකය ද ලෝක සමුදය ද ලෝක නිරෝධය ද ලෝක නිරෝධය සඳහා වූ මාර්ගය ද පනවමි''[9] යනුවෙනි.

අපගේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාළ ශ්‍රී සද්ධර්මයේ සුවිශේෂම ධර්මය මෙම චතුරාර්‍ය්‍ය සත්‍යය ධර්මයයි. මේ නිසාම සාරිපුත්ත මහ රහතන් වහන්සේ විසින් යම් කුසල ධර්මයක් වේ නම් ඒ සියල්ලම චතුරාර්‍ය්‍ය සත්‍යයෙහි අන්තර්ගත කළ හැකි බව ඉතාමත්ම ලස්සන උපමාවකින් එනම් ඇතුගේ පා සටහනේ උපමාවෙන් දේශනා කොට වදාළහ. මජ්ඣිම නිකායේ මහා හත්ථිපදෝපම සූත්‍රයෙහි සඳහන් මේ උපමාවෙන් උන්වහන්සේ එය පැහැදිලි කළේ මෙසේය. ''මේ මහ පොළොව මත පා තබා ඇවිදින

සියලු සත්වයන්ගේ පා සටහන් ඇතාගේ පා සටහනෙහි බහා ලිය හැක්කේ යම් සේද, චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයෙහි සියලු කුසල දහම් බහා ලිය හැකිය.''[10] යනුවෙනි.

අපගේ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුපියාණන් වහන්සේ වරක් වජ්ජි ජනපදයේ කෝටිගාම නම් ස්ථානයෙහි වැඩ සිටිද්දී භික්ෂූන් වහන්සේලා අමතා මෙසේ දේශනා කළහ. ''පින්වත් මහණෙනි, මේ චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධ නොකළ නිසා, ප්‍රතිවේද නොකළ නිසා, දීර්ඝ කාලයක් තිස්සේ මෙසේ ඔබේත් මගේත් සසර සැරිසැරීම සිදුවිය.''[11] යනුවෙනි.

සංයුත්ත නිකායේ සච්ච සංයුත්තයේම එන අභිසම්බුද්ධ සූත්‍රයෙන් අපගේ බුදුපියාණෝ අපට පෙන්වා දෙන්නේ මේ චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කරගත් හෙයින්ම තථාගතයන් වහන්සේ ''අරහත් සම්මාසම්බුද්ධ'' යැයි කියන බවය. ඒ බව ''ඉමෙසං ඛො භික්ඛවෙ චතුන්නං අරියසච්චානං යථාභූතං අභිසම්බුද්ධත්තා තථාගතෝ අරහං සම්මා සම්බුද්ධෝති වුච්චති'' යන පාඨයෙන් මොනවට පැහැදිලි වේ. සංයුත්ත නිකායේ සච්ච සංයුත්තයේම එන ''මිත්ත'' සූත්‍රයෙන් උන්වහන්සේ මෙසේ දේශනා කරති.

'' පින්වත් මහණෙනි, යම් කෙනෙක් තමන්ගේ මිතුරෙක් හෝ සහලේ ඥාතියෙක් හෝ කෙරෙහි අනුකම්පා කරන්නේ නම්, ඔවුහු යමක් ශ්‍රවණය කරන්නේ නම් මැනවැයි සිතන්නේ නම්, ඒ අයට මේ චතුරාර්‍ය්‍ය සත්‍යය ධර්මයම ශ්‍රවණය කිරීමට අවබෝධකරගැනීමට ඉඩ සලසන්න, එහිම සමාදන්

කරවන්න, එහිම පිහිටුවන්න.'' යනුවෙනි.

යම් කෙනෙක් විසින් මේ චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන්ගෙන් එකක් දකියි ද අවබෝධ කරගනියි ද, හෙතෙම අනිත් ධර්ම තුනත් එසේම දකියි, අවබෝධ කරගනියි.[12] වරක් බුදුරජාණන් වහන්සේ කොසඹෑනුවර සිංසපාවනයේ වැඩසිටිද්දී තමන් වහන්සේගේ ශ්‍රී හස්තයට සිංසපා හෙවත් ඇට්ටේරිය කොළ ස්වල්පයක් ගෙන භික්ෂූන් වහන්සේලාට පෙන්වමින් තමන් වහන්සේ විසින් දේශනා කළ ධර්මය මේ අතේ ඇති කොළ ප්‍රමාණය මෙන් ඉතාම ටිකක් බවත් තමන්වහන්සේ විසින් අවබෝධ කරගත් ධර්මය මේ වනාන්තරයේ තියෙන කොළ මෙන් අප්‍රමාණ බවත් දේශනා කළහ. අනතුරුව එසේ තමන් වහන්සේ විසින් අවබෝධ කරගත් නමුත් ඒ ධර්මයන් දේශනා නොකළේ ඒ ධර්මයන් අර්ථ සහිත නොවන නිසාත් , බ්‍රහ්මචරියාවට හේතු නොවන නිසාත්, නිබ්බිදාවට, විරාගයට, නිරෝධයට, කෙලෙස් නැති කොට සැනසීම ලබාගැනීමට, අභිඤ්ඤාවට හෙවත් උසස් ඥාණ ලබාගැනීමට, සම්බෝධියට හා නිර්වාණ ධර්මය අවබෝධයට හේතු නොවන නිසා බව පැහැදිලි කළහ.

තවද එදා බුදුපියාණෝ තමන් වහන්සේ විසින් පැහැදිලිව දේශනා කොට වදාළ ධර්මය කුමක්ද යන්න ද දේශනා කළහ. '' පින්වත් මහණෙනි, මා විසින් දේශනා කරනලද්දේ කුමක්ද? මේ දුක යැයි මාවිසින් දේශනා කරනලදී, මේ දුකට හේතුව යැයි මාවිසින් දේශනා කරනලදී, මේ දුක නැතිකිරීම යැයි මා විසින් දේශනා කරනලදී, මේ දුක නැතිකිරීමේ මාර්ගය යැයි මා විසින් දේශනා කරනලදී. කුමක් නිසා මා විසින් මෙය දේශනා

කරන ලද්දේද? මෙය අර්ථ සහිතය බ්‍රහ්මචරියාවට මුල්වෙන්නේය, නිබ්බිදාවට, විරාගයට, නිරෝධයට, උපසමයට හෙවත් කෙලෙස් සංසිඳවීමට, අභිඤ්ඤාවට සම්බෝධියට හා නිර්වාණයට හේතුවන්නේය. එබැවින් මාවිසින් දේශනා කරනලදී. එබැවින් පින්වත් මහණෙනි, මේ දුක යැයි තේරුම් ගෙන භාවනා කරන්න, මේ දුකට හේතුව යැයි තේරුම් ගෙන භාවනා කරන්න, මේ දුක නැතිකිරීම යැයි තේරුම් ගෙන භාවනා කරන්න, මේ දුක නැතිකිරීම සඳහා වූ මාර්ගය යැයි තේරුම් ගෙන භාවනා කරන්න.''[13] යැයි අපේ බුදුහාමුදුරුවෝ ඉතාමත්ම කරුණාවෙන් අනුකම්පාවෙන් අපට දේශනා කළහ.

මෙසේ දේශනා කොට වදාළ චතුරාර්‍ය්‍ය සත්‍යය නොදැනීම නිසා සත්වයා භවයෙන් භවයට සැරිසරමින් සසර ගමන් කරති. එසේ සසර සැරිසරමින් එක් භවයකින් තවත් භවයකට ගමන් කිරීම හරියට අහසට විසි කළ ලී කෝටුවක් මෙන් යැයි වරක් බුදුහු දේශනා කළහ. යම් කෙනෙක් අහසට ලීයක් විසි කළොත් එය උඩ සිට එක්වරක ඒ ලී කෝටුවේ මුල පැත්තෙන් පහතට එයි. තව වරෙක ලී කෝටුවේ අග පැත්තෙන් පහතට එයි. තවත් වරෙක ලී කොටුවේ මැදින් පහතට එයි. මෙසේ සත්වයා එක්වරෙක දිව්‍යලෝකයේ සිට මෙහි එයි. තවත් වරෙක මෙහි සිට දිව්‍යලෝකයට යයි. තවත් වරෙක අපායට යයි, තවත් වරෙක අපායේ සිට මෙහි එයි, තවත් වරෙක තිරිසන් ලෝකයට යයි, තවත් වරෙක තිරිසන් ලෝකයෙන් මෙහි එයි. මේ මෙසේ සිදුවන්නේ අන් කිසිවක් නිසා නොව මේ චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් ඒ අයුරින්ම අවබෝධ කරනොගත් නිසා බව තථාගතයාණන් වහන්සේගේ දේශනයයි.[14]

හොඳයි, ඔබ ඇඳගෙන සිටින වස්ත්‍රයට හෝ හිස කෙස්වලට ගිනි ඇවිලුණොත් ඔබ මොකද කරන්නේ? වරක් බුදුපියාණෝ භික්ෂූන් වහන්සේලාගෙන් මේ ප්‍රශ්නය ඇසුහ. '' පින්වත් මහණෙනි, යම් කෙනෙකුගේ වස්ත්‍රය හෝ හිස ගිනිගත්තොත් ඔහු විසින් කුමක් කළයුතුද?'' එවිට භික්ෂූහු මෙසේ කීහ. '' ස්වාමීනි, යම් කෙනෙකුගේ වස්ත්‍රය හෝ හිස හෝ ගිනිගත් කල්හී ඒ වස්ත්‍රය හෝ හිස නිවීම සඳහාම සුවිශේෂ කැමැත්තක්, මහත් උත්සාහයක්, අධික උත්සාහයක්, මහත් උද්යෝගයක්, අනවරත සිහියක් හෙවත් නිරන්තර සිහියක්, සම්පජඤ්ඤයක් ඇතිකරගත යුතුය.'' තවදුරටත් බුදුපියාණෝ මෙසේ දේශනා කළහ.''පින්වත් මහණෙනි, යම් කෙනෙක් වස්ත්‍රය හෝ හිස ගිනිගත් විටත් කිසියම් උපේක්ෂාවක් ඇතිකරගත හැකියි. එහෙත් මේ චතුරාර්‍ය සත්‍යය ධර්මයන් ඒ අයුරින්ම අවබෝධ කර නොගත් තැනැත්තා විසින් සුවිශේෂ කැමත්තක් ඇතිකරගත යුතුය, මහත් උත්සාහයක් ඇතිකරගත යුතුය, අනවරත සිහියක් ඇතිකරගත යුතුය, සම්පජඤ්ඤයක් ඇතිකරගත යුතුය.''[15] යනුවෙනි.

යම් කෙනෙක් මුළු දඹදිවම තියෙන ගස්, අතු, ඉති, රිකිලි එකතු කරලා ඒ සියල්ලම උල් කරලා ඒ එක් එක් උල අරගෙන මහ සාගරයේ ඉන්න මාළු එකිනෙකා අරගෙන අමුණනවා කියලා හිතන්න. විශාල මාළු විශාල උල් වල අමුණනවා, කුඩා මාළු කුඩා උල් වල අමුණනවා, මධ්‍යම ප්‍රමාණයේ මාළු මධ්‍යම ප්‍රමාණයේ උල් වල අමුණනවා. එසේ ඒ මාළු ඇමුණුවත් මහසයුරේ මාළු ඉවරවෙන්නේ නැහැ. ඒසේම සමහර මාළු ඉන්නවා මේ උල්වල අමුණන්නත් බැහැ. ඒ තරමටම ඔවුන්ගේ ශරීර සියුම්. මේ තමයි තිරිසන් අපාය. තිරිසන් අපාය

හිතාගන්නටත් බැරි තරම් සංකීර්ණයි, ඒ වගේම දුක් සහිතයි. යම් කෙනෙක් සම්මා දිට්ඨියෙන් යුක්ත වෙයිද හෙවත් චතුරාර්‍ය සත්‍යය අවබෝධ කරගනියි ද හෙතෙම මේ අපායෙන් මිදෙයි. යනු අපගේ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ දේශනයයි.[16] චතුරාර්‍ය සත්‍ය ධර්මයන් අවබෝධකරගැනීම සඳහා අත්‍යවශ්‍යම දෙය සම්මා දිට්ඨියයි.

සම්මා දිට්ඨි යන්න බුදුපියාණන් වහන්සේ විසින් නිර්වචනය කර ඇත්තේ '' දුක්ඛෙ ඤාණං දුක්ඛ සමුදයේ ඤාණං දුක්ඛ නිරෝධෙ ඤාණං දුක්ඛ නිරෝධ ගාමිනියා පටිපදාය ඤාණං'' යනුවෙන් දුක පිළිබඳ අවබෝධය, දුක හටගැනීම පිළිබඳ අවබෝධය, දුක නැතිවීම පිළිබඳව අවබෝධය හා දුක නැති කිරීම සඳහා වූ මාර්ගය පිළිබඳව අවබෝධය යනුවෙනි. හිරු උදාවට පෙරනිමිත්ත වන්නේ අරුණළුය. එසේම චතුරාර්‍ය සත්‍යය අවබෝධය සඳහා පෙරනිමිත්ත වන්නේ සම්මාදිට්ඨියයි.[17]

අපේ බුදුහාමුදුරුවෝ මෙසේ වදාළ සේක. ''පින්වත් මහණෙනි, යම් කලෙක මේ ලෝකයේ හිරුසඳු නූපදිත් ද එවිට මේ ලෝකයේ මහත් ආලෝකයක් ඇති නොවෙයි. එවිට ඇත්තේ අන්ධකාරයයි, ඝන අන්ධකාරයයි. රෑ දවල් කියා දෙකක් පැනවිය නොහැක. මාස අඩමාස කියා පැනවිය නොහැක. ඍතු හා වර්ෂ පැනවිය නොහැක. එහෙත් ලෝකයේ යම් කලෙක හිරුසඳු බබළත් ද එවිට මහත් ආලෝකයක් ඇතිවෙයි. අන්ධකාරයක් නැත, මහත් අන්ධකාරයක් නැත. රෑ දවල් පැනවිය හැක. මාස අඩමාස පැනවිය හැක. ඍතු හා වර්ෂ පැනවිය හැක. එසේම පින්වත් මහණෙනි, තථාගත අරහත් සම්මා

සම්බුදුරජාණන් වහන්සේ මේ ලෝකයේ යම් තාක් නොඋපදිත් ද ඒ තාක් මේ ලෝකයේ අන්ධකාරයක් පවතියි. මහත් අන්ධකාරයක් පවතියි. චතුරාර්‍ය සත්‍යය කියාදෙන කෙනෙක් නොවෙයි. දේශනා කරන කෙනෙක් නොවෙයි. පනවන කෙනෙක් නොවෙයි. ස්ථාපනය කරන කෙනෙක් නොවෙයි. විවරණය කරන කෙනෙක් නොවෙයි. බෙදා දක්වන කෙනෙක් නොවෙයි. ඉස්මතු කර හෙවත් උඩුකුරු කර දක්වන කෙනෙක් නොවෙයි. එහෙත් අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලොව පහළ වෙත් ද එවිට ලෝකයේ මහත් ආලෝකයක් ඇතිවෙයි. අන්ධකාරය දුරුවෙයි.මහත් අන්ධකාරය නැතිවෙයි. චතුරාර්‍ය සත්‍යය කියාදෙන්නේ වෙයි. දේශනාකරන්නේ වෙයි. පනවන්නේ වෙයි. ස්ථාපනය කරන්නේ වෙයි. විවරණය කරන්නේ වෙයි. බෙදා දක්වන්නේ වෙයි. උඩුකුරු කර පෙන්වන්නේ වෙයි.''[18]

''බ්ලැක් හෝල්ස්'' හෙවත් මහා අන්ධකාර අගාධ ගැන අද විද්‍යාඥයන් කතා කරන බව ඔබත් දන්නවා නේද? එහෙත් බ්ලැක් හෝල්ස් ගැන අපේ බුදුහාමුදුරුවෝ මෙයට වර්ෂ දෙදහස් හයසියයකට පෙර කථා කර ඇති බව ඔබ දන්නේ නැහැ නේද? මේ බලන්න, අපි අපේ බුදුහාමුදුරුවන් වහන්සේගේ බුදු වදනම කියවමු. ''පින්වත් මහණෙනි, මෙබඳු මහත් ඍද්ධි සම්පන්න වූ මහත් ආනුභාව සම්පන්න වූ මේ හිරු සඳු දෙදෙනාගේ ආලෝකය පවා යම් තැනකට නොවැටෙයි ද ලෝක අතර පවත්නා එවැනි අගාධ සහිත ඝන අන්ධකාරයෙන් යුක්ත වූ විවර ඇත.'' මෙසේ දේශනා කරද්දී එක්තරා භික්ෂුවක් බුදුපියාණන් වහන්සේගෙන් මෙසේ ඇසුවේය. ''ස්වාමීනි භාග්‍යවතුන්

වහන්ස, ඒ අඳුර ඉතා මහත් අඳුරකි. එහෙත් ඒ අඳුරටත් වඩා මහත් අඳුරක් තියෙනවාද, භයානක අඳුරක් තියෙනවාද?'' එවිට බුදුපියාණෝ ''පින්වත් භික්‍ෂුව, ඒ අඳුරටත් වඩා ඉතා මහත් වු භයානක වු වෙනත් අඳුරක් ඇත.''යැයි දේශනා කළහ. එවිට ඒ භික්‍ෂුව ''ස්වාමීනි ඒ භයානක අන්ධකාරය මොකක්ද?'' යැයි ඇසුවේය. එවිට බුදුහු ''යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මේ දුක යැයි ඇතිසැටියෙන් නොදනිත් ද, මේ දුකට හේතුව යැයි ඇතිසැටියෙන් නොදනිත් ද, මේ දුක්ඛ නිරෝධය යැයි ඇතිසැටියෙන් නොදනිත්ද, මේ දුක්ඛ නිරෝධය සඳහා වු මාර්ගය යැයි ඇතිසැටියෙන් නොදනිත් ද, හෙතෙම ඉපදීම පිණිස හේතුවන සංස්කාරවල ඇලෙත්. ජරාව පිණිස හේතුවන සංස්කාරවල ඇලෙත්. මරණ... සෝක... පරිදේව... දුක්ඛ...දෝමනස්ස උපායාය පිණිස හේතුවන සංස්කාරවල ඇලෙත්. එසේ සංස්කාර රැස්කරති. මේ අනුව ජාති අන්ධකාරයට ද වැටෙත්. ජරා අන්ධකාරයට ද වැටෙත්. මරණ අන්ධකාරයට ද වැටෙත්. සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, අන්ධකාරයට ද වැටෙත්. හෙතෙම ජාතියෙන් ජරාවෙන් මරණයෙන් සෝකයෙන් පරිදේවයෙන් දුක්ඛයෙන් දෝමනස්සයෙන් උපායාසයෙන් නොමිදෙත්. සියලු දුකින් නොමිදෙත් යැයි කියමි.

''එහෙත් යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මේ දුක යැයි ඇතිසැටියෙන් දනිත් ද මේ දුකට හේතුව යැයි ඇතිසැටියෙන් දනිත් ද මේ දුක නැති කිරීම යැයි ඇති සැටියෙන් දනිත් ද මේ දුක නැති කිරීම සඳහා වු මාර්ගය යැයි ඇතිසැටියෙන් දනිත් ද ඉපදීමට හේතුවන ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස වලට හේතුවන සංස්කාරවල

නොඇලෙත් ද එවිට ඔවුහු ජාති අන්ධකාරයට, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාසාදී අන්ධකාරයන්ට නොවැටෙත්. ජාති ජරා මරණ සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාසාදියෙන් මිදෙති. ඒ අනුව දුකින් මිදෙත් යැයි කියමි. එබැවින් පින්වත් මහණෙනි, මේ දුක යැයි දැනගනිමින් භාවනාවෙහි නිරත වෙන්න. මේ දුකට හේතුව යැයි දැනගනිමින් භාවනාවෙහි නිරත වෙන්න. මේ දුක නැතිකිරීම යැයි දැනගනිමින් භාවනාවෙහි නිරත වෙන්න. මේ දුක නැති කිරීම සඳහා වු මාර්ගය යැයි දැනගනිමින් භාවනාවෙහි නිරත වෙන්න.''[19] යනුවෙන් දේශනා කොට වදාළහ.

මේ ඔබ පුංචි දවස්වල සිට දන්න දේශනයක්. ඒත් සමහර විට ඔබ මෙය අසා ඇත්තේ වෙනත් විදිහකට වෙන්න පුළුවනි. දැන් අපි දැනගනිමු බුදුපියාගේ නියම බුදුවදන සූත්‍රදේශනා ඇසුරින්ම. මේ අර කන කැස්බෑවා විය සිදුරින් අහස දකින්නා වගෙයි කියා ඔබ ඇසූ පුදුම කතාවයි. අපිට අපේ බුදුහාමුදුරුවෝ මෙසේ දේශනා කරති. '' පින්වත් මහණෙනි, එක්තරා පුරුෂයෙක් මහා සමුද්‍රයෙහි එක් සිදුරක් පමණක් ඇති වියගහක් දමනවා කියලා සිතන්න. ඒ මහා සමුද්‍රයෙහි කන කැස්බෑවෙක් හෙවත් එක් ඇසක් පමණක් පෙනෙන කැස්බෑවෙක් ඉන්නවා. අවුරුදු සියයකට එක් සැරයක් පමණයි මේ කන කැස්බෑවා ජලය මතුපිටට එන්නේ. පින්වත් මහණෙනි, ඔබ වහන්සේලා මොකද සිතන්නේ, එසේ අවුරුදු සියයකට වතාවක් එක් වරක් පමණක් ජලය මතුපිටට එන කන කැස්බෑවාට අර එක සිදුරක් ඇති වියගහේ ඒ සිදුරින් තමන්ගේ හිස ඇතුළ් කරලා අහස බලන්න පුළුවන් වෙයිද? පින්වත් මහණෙනි, ඒකත් සිද්ධවිය හැකි දෙයක්. ඒත් ඒ බොහෝ දීර්ඝ කාලයක්

එසේ කරන විට තමයි. පින්වත් මහණෙනි, එසේ කන කැස්බෑවා අවුරුදු සියයකට වතාවක් ඇවිත් යම් විටක විය සිදුරින් ගෙල දැමිය හැකි වේවි ද එය ඉක්මනින් සිදුවෙන දෙයක් යැයි කිව හැකියි. නමුත් එක් වරක් හෝ විනිපාතයට හෙවත් අපායට ගිය බාලයා නම් නැවත මිනිසත් බවක් ලබයි කියන එක එසේ සුලබ දෙයක් යැයි මම නොකියමි. ඒ කවර හෙයින් ද යත්, පින්වත් මහණෙනි, එහි දහම්හි හැසිරීමක් නැත. පින් කිරීමක් නැත. එහි ඇත්තේ එකි නෙකා කා ගැනීමකි. එහි ඇත්තේ දුබලයා කා ගැනීමකි. එයට හේතුව කුමක්ද? සතර ආර්‍ය්‍ය සත්‍යය නොදැකීමයි. කවර සතරද? මේ දුක යැයි නොදැකීම, මේ දුකට හේතුව යැයි නොදැකීම, මේ දුක නැතිකිරීම යැයි නොදැකීම, මේ දුක නැතිකිරීම සඳහා වූ මාර්ගය යැයි නොදැකීම. එබැවින් පින්වත් මහණෙනි, මේ දුක යැයි දැනගනිමින් භාවනාකරන්න. මේ දුකට හේතුව යැයි දැනගනිමින් භාවනා කරන්න. මේ දුක නැති කිරීම යැයි දැනගනිමින් භාවනා කරන්න. මේ දුක නැති කිරීම සඳහා වූ මාර්ගය යැයි දැනගනිමින් භාවනා කරන්න.''[20]

අපේ බුදුහාමුදුරුවෝ මෙසේ වදාරති. ''පින්වත් මහණෙනි, ඔබ මොකද හිතන්නේ, යම් පුරුෂයෙක් මහා මේරු පර්වත රාජායා අසළ මුං ඇට සමාන තරම් වූ කුඩා ගල්කැට හතක් තියනවා කියලා හිතන්න. මේවායින් මොකක්ද විශාල, අර මුං ඇටවගේ තියෙන කල් කැට හත ද එහෙම නැත්තම් මහාමේරු පර්වතය ද?'' ''ස්වාමීනි මහාමේරු පර්වත රාජයාම විශාලයි. අර මුං ඇට සමාන ගල් කැට ගණන් ගන්නටත් මදි. සංසන්දනය කරන්නටත් මදි. ඉතාම ටිකයි.'' යැයි භික්ෂුහු කීහ. ''පින්වත් මහණෙනි, එසේම මේ චතුරාර්‍ය්‍ය

සත්‍ය ධර්මයන් අවබෝධ කළ දිට්ඨිසම්පන්න වූ ආර්ය ශ්‍රාවකයාගේ (සෝවාන් පුද්ගලයාගේ) නැති කළ දුක් ප්‍රමාණයම වැඩියි (මහා මේරු පර්වතය වගෙයි) ඉතිරිවී ඇති දුක් ප්‍රමාණය ඉතාමත්ම ස්වල්පයයි (මුං ඇට හතක් වගෙයි). නැති කළ දුක් ගොඩ ඉතිරි දුක් සමග සංසන්දනය කිරීමේ දී එය ගණන් ගැනීමටත් නොහැකියි. හෙතෙම සසර සැරිසරන්නේ උපරිම වශයෙන් තවත් ආත්ම භාව හතක් පමණි. මේ නිසා මේ දුක යැයි දැනගනිමින් භාවනා කරන්න. මේ දුකට හේතුව යැයි දැනගනිමින් භාවනා කරන්න. මේ දුක නැතිකිරිම යැයි දැනගනිමින් භාවනා කරන්න. මේ දුක නැතිකිරීමේ මාර්ගය යැයි දැනගනිමින් භාවනා කරන්න.'' යැයි තථාගත බුදුපියාණෝ ඉතාමත්ම පැහැදිලිව කරුණාවෙන් අනුකම්පාවෙන් දේශනා කළහ.

වරක් අපේ බුදුහාමුදුරුවෝ තමන් වහන්සේගේ නිය පිටට පස් ටිකක් ගෙන මහපොළොවෙහි පස් හා සසඳමින්, ''පින්වත් මහණෙනි, චතුරාර්‍ය සත්‍යය අවබෝධ කළ දිට්ඨිසම්පන්න වූ ආර්‍ය ශ්‍රාවකයා විසින් නැති කළ දුක් මේ මහපොළොවෙහි පස් මෙන් විශාලයි. නැති කිරීමට ඇති දුක් මෙන්න මේ නියපිටෙහි ඇති පස්ටික හා සමානයි.'' යැයි දේශනා කළහ.

''පින්වත් මහණෙනි, පනස් යොදුනක් දිග පනස් යොදුනක් පළල පනස් යොදුනක් ගැඹුරුවූ පොකුණක මුව විටටම ජලය පිරිලා තියෙනවා කියලා හිතන්න. එක්තරා පුරුෂයෙක් තණපතක් ගෙන ඒ පොකුණෙන් දිය ටිකක් ඉසිනවා කියා සිතන්න. චතුරාර්‍ය සත්‍යය අවබෝධ කළ දිට්ඨිසම්පන්න වූ ආර්‍ය ශ්‍රාවකයා විසින් නැති කළ දුක් ඒ පොකුණෙහි දිය හා සමානයි. නැති

කිරීමට ඇති දුක ඒ තණ පතින් ගත් දිය හා සමානයි.''

'' පින්වත් මහණෙනි, යම් පුරුෂයෙක් හිමාල පර්වතය අසල අබ ඇට පමණ වූ ගල්කැට හතක් තියයි. චතුරාර්‍ය සත්‍යය අවබෝධ කළ දිට්ඨිසම්පන්න වූ ආර්‍ය ශ්‍රාවකයා විසින් නැති කළ දුක් හිමාල පර්වතය මෙනි. නැති කිරීමට ඇති දුක අර අබ ඇට පමණ වූ ගල් කැට හත මෙනි.''

'' පින්වත් මහණෙනි, හිතන්න හිමාල පර්වතය අබ ඇට පමණ වූ ගල් කැට හතක් ඉතිරි කොට ගෙවිලා ගියා කියලා. චතුරාර්‍ය සත්‍යය අවබෝධ කළ දිට්ඨි සම්පන්න වූ ආර්‍ය ශ්‍රාවකයා විසින් නැති කළ දුක් හිමාල පර්වතය වගෙයි. නැති කිරීමට ඇති දුක් අර අබ ඇට සමාන ගල් කැට හත වගෙයි. ඒ නැනැත්තාට ඇත්තේ උපරිම වශයෙන් තව භව හතක් පමණි.'' යැයි වදාළ සේක.

මෙසේ අපේ බුදුහාමුදුරුවෝ විවිධ අවස්ථාවල විවිධාකාරයෙන් මේ චතුරාර්‍ය සත්‍ය ධර්මයන් අවබෝධකර ගැනීමේ වැදගත් කම දේශනා කොට වදාළහ. චතුරාර්‍ය සත්‍යයෙන් තොර බුදුදහමක් නැත. යමෙක් චතුරාර්‍ය සත්‍යය දන්නේ ද හෙතෙම සම්මා දිට්ඨිය ඇත්තෙකි. සම්මා දිට්ඨිය යමෙකුට ඇද්ද හෙතෙම සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන ආර්‍ය අෂ්ටාංගික මාර්ගයට පිවිසෙයි. ඒ ආර්‍ය ආෂ්ටාංගික මාර්ගය නිවණට ඇති එකම මාර්ගයයි. ඒ චතුරාර්‍ය සත්‍යයේ හතර වෙනි සත්‍යයයි.

(ඊ). ආයර්‍ය අෂ්ටාංගික මාර්ගය

ආයර්‍ය අෂ්ටාංගික මාර්ගය අපේ බුදුහාමුදුරුවෝ අවබෝධ කරගත් සුවිශේෂ මාර්ගයයි. එය මධ්‍යම ප්‍රතිපදාවකි. එය මධ්‍යම ප්‍රතිපදාවක් වන්නේ බැහැර කරන බැවිනි. අපේ බුදුහාමුදුරුවෝ සම්මා සම්බුද්ධත්වයෙන් මාස දෙකක් ගතවෙද්දී බරණැස ඉසිපතනයේ මිගදායේ දී පස්වග මහණුන් අමතා තම ප්‍රථම ධර්මදේශනය පැවැත්වූහ. එම ධර්ම දේශනය ආරම්භ කරමින් ''ද්වේ මේ භික්ඛවේ අන්තා පබ්බජිතේන නසේවිතබ්බා.'' යනුවෙන් ''පින්වත් මහණෙනි, මේ අන්ත දෙක පැවිද්දා විසින් සේවනය නොකළයුතුයි'' යනුවෙන් අන්ත දෙකක් බැහැර කළහ. ඒ අන්ත දෙක නම් කාමසුඛල්ලිකානු යෝගය සහ අත්තකිලමථානු යෝගයත්ය. මෙසේ මෙම අන්ත දෙක බැහැර කරමින් බුදුපියාණෝ මධ්‍යම ප්‍රතිපදාවක් දේශනා කළහ. ඒ ආයර්‍ය අෂ්ටාංගික මාර්ගයයි. මේ අන්ත දෙක බැහැර කරමින් තථාගතයන් වහන්සේ විසින් මධ්‍යම ප්‍රතිපදාව අවබෝධකරගත් බවත් එය නුවණැස පහළ කරන බවත්, ඤාණය ලබාදෙන බවත්, කෙලෙස් නැති කරමින් සැනසීම ලබාදෙන බවත්, අභිඤ්ඤාවට, සම්බෝධියට, නිබ්බාණයට හේතුවන බවත් දේශනා කළහ. (චක්ඛු කරණී, ඤාණ කරණී, උපසමාය, අභිඤ්ඤාය, සම්බෝධාය, නිබ්බාණාය සංවත්තති.) ඒ මැදුම් පිළිවෙත හෙවත් මධ්‍යම ප්‍රතිපදාව නම් ''අයමේව අරියෝ අට්ඨංගිකෝ මග්ගෝ'' යනුවෙන් දේසිත අරි අටගි මගයි. එනම්:

සම්මා දිට්ඨි
සම්මා සංකප්ප

සම්මා වාචා
සම්මා කම්මන්ත
සම්මා ආජීව
සම්මා වායාම
සම්මා සති
සම්මා සමාධි යන අංග අටකින් යුත් මාර්ගයයි.

මේ අංග අටකින් යුත් මාර්ගය අනුගමනය කරන්නේ සේඛ පුද්ගලයා විසිනි හෙවත් මාර්ගයෙහි පුහුණු වෙන්නා විසිනි. මාර්ගයෙහි පුහුණුවෙන අය කොටස් තුනකි. එනම් සෝවාන්, සකදාගාමි සහ අනාගාමි යන කොටස් තුනයි. රහතන් වහන්සේ කෙනෙක් වීම සඳහා යම් කෙනෙක් විසින් තවත් අංග දෙකක් සම්පූර්ණ කළ යුතුය. එනම් සම්මා ඤාණ හා සම්මා විමුත්ති යන දෙකය. එවිට ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය ආර්‍ය්‍ය දසාංග මාර්ගයක් බවට පත්වේ.

අපගේ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් මෙම අංග අටකින් යුත් මාර්ගය සේඛ තැනැත්තාගේ මාර්ගය බවත් දස අංගයකින් යුත් මාර්ගය රහතන් වහන්සේගේ මාර්ගය බවත් ඉතාමත්ම පැහැදිලිව මජ්ඣිම නිකායේ මහා චත්තාරීසක සූත්‍රයෙන්[21] පෙන්වා දී ඇති බවඅපි ඉහත දී ද සඳහන් කළෙමු. ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය ගැන කතා කිරීමේදී මෙම සූත්‍රදේශනය කිසිම ආකාරයකින් අමතක නොකළ යුතු සූත්‍ර දේශනයකි. එම සූත්‍රදේශනයට අනුව බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන්නේ සම්මා සමාධිය ලැබීම සුවිශේෂ දෙයක් බවයි.

ඒ සම්මා සමාධිය ලබාගන්නේ ආර්‍ය්‍ය අෂ්ඨාංගික

මාර්ගයේ පළවෙනි අංග හතෙහි උපකාරයෙනි. තවත් විදියකින් කියන්නේ නම් සම්මා දිට්ඨියේ පටන් සම්මා සති දක්වා වූ අංග හත ම සම්පූර්ණ වීමෙන් තමයි සම්මා සමාධිය සම්පූර්ණ වෙන්නේ. එය සුවිශේෂ දෙයකි. එසේම මෙහි දක්වන තවත් විශේෂ දෙයක් ඇත. එනම් සම්මා දිට්ඨි, සම්මා වායාම හා සම්මා සති යන තුන ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ හැම අංගයකටම සම්බන්ධවෙන බවයි. මේ තුන එකිනෙක පසු පස්සේ අනුපරිධාවනය කරන බව හෙවත් අනුව ගමන් කරන බව අපේ බුදුහාමුදුරුවෝ අපට මහත් කරුණාවෙන් මහත් අනුකම්පාවෙන් පෙන්වා වදාළහ.

මජ්ඣිම නිකායේ සම්මාදිට්ඨි[22] සූත්‍රයෙන් අපේ සාරිපුත්ත මහරහතන් වහන්සේ මේ චතුරාර්ය සත්‍යය හා ආර්ය අෂ්ඨාංගික මාර්ගය පටිච්චසමුප්පාදය සමග ගලපමින් සුවිශේෂ විස්තරයක් කරති. එය ද අතිශයින්ම වැදගත් ආශ්චර්යමත් දේශනයකි. ඒ අනුව පටිච්චසමුප්පාදයේ අංග දොළහටම චතුරාර්ය සත්‍ය ධර්මයන් සම්බන්ධ වෙන ආකාරය ඉතාමත්ම සිත්ගන්නා සුළුය. මෙයින් බුද්ධදහමේ හරය කැටිවෙන හැටි බුද්ධදහම එකිනෙකට සුසංයෝගී වෙන හැටි මන නන්දනීයයි. මෙහිදී උන්වහන්සේ පෙන්වා දෙන්නේ පටිච්චසමුප්පාදයේ අංග දොළහෙන්ම පෙන්වා දෙන සියලුම දුක් නැති කිරීම සඳහා ඇති එකම මාර්ගය මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය බවය.

ආර්ය අෂ්ඨාංගික මාර්ගය සෑම බුදුරජාණන් වහන්සේ කෙනෙක් විසින්ම අනුගමනය කරන මාර්ගයයි. මේ මාර්ගයට අපේ බුදුහාමුදුරුවෝ ''පුරාණං අඤ්ජසං'', ''පුරාණං මග්ගං'' යන වචන යොදාගෙන

ඇත්තේ මේ නිසාය. සංයුත්ත නිකායේ නිදාන සංයුත්තයේ එන නගර සූත්‍රයෙන්[23] මේ බව පෙන්වා වදාළහ. එහිදී මේ සඳහා අපේ බුදුහාමුදුරුවෝ අපට නගරයක් පිළිබඳව ඉතාමත්ම ලස්සන උපමාවක් ගෙන හැර දක්වා වදාළහ. ඒ මෙසේය.

''පින්වත් මහණෙනි, හිතන්න යම් කිසි පුරුෂයෙක් කැළයක් දිගේ ඇවිදගෙන යද්දී අතීතයේ සිටි මිනිස්සු පාවිච්චි කළ කිසියම් පුරාණ මාර්ගයක් දකිනවා කියලා. ඒ තැනැත්තා ඒ පුරාණ මාර්ගය දිගේ ගමන් කරනවා. එසේ ඒ මාර්ගයේ ටික දුරක් යනවිට ඔහුට පුරාණ නගරයක් හමුවෙනවා කියලා හිතන්න. ඒ නගරය පුරාණයේ මිනිස්සු පදිංචිවෙලා හිටිය නගරයක්. එහි උද්‍යාන, ආරාම, පොකුණු, තාප්ප, සිත් ඇදගන්නා සුළු ඉතාම ලස්සන ස්ථාන, ආදිය තියෙනවා. ඉතින් ඒවා දැකලා අර පුරුෂයා ආපසු ඇවිත් රජ්ජුරුවන්ට හෝ රාජකීය ඇමතියෙකුට හෝ කියනවා ඒ සියලු තොරතුරු. එවිට රජු හෝ රාජකීය ඇමතියා එහි ගොස් ඒ නගරය අලුත් වැඩියා කරවයි. ටික කලකට පස්සේ ඒ නගරය ඉතා සාර්ථක මෙන්ම සමෘධිමත් නගරයක් බවට ජනාකීර්ණ වූ සිත් ගන්නා සුළු නගරයක් බවට පත්වෙයි. මහත් නගරයක්, විශාල නගරයක් බවට පත්වෙයි.

''එසේම පින්වත් මහණෙනි, මම පෙර සම්මා සම්බුදුරජාණන් වහන්සේලා විසින් වැඩම කරන ලද පුරාණ මාර්ගයක් දුටුවෙමි.එම මාවත ඔස්සේ ගියෙමි. එසේ යනවිට මම ජරාමරණ දැනගතිමි. ජරාමරණ ඇතිවීම දැනගතිමි. ජරාමරණ නිරෝධය දැනගතිමි. ජරාමරණ නිරෝධයට මාර්ගය දැනගතිමි. එසේ ඒ මාර්ගයේම ගමන් කළෙමි. එසේ ගමන් කරනවිට ජාතිය

දැනගතිමි. ජාතිය ඇතිවීම දැනගතිමි. ජාති නිරෝධය දැනගතිමි. ජාති නිරෝධයට මාර්ගය දැනගතිමි. භවය දැනගතිමි... උපාදාන දැනගතිමි... තණ්හාව දැනගතිමි... වේදනාව දැනගතිමි... ඵස්සය දැනගතිමි... සළායතන දැනගතිමි... නාමරූප දැනගතිමි... විඤ්ඤාණය දැනගතිමි... සංඛාර දැනගතිමි. සංඛාර සමුදය දැනගතිමි. සංඛාර නිරෝධය දැනගතිමි. සංඛාර නිරෝධය සඳහා වු මාර්ගය දැනගතිමි. එසේ දැනගෙන භික්ෂුන්ට ද, භික්ෂුණීන්ට ද, උපාසකයන්ට ද, උපාසිකාවන්ට ද, ප්‍රකාශ කළෙමි. පින්වත් මහණෙනි, දැන් මේ ශාසනය බඹසර වාසය ඉතා සාර්ථක එකක් බවට පත්වී ඇත. සමෘධිමත් බවට පත්වී ඇත. ජනප්‍රියවී ඇත. මහත් බවට, විපුල බවට පත්වී ඇත. දෙවියන් අතර ද මිනිසුන් අතර ද මැනවින් කතා කරන දෙයක් බවට පත්වී ඇත.'' යනුවෙනි.

එක දවසක් අපේ ආනන්ද හාමුදුරුවෝ බුදුරජාණන් වහන්සේ වෙතට වැඩම කරලා අහනවා මෙහෙම, ''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මේ ශාසනයෙහි බ්‍රහ්මයානයක් පනවන්නට පුළුවන්ද?'' එවිට බුදුපියාණෝ ''පුළුවන් ආනන්ද, බ්‍රහ්මයානය යනු ද ධම්මයානය යනු ද අනුත්තර සංගාමවිජය යනු ද මේ ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගයටම නමක්.'' යැයි දේශනා කොට තවදුරටත් මෙසේ දේශනා කළහ. '' ආනන්ද සම්මාදිට්ඨිය භාවිත කරනවිට බහුල වශයෙන් වඩනවිට එය රාගය නැති කිරීමට හේතුවේ. ද්වේෂය නැති කිරීමට හේතුවෙයි. මෝහය නැති කිරීමට හේතුවෙයි. වඩන ලද බහුල කරන ලද සම්මා සංකප්පය රාගය දුරුකිරීමට හේතුවෙයි. ද්වේෂය දුරුකිරීමට හේතුවෙයි. මෝහය දුරුකිරීමට හේතුවෙයි. වඩන ලද බහුල කරනලද සම්මා

වාචා ව රාගය දුරුකිරීමට හේතුවෙයි. ද්වේෂය දුරුකිරීමට හේතුවෙයි. මෝහය දුරුකිරීමට හේතුවෙයි. වඩන ලද බහුල කරන ලද සම්මාකම්මන්තය රාගය දුරුකිරීමට හේතුවෙයි. ද්වේෂය දුරුකිරීමට හේතුවෙයි. මෝහය දුරුකිරීමට හේතුවෙයි. වඩන ලද බහුල කරන ලද සම්මා ආජීවය රාගය දුරුකිරීමට හේතුවෙයි. ද්වේෂය දුරුකිරීමට හේතුවෙයි. මෝහය දුරුකිරීමට හේතුවෙයි. වඩන ලද බහුල කරන ලද සම්මා වායාමය රාගය දුරුකිරීමට හේතුවෙයි. ද්වේෂය දුරුකිරීමට හේතුවෙයි. මෝහය දුරුකිරීමට හේතුවෙයි. වඩන ලද බහුල කරන ලද සම්මාසතිය රාගය දුරුකිරීමට හේතුවෙයි. ද්වේෂය දුරුකිරීමට හේතුවෙයි. මෝහය දුරුකිරීමට හේතුවෙයි. වඩන ලද බහුල කරන ලද සම්මා සමාධිය රාගය දුරුකිරීමට හේතුවෙයි. ද්වේෂය දුරුකිරීමට හේතුවෙයි. මෝහය දුරුකිරීමට හේතුවෙයි.''[24] යනුවෙන් දේශනා කොට වදාළහ.

සංයුත්ත නිකායේ මග්ග සංයුත්තයේ එන භික්ඛු සූත්‍රයෙන් මේ ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය ''බ්‍රහ්මචරියය'' යනුවෙන් නම් කොට වදාළහ. එම සූත්‍රයට අනුව එක්තරා භික්ෂුවක් බුදුපියාණෝ වෙත පැමිණ '' ස්වාමීනි, 'බ්‍රහ්මචරිය' 'බ්‍රහ්මචරිය' කියා කියති. මේ බ්‍රහ්මචරිය කියන්නේ කුමකටද බ්‍රහ්මචරිය අවසානය යැයි කියන්නේ කුමකටද?'' යැයි ඇසුවේය. එවිට බුදුපියාණෝ පින්වත් භික්ෂුව මේ ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගයම බ්‍රහ්මචරියාවයි. එනම් සම්මා දිට්ඨි... සම්මා සමාධි. යමෙක් රාගය නැති කළේ නම් ද්වේෂය නැති කළේ නම් මෝහය නැති කළේ නම් මෙය බ්‍රහ්මචරිය පරියෝසානයයි හෙවත් බ්‍රහ්මචරිය අවසානයයි'' යැයි දේශනා කළහ.

සංයුත්තනිකායේ මග්ග සංයුත්තයේම එන අනුපාදා සූත්‍රයෙහි බුදුපියාණන් වහන්සේ මෙසේ දේශනා කරති. පින්වත් මහණෙනි, යම් හෙයකින් අන්‍ය තීර්ථක පරිව්‍රාජකයින් මෙසේ විචාරන්නේනම්, ''ඇවැත්නි, ශ්‍රමණ භවත් ගෞතමයන් කෙරෙහි කුමක් පිණිස බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්නේද?'' එසේ ඇසූ කල්හී පින්වත් මහණෙනි, ඒ අයට මෙසේ කියන්න. ''ඇවැත්නි, උපාදානයන්ගෙන් තොරව පරිනිර්වාණය පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බ්‍රහ්මචරියාවෙහි හැසිරෙමු'' එවිට ඒ අන්‍ය තීර්ථක පරිව්‍රාජකයෝ මෙසේ අසන්නේ නම්, ''ඒ උපාදානයන්ගෙන් තොරව පරිනිර්වාණය සඳහා මාර්ගයක් තියෙනවාද? ප්‍රතිපදාවක් තියෙනවාද?'' කියලා. එවිට මෙසේ කියන්න ''ඇවැත්නි, උපාදානයන්ගෙන් තොරව පරිනිර්වාණය සඳහා මාර්ගයක් ඇත. ප්‍රතිපදාවක් ඇත.'' යනුවෙනි. ඒ මාර්ගය මොකක්ද? ඒ ප්‍රතිපදාව මොකක්ද? මේ ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගයමයි. එනම් සම්මා දිට්ඨි... සම්මා සමාධි. පින්වත් මහණෙනි, උපාදානයන්ගෙන් තොරව පරිනිර්වාණය සඳහා මේ මාර්ගයයි, මේ ප්‍රතිපදාවයි.''[25]

මේ ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගයම ඤාණදස්සනය පිණිස ද, සියලු ආශ්‍රව ධර්මයන් ක්ෂය කිරීම පිණිසද, විජ්ජා හා විමුත්තිඵල සාක්ෂාත් කරගැනීම පිණිස ද එකම මාර්ගය බව, ප්‍රතිපදාව බව, මෙම සංයුත්ත නිකායේම මග්ග සංයුත්තයේ එන ඤාණදස්සන, ආසවක්ඛය හා විමුත්තඵල යන සූත්‍ර දේශනයන්ගෙන් අපේ බුදුහාමුදුරුවෝ අපට පෙන්වා වදාළහ.

සංයුත්ත නිකායේ මග්ග සංයුත්තයේ ඔඝ වර්ගයේ එන ඕරම්භාගිය සංයෝජන සූත්‍රයෙන්

බුදුපියාණෝ අපට පෙන්වා දෙන්නේ සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස, කාමරාග, පටිඝ යන ඕරම්භාගිය සංයෝජනයන් නැති කිරීම පිණිස මේ ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය වඩන්න යනුවෙනි. යම් කෙනෙක් මේ සංයෝජන පහ නැති කළොත් හෙතෙම සෝවාන්, සකදාගාමි, අනාගාමි, යන මාර්ගඵල සාක්ෂාත් කරගනියි. ඒ අනුව හෙතෙම නැවත සසරට නොඑන කෙනෙක් බවට පත්වෙයි.[26] එසේම උද්ධම්භාගිය සංයෝජනයන් නැති කිරීමට ද මාර්ගය වෙනත් එකක් නොව මෙයමයි. උද්ධම්භාගිය සූත්‍රයේ එය මෙසේ පැහැදිලි කරති. ''පින්වත් මහණෙනි, මේ උද්ධම්භාගිය සංයෝජන පහකි. එනම් රූප රාග, අරූප රාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යන පහයි. මේ පඤ්ච උද්ධම්භාගිය සංයෝජනයන් දැනගැනීම පිණිස, පිරිසිඳ දැනගැනීම පිණිස, නැති කිරීම පිණිස, සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම පිණිස, ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය වැඩිය යුතුය.''[27] මෙසේ යම් කෙනෙක් මේ සියලු දස සංයෝජන ධර්මයන් මැනවින් දැනගන්නේ නම්, දැක ගන්නේනම්, හෙතෙම ඒකාන්තයෙන්ම සියලු දුක් නැති කොට අමා මහා නිවණ සාක් ෂාත් කරගන්නා බව අපගේ සම්මා සම්බුද්ධ දේශනයයි.

මේ අනුව මෙම ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය වැඩීම සම්බුද්ධ ධර්මයෙහි අත්‍යවශ්‍යම අංගයක් බව අපි නැවත නැවතත් තේරුම් ගනිමු, පැහැදිලි කර ගනිමු. ඒ මාර්ගයේ ඒ ඒ අංග එකි නෙක ටික ටික හෝ වැඩීම සඳහා අද අදම දැන් දැන්ම උත්සුක වෙමු. නිවණට මග බුදුදහමයි කියන්නේ නිවණට මග ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගයම වන බැවිනි. එදා බුදුරජාණන් වහන්සේගේ දවස පටන් අද දක්වාම යම් කෙනෙක් සෝවාන්,

සකදාගාමි, අනාගාමි, අරහත් යන තත්වයන්ට පත්වුයේ ද නිර්වාණ ධර්මය අවබෝධ කරගත්තේ ද ඒ සෑම දෙනා විසින්ම අනුගමනය කර ඇත්තේ මේ මාර්ගයයි. මේ මාර්ගයේ ගමන් කරන කෙනා අවසන් වෙන්නේ දස අංගයකින් සමන්නාගතව අරහත් බවට පත්වීමෙනි හෙවත් ලෝකයට තවත් රහතන් වහන්සේ කෙනෙක් එකතු කරමිනි. අපි හැම දෙනාටම එම ශක්තිය ඇති බව අපේ බුදුහාමුදුරුවෝ අපට පෙන්වා වදාළහ. එබැවින් අපි ඒ අපේ බුදුහාමුදුරුවන් වහන්සේ විසින් අපට ලබා දුන් උපදෙස් පිළිපදිමු. බුදුවදන සිතට ගෙන නැවත නැවතත් බුදු දහමෙහි නිරත වෙමු. ප්‍රායෝගික වෙමු.

දැන් අපි මෙසේ දස අංගයෙන් සමන්නාගතව හෙවත් ආර්‍ය දසාංග මාර්ගය සම්පූර්ණ කොට සියලු කෙලෙස් නැති කොට නැවත කවදාකවත්ම මේ සසරට නොඑන අවසන් ශරීරය දරන රහතන් වහන්සේ කෙනෙක් බවට පත් වෙන ඒ අරහත් මුනි උතුමාගේ නිවුණ සිත හෙවත් නිවණ යනු කුමක් දැයි ටිකක් සොයා බලමු. සියලු උපාදානයන් ගෙන් තොරව ලබන ඒ නිවණ යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

5 පරිච්ඡේදය

නිවණ සහ සම්බුද්ධ පරිනිර්වාණය

(1) නිවණ

නිවණ යනු නිවීමයි. නිවීමක් අවශ්‍ය වෙන්නේ ගින්නක් හෙවත් ඇවිලීමක් ඇති විටයි. ගින්න යනු කෙලෙස් ගින්නයි. මේ සසර අක්මුල් නොදැන සැරිසරණ ඔබ අප හැම දෙනාම නිබඳවම නිරතුරුවම ගිනි එකොළහකින් තැවෙයි, දැවෙයි. දුක යනු එයයි. වරක් බුදුපියාණන් වහන්සේ දේශනා කළේ සියල්ල ගිනිගන්නා බවයි. ඔබත් දන්නා පරිදි, එදා බුදුපියාණෝ ගයා ශීර්ෂයෙහි දී උරුවේල කාශ්‍යප, ගයා කාශ්‍යප හා නදී කාශ්‍යප යන තුන් බෑ ජටිලයන් දමනය කොට දහසක් වූ එම භික්ෂූන් අමතා ආදිත්ත පරියාය සූත්‍රය දේශනා කරමින් ''සබ්බං භික්ඛවේ ආදිත්තං'' (පින්වත් මහණෙනි, සියල්ල ගිනිගනී). යනුවෙන් දේශනා කොට සියල්ල යනු කුමක්දැයි පෙන්වා දෙමින් ''ඇස ගිනි ගනියි, රූප ගිනි ගනියි, ඇසේ විඤ්ඤාණය ගිනිගනියි, ඇසේ ස්පර්ශය ගිනිගනියි, ඇසේ ස්පර්ශය නිසා සැප වේදනා, දුක් වේදනා, අදුක්ඛ අසුඛ වේදනා වශයෙන් කිසියම් වේදනාවක් ඇතිවෙයි ද ඒ වේදනාව ගිනි ගනියි.'' යනුවෙන් දේශනා කළහ. අනතුරුව ගිනි ගන්නේ කුමකින් ද යන්න ද පැහැදිලි කරමින්, ''කේන ආදිත්තං'' යනුවෙන් ප්‍රශ්න කොට ''රාගග්ගිනා, දොසග්ගිනා, මෝහග්ගිනා, අදිත්තං ජාතියා ජරාමරණේන, සොකෙහි, පරිදේවේහි, දුකෙඛහි,

දොමනස්සෙහි, උපායාසෙහි අදිත්තන්ති වදාමි.'' යනුවෙන් රාග, ද්වේෂ, මෝහ, ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස යන ගිනි එකොළහකින් ගිනි ගන්නා හෙවත් ඇවිලගන්නා බව දේශනා කළහ.[1] මේ ගිනි නිවු තැනැත්තා රහතන් වහන්සේය. ගිනි නිවු විට සිසිලස ඇතිවෙයි. ඒ තත්වය ''සීතිභූත'' (සිසිල් බවට පත්වීම) යැයි දේශනා කළහ. සූත්‍ර පිටකයේ එන ථෙරගාථාවල සහ තවත් විවිධ අවස්ථාවල අපට ''සීතිභූතෝස්මි නිබ්බුතෝ'' (සිසිල් බවට පත්වුයෙමි. නිවුණ බවට පත්වුයෙමි) යන පාඨය දක්නට ලැබේ.[2]

රහතන් වහන්සේ හඳුන්වන වචන කීපයක් ගත්විට අපට උන්වහන්සේගේ ස්වභාවය තේරුම් ගැනීමට අපහසු නැත. අපි දැන් මෙසේ වචන කීපයක් ගෙන බලමු. ඛීණාසවෝ, අන්තිම දේහධාරී, කතකිච්චෝ, විජිතසංගාම, ඕහිතභාරෝ, අනුප්පත්ත සදත්ථෝ, භවබන්ධනච්ඡිදෝ, යනු අපමණ වචන වලින් වචන හතක් පමණි. මෙම වචන හතෙන් අපට උන්වහන්සේගේ ස්වභාවය සාමාන්‍ය වශයෙන් තේරුම් ගත හැකිය. මෙම වචනවල තේරුම එකිනෙක ගෙන බලමු. ඛීණසව යන්නෙහි ඛීණ යනු නැති කිරීමයි. ආසව යනු කෙලෙස් වලට නමකි. ඒ අනුව උන්වහන්සේ කෙලෙස් නැති කළ උතුමාණෝය. අන්තිම දේහධාරී යනු අවසන් දේහය දරණ යන අදහසයි. උන්වහන්සේ නැවත සසර ඉපදෙන්නේ නැත. මේ උන්වහන්සේ දරන්නේ අන්තිම දේහයයි හෙවත් අන්තිම ශරීරයයි, පඤ්චස්ඛන්ධයයි. කතකිච්චෝ යනු කරනලද කිස ඇති යන්නයි. එනම් කළයුතු සියල්ල අවසන් කර ඇත. කළ යුතු සියල්ල නම් කෙලෙස් සියල්ල නැති කිරීමයි.

උන්වහන්සේ සියලු කෙලෙස් නැතිකොට නිවුණ සැනසුන මනසින් මේ සමාජයේ අප අතරම සැනසිල්ලේ ජීවත් වෙන මුනි උතුමෝය. විජිතසංගාම යනු යුද්ධයෙන් ජයගත් යන්නයි. යුද්ධය නම් කෙලෙස් සතුරන් සමග කරන යුද්ධයයි. උන්වහන්සේ සියලු කෙලෙස් සතුරන් නැති කොට යුද්ධයෙන් ජයගත් කෙනෙකි. ඕහිතභාරෝ යනු බර බිම තැබූ යන අදහසයි. බර නම් මේ පංචස්බන්ධයේ බරයි. සංයුත්ත නිකායේ භාරසුත්‍රයෙන් අපේ බුදුහාමුදුරුවෝ අපට ඉතාමත්ම ලස්සනට බර යනු කුමක්ද බර රැගෙනයන්නේ කවුද බර බහා තබන්නේ කවුද යනුවෙන් විස්තර කර ඇත.[3] ඒ බර යනු මේ පඤ්චස්බන්ධයේ බරයි. බර බහාතැබූ තැනැත්තා අන්කිසිවෙක් නොව රහතන් වහන්සේය. අනුප්පත්ත සදත්ථ යන්නෙහි සද්අර්ථය නම් නිවණයි. අනුප්පත්ත යනු පැමිණීමයි. ඒ අනුව උන්වහන්සේ නිවණට පැමිණ වාසය කරන කෙනෙකි. භව බන්ධනච්ඡිදෝ යනු භව බන්ධන හෙවත් භවයට බැඳ තබන බැමි නැති කළ යන අරුතයි. ඒ අනුව උන්වහන්සේ සසරට හෙවත් භවයට බැඳ තබන සියලු බැමි සිඳ බිඳ දැමූ කෙනෙකි. මේ වචන වලින් රහතන් වහන්සේ හෙවත් නිවණට පැමිණි උතුමා කවරෙක් ද යන්න අපට සාමාන්‍ය වශයෙන් පැහැදිලි වේ යැයි සිතමු.

තවද නිවණ අවබෝධකරගත් ඒ රහතන් වහන්සේලාගේ ස්වභාවය පැහැදිලිව තේරුම් ගැනීමට ඉතාමත්ම සුදුසු ගාථා රත්නයන් දහයක් ධම්මපදයේ අරහන්ත වග්ගයෙන් අපට හමුවෙන අතර භික්ඛු වර්ගය, හා බ්‍රාහ්මණ වර්ගයෙන් ද තවත් සුවිශේෂ ගාථා රත්නයෝ අපට හමුවෙති. එසේම මේ සම්බුද්ධ

ශාසනය බැබළවූ මහරහත් උතුමන්ගේ ගුණ කියවෙන ථෙර ගාථාවලින් හා ථෙරී ගාථාවලින් ද දක්වන්නේ ඒ අරහත් බව ලැබගත් මහරහතන් වහන්සේලාගේ හා මහරහත් මෙහෙණින් වහන්සේලාගේ ස්වභාවයයි. එමෙන්ම සුත්ත නිපාතයෙන් ද ඒ මහරහත් උතුමාණන් වහන්සේලාගේ ස්වභාවය දැක්වෙන ගාථාරත්නයෝ රාශියක් අපට හමුවෙති. මේවා අතුරින් මුලින්ම අපි කාටත් සුපුරුදු ග්‍රන්ථයක් වන ධම්මපදයේ උන්වහන්සේලා ගැන කියවෙන තොරතුරු ඇතුළත් ගාථා කීපයක අදහස පමණක් ගෙන බලමු.

අපේ බුදුහාමුදුරුවෝ මෙසේ වදාරති. ''සසර ගමන නිමකළ, සෝක නැති, සියලු බැමි ප්‍රහාණය කළ ඒ උතුමාට කෙලෙස් වලින් දාහයක්, දැවිල්ලක් නැත.'' ''උත්සාහයෙන් හා සිහියෙන් යුක්ත වූ උන්වහන්සේලා කිසිම නිවහනක නොඇලෙයි. හරියට විල හැරයන හංසයෙක් සේ එකින් එක අත්හැර යති.'' ''උන්වහන්සේලාට කිසිම රැස්කිරීමක් නැත. ආහාර ගන්නේ ඉතාමත් හොඳින් පමණ දැනගෙනයි. ශූන්‍ය වූත් නිමිති රහිත වූත් විමෝක්ෂය කැමති පරිදි ස්පර්ශ කරමින් ජීවත්වෙන උන්වහන්සේලා හරියට අහසින් ගිය කුරුල්ලන් වගෙයි, වැඩමකළ මාර්ගයේ කිසිම සළකුණක් නැත. එබැවින් සොයන්නට කිසිවෙකුටත් නොහැක.'' ''ඒ උතුමෝ මහා පොළොවසේ අකම්ප්‍ය ගුණයෙන් යුක්තයි. විරුද්ධත්වයක් නැහැ. ස්ථිරසාරයි, හරියට ඉන්ද්‍රඛීලයක් වගෙයි. ''මඩවලින් තොරවූ පිරිසිදුවූ ගැඹුරු විලක් වගේ පිරිසිදුයි. උන්වහන්සේගේ මනස හරිම ශාන්තයි. උන්වහන්සේගේ වචනයත් හරිම ශාන්තයි. එසේම උන්වහන්සේගේ ක්‍රියාවත් ශාන්තයි. මැනවින් දැනගෙන කෙලෙස් වලින් මිදුණු, ඒ උතුමෝ

තමාතුළින්ම ශාන්ත භාවයටපත්ව නොසෙල්වෙන ගුණයන්ගෙන් පිරිපුන්ව වාසයකරති.'' ''යම් ගමක හෝ ආරණ්‍යයක හෝ නිම්නයක හෝ කන්දක හෝ ඒ රහතන් වහන්සේලා වාසය කරත් ද ඒ බිම රමණීය බිමකි, පින්බිමකි.''

ධම්මපදයේම බ්‍රාහ්මණ වග්ගයේ එන මේ අදහස් බලන්න.''සියලු බැමි සිඳ බිඳ දමා යම් කෙනෙක් නොතැවෙත් ද සියලු බැඳීම් ජයගත්තේ ද ඒ තැනැත්තා රහතන් වහන්සේ නමකි.'' ''යම් කෙනෙකුට මෙතෙරක් නැද්ද එතෙරක් නැද්ද, මෙතෙර එතෙර දෙකම නැද්ද, පහ වු සෝක ඇති, සියලු බැඳීම් වලින් මිදුණු හෙතෙම රහතන් වහන්සේ නමකි.'' ''උන්වහන්සේ කාමයන්හි ඇලෙන්නේ නැත. නෙළුම් පතෙහි ජල බිඳුමෙනි. ඉදිකටු තුඩක අබ ඇටයක් රැඳවිය නොහැක්කාක් මෙනි.'' ''උන්වහන්සේට ඉතා ගැඹුරු ප්‍රඥාවක් ඇත. මග නොමග හොඳහැටි දනිති. උතුම් අර්ථයට හෙවත් නිවණට පැමිණ වාසය කරති.'' ''උන්වහන්සේ සියලු ආශ්‍රව ක්‍ෂය කොට ඛීණාසව තත්වයට පත්වූ උතුමෙකි. උන්වහන්සේට ඇත්තේ අනිස්සිත අනුපාදාන මනසකි. උන්වහන්සේ කිසිවක් අල්ලන්නෙත් නැහැ, අතහරින්නේත් නැහැ. රාගයට ඇලෙන්නේත් නැහැ, විරාගයට ඇළෙන්නේත් නැහැ. උන්වහන්සේ මෙලොවට ආශාවකුත් නැහැ, පරලොවට ආශාවකුත් නැහැ. උන්වහන්සේට පෙර, පසු, මැද හෙවත් අතීත, අනාගත, වර්තමාන යන කාල තුනෙහිම කිසිම ඇලීමක් නැහැ. කිසිවකටත් නොඇලෙන කිසිවක් දැඩිලෙස නොගන්නා උන්වහන්සේ බ්‍රාහ්මණයෙකි, රහතන් වහන්සේ කෙනෙකි.''

සංයුත්ත නිකායේ ඛන්ධ සංයුත්තයේ ඛජ්ජනීය සූත්‍රයට අනුව උන්වහන්සේ අතීත, අනාගත, වර්තමාන, අධ්‍යාත්මික, බාහිර, ඕලාරික, සුඛුම, හීන ප්‍රණීත, දුර, ළඟ, යන රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ, සියල්ලම මගේ නොවෙයි, මම නොවෙයි, මගේ ආත්මය නොවෙයි, යනුවෙන් දැන දැක පසක් කරගත් උතුමෙකි. සියල්ලම අනිත්‍යයි, සියල්ලම දුක්ඛයි, සියල්ලම අනාත්මයි යනුවෙන් දැන දැක පසක් කරගත් උතුමෙකි.

රහතන් වහන්සේ කෙනෙකුගේ ස්වභාවය දැක්වෙන සුවිශේෂ ගාථා රත්නයක් රතන සූත්‍රයේ අවසානයට අපට හමුවෙයි. එහි කියවෙන්නේ අරහත් බව පසක් කරගත් ආර්‍ය මහා සංඝරත්නයේ ගුණයන්ය. ඔබත් දන්න ඒ ගාථා රත්නය මෙසේය.

''ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්ත චිත්තා ආයතිකෙ භවස්මිං
තෙ ඛීණ බීජා අවිරුළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථා යම් පදීපෝ''.

එහි අදහස මෙන්න. '' සියලු පෙර කර්ම නැති කළ, අලුත් කර්ම රැස්නොකරන, නැවත භවයක කිසිම ආකාරයකින් සිත නොඇලෙන, සියලු බීජ විනාශ කළ, නැවත උපතකට ආශාවක් ඇති නොකරන, ඒ ප්‍රඥාවන්ත උතුමෝ පහනක් නිවෙන්නාසේ නිවුණ තත්වයට හෙවත් නිවණට පත්වෙති.''

යම් කෙනෙක් රහතන් වහන්සේ කෙනෙක් බවට පත්වන්නේ තම සිත හෙවත් විඤ්ඤාණය පිරිසිදු

කිරීමෙනි. අප සිත යැයි කතා කරන මේ අපේ පඤ්චස්කන්ධය තුළ ඇති සුවිශේෂ ශක්තිය හෙවත් චිත්ත ශක්තිය නිර්වචනය කිරීම සඳහා අපගේ තථාගත ලොවුතුරා බුදුරජාණන් වහන්සේ විසින් චිත්ත, මනෝ, විඤ්ඤාණ, යනුවෙන් වචන තුනක් දේශනා කර ඇත. ඒ තුනෙන් රහතන් වහන්සේ කෙනෙක් වූ විට අප කතා කරන්නේ උන්වහන්සේගේ විඤ්ඤාණය ගැනයි. සාමාන්‍යයෙන් සෑම කෙනෙකුටම හය ආකාරයක විඤ්ඤාණ ඇති බව ඔබත් දන්නවා නේද? ඒ චක්ඛු විඤ්ඤාණය, සෝත විඤ්ඤාණය, ඝාණවිඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය, මනෝ විඤ්ඤාණය යන හයයි. මහරහත් උතුමෝ ආවේග නැති බැවින් චිත්ත තත්වයෙන් මිදී ඇත. චිත්ත යනු සිතෙහි ආවේගාත්මක අංශයයි. උන්වහන්සේගේ සිත මනස හෙවත් හුදු මනෝ තත්වයෙන් ද උසස් වූවකි. හුදු මතකයන්ට පමණක් සීමා වූ සිතක් නොව එය ප්‍රභාස්වර විඤ්ඤාණයකි. මනෝ යනු සිතෙහි ඇති මතකයන් අවදිකර දෙන ස්වභාවයයි, ස්මරණ ශක්තියයි නොහොත් සෑම ධර්මයකටම මුල්වෙන ස්වභාවයයි. (මනෝ පුබ්බංගමා ධම්මා). රහතන් වහන්සේට ඇති මතකය ස්මරණය දියුණු කිරීම නිසා හෙවත් සති ඉන්ද්‍රිය දියුණු කළ නිසා ඇති මතකයයි. උන්වහන්සේට අවශ්‍ය නම් මේ භවයේ පමණක් නොව වෙනත් භවවල සිදු වූ දේ පවා මතකයට නඟා ගත හැකිය.

රහතන් වහන්සේ යම් දෙයක් දෙස බලන්නේ සිය මතකයන් ඔස්සේ නොවේ. විෂයානුබද්ධ නිරීක්ෂණයක් ලෙස වස්තු හා පුද්ගලයන් මෙන්ම සත්වයන් වෙත ද සිය අවධානය යොමු කරන බැවින් උන්වහන්සේට සත්ව පුද්ගල වශයෙන් හෝ වෙනත් කිසිම ආකාරයක

බෙදීමක් නැතිව යමක් දෙස බැලීමේ හැකියාව ඇත. තවත් ආකාරයකින් කියන්නේ නම් උන්වහන්සේට මාන්නය හෙවත් මැනීමක් නැත. උන්වහන්සේගේ මනසින් ලෝකය බලන්නේ සති සම්පජඤ්ඤය මුල් කරගෙන බැවින් උන්වහන්සේගේ සංජානනය හෙවත් යමක් දැනගැනීමේ හැකියාව ඉතාමත්ම පුළුල් වූ දෙයකි. සාමාන්‍ය මනුෂ්‍යයෙක් යමක් දෙස බලා ඇතිකරගන්නේ සංජානනයකි හෙවත් කිසියම් සඤ්ඤාවක් ඇති කරගැනීමකි. එහිදී සිදුවෙන්නේ ඔබ බලන දේ පෙනීමයි. (You see what you see) එය ඉංග්‍රීසී භාෂාවෙන් හඳුන්වන්නේ පඍෙප්ෂන් (perception) යනුවෙනි. සංජානනයක් ඇතිවීම සඳහා අභ්‍යන්තර ඉන්ද්‍රියයන්ගේ සහ ඒ ඉන්ද්‍රියයන්ට විෂය වන බාහිර අරමුණු වලත් සම්බන්ධතාවය තිබිය යුතුය. ඒ සම්බන්ධතාවය ගොඩ නගන්නේ විඤ්ඤාණයෙනි. මේ තුනෙහි එකතුව ස්පර්ශයයි. (තිණ්ණං සංගති ඵස්සෝ) ඒ ස්පර්ශය නිසා තමයි වින්දන ඇතිවෙන්නේ. යමක් වින්දනය කරයි ද එය සංජානනය හෙවත් දැනගැනීම බවට පත්වේ. යනුවෙන් තථාගත බුදුපියාණෝ අපට මේ සංජානනය සිදුවෙන ආකාරය ඉතාම ලස්සනට මජ්ඣිම නිකායේ මධුපිණ්ඩික සූත්‍රය, ඡ ඡක්ක සූත්‍රය වැනි සූත්‍ර දේශනා වලින් පැහැදිලි කොට වදාළහ.[5]

එහෙත් මහ රහත් උතුමාණන් වහන්සේගේ සංජානනය සාමාන්‍ය පෘතග්ජනයෙකුගේ සංජානනයට හෙවත් දැකීමට වඩා වෙනස් ය. උන්වහන්සේට ඇත්තේ විවිධ දේ පිළිබඳව හුදු බුද්ධිය හෝ මතකයන් ඇසුරෙන් ලබාගත් ඥානයකට වඩා ප්‍රඥාවෙන් අවබෝධ කරගත් මහා ප්‍රඥාමහිමයකි. එය දැනුම ලබාගන්නා ක්‍රම තුනෙන් සඤ්ඤා විඤ්ඤාණ යන දෙකෙන්ම එහාට ගිය

පඤ්ඤාවෙන් විකසිත කරගත් අවබෝධයකි. එය දැනීමක් නොව ප්‍රඥාවෙන් ලබාගත් අවබෝධයකි. රහතන් වහන්සේ ජීවත් වෙන තාක් විඤ්ඤාණය පවතියි. එහෙත් ඒ විඤ්ඤාණයේ නාමරූප වශයෙන් බැඳීමක් නැත. පිවිතුරු කැඩපතක් මෙනි. එහි නාම රූප නැමති සියළු දූවිලි ඉවත් කර ඇති බැවින් පිවිතුරුය, පිරිසිදුය. උන්වහන්සේ පිරිනිවන් පෑ කල්හී ඒ විඤ්ඤාණය තවත් තැනක රඳන්නේ, ළැගීමට යන්නේ හෙවත් මව්කුසක පිළිසිඳගන්නේ නැත. අර මෙත්ත සුත්‍රයේ හෙවත් කරණීය මෙත්ත සුත්‍රයේ ''නහි ජාතු ගබ්භසෙය්‍යං පුනරේතී'' යැයි අපි නිතර භාවිතා කරන්නේ මෙයයි. එහි අදහස උපතක් සඳහා නැවත ගැබකට හෙවත් මව් කුසකට එන්නේ නැහැ යන්නයි.

භවයෙන් භවයට පුද්ගලයාගේ පැවැත්ම සාදා දෙන්නේ විඤ්ඤාණයයි. එහෙත් විඤ්ඤාණය හුදුකලාව භවයෙන් භවයට අවිනෂ්ටව යන දෙයක් නොවෙයි. අර මජ්ඣිම නිකායේ මහා තණ්හා සංඛය සුත්‍රයෙන් පෙන්වා දෙන්නේ දිනක් සාති කියලා භික්ෂුවක් එවැනි වැරදි දෘෂ්ටියක් අරගෙන සිටිය ආකාරය. ඒ භික්ෂුව දැඩි මතයක හිටියේ ''මේ භවයෙන් භවයට යන්නේ නොවෙනස් වෙන විඤ්ඤාණයක් කියලා.''[6] එවැනි විඤ්ඤාණයක් ගැන අපේ බුදුහාමුදුරුවෝ දේශනා කරන්නේ නැහැ. එසේම අපේ බුදුරජාණන් වහන්සේ ඒ විඤ්ඤාණය ද හුදකලාව මේ භවයෙන් ඊළග භවයට යන්නක් නොව හේතුඵල ධර්මයන්ට අනුව ''නාමරූප පච්චයා විඤ්ඤාණං'' කියා දේශනා කළ බුද්ධ වචනයටම අනුව නාමරූප ප්‍රත්‍යය කරගනිමින් හෙවත් නාමරූප ධර්ම වල යැපෙමින් භවයෙන් භවයට යන්නේ නාමරූප ද ඇතිවයි. ඒ විඤ්ඤාණය මෙහෙයවන්නේ

අප විසින් කරන ලද කර්ම වලිනි. කර්මවල විපාක ලබා දීමට අවශ්‍ය තැනක් සොයා ගැනීම භවයයි. භවය ඇතිවෙන්නේ උපාදානය හෙවත් දැඩිව ග්‍රහණය කර ගැනීම නිසයි. විඤ්ඤාණය ධ්‍රැව ලෙසින් හෙවත් ස්ථිර සාර ලෙසින් පවතින්නක් තියා එක මොහොතක් එක ක්ෂණයක්වත් නොවෙනස්ව පවතින්නක් නොවේ. විඤ්ඤාණය ද පටිච්චසමුප්පන්න දෙයකි. යම් දවසක නාමරූප නැති කළ කල්හී විඤ්ඤාණය ප්‍රභාස්වර වෙයි. ඒ ප්‍රභාස්වර විඤ්ඤාණය රහතන් වහන්සේගේ විඤ්ඤාණයයි (සබ්බතො පභං). මෙය හරියට පහනෙහි තෙල් ඉවරයි ඒත් වැටිය පමණක් දැල්වෙන්නාක් මෙනි. නාමරූප නැති කල්හී විඤ්ඤාණය ද නැති විය යුතුයි. ඒත් රූපාදී ස්කන්ධයන්ගේ තව ටිකක් පැවැත්ම ඇති බැවින් පහනෙහි වැටිය දැවී ඉවර වෙනතාක් පහන දීප්තිමත්ව ඇවිලෙන්නාක් මෙන් රහතන් වහන්සේගේ විඤ්ඤාණය ද බබලයි. ඒ විඤ්ඤාණයේ නිරෝධය සිදුවන්නේ රහතන් වහන්සේ මහා පරිනිබ්බාණයෙන් පිරිනිවන් පෑ විටය.

අපේ බුදුහාමුදුරුවෝ සුත්ත නිපාතයේ සඳහන්වෙන ද්වයතානුපස්සනා සූත්‍රයෙහි දක්වන අයුරින් ''කිසියම් හෝ වූ දුකක් හටගන්නේ නම් ඒ සියල්ල විඤ්ඤාණය හේතු කරගෙන හටගනියි. විඤ්ඤාණයේ නිරෝධයෙන් දුකේ හටගැනීම නැතිවෙයි.''

(යංකිඤ්චි දුක්ඛං සම්භෝති
සබ්බං විඤ්ඤාණ පච්චයා
විඤ්ඤාණස්ස නිරෝධෙන
නත්ථි දුක්ඛස්ස සම්භවෝ)[7].

මේ අනුව විඤ්ඤාණයෙන් වුවද සිදුවෙන්නේ අපට අහිත පිණිස පවතින දෙයකි. අපේ බුදුහාමුදුරුවෝ විඤ්ඤාණය මායාකාරයෙකුට උපමා කර ඇති බව ඔබත් දන්නවා නේද? විඤ්ඤාණයේ ප්‍රභේද දෙකක් ඇත. එනම්:

1. පතිට්ඨිත විඤ්ඤාණය
2. අප්පතිට්ඨිත විඤ්ඤාණය[8]

පතිට්ඨිත විඤ්ඤාණය ඇත්තේ අරහත් තත්වයට පත් නොවුන අයටය. පතිට්ඨිත යන්නෙන් අදහස් කරන්නේ 'පිහිටනලද' යන්නයි. පිහිටා ඇත්තේ මොනවාද? පිහිටා ඇත්තේ නාමරූපයන්ය. නාම රූප පිහිටන්නේ කොහෙද? නාමරූප පිහිටන්නේ විඤ්ඤාණයේය. විඤ්ඤාණය නිසා නාමරූප හටගනියි යනු සම්බුද්ධ දේශනයයි. විඤ්ඤාණ පච්චයා නාමරූපං යන්නෙන් අප ඉහත දී ද ප්‍රකාශ කළේ මෙයයි. මේ අනුව විඤ්ඤාණය ඇත්තේ යම් තැනක ද එහි නාමරූප ඇත. නාමරූප ඇත්තේ යම් තැනක ද එතැන විඤ්ඤාණය ඇත.

මෙම විඤ්ඤාණය හුදකලාව පවතින්නේවත් හුදකලාව කොහෙවත් යන්නේවත් කොහේ සිට හෝ එන්නේ වත් නැති බව සංයුත්ත නිකායේ බීජ සූත්‍රයෙන් අපේ බුදුහාමුදුරුවෝ අපට පෙන්වා වදාළහ.[9]

අප්පතිට්ඨිත විඤ්ඤාණය යනු රහතන් වහන්සේගේ විඤ්ඤාණයයි. එය අප්පතිට්ඨිත කියන්නේ පිහිටීමක් නැහැ කියන අදහසයි. පිහිටන්නේ

නැත්තේ නාම රූපයි. ඒ අනුව රහතන් වහන්සේගේ විඤ්ඤාණයෙහි නාම රූප නැති විය යුතුයි. නාමරූප ඇති තාක් නැවත නැවත භවයන් සාදා දෙයි. රහතන් වහන්සේගේ විඤ්ඤාණය හෙවත් සිත විසංඛාර ගත සිතකි (විසංඛාර ගතං චිත්තං). ඒ රහතන් වහන්සේගේ විඤ්ඤාණය හඳුන්වන සුවිශේෂ වචනයක් අපට සූත්‍රපිටකයේ දීඝනිකායේ කේවඩ්ඪ[10] සූත්‍රයෙන් හමුවෙයි. ඒ ''අනිදස්සන විඤ්ඤාණය''යන්නයි.

(2). අනිදස්සන විඤ්ඤාණය

මහරහත් උතුමන්ගේ සිතට අප කියන්නේ සිත කියා හෝ මනස කියා හෝ හුදු විඤ්ඤාණය කියා හෝ නොව ''අනිදස්සන විඤ්ඤාණය'' කියාය. එය නිදර්ශන නැති හෙවත් මෙන්න කියා පෙන්විය හැකි යමක් නැති, වෙනත් කිසිම කෙනෙකුගේ සිතට සමාන කළ නොහැකි විඤ්ඤාණයකි. අපි මේ මෙසේ කරුණු කියන්නේ අපේ දැනුමක් නිසා නොව අපේ බුදුහාමුදුරුවෝ අපට මේ කරුණ ගැන දේශනා කර ඇති බැවිනි. මේ ගැන මේ සූත්‍ර දේශනයේ එනම් කේවඩ්ඪ සූත්‍රයේ අපේ බුදුහාමුදුරුවෝ අපට දේශනා කර ඇති ඒ කරුණ ගැන දැන් අපේ අවධානය යොමු කරමු. ඒ මෙසේය.

''විඤ්ඤාණං අනිදස්සනං
අනන්තං සබ්බතෝ පභං
එත්ථ ආපෝ ච පඨවී තේජෝ වායෝ නගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපඤ්ච අසේසං උපරුජ්ඣති
විඤ්ඤාණස්ස නිරෝධෙන එත්ථෙතං උපරුජ්ඣතී''

මෙය අතිශයින්ම වැදගත් ගාථා රත්නයකි. මෙයින් අපට නිවණ අවබෝධකරගත් ඒ උතුමාගේ සිත ගැන දැනගත හැකිය. මෙම ගාථාව අපේ බුදුහාමුදුරුවෝ අපට දේශනා කර ඇත්තේ එක්තරා භික්ෂුවක් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ ඉදිරිපත් කළ ගාථාවකට පිළිතුරක් වශයෙනි. ඒ භික්ෂුවගේ කතාව ඉතා සිත්ගන්නා සුළු එකකි. එබැවින් අපි පළමුව එම කතාව ඉතාම කෙටියෙන් අසමු.

එක දවසක් එක්තරා භික්ෂුවක් භාවනා කර කර සිටිද්දී සිය සිතෙහි ''මේ පඨවි ආපෝ තේජෝ වායෝ යන සතර මහා භූත ඉතිරි නැතිව නැතිවෙන්නේ කොහෙදීද?'' යනුවෙන් ප්‍රශ්නයක් ඇතිවිය. ඒ අවස්ථාවේ දී ඒ භික්ෂුව සමාධිය ලබා ඉද්ධිබලයෙන් ද යුක්තව සිටි බැවින් දිව්‍ය ලෝක වලට යාමට හැකියාව තිබුණි. ඒ අනුව හෙතෙම චාතුම්මහාරාජික දිව්‍ය ලෝකයට ගොස් එහි සිටි දෙවියන්ගෙන් මේ ප්‍රශ්නය ඇසුවේය. ඒ දෙවිවරු එය නොදත් බැවින් සතර වරම් මහරජවරුන් වෙත යොමු කළහ. ඒ සතරවරම් මහරජවරු ද නොදනිති. අනතුරුව තාවතිංස වැසි දෙවියන්ගෙන් ඇසීය. ඒ දෙවිවරු ද නොදත්හ. ඉන් අනතුරුව සක්‍ර දේවේන්ද්‍රයන් වෙත යොමු කළ නමුත් සක්‍ර දේවේන්ද්‍රයන් ද නොදත්හ. මෙසේ පිළිවෙලින් යාමයෙහි දෙවියන්ගෙන් ද එහි සිටි ඒ අයට වඩා උතුම් වූ සුයාම නම් දෙවින්ගෙන් ද තුසිතයේ දෙවියන්ගෙන් ද එහි සිටි ඒ අයට වඩා උතුම් වූ සන්තුසිත නම් දෙවියන්ගෙන් ද නිම්මාණරතී දෙවියන්ගෙන් ද එහි සිටි ඒ අයට වඩා උතුම් වූ සුනිම්මිත නම් දෙවියන්ගෙන් ද පරනිම්මිත වසවත්ති යෙහි සිටි දෙවිවරුන්ගෙන් ද එහි

සිටි ඒ අයට වඩා උතුම් වූ වසවත්තී නම් දෙවියන්ගෙන් ද බ්‍රහ්මකායික දෙවියන්ගෙන් ද එහි සිටි ඒ අයට වඩා උතුම් වූ සියල්ල මවන්නා වූ, ශ්‍රේෂ්ඨ වූ,සියල්ල තමා වසඟයෙහි පවත්වන ඊශ්වර නම් වූ බ්‍රහ්ම හෙවත් මහා බ්‍රහ්මයා වෙත ද ගොස් ඒ භික්ෂුව මෙම ප්‍රශ්නය යොමුකළේය.

ඒ අනුව එම භික්ෂුව මහා බ්‍රහ්මයාගෙන් '' මේ පඨවි ආපෝ තේජෝ වායෝ යන සතර මහා ධාතු ඉතිරි නැතිව නැතිවෙන්නේ කොහේදීද?'' යන ප්‍රශ්නය ඇසුවේය. එවිට මහා බ්‍රහ්මයා මෙසේ පිළිතුරු දුන්හ. ''භික්ෂුව මම තමයි බ්‍රහ්මයා, මහා බ්‍රහ්මයා, සියල්ල වසඟ කරගෙන සිටින්නා, ඊශ්වර වූ සියල්ල කළ, නිර්මාණය කළ, ශ්‍රේෂ්ඨ වූ බ්‍රහ්මයා මමයි'' යනුවෙන් තමාගැනම පුරසාරම් වශයෙන් කීය. දෙවෙනි වතාවට ද තුන්වෙනි වතාවට ද එම භික්ෂුව ඒ ප්‍රශ්නය මහා බ්‍රහ්මයාට ඉදිරිපත් කළ විට දුන් පිළිතුර එයම විය.

අනතුරුව මහා බ්‍රහ්මයා එම භික්ෂුවගේ අතින් අල්ලාගෙන එකත් පසෙකට ගොස් ඒ භික්ෂුවට මෙසේ කීය. ''මේ භික්ෂුව, මේ බ්‍රහ්මකායික දෙවිවරු හිතාගෙන ඉන්නේ බ්‍රහ්මයා නොදුටු කිසිවක් නෑ. නොදත් කිසිවක් නෑ. ප්‍රත්‍යක්ෂ නොකළ කිසිවක් නෑ කියලයි. ඒ නිසයි මම ඒ අයගේ ඉදිරියේ මෙය ප්‍රකාශ නොකළේ. භික්ෂුව මමත් දන්නේ නෑ මේ සතර මහා භූත ඉතිරි නැතිව නැතිවෙන්නේ කොහෙද කියලා. ඔබමයි මේ වැරැද්ද කරලා තියෙන්නේ. මේක අහන්ඩ ඕනේ භාග්‍යවතුන් වහන්සේගෙන් නේද? භාග්‍යවතුන් වහන්සේගෙන්නේ අහන්ඩ තිබුණේ. යන්ඩ ගිහිල්ලා භාග්‍යවතුන් වහන්සේගෙන් මේ ගැන අහන්ඩ. භාග්‍යවතුන් වහන්සේ

යම් සේ පිළිතුරු දෙත් ද ඒ ආකාරයෙන් දැනගන්න දරාගන්න'' යැයි කීය.

ඒ අනුව එම භික්ෂුව බ්‍රහ්ම ලෝකයෙන් චුතව මනුෂ්‍යලෝකයට පැමිණ බුදුරජාණන් වහන්සේ ඉදිරියේ පෙනී සිටියේය. බුදුරජාණන් වහන්සේට වැඳ මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේය. එවිට බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කළහ. ''පින්වත් භික්ෂුව පෙර මහ මුහුදෙහි වෙළඳ කටයුතු සඳහා නැව් වලින් යන නාවිකයෝ වෙරළ සොයාගැනීම සඳහා පක්ෂීන් ගෙනයනවා. ඒ පක්ෂීන් මහ මුහුදේ දී නිදහස් කළ විට විවිධ දිසාවලට පියාසර කොට වෙරළක් සොයා බලා වෙරළක් ළග පාත තිබේ නම් ඒ වෙරළ දෙසට පියාසර කරනවා. එසේ නැතිව වෙරළක් පෙනෙන තෙක් මානයකවත් නැතිවිට නැවතත් ආපසු ඒ නැවටම එනවා. මෙසේ ඔබත් බ්‍රහ්මලෝකය දක්වාම ගොස් සොයා බලා මේ ප්‍රශ්නයට පිළිතුරක් සොයා ගැනීමට බැරිව මා වෙතම ආවා නේද?'' යැයි වදාළහ. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට පෙර බුදුපියාණෝ මෙසේ වදාළ සේක.''පින්වත් භික්ෂුව ඔබ මේ ප්‍රශ්නය අහන හැටිම වැරදියි. එය ඔබ විසින් ඇසිය යුත්තේ එහෙම නෙවෙයි. මෙන්න මේ ආකාරයටයි. ''මේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ, දීඝ, රස්ස, අණු, ථූල, සුභ, අසුභ, නාමරූප යන මේවා පිහිටන්නේ නැත්තේ කොහෙද? මේවා නිරුද්ධ වෙන්නේ කොහෙදීද?'' කියලයි.

මෙසේ මේ ප්‍රශ්නය විචාළ කල්හී අනන්ත නය දස්සී වූ ප්‍රඥාසාගර වූ අපේ තිලෝගුරු වූ බුදුහාමුදුරුවෝ මෙම අනිදස්සන විඤ්ඤාණය ගැන පැහැදිලි කරමින් භික්ෂුව අමතා ඉතාම පැහැදිලිව මෙසේ දේශනා කළහ.

''විඤ්ඤාණං අනිදස්සනං අනන්තං සබ්බතෝ පභං
එත්ථ ආපෝ ච පඨවී තේජෝ වායෝ න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපඤ්ච අසේසං උපරුජ්ඣති.
විඤ්ඤාණස්ස නිරෝධෙන එත්ථෙතං උපරුජ්ඣති''.

දැන් මේ ගාථාවේ අදහස සොයා බලමු. එහි සාමාන්‍යය අදහස මෙසේය. ''මේ විඤ්ඤාණය අනිදස්සනයි හෙවත් නිදර්ශන වලින් විවිධ ලක්ෂණ වලින් තොරයි දැකීමට නොහැකියි. අනන්තයි. සියලු පැතිවලින් ප්‍රභාස්වරයි. මෙහි ආපෝ, පඨවි, තේජෝ, වායෝ, යන කිසිවක් පිහිටන්නේ නැත. දීඝ, රස්ස, අණු, ථූල, සුභ, අසුභ, නාම, රූප, යන සියල්ලම මෙහිදී ඉතිරි නැතිව නැතිවෙයි. විඤ්ඤාණයේ නිරෝධයෙන් මෙය මෙහිම සංසිඳීමට පත්වෙයි.'' යන්නය.

දැන් මේ අනිදස්සන විඤ්ඤාණය යනු කුමක්දැයි සොයා බලමු. මේ අනිදස්සන විඤ්ඤාණය යනු අන් කිසිවක් නොව මහරහත් උතුමාණන් වහන්සේලාගේ විඤ්ඤාණයයි හෙවත් විසංඛාර බවට පත් වූ සිතයි, තණ්හාවෙන් සම්පූර්ණයෙන්ම නිදහස් වූ සිතයි. එසේ අරහත් බවට පත් වූ උතුමා ලොව දකින්නේ සුවිශේෂ ආකාරයකටයි. එනම් ඇත්ත ඇතිසැටියෙන් දැකීමකි. මෙහිදී උන්වහන්සේගේ විඤ්ඤාණය ප්‍රභාස්වර හෙයින් තමාගේ අවධානය යොමු කරන සියල්ල ඇති සැටියෙන්ම හෙවත් යථාභූත වශයෙන්ම උන්වහන්සේට අවබෝධ වේ. මෙහිදී උන්වහන්සේ සවිඤ්ඤාණකව තමන් වහන්සේ දකින දෙය දකින්නේ කෙසේදැයි තමන් වහන්සේ දකියි. මෙය ඉංග්‍රීසියෙන් කියන්නේ '' නොට් වට් හී සීස් බට් හවු හී සීස්'' (not what he sees but how

he sees) යනුවෙනි. උන්වහන්සේගේ ඒ දැකීම හුදු සංජානනයක් හෝ සඤ්ඤාවක් (perception) නොව සවිඤ්ඤාණික සිතින් සිත බැලීමකි, හෙවත් තමා කරන්නේ කුමක්දැයි තමා විසින්ම දැකීමකි. එයට අපි ඉංග්‍රීසි භාෂාවෙන් කියන්නේ ඇපපෂෙප්ෂන් (apperception) කියාය.

අනිදස්සන විඤ්ඤාණයෙන් සවිඤ්ඤාණික වූ මහරහත් උතුමෝ මෙලොව ජීවත් වෙන්නේ පහනක් හෙවත් ගින්නක් දැල්වෙන්නාක් මෙනි. ගින්න දැල්වෙන්නේ ඉන්ධන ඇතිතාක් පමණි. මේ උපමාව අපේ සූත්‍ර දේශනා වල විවිධ තැන් වලින් අපට හමුවේ. මේ බලන්න මජ්ඣිම නිකායේ අග්ගිවඡ්ජගොත්ත සූත්‍රයේ අපේ බුදුහාමුදුරුවෝ අපට දෙන පණිවිඩය.

දිනක් අග්ගිවච්ඡගොත්ත නැමති එක්තරා පරිබ්බාජකයෙක් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ විවිධ ප්‍රශ්න ඇසීය. ඔහු රහතන් වහන්සේ ගැන අසමින් විමුක්තියට පත් භික්ෂුව උපදින්නේ කොහිදැයි විමසීය. එහිදී බුදුරජාණන් වහන්සේ සහ වච්ඡ අතර ඇතිවූ සංවාදය මෙන්න.

වච්ඡ - මෙසේ විමුක්තියට පත් භික්ෂුව හෙවත් රහතන් වහන්සේ උපදින්නේ කොහෙද?

බුදුහු - වච්ඡ එසේ උපදී යැයි කීම අදාළ නොවේ.

වච්ඡ - එහෙම නම් උපදින්නේ නැද්ද?

බුදුහු - නො උපදී යැයි කීම ද අදාළ නොවේ.

වච්ඡ - එසේ නම් ගෞතමයනි, උපදින්නේත් වේද නොඋපදින්නේත් වේද?

බුදුහු - උපදින්නේත් වේ නොඋපදින්නේත් වේ යැයි කීමද අදාළ නොවේ.

වච්ඡ - එසේ නම් ගෞතමයනි, උපදින්නේ නැත්තේත් නොවේ, නැත්තේ නැත්තේත් නොවේ ද?

බුදුහු - උපදින්නේ නැත්තේත් නොවේ, නැත්තේ නැත්තේත් නොවේ යැයි කීම ද අදාළ නොවේ.

මෙසේ මේ අපගේ බුදුපියාණන්ගේ පිළිතුර වච්ඡට නම් කොහොමවත්ම තේරුම් ගන්ඩ බැරිවුණා. මුළාවට පත්වුණා. ඔහු මෙහෙම කිව්වා. ''මම මුලින් ගෞතමයන් එක්ක කථා කරලා යම් කිසි පැහැදීම් මාත්‍රයක් හරි තිබුණා නම් දැන් නම් ඒ ටිකත් නැත්තටම නැතිව ගියා.''

එවිට අපේ බුදුහාමුදුරුවෝ ඔහුට මෙසේ ප්‍රකාශ කළහ. ''එසේ ඔබට තේරුම් ගැනීමට අපහසු වීම පුදුමයක් නොවේ. මේ ධර්මය ඉතාම ගැඹුරුයි, දැකීමට අමාරුයි, අවබෝධකිරීමට අපහසුයි, ශාන්තයි, ප්‍රණීතයි, තර්කයට ගොදුරුවෙන්නේ නැහැ, නිපුණයි, මෙය නුවණැත්තන් විසින් ප්‍රත්‍යක්‍ෂකරගතයුතු දෙයකි.'' යනුවෙනි. එහිදී බුදුරජාණන් වහන්සේ ඔහුට උපමාවකින් මේ කරුණ පැහැදිලි කිරීමට මෙසේ වදාළහ.

බුදුහු - වච්ඡ, හිතන්න ඔබ ඉදිරියේ ගිනිගොඩක් දැල්වෙනවා කියලා. යම් කෙනෙක් ඇහුවොත් මේ ගිනිගොඩ දැල්වෙන්නේ කුමක් නිසාද? කියලා ඔබ මොකක්ද දෙන උත්තරේ?.

වච්ඡ - යම් කෙනෙක් මගෙන් එසේ ඇසුවොත් මම කියන්නේ මේ ගිනිගොඩ තණ කොළ ආදිය නිසා හෙවත් ඉන්ධන නිසා දැල්වෙන බවයි.

බුදුහු - හොඳයි ඒ ගිනිගොඩ නිවෙනවා. ඔබ දන්නවාද ඒ ගිනිගොඩ නිවෙනවා කියලා.

වච්ඡ - ඔව් එසේ ගිනිගොඩ නිවෙනවා නම් මම දන්නවා එය නිවෙනවා කියලා.

බුදුහු - යමෙක් ඇහුවොත් ඒ නිවුණ ගින්න මොන දිසාවට ද ගියේ කියලා පෙරදිගට ද, බටහිර දිගට ද උතුරු දිගට ද, දකුණු දිගට ද කියලා, එසේ ඇසුවොත් ඔබ මොකද කියන්නේ?

වච්ඡ - භවත් ගෞතමයිනි, එසේ ඇසීම අදාළ වෙන්නේ නැහැ. ගෞතමයෙනි, යම් තණකොළ ආදිය හේතුකොටගෙන ඇවිලුණේද ඒවායේ අවසන් වීම නිසා, ඇවිලීමට අවශ්‍ය ආහාර නැතිවීම නිසා, ඒ ගින්න නිවිලා ගියා. කියලයි කියන්න තියෙන්නේ.

බුදුහු - අන්න ඒවගේ තමයි වච්ඡ තථාගතයන් වහන්සේත් (රහතන් වහන්සේත්). යම් රූපයක් නිසා තථාගත යැයි පැණවීමක් තිබුණි නම් ඒ රූපය නැතිව ගියා, හරියට තල්ගහක් මුලින්ම

කපලා දැම්මා වගෙයි. නැවත දළු දැමීමක් නැහැ. නැවත ඉපදීමක් නැහැ. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන සියල්ලම එසේයි. ඒ රූප වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ යන කිසිවක් ඒ සංඛ්‍යාවට ගැනීමක් නැත. හෙතෙම සියල්ලෙන් මිදුණි (රූප සංඛා විමුත්තෝ, වේදනා සංඛාවිමුත්තෝ, සඤ්ඤා සංඛාවිමුත්තෝ, සංඛාර සංඛාමුත්තෝ, විඤ්ඤාණ සංඛාවිමුත්තෝ). ඒ තථාගතයන් වහන්සේ මෙසේ යැයි ගණනය කළ නොහැක. මහා සමුද්‍රයමෙනි. ගම්භීරයි, අප්‍රමාණයි, මෙච්චරයි මෙපමණයි කියා ප්‍රකාශ කළ නොහැක.[11]

සුත්ත නිපාතයේ උපසීව සූත්‍රයට අනුව උපසීව නම් තරුණයෙක් වරක් බුදුරජාණන් වහන්සේ ගෙන් මෙසේ විචාළේය. ''සමන්ත චක්ඛු වූ බුදුරජාණන් වහන්ස, යම් කෙනෙක් පිරිහීමට පත් නොවී, ආකිඤ්ච ඤ්ඤායතනයේ වර්ෂවලින් මුළු යුගයක්ම සිටියොත් එතැන්දීම සිසිල් බවට පත්ව මිදුණ කෙනෙක්ව නිවණට පත්වෙනවද? එබඳු පුද්ගලයාගේ විඤ්ඤාණය අභාවයට යනවද?'' එවිට බුදුපියාණෝ මෙසේ වදාළහ.

''අච්චී යථා වාතවේගෙන ඛිත්තා
අත්ථං පලෙති න උපෙති සංඛං
ඒවං මුනි නාම කායා විමුත්තෝ
අත්ථං පලෙති නඋපෙති සංඛා''[8]

එහි අදහස මෙසේය. ''යම් සේ වාත වේගයෙන් නිවා දමන ලද ගිනි දැල්ලක් අභාවයට යන්නේද, එවිට ඒ ගිනිදැල්ලට වූ දෙය දැන ගත හැකි නොවන්නේ යම් සේද, එසේම නාම කායයෙන් මිදුණු ඒ මුනිවරයා

අභාවයට යන්නේය. එතුමාට වූ දෙයක් දැන ගත හැකි නොවේ.''

මේ අනුව නාම කායයෙන් මිදුණ මුනිවරයා හෙවත් රහතන් වහන්සේ ගැන සෙවීමෙන් පළක් නැත. ඒ උතුමෝ මෙලොව වාසය කරන්නේ මේ පඤ්චස්ඛන්ධය ඇති තාක් පමණි. ඒ දරන්නේ අන්තිම දේහයයි. ඒ දේහයේ නික්මීමත් සමග උන්වහන්සේගේ නික්මීම ද සිදුවේ.

සුත්ත නිපාතයේම වංගීස සූත්‍රයට අනුව තම ගුරුවරයාණන් වූ නිග්‍රෝධ කප්ප මහ තෙරුන් වහන්සේ පිරිනිවීමට පත්ව නොබෝ කලකින් වංගීස තෙරණුවෝ භාවනාවෙහි යෙදී සිටිද්දී මෙසේ සිතන්නට විය. ''මගේ උපාධ්‍යායයන් වහන්සේ පිරිනිවන් පෑව ද නැද්ද?'' මෙසේ සිතා වංගීස හිමියෝ අපගේ තථාගත බුදුරජාණන් වහන්සේ හමුවීමට ගියහ. මෙම භික්ෂුව සම්බුද්ධ ශාසනයේ සිටි ශ්‍රේෂ්ඨ කවියෙකි. ඒ අනුව එදා බුදුරජාණන් වහන්සේ වෙත ගොස් ද විවිධාකාරයෙන් බුදුගුණ ගයා මෙසේ කීවේය. ''ස්වාමීනි, නිග්‍රෝධ කප්පායනයෝ අරහත් බව පිණිස මාර්ග බ්‍රහ්ම චර්යාවෙහි නිරත විය. කොහොමද එය උන්වහන්සේට අර්ථ පිණිස වුයේද? හෙතෙම අනුපදිසේසව පිරිනිවන් පෑවද, නැද්ද?''එවිට බුදුපියාණෝ මෙසේ දේශනා කළහ.

''උන්වහන්සේ දිගුකලක් තිස්සේ මේ නාම රූප දෙකෙහි ඒ අනුවම අනුසය වශයෙන් නිදාගෙන සිටි තණ්හාව සම්පූර්ණයෙන්ම සිඳ බිඳ දැම්මා. ජාතිමරණ ඉතිරි නැතිවම තරණය කළා.''

(අච්ජෙච්ඡි තණ්හං ඉධ නාම රූපෙ
කණ්හසස සොතං දීඝරත්තානුසයිතං
අතාරි ජාතිමරණං අසෙසං
ඉච්චබ්‍රවී භගවා පඤ්චසෙට්ඨො)[12]

සුත්ත නිපාතයේ පාරායන වර්ගයේ අජිත සූත්‍රයෙන් ද අපට මේ කරුණ සම්බන්ධයෙන් ඉතාමත්ම වැදගත් විවරණයක් සොයාගත හැකිය. ඒ මෙසේය. අජිත නම් තරුණයෙක් තවත් තරුණ ශිෂ්‍යයන් පහළොස් දෙනෙක් සමග බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ විවිධ ප්‍රශ්න ඇසීය. ඒ ප්‍රශ්න වලින් එකක් මෙසේය.

''නිදුකාණන් වහන්ස, ප්‍රඥාව ද සිහිය ද නාම රූපය ද යන මේවා ඉතිරි නැතිව නිරෝධයට පත්වෙන්නේ (නැතිවෙන්නේ) කොහේදීද?''

(පඤ්ඤා චෙව සතී චෙව - නාමරූපඤ්ච මාරිස
එතං මෙ පුට්ඨො පබ්‍රෑහි - කත්ථෙතං උපරුජ්ඣති)

එවිට බුදුහු මෙසේ වදාළහ.

'' යම් තැනක නාමය ද රූපය ද ඉතිරි නැතිව නිරෝධයට පැමිණේ ද, විඤ්ඤාණයේ නිරෝධයෙන් එය එහිම නිරෝධයට පත්වේ.''

(යත්ථ නාමඤ්ච රූපඤ්ච අසේසං උපරුජ්ඣති
විඤ්ඤාණස්ස නිරෝධෙන එත්ථෙතං උපරුජ්ඣති)[13]

සියලු උපාදානයන්ගෙන් තොරවූ මහරහත් උතුමන්ගේ ස්වභාවය කිසිවෙකුටත් ගණනය කිරීමට

නොහැක. උන්වහන්සේගේ විඤ්ඤාණය අනන්තයි. සියලු දිසාවෙන්ම ප්‍රභාස්වරයි. ඒ අනිදස්සන විඤ්ඤාණයේ ස්වභාවයයි. නිවන් අවබෝධ කරගත් ඒ මහරහත් උතුමෝ නැවත සසරට එන්නේ නැත. ''ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති'' යනුවෙන් දක්වන පරිදි උන්වහන්සේ ජාතිය හෙවත් නැවත ඉපදීම නැති කළේය. බඹසර හැසිරුණේය හෙවත් ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය සම්පූර්ණ කළේය. කළ යුතු සියල්ල කළේය. නැවත කිරීමට දෙයක් නැත. උන්වහන්සේ සියල්ලෙන්ම මිදුණේය. විමුක්තියට පත්වූයේය. විමුක්තියට පත්වූ නිසා ඒ සිත විමුක්තියට පත්වූ බව දැන ගත්තේය. (විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති) උන්වහන්සේගේ විමුක්ති සැපය ලබාගත් දවසේ සිට මරණය තෙක් විමුක්ති සුව වින්දේය. මරණින් පසු නැවත භවයට හෙවත් සසරට පැමිණීමක් නැත.

අපේ බුදුහාමුදුරුවෝ සම්මා සම්බුද්ධත්වයට පත්වෙමින් එදා දඹදිව බුද්ධගයාවේදී ඒ උතුම් විමුක්ති සුවයට පත්වූ සේක. එතැන් පටන් අසූවයස් සපිරීමෙන් ස්ඛන්ධ පරිනිර්වාණයට හෙවත් අනුපදිසේස පරිනිර්වාණයට පත්වීම දක්වා උන්වහන්සේ ඒ අමාසැප හෙවත් විමුක්ති සුවය වින්දහ. අපගේ තථාගත ලොවුතුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ එදා මහාපරිනිර්වාණයට පත්වූ ආකාරය අවබෝධ කරගැනීමෙන් අපට මේ ස්ඛන්ධ පරිනිර්වාණය හෙවත් අනුපදිසේස පරිනිර්වාණය කුමක්දැයි තේරුම්කරගත හැකිය. එබැවින් අපි දැන් අපේ බුදුහාමුදුරුවෝ වසර හතළිස් පහක් තිස්සේ අපට, ලෝකයාට, මහත් අනුකම්පාවෙන් දහම් දේශනා කරමින් වැඩසිට එදා

කුසිනාරාවේ මල්ල රජදරුවන්ගේ උපවර්තන නම් වූ සල් උයනේදී අනුපාදිසේස පරිනිර්වාණයෙන් පරිනිර්වාණයට පත් වූ ආකාරය දැනගනිමු.

(3). අපේ බුදුහාමුදුරුවෝ තම අවසන් කාලය ගත කළ ආකාරය හා සම්බුද්ධ පරිනිර්වාණය

ඔබත් දන්නා පරිදි, අපේ බුදුහාමුදුරුවෝ පන්සාළිස් වසක් මුළුල්ලේ දහම් අමා වැසි වස්සවා, සකල ලෝ සත වෙත පතළ මහා කරුණාවෙන් දහම් මග කියා දී තමන්වහන්සේට වයස අවුරුදු අසූවක් ගත වූ අවස්ථාවේ ඈත පිටිසර ප්‍රදේශයක් වූ කුසිනාරාවේදී මහ පොළොව කම්පා කරමින් සියලු පෘථග්ජන හදවත් කම්පා කරමින් ලොවම ආලෝකවත් කළ පහණ නිවීගියාසේ සියලු සංස්කාර ධර්මයන්ගේ අනිත්‍යබව ප්‍රකට කරමින් පිරිනිවන් පා වදාළ සේක.

එදා ඒ පරිනිර්වාණ මඤ්චකය දක්වා වැඩම කළ මග විවිර කරගැනීම බුදුරජාණන් වහන්සේගේ සුවිශේෂත්වය හදුනාගැනීමට ද මහත් සේ උපකාරවන බැවින් අපි ඒ ගමන් මග දීඝනිකායේ මහා පරිනිබ්බාණ සූත්‍ර දේශනයේ [11] සඳහන් වෙන ආකාරයෙන් එහෙත් කෙටියෙන් දැන් ටිකක් තේරුම් ගනිමු.

මහා පරිනිර්වාණ සූත්‍රදේශනය ආරම්භ වෙන්නේ අපගේ ශාන්තිදායකවූ බුදුපියාණෝ රජගහ නුවර ගිජ්ඣකූට පර්වතයේ වැඩ සිටින සමයක අජාසත් මහරජුගේ මහ ඇමති වස්සකාර නම් බමුණු තෙමේ බුදුරජාණන් වහන්සේ වෙත ගොස් කළ ප්‍රකාශයකිනි. හෙතෙම එහි ගොස් ප්‍රකාශ කරන්නේ අජාසත් මහරජු

වජ්ජීන් මැඩලීමට හෙවත් විනාශ කිරීමට යන බවය. එවිට බුදුපියාණෝ තමන් වහන්සේට පවන් සළමින් වැඩසිටි ආනන්ද හිමියන් අමතා ''ආනන්ද සප්ත අපරිහානිය ධර්මයන් අනුගමනය කරන තෙක් වජ්ජීන් විනාශ කළ නොහැක.'' යනුවෙන් දේශනා කළහ. එම සප්ත අපරිහානිය ධර්ම අදත් ඕනෑම ආයතනයක, සංවිධානයක, සමාජයක, අනුගමනය කරන්නේ නම් ඒ ආයතනයේ, සංවිධානයේ, සමාජයේ, නොපිරිහීමටම හේතු වන්නේය.

එම අපරිහානිය ධර්ම හත මෙසේය.

1. නිතර නිතර රැස්වීම් පැවැත්වීම.

2. සමඟිව රැස්ව, සමඟිව කටයුතු කොට සමඟිව විසිර යෑම.

3. නොපැනවූ නීති නොපැනවීම, පෙර සිට පැනවූ නීති කඩ නොකර ඒ ආකාරයෙන්ම ආරක්‍ෂාකිරීම.

4. තමන්ගේ වැඩිහිටි අයට සැළකීම, සත්කාර සම්මාන කිරීම, හෙවත් වැඩිහිටියන් පිදීම.

5. තමන්ගේ කුලයේ ස්ත්‍රීන් ආරක්‍ෂාකිරීම, ඔවුන්ට බලහත්කාර කම් නොකිරීම, බලෙන් පැහැරගෙන ගොස් තමන් වසඟයේ තබා නොගැනීම.

6. තමන්ගේ පෙරසිට පැවති යම් පූජනීය ස්ථානයන් වේද ඒවාට සත්කාර කිරීම, ගරු කිරීම, බුහුමන් කිරීම, පුද පූජා ආදිය පැවැත්වීම.

7. තමන්ගේ විජිතයෙහි, දේශයෙහි, වැඩසිටින රහතන් වහන්සේලාට පැවිදි උතුමන්ට ධාර්මික රැකවරණයන් සැලසීම මෙන්ම තම විජිතයට පැමිණෙන එවැනි උතුමන්ට ද ධාර්මික රැකවරණයන් සැළසීම.

මේ කරුණු හත අසා වස්සකාර බමුණුතෙමේ පිටත්ව ගිය පසු බුදුපියාණෝ ආනන්ද හිමියන් අමතා ''ආනන්ද යන්න, ගිහින් මේ රජගහනුවර ඇසුරු කරමින් වැඩ සිටින භික්ෂූන් වහන්සේලා යම්තාක් වේද ඒ සියලුම දෙනා උපස්ථාන ශාලාවට රැස්කරවන්න'' යැයි වදාළහ. එවිට ආනන්ද හිමියන් එසේ කළහ. ඒ අනුව අපේ බුදුහාමුදුරුවෝ ඒ සියලු භික්ෂූන් වහන්සේලා අමතා භික්ෂූන් වහන්සේලාට ද අපරිහානිය ධර්ම හතක් දේශනා කළහ. ඒ අපරිහානිය ධර්ම හත මෙසේය.

1. යම්තාක් භික්ෂූන් නිතර නිතර රැස්වන්නේ නම් එය නොපිරිහීමට කරුණකි.

2. යම්තාක් භික්ෂූන් වහන්සේලා සමඟිව රැස්ව, සමඟිව සංඝකර්ම කරමින් සමඟිව විසිර යයි ද එය නොපිරිහීමට කරුණකි.

3. යම්තාක් භික්ෂූන් නොපැනවූ ශික්ෂා ආදිය නොපනවන්නේ ද පැනවූ ශික්ෂා ආදිය කඩ නොකොට ඒ ආකාරයෙන්ම අනුගමනය කරන්නේ ද එය නොපිරිහීමට කරුණකි.

4. යම් තාක් භික්ෂූන් වහන්සේලා තමන් වහන්සේලා අතර බොහෝ කාලයක් පැවිද්ද ආරක්ෂාකරමින් සංඝ

පීතෘෲන් වහන්සේලා වශයෙන් සංඝනායකයාණන් වහන්සේලා වශයෙන් වැඩසිටින මහ තෙරවරුන්ට සත්කාර කරන්නේ ද ගරුකරන්නේ ද මානන පූජන ආදිය කරන්නේ ද එය නොපිරිහීමට කරුණකි.

5. යම්තාක් භික්ෂූන් වහන්සේලා පුනර්භවය සකස් කොට දෙන උපන් තණ්හාවේ වසඟයට නොයත් ද එය නොපිරිහීමට කරුණකි.

6. යම්තාක් භික්ෂූන් වහන්සේලා ආරණ්‍යවල, සේනාසනවල, මාර්ග එලාදිය අපේක්ෂා සහිතව වැඩ වාසය කරන්නේ ද එය නොපිරිහීමට කරුණකි.

7. යම්තාක් භික්ෂූන් වහන්සේලා සපැමිණි සුපේශල සබ්‍රහ්මචාරීන් වහන්සේලා (එකට වැඩ සිටින අය) සුවසේ පහසු විහරණය කරත්වා, නොපැමිණි සුපේශල බ්‍රහ්මචාරීන් වහන්සේලා සුවසේ වැඩම කරත්වා යැයි සිහි නුවණින් යුක්ත වෙද්ද එය නොපිරිහීමට කරුණකි.

මෙසේ භික්ෂූන් වහන්සේලා අමතා තව තවත් අපරිහානිය ධර්ම රාශියක් දේශනා කළ බුදුපියාණෝ තවදුරටත් භික්ෂූන් වහන්සේලාට සීල, සමාධි, පඤ්ඤා යන ත්‍රිවිධ ශික්ෂාව වැඩීම නිසා කාමාසව, භවාසව, අවිජ්ජාසව යන සියලු ආසව ධර්මයන්ගෙන් මිදීමේ මග කියා දෙමින් රජගහනුවර ගිජුකුළ පව්වෙහිම වාසය කළහ.

අනතුරුව අපේ බුදුහාමුදුරුවෝ ආනන්ද හිමියන් සමග අම්බලට්ඨිකා නම් උයනට වැඩම කළහ. එහිදීද

බොහෝ භික්ෂූන්ට සීල, සමාධි, පඤ්ඤා වැඩීමේ වැදගත් කම පැහැදිලි කරමින් දහම් දේශනා කළහ. එහිදී බුදුහු ආනන්ද හිමියන් අමතා ''ආනන්ද දැන් අපි නාලන්දාවට යමු'' යැයි යෝජනා කළහ. ඒ අනුව ආනන්ද හිමියන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා ද සමග නාලන්දාවට වැඩම කොට එහි පාවාරික නම් අඹවනයෙහි වැඩ සිටිසේක.

නාලන්දාව, අපේ සාරිපුත්ත මහරහතන් වහන්සේගේ ගම් ප්‍රදේශයයි. එහිදී සාරිපුත්ත මහරහතන් වහන්සේ බුදුපියාණන් වහන්සේ වෙත වැඩම කොට ''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස මම මෙසේ මහත් ප්‍රසාදයට පත්වුයෙමි. භාග්‍යවතුන් වහන්සේට වඩා සම්බෝධියෙන් උතුම් වු වෙනත් සමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ කිසිම කෙනෙක් මෙයට පෙර සිටියෙත් නැහැ. මතු ඇතිවෙන්නේත් නැහැ. දැනට ඇත්තේත් නැහැ.'' යනුවෙන් මහා සිංහනාදයක් පැවැත්වූහ. එවිට බුදුහු සාරිපුත්ත මහරහතන් වහන්සේ අමතා එය ඒකාංශවාදී හෝ අන්තවාදී හෙවත් ආදානග්‍රාහී ප්‍රකාශයක් නේද? යැයි විචාළ කල්හී සැරියුත් මහරහතන් වහන්සේ ප්‍රකාශ කළේ එය එසේ දේශනා කිරීමට තරම් තමන්වහන්සේට හැකියාව ලැබුණේ තම ''ධර්මන්වය'' හෙවත් ධර්මය පිළිබඳව ඇතිවූ නිවැරදි, පැහැදිලි, පිරිසිදු, දැනුම හෙවත් අනුබෝධඤාණය නිසා බවය.

නාලන්දාවේ කැමතිසේ වැඩ සිට ආනන්ද හිමියන් අමතා ''ආනන්ද දැන් අපි පාඨලීගමට යමු ද?'' යැයි යෝජනා කළහ. ඒ අනුව මහත් භික්ෂූන් වහන්සේලා පිරිසක් ද සමග පාඨලී නම් ගමට වැඩම කළහ. මේ අශෝක රජු සමයේ පාඨලීපුත්‍ර නමින් ද වර්තමානයේ

පැට්නා නමින් ද හඳුන්වන නගරයයි. බුදුහු පාඨලී නම් ගමට වැඩම කළ විට එහි සිටි ජනතාව බුදුරජාණන් වහන්සේගේ ආගමනය අසා උන්වහන්සේ වෙත පැමිණ ආවාස ගෙයක් කරවා පූජාකළෝය. එම ආවාසයේදී බුහුදු එම උපාසකයන් අමතා සීලයෙන් තොරවූ දුශ්ශීලයාට සිදුවන සීල විපත්ති පහක් සහ සීලවන්තයාට සිල්වත් බව නිසා ඇතිවෙන ආනිසංස පහක් දේශනා කළහ. මෙසේ රාත්‍රිය බොහෝ කාලයක් ඉක්ම යන තෙක් ම අපේ බුදුහාමුදුරුවෝ ඒ පිරිසට දහම් දෙසුහ.

අපේ බුදුහාමුදුරුවෝ මෙසේ මේ පාඨලීගාමයෙහි වැඩ වසන සමයෙහි සුනීධ හා වස්සකාර යන මහ ඇමති වරු දෙපොළ නගර නිර්මාණයට පැමිණි අතර ඔවුහු බුදුරජාණන් වහන්සේ පසුපසින් ගොස් බුදුරජාණන් වහන්සේ යම් දොරකින් නික්මුණේ ද ඒ දොර ''ගෞතමද්වාර'' යැයි නම් කළහ. යම් තොටුපළකින් ගංගානම් නදිය තරණය කළේද ඒ තොටුපළ ''ගෞතම තීර්ථය'' යැයි නම් කළහ. මෙසේ බුදුහු ගංගානදිය වෙතට පැමිණි විට ගංගානදිය ඉවුරු මට්ටමට ම පිරී ගළා බසිමින් තිබුණි. එවිට බොහෝ දෙනා එතෙරට යාම පිණිස විවිධාකාරයෙන් ඔරු පාරු සකස් කරමින් සිටියදී අපේ ශාන්ති දායක වූ බුදුහාමුදුරුවෝ තම භික්ෂූන් වහන්සේලා ද සමග මෙතෙරින් අතුරුදහන්ව එතෙර පෙනී සිටියහ. සියල්ලෝ ම මහ පුදුමයෙන් බලා සිටියහ.

ගංගා නදියෙන් එතෙර වූ බුදුපියාණෝ ආනන්ද හිමියන් අමතා '' ආනන්ද අපි කෝටි ගාමයට යමුද?'' යැයි යෝජනා කළහ. ඒ අනුව මහත් භික්ෂු පිරිස ද සමග කෝටිගාමයට වැඩම කළහ. එහිදී භික්ෂූන් වහන්සේලා

අමතා මෙසේ ඉතාමත්ම වැදගත් දේශනයක් කළහ.

''පින්වත් මහණෙනි, මෙච්චර කාලයක් තිස්සේ ඔබලාත් මමත් මේ තරම් දීර්ඝ කාලයක් සසර සැරිසැරුවේ, දිව්වේ, මේ චතුරාර්‍ය සත්‍යය ධර්මය අවබෝධ නොකළ නිසයි, ප්‍රතිවේධ නොකළ නිසයි.''

මෙසේ කෝටිගාමයෙහි වැඩ සිටිද්දී ද බොහෝ භික්ෂූන් වහන්සේලාට සීල, සමාධි, පඤ්ඤා වැඩීමේ වැදගත් කම දේශනා කළහ.

කෝටිගාමයෙහි කැමති තාක් කල් වැඩ සිටි අපේ බුදුහාමුදුරුවෝ ආනන්ද හිමියන් අමතා ''ආනන්ද දැන් අපි නදීකාවට යමුනේද?''' යැයි යෝජනා කළහ. ඒ අනුව නදීකාවට වැඩම කොට එහි වැඩ සිටියහ. එහිදී ආනන්ද හිමියන් වෙත පැමිණි විවිධ අය තමන්ගේ පරලොව සැපත් ඥාතීන්ට මොකද වුණේ, ඒ අය කොහෙද ඉපදුණේ යැයි බුදුපියාණන්ගෙන් අසන්න යැයි ආයාචනා කළහ.

එවිට ආනන්ද හිමියෝ බුදුපියාණෝ වෙත පැමිණ සාළ්හ නම් භික්ෂුව ද , නන්දා නම් භික්ෂුණිය ද, සුදත්ත නම් උපාසක ද, සුජාතා නම් උපාසිකාව ද, කකුධ නම් උපාසක ද, කාලිංග නම් උපාසක ද, නිකට නම් උපාසක ද, කටිස්සභ නම් උපාසක ද, තුට්ඨ නම් උපාසක ද, සන්තුට්ඨ නම් උපාසක ද, භද්ද නම් උපාසක ද, සුභද්ද නම් උපාසක ද, යන අය මිය ගොස් ඇති බවත් ඒ අයගේ උපත සිදුවුයේ කොයි ආකාරයෙන් ද යනුවෙන් දේශනා කරන ලෙසත් ඉල්ලා සිටියහ. ඒ අනුව බුදුහු ඒ ගැන දේශනා කොට අනතුරුව

මේ නදිකාවේ ම පනහකට වැඩි උපාසක පිරිසක් කළුරිය කොට ඕරම්භාගිය සංයෝජන නැති කිරීමෙන් සුද්ධාවාසයෙහි උපත ලැබූ බවත්, එහිදී පිරිනිවනට පත්වෙන බවත්, අනූවකට වැඩි පිරිසක් සකදාගාමී වී කළුරිය කළ බවත් ඒ අය නැවත එක් වරක් මෙහි පැමිණෙන බවත්, පන්සියයකට වැඩි පිරිසක් සෝවාන් වී කළුරිය කළ බවත් ඒ අනුව අපායෙහි නොවැටෙන බවත් අනිවාර්යයෙන් ම සම්බෝධිය කරා යන බවත් දේශනා කොට මෙසේ වදාළහ. '' ආනන්ද මෙසේ මිය යන අයගේ තොරතුරු ඇසීමට පැමිණීම තථාගතයන් වහන්සේට අපහසුවක්. ඒනිසා 'මින් මතු මම නිරයෙහි ඉපදෙන්නේ නෑ. මින් මතු මම තිරිසන් යෝනියෙහි ඉපදෙන්නේ නෑ, මින් මතු මම ප්‍රේත ලෝකයෙහි ඉපදෙන්නේ නෑ. මින්මතු මම කිසිම අපායක ඉපදෙන්නේ නෑ. නියත වශයෙන් ම සම්බෝධියට පත්වෙමි.' යනුවෙන් තමන්ට ම තමාගැන කිව හැකි වන සේ ධර්ම ආදාසයක් හෙවත් දහම් කැඩපතක් වෙන්න''යැයි දේශනා කළහ. ඒ දහම් කැඩපත යනු සෝවාන් තත්වයට පත්වීමයි. ඒ සඳහා අවශ්‍ය කරුණු හතරක් මෙහිදී දේශනා කළහ. එනම්,

1. බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචල ශ්‍රද්ධාව,
2. ධර්ම රත්නය කෙරෙහි අචල ශ්‍රද්ධාව,
3. සංඝ රත්නය කෙරෙහි අචල ශ්‍රද්ධාව,
4. අරියකාන්ත සීලයෙන් යුක්ත විම. යන හතරයි.

මෙසේ අපේ බුදුහාමුදුරුවෝ නදීකාවෙහිද කැමති පරිදි වැඩ සිට ආනන්ද හිමියන් අමතා ''ආනන්ද දැන් අපි වේසාලියට යමුද?'' යැයි යෝජනා කළහ. ඒ අනුව ආනන්ද හිමියන් ප්‍රමුඛ මහත් භික්ෂු පිරිසක් ද සමග

වේසාලියට වැඩම කොට එහි අම්බපාලියගේ අඹවනයෙහි වැඩසිටිසේක.

මෙහිදී අපේ බුදුහාමුදුරුවෝ අපට දේශනා කළ සුවිශේෂම දෙය මෙන්න. ''සතො භික්ඛවෙ භික්ඛු විහරෙය්‍ය සම්පජානො. අයං වෝ අම්හාකං අනුසාසනී.'' මෙහි තේරුම ''පින්වත් මහණෙනි, සිහියෙන් හා නුවණින් යුතුව වාසය කරන්න. මේ ඔබලාට අපගේ අනුශාසනයයි.''

මෙහි සිහි නුවණින් යනු සතිසම්පජඤ්ඤයෙන් යුතුව වාසය කිරීමයි. මේ සිහියෙන් හා නුවණින් හෙවත් සතිසම්පජඤ්ඤයෙන් වාසය කිරීම යනු අන් කවරක්වත් නොව සතර සතිපට්ඨානයෙන් යුතුව වාසය කිරීම බව අපගේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ එහිදීම දේශනා කළහ.

බුදුරජාණන් වහන්සේ භික්ෂු මහා සංඝරත්නයත් සමග තමන්ගේ අඹ උයනට පැමිණ වැඩ සිටින බව අම්බපාලී ගණිකාවට අසන්නට ලැබුණි. ඒ අනුව ඇය එහි ගොස් මහත්සේ සතුටුව දහම් කතාවන්ට සවන් යොමුකොට පසුදින දානයට ආරාධනා කළාය. බුදුහු එම ආරාධනය නිහඬව සිටිමින් භාරගත්හ. ඇය ගිය පසු වේසාලියේ ලිච්ඡවීහු ද බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ පසුදින දානයට ආරාධනා කළහ. එහෙත් බුදුපියාණෝ ඒ වනවිට අම්බපාලි ගණිකාවගේ දානය පිළිගෙන තිබූ නිසා මේ රජදරුවන්ගේ දානය පිළිගත්තේ නැත. එදා ලිච්ඡවී රජදරුවන් තමන් වහන්සේ වෙත පැමිණෙන ආකාරය දැක බුදුරජාණෝ භික්ෂූන් වහන්සේලා ඇමතූහ. ''පින්වත් මහණෙනි, යම්

කෙනෙක් තාවතිංසයේ දෙවිවරු දැකලා නැත්තම් මෙන්න මේ ලිච්ඡවී පිරිස බලන්න. තාවතිසංසයේ දෙවිවරුත් මෙන්න මේ වගේ තමයි.'' යැයි දේශනා කළහ. මෙසේ බුදුහු මෙහිදී ද භික්ෂුන් වහන්සේලාට සීල, සමාධි, පඤ්ඤා වැඩීමේ වැදගත්කම පෙන්වා දෙමින් දහම් දෙසමින් වැඩසිටියහ.

එහි ද කැමති පරිදි වැඩ සිට ආනන්ද හිමියන් අමතමින් ''ආනන්ද දැන් අපි බේලුව ගමට යමුද?'' යැයි යෝජනා කළහ. ඒ අනුව මහත් භික්ෂු පිරිසක් සමග බේලුව ගමට වැඩම කළහ. එහිදී භික්ෂුන් ඇමතූ බුදුපියාණෝ '' පින්වත් මහණෙනි, මේ වේසාලියෙහි යම්සේ මිත්‍රයන් වෙත් ද සම්බන්ධතා ඇති අය වෙත් ද එකට අනුභව කරන දැඩි මිතුරු සබඳතා ඇති අය වෙත් ද ඒ අය සමග වස් වසන්න. මම ද මෙහිම මේ බේලුව ගමෙහිම වස් වසමි.'' යැයි දේශනා කළහ. ඒ අනුව බුදුහු බේලුව ගමෙහි වස් විසූහ. මෙසේ වස් විසූ බුදුරජාණන් වහන්සේට එහිදී දැඩි සේ, මරණාන්තිකව, අසණීප විය. එහෙත් අපේ බුදුහාමුදුරුවෝ සිතෙහි කිසිම විපිළිසර බවක් නැතිව ඒ සියලු වේදනා සිහිනුවණින් යුතුවම ඉවසා වදාළහ.

අපේ බුදුහාමුදුරුවෝ මේ අවස්ථාවේ දී මෙසේ සිතූහ. ''මෙහිදී මා උපස්ථායකාදී භික්ෂූන්ට නොදන්වාම පිරිනිවන් පාන්නේ නම් එය නොගැළපෙන්නකි. එබැවින් මේ ආබාධය වීර්යයීයෙන් මැඩපවත්වා ජීවිත සංස්කාර අධිෂ්ඨාන කොට (තව දුරටත් ජීවත් වෙන්නෙමි යැයි අධිෂ්ඨාන කොට) වාසය කළ යුතුයි.'' යනුවෙනි. එසේ සිතා ඒ අනුව තව දුරටත් ජීවත් වෙන්නෙමි යැයි අධිෂ්ඨාන කොට වාසය කළහ.

එසේ ආබාධයෙන් තොරවූ කල්හී අපේ බුදුහාමුදුරුවෝ විහාරයෙන් පිටපැත්තෙහි විහාර සෙවනෙහි පනවනලද ආසනයෙක වැඩ සිටිසේක. එවිට ආනන්ද හිමියෝ එතැනට පැමිණ වැඳ මෙසේ කීහ. ''ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ පහසුව සිටින බව දුටිමි. භාග්‍යවතුන් වහන්සේගේ ඛමනීය බව දුටිමි. ඒත් මගේ මුළු ශරීරයම මත්වෙලා වගේ දැනුණා. භාග්‍යවතුන් වහන්සේගේ ගිලන් බව නිසා මට උතුර දකුණ පෙන්නේ නැතිව ගියා. ධර්මය වැටහෙන්නේ නැතිව ගියා. එසේ වුව ද භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා අමතා අවසන් වශයෙන් අවවාදයක් නොවදාරා නම් පිරිනිවන් පාන්නේ නැතැයි සිතා ආශ්වාද මාත්‍රයක් ඇති කරගත්තා.'' යනුවෙනි. එවිට අපේ බුදුහාමුදුරුවෝ ආනන්ද හාමුදුරුවන්ට මෙසේ දේශනා කළහ.

''ආනන්ද භික්ෂු සංඝයා මගෙන් මොනවද බලාපොරොත්තු වෙන්නේ? මම කිසිම හිඩැසක් නැතිව, බාධාවක්, අඩුපාඩුවක් නැතිව, බාහිර දෙයක් නොකොට, ආචාර්ය මුෂ්ඨි නැතිව, ධර්ම ය දේශනා කළා. ආනන්ද යම්කෙනෙකුට හිතෙනවා නම් 'මම භික්ෂුසංඝයා පරිහරණය කරනවා' කියලා හෝ 'භික්ෂු සංඝයා මම උදෙසායි සිටින්නේ' කියලා හෝ හෙතෙම භික්ෂුසංඝයාට කිසිවක් කිව යුතුයි. නමුත් ආනන්ද තථාගතයන්ට එවැනි අදහසක් නැහැ. ඒ නිසා ආනන්ද තථාගතයන් වහන්සේ භික්ෂු සංඝයාට මොනවා කියන්නද?''

තවදුරටත් අපේ බුදුහාමුදුරුවෝ මෙසේ වදාරති. ''ආනන්ද මම දැන් හොඳටම දිරලා. වසයට ගිහිල්ලා. ජීවිතයේ අවසානයට ඇවිල්ලා. මගේ වයස දැන්

අසූවයි. ආනන්ද හරියට දිරාපු කරත්තයක් යන්තම් එහෙන් මෙහෙන් බැඳගෙන බොහොම අමාරුවෙන් පදවාගෙන යන්නේ යම් සේද එසේම ආනන්ද තථාගතයන් වහන්සේගේ කයද බොහොම අමාරුවෙන් තමයි මේ පවත්වාගෙන යන්නේ. යම් අවස්ථාවක තථාගතයන් වහන්සේ සියලු නිමිති සිහිනොකොට එකම වූ වේදනාවන්ගේ නිරෝධයට සිත යොමු කොට චිත්ත සමාධියට පත්ව වාසය කරන්නේ ද හෙවත් සඤ්ඤාවේදයිත නිරෝධයට සමවැද වාසය කරන්නේද එවිට තථාගතයන් වහන්සේගේ කයට මහත් පහසුවක් දැනේ. මේ නිසා ආනන්ද තමන්ම තමාට දිවයිනක් මෙන් වාසය කරන්න. තමාට තමාම සරණ කරගන්න. වෙනත් කෙනෙක් සරණ යන්න එපා. ධර්මය දිවයිනක් කොට වාසය කරන්න. ධර්මය සරණ යන්න. වෙනත් දෙයක් සරණ කරගන්න එපා.'' (අත්තදීපා විහරථ අත්තසරණා අනඤ්ඤසරණා, ධම්මදීපා ධම්මසරණා අනඤ්ඤසරණා).

මෙසේ තමාට තමාම පිහිට කරගන්නේ කෙසේද ධර්මය පිහිට කරගන්නේ කෙසේද යන්න ද පැහැදිලි කළ අපේ බුදුහාමුදුරුවෝ අපට දේශනා කළේ සතර සතිපට්ඨානයෙන් යුතුව වාසය කරන්න යන්නය. ඒ බුදුපියාණන් වහන්සේ විසින් මහත් කරුණාවෙන් අපට දේශනා කළ ඒ ශ්‍රේෂ්ඨ අවවාදය අපිත් මහත් ගෞරවයෙන් යුතුව දොහොත් මුදුන් දී හිස් මුදුනින්ම පිළිගනිමු. ඒ අනුව අපේ ජීවිත ධර්මයටම කැප කොට සතර සතිපට්ඨාන වඩමු. ඒ තමාට තමාම පිහිට කරගැනීමයි. ධර්මය පිහිට කරගැනීමයි.

මෙසේ බුදුපියාණන් වහන්සේගේ අසණ්ඛපයෙන්

පසුව නැවත නිරෝගී බවට පත්වූ අතර උන්වහන්සේ නැවත වේසාලියෙහි පිණ්ඩපාතයට ද වැඩම කළහ. අනතුරුව දානයෙන් පසු ආනන්ද හිමියන් ඇමතූහ. ''ආනන්ද නිසීදනය (වාඩිවෙන පත්කඩය)ගන්න. අපි දවල් කාලයේ සුවසේ වාසය කිරීම සඳහා චාපාල චේතියට යමු'' යැයි යෝජනා කළහ. ආනන්ද හාමුදුරුවොත් නීසිදනය ගෙන අපේ බුදුහාමුදුරුවන් වහන්සේගේ පසුපසින් හෙමින් හෙමින් වැඩියහ. මෙසේ අපේ බුදුහාමුදුරුවෝ චාපාල චේතිය නැමති ස්ථානයට වැඩම කොට පනවනලද ආසනයෙහි වැඩ සිටිසේක. අනතුරුව තථාගත බුදුරජාණන් වහන්සේ ආනන්ද හිමියන් අමතා මෙසේ දේශනා කළ සේක.

''ආනන්ද මේ වේසාලිය රමණීයයි. උදේන චේතිය රමණීයයි. ගෝතමක චේතිය රමණීයයි. සත්තම්බ චේතිය රමණීයයි. බහුපුත්ත චේතිය රමණීයයි. සාරන්දද චේතිය රමණීයයි. චාපාල චේතිය රමණීයයි. ආනන්ද යම්කෙනෙක් සතර ඉද්ධිපාද නැවත නැවත වඩලා තියෙනවා නම්, බහුල වශයෙන් වඩලා තියෙනවා නම්, යානයක් වගේ කරගෙන තියෙනවා නම්, වස්තුවක් වගේ තමාට පිහිට පිණිස සකස් කරගෙන තියෙනවා නම්, තමන් අනුව සිටින දෙයක් බවට පත් කරගෙන තියෙනවා නම්, මැනවින් පුරුදු කරගෙන තියෙනවා නම්, මැනවින් ආරම්භ කරලා තියෙනවා නම්, හෙතෙම කැමති නම් කල්පයක් හෝ කල්පයකට වැඩියෙන් හෝ ජීවත්විය හැකිවන්නේය. ආනන්ද තථාගතයන්ගේ සතර ඉද්ධිපාද නැවත නැවත වඩලයි තියෙන්නේ, බහුල වශයෙන් වඩලයි තියෙන්නේ, යානයක් වගේ කරගෙනයි තියෙන්නේ, වස්තුවක් වගේ කරගෙනයි තියෙන්නේ, තමාට පිහිට පිණිස සකස් කරගෙනයි

තියෙන්නේ, තමන් අනුව සිටින දෙයක් බවට පත් කරගෙනයි තියෙන්නේ, මැනවින් පුරුදු කරගෙනයි තියෙන්නේ, මැනවින් ආරම්භ කරලයි තියෙන්නේ. එබැවින් ආනන්ද තථාගතයන් කැමති නම් කල්පයක් හෝ එයිට ටිකක් වැඩියෙන් වුවද ජීවත්විය හැකියි.'' යනුවෙනි.

මෙසේ බුදුරජාණන් වහන්සේ කෙලින්ම නොකියා කිසියම් සංඥාවක් වශයෙන් නිමිත්තක් වශයෙන් තමන් වහන්සේට අවශ්‍ය නම් ආයුෂ් කල්පයකට වඩා වුවද ජීවත්විය හැකි යැයි ප්‍රකාශ කරද්දී ආනන්ද හිමියන්ට ''පින්වත් ස්වාමීනි එසේ නම් භාග්‍යවතුන් වහන්සේ බොහෝ දෙනාට හිත සුව පිණිස ලොවට අනුකම්පා පිණිස දෙව් මිනිසුන්ගේ යහපත පිණිස කල්පයක් වැඩ සිටින සේක්වා'' යනුවෙන් ආරාධනා කළ යුතු යැයි හැඟීමක්, අවබෝධයක් ඇති නොවීය. මේ ආකාරයෙන් බුදුපියාණන් වහන්සේ තෙවරක්ම ප්‍රකාශ කළ ද ආනන්ද හිමියන්ට එවැනි හැඟීමක්, අවබෝධයක් ඇති නොවීය. එයට හේතුව වුයේ ඒ අවස්ථාව වනවිට මාරයා උන්වහන්සේගේ සිත වසඟ කරගෙන සිටීම යැයි මහා පරිනිබ්බාණ සූත්‍රයෙහිම සඳහන් වේ. කෙසේ වුවද ලෝක සත්වයාට එනම් අපට අපේ බුදුහාමුදුරුවෝ දැක ගැනීමට දහම් ඇසීමට තිබුණ ඒ අනඟි අවස්ථාව අහිමි විය. සියල්ලම අනිත්‍යයි.

අනතුරුව අපේ බුදුහාමුදුරුවෝ ආනන්ද හාමුදුරුවන් වහන්සේට ''ආනන්ද එහෙම නම් දැන් ඔබට මෙතැනින් යන්න සුදුසු කාලය බව දැනගන්න'' යැයි ප්‍රකාශ කළහ. ඒ අනුව ආනන්ද හිමියෝ එතැනින් නික්ම ගොස් නුදුරු තැනක එක්තරා ගසක් මුල වැඩ

සිටියේය. ඒ අවස්ථාවේ මාරයා බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ එකත් පසෙක හිටගෙන මෙසේ කීවේය.

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පාන සේක්වා. සුගතයන් වහන්සේ පිරිනිවන් පාන සේක්වා. භාග්‍යවතුන් වහන්සේ දැන් පිරිනිවන් පාන්නට කාලයයි. භාග්‍යවතුන් වහන්සේ මෙවැනි ප්‍රකාශයක් කර ඇත්තාහ. ''පාපී මාරය, මම යම්තාක් මගේ භික්ෂූන් වහන්සේලා ව්‍යක්ත වු විනීත වු විසාරද වු බහුශ්‍රැත වු ධර්මධර වු ධර්මානු ධර්ම ප්‍රතිපන්න වු සාමීචි ප්‍රතිපන්න වු ධර්මයට අනුව හැසිරෙන්නාවු පිරිසක් නොවන්නේ ද තමන්ගේ ආචාර්‍යවාදය ඉගෙනගෙන නොකියන්නාහු ද නොදෙසන්නාහු ද නොපනවන්නාහු ද නොපිහිටන් නාහු ද ප්‍රකට නොකරන්නාහු ද පහළ වු පරප්‍රවාද කරුණු සහිතව මැඩලා ප්‍රාතිහාර්‍ය සහිතව දහම් නොදෙසන්නාහු ද ඒ තාක් තථාගතයන් වහන්සේ පිරි නිවන් පාන්නේ නැත.'' යනුවෙනි. ''එහෙත් දැන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා ව්‍යක්තයි, විනීතයි, විසාරදයි, බහුශ්‍රැතයි, ධර්මධරයි, ධර්මානුධර්ම ප්‍රතිපන්නයි, සාමීචිප්‍රතිපන්නයි, ධර්මයට අනුව හැසිරෙයි, තමන්ගේ ආචාර්‍යවාදය ඉගෙනගෙන ප්‍රකාශකරන අයයි, දේශනා කරන අයයි, මැනවින් පිහිටි අයයි, පහළ වු පරප්‍රවාද මථනය කරමින් කරුණු සහිතව මැනවින් දහම් දේශනා කරන අයයි. භාග්‍යවතුන් වහන්සේ දැන් ඉතින් පිරිනිවන් පාන සේක්වා. සුගතයන් වහන්සේ දැන් ඉතින් පිරිනිවන් පාන සේක්වා. දැන් භාග්‍යවතුන් වහන්සේට පිරිනිවන් පාන්නට කාලයයි.'' භික්ෂුණීන් වහන්සේලා ද ... උපාසකවරු ද.... උපාසිකාවරු ද... දැන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවිකා වු උපාසිකාවෝ ව්‍යක්තයි. විනීතයි.

විසාරදයි... භාග්‍යවතුන් වහන්සේ විසින් ''පාපී මාරය යම්තාක් මාගේ මේ ශාසන මාර්ග බ්‍රහ්මචර්යාව සමෘද්ධ නොවන්නේ ද වෘද්ධියට නොපැමිණෙන්නේ ද විස් තීර්ණ නොවන්නේ ද බොහෝ දෙනා විසින් දැන ගන්නා ලද්දේ නොවන්නේ ද , පෘථුල නොවන්නේද, නුවණැති සියලු දෙව් මිනිසුන් විසින් සුප්‍රකාශිත නොවන්නේ ද ඒ තාක් පිරිනිවන් නොපාන්නෙමි.'' යැයි ප්‍රකාශ කරනලදී. භාග්‍යවතුන් වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේගේ ශාසන මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව සමෘද්ධියට පත්ව ඇත. වෘද්ධියට පත්ව ඇත. විස්තෘත භාවයට පත්ව ඇත. බොහෝ ජනයා අතර පෘථුල වී ඇත. නුවණැති දෙව් මිනිසුන් විසින් සුප්‍රකාශිත ද වේ. එබැවින් දැන් භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පාන සේක්වා. සුගතයන් වහන්සේ පිරිනිවන් පාන සේක්වා. දැන් භාග්‍යවතුන් වහන්සේට පිරිනිවන් පාන්නට සුදුසු කාලයයි.'' යනුවෙනි.

මාරයා මෙසේ කී කල්හී අපේ බුදුහාමුදුරුවෝ මාරයාට මෙසේ කීහ. ''පවිටු මාරය එතරම් කළබලවිය යුතු නැහැ. දැඩි උත්සාහයක් අවශ්‍ය නැහැ. නොබෝ කලකින්ම තථාගතයන්ගේ පරිනිර්වාණය සිදුවන්නේය. මෙයින් මාස තුනක් ඇවෑමෙන් තථාගතයන් වහන්සේ පිරිනිවන් පාන්නේය'' යැයි දේශනා කළහ. ඉක්බිති භාග්‍යවත් වූ බුදුපියාණන් වහන්සේ චාපාල චේතියේ දී සිහිනුවණින් යුතුව ආයුසංස්කාරය අත්හරින ලදී. ඒ සමගම සිරුරේ මයිල් කෙළින් සිටින තරම්, භයානකවූ, මහා භූමිචලනයක් ඇතිවිය. දෙවියන්ගේ බෙර හඬ ද ඇසුණාහ. මේ අවස්ථාවේ ආනන්ද හිමියෝ බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ මේ මහා භූමිචලනයට හේතුව විචාළහ. එහිදී බුදුරජාණන් වහන්සේ භූමිචලනයට හේතු

අටක් ඇති බව පැහැදිලි කළහ. එහිදීම අට පිරිසද, අභිභායතන අට ද, විමෝක්ෂ අට ද, දේශනා කළසේක. අනතුරුව බුදුරජාණන් වහන්සේ ආනන්ද හිමියන් අමතා ''ආනන්ද සම්බුද්ධත්වයට පත්වී මුල් දවස්වලම දිනක් මම උරුවේලාවේ නේරංජරා නදී තීරයෙහි අජපාල නුගරුක මුල වාසය කරනවිට මේ පවිටු මාරයා මා වෙත පැමිණුනා. පැමිණ භාග්‍යවතුන් වහන්සේ දැන් පිරිනිවන්පාන සේක්වා, සුගතයන් වහන්සේ දැන් පිරිනිවන්පාන සේක්වා, දැන් පිරිනිවීමට කාලයයි.'' යනුවෙන් ආයාචනා කළ බව දේශනා කළහ. එසේ දේශනා කොට තවදුරටත් මෙසේ පැවසූහ. ''එසේ කියද්දී ආනන්ද මම 'මගේ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා පිරිස් ව්‍යක්ත, විනීත,විසාරද බහුස්සුත, ධම්මධර, ධම්මානුධම්ම පටිපන්න, සාමීචිපටිපන්න වු පරප්‍රවාදයන් නැති කිරීමට සමත්වු පිරිසක් වෙනතෙක්, මේ බ්‍රහ්මචරිය හෙවත් ශාසනය දෙව් මිනිසුන් අතර මැනවින් ස්ථාපිත වෙන තෙක් පිරිනිවන් පාන්නේ නැතැයි කීවෙමි. දැන් මේ අදත් පාපී මාරයා මා වෙත පැමිණ 'භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පාන සේක්වා, සුගතයන් වහන්සේ පිරිනිවන් පාන සේක්වා. භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා, සිව්පිරිස ව්‍යක්ත විනීත, විසාරද පිරිසක් වෙන තෙක් පිරිනිවන් නොපාන බව කීවත් දැන් ඒ සියල්ල සම්පූර්ණයි, දැන් පිරිනිවන් පාන්නට කාලයයි යනුවෙන් කීවේය. ආනන්ද ඒ අනුව මම 'මාරය ඒ තරම් කලබල වෙන්න ඕනේ නැහැ. මහන්සි වෙන්න ඕනේ නැහැ, නොබෝ කලකින්ම, එනම් මෙයින් තුන්මාසයක් ඇවෑමෙන් තථාගතයන්ගේ පරිනිර්වාණය සිදුවන්නේය' යැයි කීවෙමි. මෙහිදීම ආනන්ද අද චාපල චෛතියේ දී තථාගතයන් විසින් සිහිනුවණින් යුක්තව

ආයුසංස්කාරය හරින ලදී'' යැයි දේශනා කළහ.

ඒ අවස්ථාවේ ආනන්ද හිමියෝ බුදුරජාණන් වහන්සේට ''ස්වාමීනි බොහෝ ජනයාට හිතසුව පිණිස, ලෝකයට අනුකම්පා පිණිස, දෙවි මිනිසුන්ගේ යහපත පිණිස භාග්‍යවතුන් වහන්සේ කල්පයක් වැඩසිටින සේක්වා, සුගතයන් වහන්සේ කල්පයක් වැඩසිටින සේක්වා'' යනුවෙන් ආයාචනා කළහ. එවිට බුදුරජාණෝ ''ආනන්ද දැන් ආයාචනා කිරීමෙන් ඵලක් නැහැ. දැන් එයට කාලය නොවේ'' යැයි දේශනා කළහ. දෙවෙනුව ද තෙවෙනුව ද ආනන්ද හිමියෝ එසේ ආයාචනා කළහ. ඒ අවස්ථාවේ දී බුදුරජාණන් වහන්සේ ආනන්ද හිමියන්ට මෙසේ දේශනා කළහ. ''ආනන්ද ඔබ තථාගතයන් වහන්සේගේ බුද්ධත්වය අදහනවද පිළිගන්නව ද?''. එවිට ආනන්ද හිමියෝ ''එසේය ස්වාමීනි'' යැයි කීය. එසේනම් කවර හෙයින් දෙවෙනි වර තෙවෙනි වර දක්වා තථාගතයන් පෙළන්නේ දැයි විචාළහ. එවිට ආනන්ද හිමියෝ ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගෙන්ම ''යම් කෙනෙක් සතර ඉද්ධිපාද වඩා ඇත්තේ නම් කල්පයක් හෝ එයිට ටිකක් වැඩියෙන් හෝ ජීවත් විය හැකිය'' යැයි ඇසුවෙමි එසේ හෙයින් මෙසේ විචාළ බව කීහ. ''ආනන්ද ඔබ එය පිළිගන්නවද?'' යැයි බුදුහු ඇසුහ. ''එසේය ස්වාමීනි'' ආනන්ද හිමියෝ පිළිතුරු දුන්හ. මෙහිදී බුදුරජාණන් වහන්සේ දේශනා කළේ එය ආනන්ද හිමියන්ගෙන්ම සිදුවූ වැරද්දක් බවයි. බුදුහු මෙසේ දේශනා කළහ. ''ආනන්ද ඉදින් ඔබ තෙවන වර දක්වා ඉල්ලා සිටියේ නම් දෙවරක්ම වුවද ප්‍රතික්ෂේප කළ ද තෙවන වර එම ඉල්ලීම තථාගතයන් වහන්සේ ඉවසන්නේය, පිළිගන්නේය'' (සචේ ත්වං ආනන්ද තථාගතං

යාචෙයයාසි, ද්වේව තෙ වාචා තථාගතො පටික්ඛිපෙයය, අථ තතියකං අධිවාසෙයය. තස්මා තිහානන්ද තුයෙහවෙතං දුක්කටං තුයෙහවෙතං අපරද්ධං) යනුවෙනි.

බුදුහු මෙයට පෙර ද මෙම කාරණය එනම් සතර ඉද්ධිපාද වැඩූ කෙනෙකුට ආයුෂ්කල්පයක් හෝ එයට වැඩියෙන් වුවද ජීවත්විය හැකි බව, ආනන්ද හිමියන්ට වක්‍ර ලෙසින් විවිධ අවස්ථාවල ප්‍රකාශ කර තිබුණ බව සඳහන් වේ.[12] කෙසේ වුවද මේ වතාවට ද එසේ ප්‍රකාශ කරද්දී ආනන්ද හිමියන්ට එම ආරාධනය කිරීමට නොහැකි වූ බවත් එබැවින් බුදුහු මාරයා විසින් කළ ආරාධනය පිළිගෙන පිරිනිවන් පෑමට තීරණය කළ බවත් දීඝනිකායේ මහා පරිනිබ්බාණ සූත්‍රයෙහි සඳහන් වේ.

''ආනන්ද සියලුම ප්‍රිය වූ මනාප වූ දේවල් වෙනස් ස්වභාවයට පත්වෙන බව, අන්‍යස්වභාවයට පත්වෙන බව, ඒවායින් වෙන් වෙන්නට සිදුවෙන බව මා විසින් කලින්ම දේශනා කරන ලදී. ආනන්ද යමක් ඉපදුණේ ද ඇතිවුයේ ද සකස් වුයේ ද වෙනස් වෙන ස්වභාවයට අයත් වුයේ ද එය එසේ වෙනස් නොවේවා පළුදු නොවේවායි යන්නක් සිදු නොවන්නේමය. ආනන්ද තථාගතයන් විසින් යමක් අත්හරින ලද ද, බැහැර කරන ලදද, මුදන ලදද, පහ කරන ලදද, දුරු කරන ලදද, යම් ආයුසංස්කාරයක් හරන ලදද, නොබෝ කල්හි තථාගතයන්ගේ පිරිනිවීම වන්නේය. මෙයින් තෙමසක් ඇවෑමෙන් තථාගතයෝ පිරිනිවන් පාන්නාහ. මෙසේ යම් ඒකාන්ත වචනයක් තථාගතයෝ ප්‍රකාශ කරන ලදද එය කිසිම ආකාරයකින් වෙනස් වෙන්නේ නැත.''යැයි දේශනා කළහ. අනතුරුව අපේ බුදුහාමුදුරුවෝ

ආනන්ද හිමියන් අමතා ''ආනන්ද දැන් අපි මහාවනයේ කූටාගාර ශාලාවට යමු'' යැයි යෝජනා කළහ.

ඒ අනුව අපේ බුදුහාමුදුරුවෝ ආනන්ද හිමියන් ද සමග මහා වනේ කූටාගාර ශාලාවට වැඩම කළහ. වැඩම කොට ආනන්ද හිමියන් අමතා මුළු වේසාලියෙහිම වැඩ සිටින සියලුම භික්ෂූන් වහන්සේලා රැස්කරවන්න යැයි කීහ. ආනන්ද හිමියෝ එසේ කළහ. රැස්ව සිටි පිරිස අමතා අපේ බුදුහාමුදුරුවෝ මෙසේ දේශනා කළහ. ''පින්වත් මහණෙනි, මාවිසින් මැනවින් අවබෝධ කරගෙන දේශනා කරන ලද යම් ධර්ම ඇද්ද ඒ ධර්ම ඔබලා විසින් මේ ශාසන බ්‍රහ්මචරියාවෙහි චිර පැවැත්ම පිණිස, බොහෝ ජනයාගේ හිතසුව පිණිස, ලෝකයාට අනුකම්පාව පිණිස, අර්ථය පිණිස, දෙවි මිනිසුන්ගේ හිතසුව පිණිස, මනාකොට ඉගෙනගෙන නිතර නිතර සේවනය කළයුතුයි, භාවිතා කළ යුතුයි, බහුල වශයෙන් වැඩිය යුතුයි. පින්වත් මහණෙනි, මා විසින් එසේ දේශනා කරනලද ධර්ම මොනවාද? සතර සතිපට්ඨාන, සතර සම්මප්පධාන, සතර ඉද්ධිපාද, පඤ්චඉන්ද්‍රිය, පඤ්චබල, සත්ත බොජ්ඣංග, ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය යන මේවාය.''

මේ අපේ බුදුහාමුදුරුවෝ දේශනා කොට වදාළ නිමල ධර්මයයි. අපි කියවන ප්‍රගුණ කරන සෑම විටම කියවිය යුත්තේත් ප්‍රගුණ කළ යුත්තේත් මේ ධර්ම කරුණුමය. මේ ධර්ම කරුණු වලින් බැහැරව බුදුදහමක් නැත.

මෙසේ දේශනා කොට බුදුරජාණන් වහන්සේ ''හන්දදානි භික්ඛවේ ආමන්තයාමි වො, වයධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදෙථ. න චිරං තථාගතස්ස

පරිනිබ්බානං භවිස්සති.'' යනුවෙන් භික්ෂූන් වහන්සේලා අමතා '' පින්වත් මහණෙනි, දැන් මම ඔබලා අමතමි. සියලු සංස්කාරයෝ විනාශ භාවයට පත්වෙති. එබැවින් සිහිනුවණින් යුතුව අප්‍රමාදීව කටයුතු කරන්න. තව නොබෝ කලකින් තථාගතයන්ගේ පිරිනිවන සිදුවන්නේය'' යැයි දේශනා කළහ. තවදුරටත් මෙහිදී අපේ බුදුහාමුදුරුවෝ මෙසේ ද වදාළහ.

''මගේ වයස් පරිපාකයට හෙවත් පැසුණ බවට පත්විය. මගේ ජීවිතය පිරුණු බවට පත්විය. දැන් මම ඔබලා අතහැර යමි. මට මගේ සරණ, පිහිට, ඇතිකර ගතිමි. පින්වත් මහණෙනි, සුසිල්වත් වෙන්න, සිහියෙන් යුක්ත වෙන්න, අප්‍රමාදී වෙන්න, තමන්ගේ සිත ආරක්ෂා කරගන්න, ඉතා හොඳ සංකල්ප ඇතිව ජීවත්වෙන්න, යම් කෙනෙක් මේ ධර්ම විනයෙහි අප්‍රමාදීව සිහියෙන් යුක්තව වෙහෙසෙයි ද හෙතෙම නැවත නැවත ඉපදෙන මේ සංසාරය බැහැර කොට සියලු දුක් කෙළවර කරන්නේය'' යනුවෙනි.

දැන් අපේ බුදුහාමුදුරුවෝ වේසාලිය හැර යන අවස්ථාවයි. වේසාලියේ සිට කුසිනාරාව දක්වා උන්වහන්සේ වැඩම කළ ගමන නම් ඉතාමත්ම සංවේග දනවන්නකි. උදේ කාලේ වේසාලියේ පිණ්ඩපාතයට වැඩම කොට සවස් කාලය වෙන විට ආනන්ද හිමියන් අමතා ''ආනන්ද මේ තථාගතයන් වහන්සේ අවසන් වතාවට වේසාලිය දැකීමයි. ආනන්ද දැන් අපි භණ්ඩ ගාමයට වඩිමු'' යැයි කීහ. තදනන්තරව මහත් භික්ෂු පිරිසක් ද සමඟ භණ්ඩ ගාමයට වැඩම කොට එහි වැඩ සිටියහ. එහිදී භික්ෂූන් අමතා ''පින්වත් මහණෙනි, මේ ධර්ම කරුණු හතරක් අවබෝධ නොකළ නිසා, ප්‍රතිවේධ

නොකළ නිසා, ඔබලාත් මමත් මේ සංසාරයේ දීර්ඝ කාලයක් තිස්සේ දුවනලදී, සැරිසරන ලදී. මොනවද ඒ ධර්ම කරුණු? ආර්‍යය සීලය, ආර්‍යය සමාධිය, ආර්‍යය ප්‍රඥාව, සහ ආර්‍යය විමුක්තිය යන හතරයි'' යැයි දේශනා කළහ.

භණ්ඩ ගාමයෙහි කැමති පරිදි වැඩ සිටි බුදුපියාණෝ එතැනින් ආනන්ද හිමියන් ප්‍රමුඛ භික්ෂූන් ද සමග පිළිවෙලින් හත්ථිගාමයට, අම්බගාමයට, ජම්බුගාමයට ද, වැඩම කරවා එතැනින් පිටත්ව භෝග නගරයට වැඩම කළහ. බුදුහු භෝග නගරයේ ආනන්ද චේතියෙහි වැඩ සිටියහ. එහිදී බුදුරජාණන් වහන්සේ සතර මහා අපදේශ මොනවා දැයි දේශනා කළහ. මේවායින් බුදුහු දේශනා කොට වදාළේ කිසිම කෙනෙක් කියන පළියට යමක් පිළිනොගන්න යමක් කියූ විට ඒ ගැන මහත් සේ සතුටු වෙන්නත් එපා. එය ප්‍රතික්ෂේප කරන්නත් එපා. ඒ පද ව්‍යඤ්ජන ඉතාම හොඳින් අධ්‍යයනය කර ඒවා සූත්‍රයන්හි බහා බලන්න. විනය සමග සන්සන්දනය කර බලන්න යනුවෙනි. (නෙව අභිනන්දිතබ්බං නප්පටික්කෝසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කෝසෙත්වා තානි පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තේ ඕතාරෙතබ්බානි. විනයේ සන්දස්සේතබ්බානි).

ලොව විවිධ ශාස්තෘන් අතරින් මෙසේ සිතීමේ නිදහස උපරිම වශයෙන් අපට ලබා දුන්නේ අපේ බුදුහාමුදුරුවෝ පමණයි නේද? භෝග නගරයේ ද කැමති පරිදි වැඩ සිටි අපගේ තිලෝගුරු වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ ''ආනන්ද දැන් අපි පාවා නුවරට යමු'' යැයි යෝජනා කළහ.ඒ අනුව බුදුහු මහත්

භික්ෂු පිරිසක් ද සමග පාවා නගරයට වැඩම කොට එහි චුන්ද කර්මාර පුත්‍රයාගේ අඹවනයෙහි වැඩ සිටියහ. එහිදී චුන්ද කර්මාර පුත් තෙමේ බුදුරජාණන් වහන්සේ තම අඹවනයෙහි වැඩ සිටින බව අසා මහත් සතුටට පත්ව එහි පැමිණ බුදුරජාණන් වහන්සේගෙන් දහම් අසා භික්ෂුන් වහන්සේලා ද සමගින් තම නිවසට පසුදින දානයට වඩින ලෙස ආරාධනා කළේය. අපේ බුදුහාමුදුරුවෝ එම ආරාධනය තුෂ්ණීම්භූතව පිළිගත්හ.

පසුදින නියමිත වේලාවට බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ භික්ෂුහු චුන්ද කර්මාර පුත්‍රයාගේ නිවසට දානයට වැඩම කළහ. බොහෝ කෑමට සුදුසු වූද බීමට සුදුසු වූද විවිධ දේ සකස් කර තිබූ අතර සූකර මද්දව ද බොහෝ කොට සකස් කර තිබුණි. මෙම සූකර මද්දව යනු ඌරන් ඇති කරන තැන හැදුන හතු විශේෂයක් බව කියති. මෙය එක්කෝ හතු විශේෂයකි නැතහොත් ජෙලි වැනි දෙයකි. සමහර අයගේ මතයක් වී ඇත්තේ මෙය ඌරුමස් බවය. එහෙත් මද්දව යනු මෙලෙක් හෙවත් සිනිඳු දෙයකි. ඌරුමස් මෙලෙක් දෙයක් නොවන බව එම මස් කන්නෝ මෙන්ම කා ඇත්තෝ ද දනිති. කෙසේ වුවද බුදුරජාණෝ දානයට වැඩම කොට චුන්ද කර්මාර පුත්‍රයාහට ආමන්ත්‍රණය කොට ''චුන්දය යම්සේ ඔබ සූකර මද්දව පිළියෙල කරන ලදද එය මට පිළිගන්වන්න. වෙනත් යම් කෑමට සුදුසු දේවල් බීමට සුදුසු දේවල් පිළියෙල කර තිබේ ද ඒවා භික්ෂු සංඝයාට පිළිගන්වන්න'' යැයි කීහ. (ඒවා මස් නම් බුදුකෙනෙක් මස්වලට ගිජුව මෙවැනි ප්‍රකාශයක් කරත් දැයි නුවණැත්තෝ සිතා බලත්වා).

ඒ අනුව චුන්ද කර්මාර පුත් තෙමේ තමාට

බුදුපියාණන් වහන්සේ විසින් උපදෙස් දුන් පරිදි දානය පිළිගැන් වුයේය. අනතුරුව බුදුරජාණන් වහන්සේගේම උපදෙස් මත තථාගතයන් වහන්සේ වළදා ඉතිරි වූ ඒ සූකර මද්දව පරිභෝග කිරීමට සුදුසු කිසිම ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවිමිනිසුන් අතර කිසිම කෙනෙක් හෝ නැති බැවින් වතුර වලකට දැම්මේය.

මෙසේ චුන්ද කර්මාර පුත්‍රයා විසින් පිළිගන්වන ලද සූකර මද්දවය වැළඳීමෙන් අනතුරුව අපේ බුදුහාමුදුරුවෝ හොඳටම අසණීප වුහ. ලෝහිත පක්ඛන්දිකා නැමති ලේ පාචන රෝගයක් වැළදුණි. එහෙත් අපේ බුදුහාමුදුරුවෝ ඒ බලවත් අසණීපය පවා ඉතාමත්ම සිහිනුවණින් යුක්තව කිසිම විපිළිසර බවක් නැතිව ඉවසා වදාළහ (භගවා සතො සම්පජානො අධිවාසෙසි අවිහඤ්ඤමානෝ). මෙසේ ලෝහිත පක්ඛන්දිකා රෝගයෙන් රෝගී වූ බුදුපියාණෝ ආනන්ද හිමියන් අමතා ''ආනන්ද දැන් අපි කුසිනාරාවට යමු'' යැයි යෝජනා කළහ. ආනන්ද හිමියන් ''එසේය ස්වාමීනි'' යැයි කියා පිළිගත් අතර එතැනින් නික්ම කුසිනාරාව බලා වැඩම කළහ.

අතර මගදී අපේ බුදුහාමුදුරුවෝ හොඳටම අසණීප වෙලා. ගහක් මුල නතර වුණා. ආනන්ද හාමුදුරුවන්ට කතා කරලා කියනවා, ''ආනන්ද මේ මගේ සංඝාටිය (සඟල සිවුර) හතර ගුණයක් කරලා නවලා එළන්න. මට කලන්තේ වගෙයි. ඉඳගන්න ඕනේ, හාන්සි වෙන්න ඕනේ.'' කියලා. එවිට ආනන්ද හාමුදුරුවෝ එසේ සිවුර හතර ගුණයක් කරලා බිම එලුවා. අපේ බුදුහාමුදුරුවෝ වැඩ සිටියා ඒ මත. දැන් කියනවා මෙහෙම ''ආනන්ද මට පිපාසයි පැන් ටිකක් අරන්

එන්න.'' ආනන්ද හිමියෝ මෙසේ කීහ. ''ස්වාමීනි, දැන් ගැල් පන්සියයක් විතර මේ කුඩා නදියෙන් එගොඩට ගියා විතරයි. ඒ ගැල්වල රෝද වලින් කුඩා නදියේ තිබුණ වතුර ටික කැළඹිලා තියෙන්නේ, බොරවතුර තමයි ගලාගෙන යන්නේ. ස්වාමීනි කුකුත්ථා නදිය මේ ළඟමයි තියෙන්නේ. කුකුත්ථා නදියේ නම් ජලය පිරිසිදුයි. සිසිල් ජලය, මඩත් නෑ. භාග්‍යවතුන් වහන්සේට කුකුත්ථා නදියෙන් නම් පැන් වළඳන්නත් පුළුවන්, ඒ වගේම ඇඟ පත ටිකක් සෝදාගන්නත් පුළුවන්.'' එවිට භාග්‍යවතුන් වහන්සේ දෙවෙනි වරට ද පැන් ඉල්ලූ අතර ආනන්ද හාමුදුරුවෝ පෙර සේම කීය. තෙවෙනි වරට ද භාග්‍යවතුන් වහන්සේ පැන් ඉල්ලුවිට ආනන්ද හාමුදුරුවෝ ''එසේය ස්වාමීනි'' යැයි කියා පාත්‍රය ගෙන පැන් ගෙන ඒමට ඒ කුඩා නදිය වෙත වැඩියහ. එවිට ඒ නදියේ ගැල් පන්සියයකින් කැඩී ගිය පස්නිසා බොරවී තිබුණ ජලය ඉතාමත් පැහැදිලිව පිරිසිදුව නොකැළතී ගලා බස්නා බව දුටහ. එය දැකීමෙන් ආනන්ද හිමියන් ආනන්දයට පත්විය. ''මේ නම් ආශ්චර්යයකි. තථාගතයන් වහන්සේගේ මහා ඉද්ධි බලයෙන් සිදුවුණ දෙයකි. යැයි සිතා පාත්‍රයෙන් ඒ පිරිසිදු පැන්ගෙන ගොස් බුදුරජාණන් වහන්සේට පිළිගැන්වූහ. එවිට අපේ බුදුහාමුදුරුවෝ පැන් වළදා පිපාසය සංසිඳවා ගත්හ.

එතැනින් පැන් වළදා එක්තරා ගසක් මුල වැඩ සිටිද්දී ආළාර කාලාමයන්ගේ ශ්‍රාවකයෙක් වූ පුක්කුස නම් මල්ලපුත්‍රයෙක් බුදුරජාණන් වහන්සේ දැක උන්වහන්සේ සමග සාකච්ඡා කොට මහත්සේ පැහැදී බුදුරජාණන් වහන්සේටත් ආනන්ද හිමියන්ටත් රන්වන් වස්ත්‍ර යුගලයක් ද පූජාකොට භාග්‍යවතුන් වහන්සේ

පැදකුණු කොට නික්ම ගියේය.

අනතුරුව එතැනින් නික්ම බුදුපියාණෝ භික්ෂූන් වහන්සේලා ද සමග කුකුත්ථා නදිය වෙත වැඩම කළහ. එහි වැඩම කොට නදියට බැස පැන් සනසා ගෙන, පැන් පානය කොට, එහි තිබූ අඹවනයට වැඩම කොට, ආයුෂ්මත් චුන්ද හිමියන්ට මෙසේ කතා කළහ. ''චුන්ද මගේ සංඝාටිය සිවු ගුණ කොට එළන්න. චුන්ද මට කලන්තේ වගෙයි. ටිකක් ඇලවෙලා ඉන්ඩ ඕනේ'' යැයි කීහ. එවිට චුන්ද හිමියෝ එසේ කළේය. බුදුපියාණෝ සිංහසෙයාාවෙන් සිහිනුවණින් යුතුව සැතපුණහ. චුන්ද හිමියෝ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිම වාඩිවී සිටියේය.

ඉක්බිතිව බුදුපියාණෝ ආනන්ද හිමියන් ඇමතූහ. ''ආනන්ද යම් හෙයකින් චුන්ද කර්මාර පුත්‍රයාහට මෙසේ සිතෙන්නට පුළුවනි. 'මගේ මේ දානය වළඳලා තමයි අන්තිම වරට තථාගතයන් වහන්සේට මේ අසණීප වුණේ' කියලා. එසේ කිසියම් විපිළිසර බවක් ඇතිවුණොත් එය නැති කළ යුතුයි. ආනන්ද සමඵල ඇති පිණ්ඩපාත දෙකකි. එනම් යම් පිණ්ඩපාතයක් වළදා තථාගතයෝ අනුත්තර වූ සම්මා සම්බුද්ධත්වයට පත්වුයේද යම් පිණ්ඩපාතයක් වළදා තථාගතයෝ අනුපදිසේස පරිනිර්වාණයට පත්වෙත් ද ඒ පිණ්ඩපාත දෙකෙහිම ඇත්තේ සමඵලයි. ''යනුවෙන් දේශනා කළහ.

දැන් නම් කුසිනාරාවට හොඳටම ළගයි. ''ආනන්ද හිරණ්‍යවතිය නදියෙන් එහා තීරයේ තමයි කුසිනාරාව තියෙන්නේ. දැන් අපි එහි මල්ලයන්ගේ උපවත්තන කියන සාල වනයට යමු'' මෙසේ යෝජනා

කොට අපේ බුදුහාමුදුරුවෝ ආනන්ද හිමියන් ප්‍රමුඛ මහත් භික්ෂූන් ද සමග උපවත්තන නම් සල්වනයට වැඩම කළහ. එහි වැඩම කොට ආනන්ද හිමියන් අමතා ''ආනන්ද දැන් එහෙනම් ඔබ මට මේ සල්ගස් දෙක අතර උතුර පැත්තට හිස සිටින සේ යහනක් පණවන්න. ආනන්ද කලන්තේ වගෙයි. මට ඇලවෙන්න ඕනේ.'' යැයි කීහ. ආනන්ද හිමියෝ 'එසේය ස්වාමීනි' කියා යහන පැණවූහ. එවිට අපේ බුදුහාමුදුරුවෝ දකුණ පසින් ඇලවී පාදයක් මත පාදයක් තබා ගනිමින් සිහිනුවණින් යුතුය සිංහ සෙයාාවෙන් සැතපුණහ. එවිට සාල රුක් දෙකෙහිම අකාල පුෂ්පයෝ විකසිත විය. තථාගතයන් වහන්සේට පූජාපිණිස ඒ විකසිත පුෂ්පයෝ මොහොතකින් බුදු සිරුරට ගිලිහි වැටුණි. දෙවියෝ දිව්‍යමල් වලින් බුදුන් පිදූහ. දිව්‍ය සඳුන් අහසින් වැටුණි. දිව්‍ය නාදයෝ වැයුණි. ඒ සියල්ල තථාගතයන් වහන්සේට පුද පිණිසය. ඒ අවස්ථාවේ තථාගතයන් වහන්සේ ආනන්ද හිමියන් ඇමතූහ.

''ආනන්ද මේ සියල්ල ම තථාගතයන් වහන්සේට සත්කාර ගරුකාර හා පුදපූජා පිණිසයි. නමුත් යම් භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ උපාසකයෙක් හෝ උපාසිකාවක් හෝ තථාගතයන්ට නියම ආකාරයෙන් සත්කාර කරන්නේ නම්, ගරුකරන්නේ නම්, පුදන්නේ නම්, කළ යුත්තේ මේවා නොවෙයි ආනන්ද. තථාගතයන් විසින් දේශනා කළ ධර්මයට අනුව, ධර්මානුධර්ම ප්‍රතිපත්තිවලට අනුව, වාසය කිරීමයි. ආනන්ද ඔබලා මෙසේ හික්මෙන්න'' යනුවෙන් දේශනා කළහ.

දැන් අපේ බුදුහාදුමුරුවෝ පිරිනිවන් පානන්ට

ඉතාමත්ම ආසන්නයි. දස දහසක් ලෝක ධාතුවලින් දෙවිවරු පැමිණලා, අපේ බුදුහාමුදුරුවෝ දැක ගන්නට. මහේසාක්‍ය දෙවිවරු රැස්වෙලා. මල්ල රජදරුවන්ගේ යොදුන් දොළහක් (සැ: 84 පමණ) විශාල උපවත්තන සල් උයනේ සෑම තැනම මහේසාක්‍ය දෙවිවරුන්ගෙන් පිරිලා, පැතිරිළා. අස්ලෝමයක් වත් පොවන්ඩ ඉඩක් ඉතුරුවෙලා නෑ. ඒ අය කියනවා ''අපි මෙච්චර දුර ඉඳලා ආවා තථාගතයන් වහන්සේ දැක ගන්ඩ. කොච්චර කාලයකින් ද තථාගතයන් වහන්සේ කෙනෙක් ලෝකේ පහළ වෙන්නේ. අද රෑ අවසන් යාමයේ තථාගතයන් වහන්සේ පිරිනිවන් පානවා. ඒත් මේ මහේසාක්‍ය වූ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ ඉදිරියේ හිටගෙන භාග්‍යවතුන් වහන්සේ වහගෙන ඉන්නවා. අපිට තථාගතයන් වහන්සේ දැකගන්ඩ ලැබෙන්නේ නෑ.''කියලා.

මෙය ඇසූ අපේ මහා කාරුණික වූ බුදුරජාණන් වහන්සේ තමන්වහන්සේට පවන් සළමින් සිටි උපවාණ හිමියන් අමතා බුදුපියාණන් වහන්සේගේ ඉදිරියෙන් ඉවත් වෙන්න යැයි කීහ. එවිට ආනන්ද හිමියෝ බුදුරජාණන් වහන්සේ උන්වහන්සේට කාලයක් තිස්සේ උපස්ථාන කළ මේ උපවාණ හිමියන්ට මේ අවසන් මොහොතේ බුදුරජාණන් වහන්සේ ඉදිරියෙන් ඉවත් වෙන්න කියා ප්‍රකාශ කරන්නේ ඇයි? දැයි ඇසූහ. එවිට බුදුරජාණෝ මේ කරුණ පැහැදිලි කළහ. දෙවියන්ට තථාගතයන් වහන්සේ දැකගැනීමට අපහසු වූයේ උපවාණ හිමියන් බුදුහු ඉදිරියේ සිටි බැවිනි.

මෙහිදී පෘථග්ජන වූ අහසෙහි පොළොව යැයි සංඥාව ඇති දෙවිවරු පැමිණ අහසෙහි සිටිමින්

ඉතාම ඉක්මණින් භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පානවා. සුගතයන් වහන්සේ පිරිනිවන් පානවා. ලෝකයේ ඇස අතුරුදහන් වෙනවා යැයි හඬා වැළපෙන හැටි ද ධර්මය දත් වීතරාගී වු දෙව්වරු සිහි නුවණින් යුතුව සියලු සංස්කාරයන්ගේ අනිත්‍ය බව සිහිකරමින් සිටින ආකාරය ද බුදුහු දේශනා කළහ.

අනතුරුව බුදුපියාණෝ ශ්‍රද්ධාවන්ත කෙනෙක් විසින් දැක සංවේගය උපදාවා ගත යුතු ස්ථාන හතරක් දේශනා කළහ. ඒ තමන් වහන්සේ උපත ලද ස්ථානය, සම්මා සම්බුද්ධත්වයට පත්වු ස්ථානය, ප්‍රථම ධර්මදේශනය කළ ස්ථානය හා පරිනිර්වාණයට පත්වු ස්ථානයත් ය.

මේ අවස්ථාවේ දී ආනන්ද හිමියෝ මෙසේ ඇසුහ. ''ස්වාමීනි අපි ස්ත්‍රීන් සමග කටයුතු කරන්නේ කෙසේද?'' එවිට බුදුහු '' ආනන්ද දකින්ඩ ඕනේ නෑ.''

ආනන්ද හිමි :- හොඳයි දැක්කොත් කොහොමද පිළිපදින්නේ ස්වාමීනි?

බුදුහාමුදුරුවෝ :- කථාකරන්න ඕනේ නෑ.

ආනන්ද හිමි :- කථා කරන්ඩ වුණොත් කොහොමද පිළිපදින්නේ?

බුදුහාමුදුරුවෝ :- ආනන්ද සිහි උපදවාගන්න.

ඊළගට පිරිනිවන් පෑවට පස්සේ තථාගතයන් වහන්සේගේ ශරීරයට මොකක්ද කරන්නේ කියා

ආනන්ද හිමියෝ ඇසුහ. එවිට තථාගත බුදුපියාණෝ දේශනා කළේ, ''ආනන්ද ඔබලා තථාගතයන්ගේ ශරීර පූජාවේ නිරත වෙන්න එපා. ඔබලා තමන්ගේ යහපත පිණිස හැසිරෙන්න. අප්‍රමාදීව කෙලෙස් තවන වීර්‍යයෙන් යුතුව වාසය කරන්න. ආනන්ද තථාගතයන් කෙරෙහි ඉතාම පැහැදීමෙන් සිටින ක්‍ෂත්‍රිය පණ්ඩිතයෝ ඉන්නවා. බ්‍රාහ්මණ පණ්ඩිතයෝ ඉන්නවා, ගෘහපති පණ්ඩිතයෝ ඉන්නවා. ඒ අය තථාගතයන්ගේ ශරීර පූජාව කරයි.'' (අබ්‍යාවටා තුම්හේ ආනන්ද හොථ තථාගතස්ස සරීර පූජාය. ඉඞඝ තුම්හෙ ආනන්ද සදත්ථෙ ඝටථ සදත්ථමනුයුඡ්ජථ, සදත්ථෙ අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරථ, සන්තානන්ද ඛත්තිය පණ්ඩිතාපි බ්‍රාහ්මණ පණ්ඩිතාපි ගහපති පණ්ඩිතාපි තථාගතෙ අභිප්පසන්නා තෙ තථාගතස්ස සරීර පූජං කරිස්සන්ති).

අනතුරුව බුදුහු ස්ථූප කිරීමට සුදුසු පුද්ගලයෝ හතර දෙනෙක් බව දේශනා කළහ. ඒ බුදු, පසේබුදු, තථාගත ශ්‍රාවකතෙමේ සහ සක්විති රජ යන හතර දෙනාය.

දැන් ආනන්ද හාමුදුරුවෝ විහාරයට ගොස් හිස පහත් කරගෙන අඬ අඬා ඉන්නවා. ''අනේ මම තාමත් රහත් වෙලත් නෑ. මට අනුකම්පාවෙන් වැඩ සිටින මගේ ශාස්තෘන් වහන්සේ තව ටික වෙලාවකින් පිරිනිවන් පානවා''. බුදුරජාණන් වහන්සේ අහනවා, ''පින්වත් මහණෙනි, ආනන්ද කෝ?'' ''ස්වාමීනි ආනන්ද හාමුදුරුවෝ විහාරයට ගිහිල්ලා අන්න දොරේ අගුළු කණුව බදාගෙන අඬනවා'' භික්‍ෂුහු කීහ. එසේ කී කල්හී බුදුහු ආනන්ද හිමියන් කැඳවාගෙන එන්න යැයි භික්‍ෂුවක් යැවූහ. ආනන්ද හිමියෝ පැමිණියහ.

එහිදී බුදුරජාණන් වහන්සේ ආනන්ද හිමියන් අමතා මෙසේ දේශනා කළහ. ''ආනන්ද සෝක කිරීමෙන් පළක් නැහැ. වැළපීමෙන් පළක් නැහැ. සියලු ප්‍රිය මනාප දෙයින් වෙන් වෙන්නට සිදුවෙන බව, ඒ සියල්ල අන්‍ය ස්වභාවයකට පත්වෙන බව, වෙනස් ස්වභාවයට පත්වෙන බව, මා විසින් කලින්ම කියන ලද්දේ නොවෙයි ද? යමක් ඉපදුණේ නම්, ඇතිවුයේ නම්,සකස් වුයේ නම්, වෙනස් වෙන සුළු නම්, තථාගතයන් වහන්සේගේ ශරීරයටත් එය එසේමයි, සාධාරණයි. එසේ සිදු නොවේවායි කීවද එය එසේ නොවන දෙයකි. ආනන්ද ඔබ බොහෝ කාලයක් තිස්සේ තථාගතයන් වහන්සේගේ හිත සුව පතමින් එකම අරමුණකින් අප්‍රමාණ වු මෛත්‍රීයෙන් යුක්ත වු කාය කර්මයෙන්, මෛත්‍රියෙන් යුක්තවු වචනයෙන් මෙන්ම මෛත්‍රියෙන් යුක්තවු සිතින් උපස්ථාන කළා. ආනන්ද ඔබ පින් කළ කෙනෙක්. වීර්‍ය්‍යය වඩන්න. ඉතා ඉක්මණින්ම ඔබට සියලු ආශ්‍රවයන් නැති කොට අරහත් බවට පත්විය හැකියි.'' යනුවෙනි.

අනතුරුව බුදුහු භික්ෂූන් අමතා ආනන්ද හිමියන්ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්ම හතරක් ද චක්‍රවර්ති රජකෙනෙකුගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්ම හතරක් ද සන්සන්දනාත්මකව දහම් දේශනා කළහ. තදනන්තරව ආනන්ද හිමියෝ ''ස්වාමීනි මේ පුංචි නගරයේ, කර්කශ නගරයේ, කුඩා නගරයේ පිරිනිවන් පාන්න එපා'' යැයි ඉල්ලීමක් කළේය. එය අසා බුදුහු මහා සුදස්සන සූත්‍රය දේශනා කරමින් මේ කුසිනාරාවේ පෙර පැවති අසිරිය මෙන්ම සමෘද්ධිමත් බව ද ගෙන හැර දක්වා වදාරා නැවත මෙසේ වදාළහ. '' ආනන්ද යන්න, කුසිනාරාවට ගොස් කුසිනාරාවේ මල්ලයන්ට මෙසේ

කියන්න. 'වාශිට්ඨයිනි, අද රාත්‍රියේ පශ්චිම යාමයේදී තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණය සිදුවන්නේය. වාශිට්ඨයිනි, දැන්ම පිටත් වෙලා යන්න, දැන්ම පිටත් වෙලා යන්න, 'අනේ අපේ ගම් පියසේම තථාගතයන් වහන්සේගේ පිරිනිවන්පෑම සිදුවුණා. ඒත් අපට තථාගතයන් වහන්සේගේ අවසන් කාලයේදීවත් උන්වහන්සේ දැකගන්නට බැරිවුණා නෙවැ ' කියලා පසුව විපිළිසර වෙන්න එපා'' යැයි කියන්න යැයි කීහ. ''එසේය ස්වාමීනි'' කියා ආනන්ද හිමියෝ කුසිනාරාවට වැඩම කොට මල්ලයන්ට ඒ පණිවිඩය කීහ. මල්ලයෝ එය අසා හඬා වැළපෙමින් ඉතාම ඉක්මණින් භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පාන්නේය. ඉතාම ඉක්මණින් සුගතයන් වහන්සේ පිරිනිවන් පාන්නේය. ඉතාම ඉක්මණින් ලොවේ ඇස අතුරුදන් වෙන්නේය. යැයි කිය කියා අපේ බුදුහාමුදුරුවෝ දැක ගන්නට පැමිණුනහ. එහිදී ආනන්ද හිමියෝ මේ මල්ලයෝ එක් එක් කෙනා වඳින්නට ගියොත් බොහෝ කාලයක් ගත වෙන බැවින් කුල වශයෙන් ගෙන, පිරිස් වශයෙන් ගෙන, බුදුරජාණන් වහන්සේට අවසන් ගෞරව දැක්වීමට අවස්ථාව සළසා දුන්හ.

ඊළගට සුභද්ද නම් පරිබ්බාජක තෙමේ බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ සැක ඇති දෙයක් විචාරීමට ආනන්ද හිමියන්ගෙන් අවසර ඉල්ලුවේය. ආනන්ද හිමියෝ එය බුදුරජාණන් වහන්සේට වෙහෙසකර හෙයින්, හිරිහැරයක් හෙයින් දෙවරක්ම ප්‍රතික්ෂේප කළහ. එවිට බුදුරජාණෝ මේ දෙදෙනාගේ කතාව අසා සුභද්දට එන්න අවසර දෙන්න යැයි කීහ. සුභද්ද බුදුරජාණෝ වෙත ගියේය. ගොස් ''භවත් ගෞතමයන් වහන්ස, මේ මහ පිරිස් පිරිවර කොට සිටින

බොහෝ කීර්තිමත් වූ ඉතාම හොඳයි කියා බොහෝ ජනයා විසින් සම්මතව කතාකරන පූර්ණ කස්සප, මක්ඛලී ගෝසාල, අජිත කේසකම්බල, පකුධ කච්චායන, සඤ්ජය බෙලට්ඨිපුත්ත, නිගණ්ඨනාත පුත්ත යන අය තමන් කියන දේ සත්‍යවශයෙන්ම දැනගෙන සිටින අයද එසේ නැත්නම් ඔවුන්ගෙන් සමහරෙක් දැනගෙන සිටින අය සමහරෙක් දැනගෙන නොසිටින අයද?'' යැයි ඇසුවේය. එවිට බුදුරජාණෝ ''සුභද්ද එයින් වැඩක් නැහැ. ඒ සියලු දෙනා තමන් කියන දේ සත්‍ය වශයෙන් දැනගෙන සිටිද්ද? නැද්ද? යන්න පැත්තක තියන්න. ඔබට ධර්මයක් දෙසන්නම් එය අසන්න'' යැයි කියා මෙසේ දහම් දේශනා කළහ.

''සුභද්ද යම් ධර්ම විනයක ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය නැද්ද, පළවෙනි ශ්‍රමණයා (සෝවාන් තැනැත්තා) ද එහි නැත. දෙවෙනි ශ්‍රමණයා (සකදාගාමි තැනැත්තා) ද එහි නැත. තෙවෙනි ශ්‍රමණයා (අනාගාමි තැනැත්තා) ද එහි නැත. සිව්වෙනි ශ්‍රමණයා (අරහත් තැනැත්තා) ද එහි නැත. සුභද්ද මේ ධර්ම විනයෙහි ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය ඇත. පළවෙනි ශ්‍රමණයා ද, දෙවෙනි ශ්‍රමණයා ද, තෙවෙනි ශ්‍රමණයා ද, සිව්වැනි ශ්‍රමණයා ද, මෙහි ඇත. අන්‍ය වූ පරවාදයෝ මේ ශ්‍රමණයන්ගෙන් හිස්ය. සුභද්ද මෙහිද (මේ ධර්ම විනයෙහිද) භික්ෂූන් වහන්සේලා මනාකොට (ධර්මානුධර්ම ප්‍රතිපත්තිවලට අනුව) වාසය කරන්නේ නම් ලෝකයේ රහතන් වහන්සේලාගෙන් කවදාවත් හිස්වීමක් නැත.'' යැයි දේශනා කළහ.

නැවත බුදුහු ආනන්ද හිමියන් අමතා ''ආනන්ද පෙර අපට ශාස්තෘවරයෙක් හිටියා දැන් අපට

ශාස්තෘවරයෙක් නැත. යන හැඟීමක් ඇතිවිය හැකිය. එසේ නොසිතිය යුතුය. ආනන්ද මා විසින් ධර්මය ද විනය ද දේශනා කරන ලද්දේද පනවනලද්දේද ඒ ධර්ම විනය මගේ ඇවෑමෙන් ශාස්තෘවරයා වන්නේය. දැන් භික්ෂූන් වහන්සේලා එකිනෙකාට කතාකිරීමේදී ''ඇවැත්නි'' කියා කතාකරති. එහෙත් මගේ ඇවෑමෙන් එසේ කතා නොකරන්න. තෙරුන් වහන්සේ විසින් නවකයන්ට නම හෝ ගෝත්‍රය හෝ ''ආවුසො'' කියා හෝ කියාවි, නවකයා විසින් තෙරුන්වහන්සේට ''භන්තේ'' කියා හෝ ''ආයස්මා'' කියා හෝ කතා කළයුතුයි. කැමති නම් සංඝයා විසින් මගේ ඇවෑමෙන් පසුව බුද්දානුබුද්දක ශික්ෂාපද වෙනස් කරගත හැකියි. ආනන්ද මගේ ඇවෑමෙන් පසු ඡන්න භික්ෂුවට බ්‍රහ්ම දණ්ඩනය දෙන්න.'' යනාදී වශයෙන් විශේෂ උපදෙස් කීපයක්ම දුන්හ. බලන්න අපේ බුදුහාමුදුරුවන් වහන්සේගේ තියෙන උතුම් මිනිස් ගුණ මෙය හරියට අවසන් මොහොතේ තමන්ගේ දරුවන් අමතා කතා කරන පියකෙනෙක් මෙන් ඉතාමත්ම සංවේගාත්මක මොහොතක් නේද? පිය කෙනෙක් තව මොහොතකින් තමා මියයන බව දැනගෙන තමන්ගේ දරුවන් අමතා කතා කරන්නේ මේ ආකාරයට නේද?

ඊළගට නැවතත් බුදුරජාණෝ භික්ෂූන් වහන්සේලා ඇමතූහ. ''පින්වත් මහණෙනි, එකම භික්ෂුවකට හෝ බුදුන් කෙරෙහි හෝ දහම් කෙරෙහි හෝ සංඝයා කෙරෙහි හෝ මාර්ගය ගැන හෝ ප්‍රතිපදාව ගැන හෝ කිසියම් සැකයක් විමතියක් තිබේනම් දැන් අසන්න. එසේ නැතිව පසුව ''අපට ශාස්තෘන් වහන්සේ හමුවීමට අවස්ථාව ලැබුණා. එහෙත් අපට භාග්‍යවතුන් වහන්සේගෙන් මෙය අහන්න ලැබුණේ නෑනේ නේද?

කියා විපිළිසර වෙන්න එපා'' යැයි කීහ. එවිට භික්ෂූන් වහන්සේලා නිශ්ශබ්ද වූහ. දෙවෙනුව ද තෙවෙනුවද එසේ ඇසූ විට භික්ෂූන් වහන්සේලා නිශ්ශබ්ද වූහ. එවිට යම් කෙනෙක් ශාස්තෘන් වහන්සේට ඇති ගෞරවය නිසා හෝ නොඅසන්නේ නම් තමන්ගේ හිතවත් කෙනෙක් ලවා අසන්න යැයි කීහ. එසේ කී කල්හී ද භික්ෂූහු නිශ්ශබ්ද වූහ.

දැන් අපේ බුදුහාමුදුරුවෝ සිය අන්තිම බුද්ධවචනය ප්‍රකාශ කරන අවස්ථාවයි. '' හන්දදානි භික්ඛවේ ආමන්තයාමි වෝ වය ධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදෙථ'' යැයි දේශනා කළහ. එහි තේරුම මෙන්න ''පින්වත් මහණෙනි, දැන් ඔබලා අමතමි. සංස්කාර ධර්මයෝ විනාශවෙන සුළුයි. අප්‍රමාදීව සම්පාදනය කරන්න.'' මෙහි අප්‍රමාදය නම් සිහිනුවණින් යුක්තව කටයුතු කිරීමයි. සම්පාදනය කළයුත්තේ කුසල් දහම්ය. ඒ අනුව මෙහි පැහැදිලි තේරුම විය යුත්තේ '' සිහිනුවණින් යුක්තව කුසල් දහම් වඩන්න'' යන්නයි. වැඩිය යුතු හෙවත් සම්පාදනය කළ යුතු කුසල් දහම් නම් සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්මය.

අනතුරුව තුන් ලොවක් මෛත්‍රී ජලයෙන් තෙමා වදාළ, තුන් ලොවක් ප්‍රඥා ආලෝකයෙන් ආලෝකවත් කළ, සකල සත්වයන් කෙරෙහි පතළ මහා කරුණාවෙන් අනුකම්පාවෙන් පන් සාළිස් වසක් මුළුල්ලේ දහම් දෙසා වදාළ අපේ බුදුහාමුදුරුවෝ පළමුවෙනි ධ්‍යානයට සමවැදුණහ. එයින් නැගී සිට දෙවෙනි ධ්‍යානයට ද එයින් නැගීසිට තෙවෙනි ධ්‍යානයට ද එයින් නැගීසිට සිවුවෙනි ධ්‍යානයට ද

පිළිවෙලින් සමවැදුණහ. මෙම සිවුවෙනි ධ්‍යානයෙන් නැගීසිට පිළිවෙලින් ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, අකිඤ්චඤ්ඤායතනය, නේවසඤ්ඤානාසඤ්ඤායතනය යන අරූපාවචර ධ්‍යානසමාපත්ති වලට සමවැදී අවසානයට සඤ්ඤාවේදයිත නිරෝධයට ද සමවැදුණහ.

එවිට ආනන්ද හාමුදුරුවෝ ආයුෂ්මත් අනුරුද්ධ මහරහතන් වහන්සේට මෙසේ කීහ. ''ස්වාමීනි අනුරුද්ධයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑවා.'' අනුරුද්ධ මහ රහතන් වහන්සේ එවිට බුදුරජාණන් වහන්සේගේ සිත දැක ගනිමින් ''නැහැ ආයුෂ්මත් ආනන්ද භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑවේ නැහැ, සඤ්ඤාවේදයිත නිරෝධයට සමවැදුණා.'' යැයි කීහ. ඉක්බිතිව භාග්‍යවතුන් වහන්සේ සඤ්ඤාවේදයිත නිරෝධයෙන් නැගීසිට පිළිවෙලින් නැවත ආපස්සට නේවසඤ්ඤානාසඤ්ඤායතනය, ආකිඤ්චඤ්ඤායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකාසානඤ්චායතනය, චතුත්ථධ්‍යානය, තතියධ්‍යානය, ද්විතීයධ්‍යානය හා ප්‍රථමධ්‍යානයට සමවැදුණහ.

නැවතත් ප්‍රථමධ්‍යානයට ද ද්විතීය ධ්‍යානයට ද තෘතිය ධ්‍යානයට ද සමවැදී අනතුරුව චතුත්ථ ධ්‍යානයට සමවැදුණහ. මෙසේ චතුත්ථධ්‍යානයෙන් නැගී සිට ඉන් අනතුරුව ඒ ක්ෂණයේදී ලෝකයේ ආලෝකය නිවීගියා. අපේ බුදුහාමුදුරුවෝ පිරිනිවන් පෑවා! සියලු ලොවම නැවතත් අවිද්‍යා අන්ධකාරයේ ගිලුණා. ලොවම කම්පාකරවමින් තථාගත ලොවුතුරා බුදුරජාණෝ, අපේ බුදුහාමුදුරුවෝ පිරිනිවන් පා වදාළසේක. සියලු සංස්කාර ධර්මයන්ම අනිත්‍යයි. ඇතිවෙන සියල්ල

නැතිවෙයි. ඒ සම්බුද්ධ පරිනිර්වාණයත් සමගම ලොමු දැහැ ගන්වන්නා වුත් භයානකවුත් මහා භූමිචලනයක් හෙවත් භූමිකම්පාවක් ඇතිවිය. දේව බෙරී නාදයන් ඇතිවිය. ඒ සමගම සහම්පතී මහා බ්‍රහ්මයා මෙසේ කීවේය.

''ලොව සියලු සත්වයෝම සිරුර හැරදමන්නේ යම්සේද එසේම දසබල ඥානයන්ට සපැමිණි, අසමසම තථාගත සම්බුද්ධ වූ ශාස්තෘන් වහන්සේ පිරිනිවි සේක.''

ඒ සමගම සක්දෙව් රජු මෙසේ කීවේය. ''සියලු සංස්කාර ධර්මයෝම අනිත්‍යයි. ඉපිද නැතිවීම ස්වභාවයයි. ඇතිවෙන සියල්ල නැතිවීමට පත්වෙති. ඔවුන්ගේ සංසිඳීම සැපයයි.''

ඒ සමගම එහි වැඩසිටි අනුරුද්ධ මහරහතන් වහන්සේ මෙසේ කීහ. ''ස්ථිති චිත්තයක් ඇති හෙවත් නොසැලෙන සිතක් ඇති අටලෝ දහමින් කම්පා නොවන බුදුරජාණන් වහන්සේගේ අශ්වාස ප්‍රශ්වාසයෝ නැවතුණහ. තණ්හාව සම්පූර්ණයෙන්ම නැති කළ ඒ උතුම් මුනිවරයාණෝ ශාන්තිය අරමුණු කරගෙන කළුරිය කළහ. නොපසුබට වූ සිතින් වේදනාව ඉවසූහ. පහනක් නිවීයන්නාක් මෙන් සිතේ මිදීම සිදුවිය.''

මේ මෙසේ ප්‍රකාශ කළේ සෑම රහතන් වහන්සේ නමකගේම විඤ්ඤාණයට සිදුවෙන දෙයයි. මෙය ඉතාමත්ම ලස්සනට අපේ බුදුහාමුදුරුවෝ සුත්ත නිපාතයේ පාරායන වග්ගයේ එන උපසීව සූත්‍රයෙන් පෙන්වා දී ඇති බව අප ඉහත සඳහන් කළෙමු. නැවතත් එය මතක් කරගනිමු.

ඒ මෙසේය.

අච්චී යථා වාතවේගෙනඛිත්තා
අත්ථං පලෙති න උපෙති සංඛං
එවං මුනී නාමකායා විමුත්තො
අත්ථං පලෙති න උපෙති සංඛං (සු.නි. 1078 ගාථාව)

(සුළඟින් නිවුන ගිනිසිලක් යම්සේ අභෝසි බවට පත්වේද, හෙවත් ව්‍යවහාරයට නොගන්නා තත්වයට පත්වේද, ඒ ආකාරයෙන්ම නාම කයින් මිදුන මුනිවරයා ද අභෝසි තත්වයට, ව්‍යවහාරයට නොගන්නා තත්වයට පත්වේ.)

සම්මා සම්බුදුරජාණන් වහන්සේලා ලෝකයේ පහළ වෙන්නේ ඉතාමත්ම කළාතුරකිනි. බුදුකෙනෙක් හෝ පසේ බුදුකෙනෙක් හෝ මහරහතන් වහන්සේ කෙනෙක් හෝ ලබාගත් නිවන් සුවයෙන් සැනසෙන්නේ තමන් ජීවත් වෙන කාලය තුළයි. මියයාම සියලුම සත්වයන්ට සාධාරණ දෙයකි. බුදුකෙනෙක් යනු සත්වයෙක් නොවේ. එබැවින් බුදුකෙනෙකුගේ පරිනිර්වාණය මියයාමක් නොවේ. පහන දැල්වෙන්නේ තෙල් මෙන්ම එහි වැටිය ද ඇති තාක් පමණි. එසේම බුදුහු ජීවත්වෙන්නේ පංචස්කන්ධය ඇති තාක් පමණි. එය තෙල් අවසන් වී වැටිය පමණක් ඉතිරිව තිබෙන්නාක් මෙනි. වැටියද අවසන් වු විට පහන නිවී යයි. උන්වහන්සේට සියලු උපාදාන නැති කළ හෙයින් සම්මා සම්බුද්ධත්වයට පත් වු මොහොතේ සිට උපාදාන ස්ඛන්ධයක් තිබුනේ නැත. එයම සැනසීමයි. නිවණයි. නිවීමයි. බුදුවරු ලෝකයේ ඉතාමත්ම දුර්ලභයි.

කලකිනි බුදුකෙනෙකුන් උපදින්නේ. එසේම මිනිසත් බවක් ලැබෙන්නේ ද ඉතාමත්ම කළාතුරකිනි. මේ සංසාරයෙන් එතෙර වීමට, හෙවත් සසර සියලු දුක් නැති කිරීමට හැකියාව ඇත්තේ බුදුරජාණන් වහන්සේ නමකගේ ශාසනයක් පවතින කාලයක මිනිසෙක් වශයෙන් ඉපදී සීල, සමාධි, පඤ්ඤා යන තුන් ආකාරවූ ශික්ෂාවෙන් සුශික්ෂිතව ආර්‍යය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කිරීමෙන් පමණි.

එබැවින් දහම් රස හදුනන්නෝ නැවත නැවතත් මේ පොත කියවත්වා! තථාගත බුදුරජාණන් වහන්සේ විසින් මැනවින් දේශනා කොට වදාළ බුදු බණම සොයත්වා! කියවත්වා! භාවනාවේ අමාරසයෙන් ජීවිතම සිසිල් කරගනිත්වා! දහම් සිසිලෙන් නිවුණ හදින් යුතුව සියලු කෙලෙස් නැති කරමින් උතුම් වු චතුරාර්‍ය සත්‍ය ධර්මයෝ වහ වහාම අවබෝධ කරගනිත්වා! සියලු සත්වයෝම නිදුක් වෙත්වා! නිරෝගී වෙත්වා! සුවපත් වෙත්වා! සසර දුකින් මිදී සියලු සත්වයෝ ම නිවන් සුවයෙන් සැනසෙත්වා!

කලකිනි බුදුකෙනෙකුන් උපදින්නේ
දුකකිනි මිනිසත් බව ලැබගන්නේ
මෙදෙකෙනි මෙසසර දුක් දුරලන්නේ
සුදණෙනි, කිම වීරිය නොකරන්නේ

සාධු සාධු මේ කළ පින් පැදි පැදි දිලේවා
ආදි ආදි අප කළ පව් සේදි සේදි ගෙවේවා
ජාති ජාති කිසිම කලෙක අපා දුකක් නොවේවා
සාධු සාධු මෙපින් බලෙන් නිවන් සුවයම ලැබේවා!

සාධු! සාධු! සාධු!

ආශ්‍රිත ග්‍රන්ථ

1. දීඝනිකාය (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා මුද්‍රණය)
2. මජ්ඣිම නිකාය (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා මුද්‍රණය සහ මහමෙවුනාවේ බෝධිඥාන ත්‍රිපිටක ග්‍රන්ථ මාලා මුද්‍රණය)
3. සංයුත්ත නිකාය (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා මුද්‍රණය සහ මහමෙවුනාවේ බෝධිඥාන ත්‍රිපිටක ග්‍රන්ථ මාලා මුද්‍රණය)
4. අංගුත්තර නිකාය (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා මුද්‍රණය)
5. ඛුද්දක නිකාය (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා මුද්‍රණය)
6. උදාන ගාථා (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා මුද්‍රණය)
7. විනය මහාවග්ගය (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා මුද්‍රණය)
8. ධම්මපදය (ආචාර්ය බුද්ධරක්ඛිත හිමිගේ ඉංග්‍රීසි ග්‍රන්ථයේ පරිවර්තන - මහා බෝධි ආශ්‍රම් බැංගලෝර්,ඉන්දියා-1986)
9. සුත්ත නිපාතය (මහාචාර්ය පී.ඩී. ප්‍රේමසිරි මැතිඳුගේ පරිවර්තනය බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය මහනුවර-2010)
10. පාලි සිංහල අකාරාදිය පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි - 1950

පාදක සටහන්

පරිච්ඡේදය 1

1. (අ) බුද්ධ - ම.නි. අරියපරියේසන සූත්‍රය. (අහං හි අරහා
ලෝකේ අහං සත්ථා අනුත්තරෝ ඒකෝම්හි
සම්මා සම්බුද්ධෝ සීතිභූතෝම්හි නිබ්බුතෝ.)

(ආ) ධම්ම - ම.නි. අරියපරියේසන සූත්‍රය. (අධිගතෝ ඛෝ
ම්‍යායං ධම්මෝ ගම්භීරෝ දුද්දසෝ දුරනුබෝධෝ
සන්තෝ පණීතෝ අතක්කාවචරෝ නිපුණෝ පණ්ඩිත
වේදනීයෝ.)

(ඇ) සංඝ- ම.නි. චූල සීහනාද සූත්‍රය. (ඉධෙව භික්ඛවෙ
සමණෝ, ඉධ දුතියෝ සමණෝ, ඉධ තතියෝ
සමණෝ, ඉධ චතුත්ථෝ සමණෝ, සුඤ්ඤා පරප්පවාදා
සමණේහි අඤ්ඤෙ'ති.)

(ඈ) දීඝනිකායේ මහා පරිනිබ්බාණ සූත්‍රය (සුභද්‍රට දෙසූ දහම්)

2. ම.නි. බහුධාතුක සූත්‍රය (උපරි පණ්ණාසකය 3.2.5)
3. ධම්මපදය - බුද්ධ වර්ගය 15 වෙනි ගාථාව.
4. අං. නි. ඒකපුග්ගල වග්ගය 1.13.1. සිට 1.13.25 දක්වා සූත්‍ර.
5. ධම්මපදය - බුද්ධ වර්ගය 16 වෙනි ගාථාව
6. ධම්මපදය - බුද්ධ වර්ගය 04 වෙනි ගාථාව
7. ම.නි. 123 සූත්‍රය - අච්ඡරිය අබ්භූත ධම්ම සූත්‍රය.
8. දී.නි. 14 සූත්‍රය - මහාපදාන සූත්‍රය.
9. සුත්ත නිපාතයේ නාලක සූත්‍රය - පරි.2, අංක 11 සූත්‍රය.
10. සං.නි. ඛන්ධ සංයුත්ත, සීහෝපම සූත්‍රය. (අං. නි. චතුක්ක නිපාතයේ චක්ක වග්ගයේ සීහ සූත්‍රය ද කියවන්න. මෙයටම සමාන සූත්‍රයකි. එහෙත් සුළු වෙනසක් ඇත.)
11. ම.නි. මහා සච්චක සූත්‍රය (අංක 36), බෝධිරාජකුමාර සූත්‍රය (අංක 85) සංගාරව සූත්‍රය (අංක 100).
12. අ.නි. සුඛුමාල සූත්‍රය. තික නිපාතයේ 39 සූත්‍රය.

13. දී.නි. මහාපදාන සූත්‍රය. සූත්‍ර අංක 14.
14. ම.නි. අරිය පරියේසන සූත්‍රය (සූත්‍ර අංක 26).
15. ම.නි. මහා සච්චක සූත්‍රය (අංක 36), බෝධිරාජ කුමාර සූත්‍රය (අංක 85) සංගාරව සූත්‍රය (අංක 100).
16. සුත්ත නිපාතය පබ්බජ්ජා සූත්‍රය (මහා වග්ගය 3.1 සූත්‍රය)
17. සං.නි. සච්ච සංයුක්තයේ 11 සූත්‍රය හෙවත් පිරුවාණා පොත් වහන්සේගේ 17 වැනි සූත්‍රය
18. අ.නි. 5. නිපාතයේ 4.5.6. මහා සුපින සූත්‍රය
19. ධම්මපදය - සහස්ස වර්ගය 6 වැනි ගාථාව
20. සං.නි. ඛන්ධ සංයුත්ත අස්සාද සූත්‍රය. (සූත්‍ර අංක 26)
21. සුත්ත නිපාතය පධාන සූත්‍රය (අංකය 3.2 සූත්‍රය)
22. ම.නි. භය භේරව සූත්‍රය - අංක 4 සූත්‍රය.

පරිච්ඡේදය 2

1. විනය මහා වග්ගය 1 මහා ඛන්ධකය බෝධිකථා, ම.නි. 26 සූත්‍රය සහ උදාන 1 කියවන්න.
2. උදාන පාළියේ තථාගතුප්පාද සූත්‍රය. (අංකය 6.10)
3. රෝග යන්න කයට නමකි. ම.නි. දීඝනඛ සූත්‍රය වැනි සූත්‍රවලින් එය පැහැදිලි වේ. බුහුදු ''අයං කායො රූපි චාතුම්මහා භූතිකො මාතා පෙත්තික සම්භවෝ ඕදන කුම්මාසුපචයෝ අනිච්චුච්ජාදන පරිමද්දන භෙදන විද්ධංසන ධම්මෝ අනිච්චතො දුක්ඛතෝ රෝගතෝ ගණ්ඩතො... යනාදී වශයෙන් දේශනා කරති.
4. ඛුද්දක නිකාය උදාන පාළි නන්ද වග්ග ලෝකවෝලෝකන සූත්‍රය (අංකය 3.10)
5. උදාන පාළි නිග්‍රෝධ සූත්‍රය (අංකය 1.4) සහ විනය මහාවග්ග 1.2. සූත්‍රය.
6. උදාන පාළි මුචලින්ද සූත්‍රය (අංකය 2.1) සහ විනය මහාවග්ග 1.3 සූත්‍රය
7. විනය මහා වග්ගය, රාජායතන කථා.
8. සං.නි. මහාවග්ග ඉන්ද්‍රිය සංයුත්තයේ බ්‍රහ්ම සූත්‍රය (අ. 4.6.7)
9. සං.නි. මහාවග්ගයේ සතිපට්ඨාන සංයුත්ත බ්‍රහ්ම සූත්‍රය (අංකය 3.2.8)
10. සං.නි. මාරසංයුත්තය තපොකම්ම සූත්‍රය (අංකය 4.1.1)

11. සං.නි. බ්‍රහ්ම සංයුත්ත ගාරව සූත්‍රය (අංකය 6.1.2)
12. අං. නි. උරුවේල සූත්‍රය (අංකය 4.1.3.1)
13. ම.නි. මහා සීහනාද සූත්‍රය (අංක 12 සූත්‍රය)
14. ම.නි. බහුධාතුක සූත්‍රය, උපරිපණ්ණාසකය. (අංක115 සූත්‍රය)
15. අං.නි. 4 වෙනි නිපාතයේ වෙසාරජ්ජ සූත්‍රය (අංක 4.1.1.8)
16. අං.නි. චතුක්ක නිපාතයේ ද්‍රෝණ හෙවත් ලෝක සූත්‍රය
17. සුත්ත නිපාතයේ සේල සූත්‍රය. (554 ගාථාව බලන්න)
18. සුත්ත නිපාතයේ සභිය සූත්‍රය
19. ම. නි. බ්‍රහ්මායු සූත්‍රය (91 වැනි සූත්‍රය)
20. ම.නි. මහා සකුළුදායි සූත්‍රය (77 වැනි සූත්‍රය)

පරිච්ඡේදය 3

1. දී.නි. මහාපරිනිබ්බාණ සූත්‍රය සහ මහානිදාන සූත්‍රය
2. ම.නි. මහාසාරෝපම සූත්‍රය. (අංක 29 සූත්‍රය)
3. දී.නි. මහා පරිනිබ්බාණ සූත්‍රය (සූත්‍ර අංක 16)
4. සං.නි.මහා වග්ගයේ සතිපට්ඨාන සංයුත්තයේ මිත්ත සූත්‍රය.
5. අං. නි. චතුක්ක නිපාතයේ පධාන සූත්‍රය. (අංක 4.1.2.3)
6. අං.නි. දුක නිපාතය
7. සං.නි. සච්ච සංයුත්ත, ධම්මචක්කපවත්තන සූත්‍රය.
8. සෝතාපන්න යනු සෝතයට හෙවත් දිය දහරට පත් කෙනා යන්නය. සෝතය නම් ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගයයි.
9. සං.නි. මග්ග සංයුත්තයේ භික්ඛු සූත්‍රය (අංක 1.1.6)
10. සං.නි. මහාවග්ගයේ මග්ග සංයුත්තයේ බ්‍රාහ්මණ සූත්‍රය (අංක 1.1.4)
11. ම.නි. මහා චත්තාරීසක සූත්‍රය (අංක 117 සූත්‍රය)
12. ඛුද්දක පාඨ අංක 4 කුමාරපඤ්හ
13. අං.නි. තික නිපාතය
14. ධම්මපදය 348 ගාථාව
15. දී.නි. මහා පරිනිබ්බාණ සූත්‍රය, සං.නි. චාපාල සංයුත්තයේ චේතිය සූත්‍රය
16. සං.නි. ඉද්ධිපාද සංයුත්තයේ අපාර සූත්‍රය (අංක 7.1.1.)
17. ම. නි. ආනාපානසති සූත්‍රය (අංක118)
18. ධම්මපදය 361 ගාථාව
19. ධම්මපදය 38 ගාථාව

20. ම.නි. චංකි සූත්‍රය (අංක 95 සූත්‍රය)
21. සං.නි. ඛන්ධ සංයුත්තයේ සමාධි භාවනා සූත්‍රය.

පරිච්ඡේදය 4

1. සං.නි. ආනාපාන සංයුත්තයේ ආනන්ද සූත්‍රය
2. ම.නි. බහුවේදනීය සූත්‍රය (අංක 59 සූත්‍රය)
3. සං.නි. සළායතන සංයුත්තයේ සමුද්ද වග්ගයේ කොට්ඨිත සූත්‍රය
4. සං. නි. බොජ්ඣංග සංයුත්තයේ භික්ඛු සූත්‍රය
5. සං.නි. බොජ්ඣංග සංයුත්තයේ සීල සූත්‍රය.
6. සං.නි. දේවතා සංයුත්තයේ උඩ්ඩිත සූත්‍රය
7. සුත්ත නිපාතය පාරායන වග්ගයේ අජිත සූත්‍රය
8. සං.නි. සච්ච සංයුත්තයේ ධම්මචක්කපවත්තන සූත්‍රය
9. සං.නි. දේවතා සංයුත්තයේ රෝහිතස්ස සූත්‍රය
10. ම.නි. මහා හත්ථිපදෝපම සූත්‍රය
11. සං.නි. සච්ච සංයුත්තයේ කෝටිගාම සූත්‍රය
12. සං.නි. සච්ච සංයුත්තයේ ගවම්පතී සූත්‍රය
13. සං.නි. සච්ච සංයුත්තයේ සිංසපා සූත්‍රය
14. සං.නි. සච්ච සංයුත්තයේ දණ්ඩ සූත්‍රය
15. සං.නි. සච්ච සංයුත්තයේ චේල සූත්‍රය
16. සං.නි. සච්ච සංයුත්තයේ පාණ සූත්‍රය
17. සං.නි සච්ච සංයුත්තයේ සුරියුපම සූත්‍රය
18. සං.නි. සච්ච සංයුත්තයේ දුතිය සුරියුපම සූත්‍රය
19. සං.නි සච්ච සංයුත්තයේ අන්ධකාර සූත්‍රය
20. සං.නි සච්ච සංයුත්තයේ ජිග්ගල සූත්‍රය
21. ම.නි මහා චත්තාරිසක සූත්‍රය (අංක 117 සූත්‍රය)
22. ම.නි. සම්මා දිට්ඨි සූත්‍රය
23. සං.නි. නිදාන සංයුත්තයේ නගර සූත්‍රය (1.7.5 සූත්‍රය)
24. සං.නි. මග්ග සංයුත්තයේ අවිජ්ජා වගගයේ බ්‍රාහ්මණ සූත්‍රය
25. සං.නි. මග්ග සංයුත්තයේ අනුපාදා සූත්‍රය
26. සං.නි. මග්ග සංයුත්තයේ ඔරම්භාගිය සංයෝජන සුත්ත
27. සං.නි. මග්ග සංයුත්තයේ ඕඝ වග්ගයේ උද්ධම්භාගිය සංයෝජන සුත්ත

පරිච්ඡේදය 5

1. සං.නි. සළායතන සංයුත්තයේ සබ්බ වග්ගයේ ආදිත්තපරියාය සූත්‍රය
2. අං.නි. 3.2.2.6 සාළ්හ සූත්‍රය (දිට්ඨෙව ධම්මේ නිච්ඡාතො නිබ්බුතෝ සීතිභූතෝ)
3. සං.නි. ඛන්ධ සංයුත්තයේ භාර සූත්‍රය
4. සුත්ත නිපාතයේ චූල්ල වග්ගයේ රතන සූත්‍රය
5. ම.නි. මධු පිණ්ඩික සූත්‍රය සහ ඡ ඡක්ක සූත්‍රය
6. මහා තණ්හා සංඛය සූත්‍රය
7. සුත්ත නිපාතයේ මහා වග්ගයේ ද්වයතානුපස්සනා සූත්‍රය
8. සං.නි සගාථ වග්ගයේ මාර සංයුත්තයේ ගෝධික සූත්‍රය
9. සං.නි. ඛන්ධ සංයුත්තයේ උපය වග්ගයේ බීජසූත්‍රය
10. දී.නි. කේවඩ්ඪ සූත්‍රය. (අංක 11 සූත්‍රය)
11. ම.නි. අග්ගිවච්ඡගොත්ත සූත්‍රය
12. සුත්ත නිපාතයේ උපසීව සූත්‍රය (ගාථා අංකය 1078)
13. සුත්ත නිපාතයේ වංගීස සූත්‍රය (ගාථා අංකය 357)
14. සුත්ත නිපාතයේ පාරායන වග්ගයේ අජිත සූත්‍රය
15. දීඝනිකායේ මහාපරිනිබ්බාණ සූත්‍රය (සූත්‍ර අංක 16)